
වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

2024

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம்
Sri Lanka Bureau of Foreign Employment

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

වාර්ෂික වාර්තාව - 2024



පටුන

	පිටු අංකය
සාරාංශය	04
වාර්තාව පිළිබඳව	05
හැඳින්වීම	06
සභාපතිතුමාගේ පණිවිඩය	11
අධ්‍යක්ෂ මණ්ඩලය	12
ඉහළ කළමනාකාරීත්වය	13
කාර්යසාධන සමාලෝචනය	16
විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි අනුබද්ධ ආයතනය	59
අධ්‍යක්ෂ වාර්තාව	60
පාලන ව්‍යූහය	63
ආයතනික සමාජීය වගකීම් වාර්තාව	67
අවදානම් විශ්ලේෂණ වාර්තාව	69
මූල්‍ය ප්‍රකාශ	73
විගණකාධිපති වාර්තාව	133
විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ නිරීක්ෂණ	149

සාරාංශය

විදේශ රැකියා සඳහා ලියාපදිංචිවීම්
314,786

පිරිමි : **186,674 (59.30%)**

කාන්තා: **128,112 (40.70%)**

පුහුණු				අඩු කුසලතා සහිත ශ්‍රමිකයින්				මුළු එකතුව
පිරිමි	කාන්තා	එකතුව	%	පිරිමි	කාන්තා	එකතුව	%	
127,928	116,539	244,467	77.66	58,746	11,573	70,319	22.34	314,786

ප්‍රධාන වශයෙන් ශ්‍රම ඉල්ලුම සහිත රටවල්
කුවේට | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | සවුදි අරාබිය

සේවක ප්‍රේෂණ
ඇ. ඩො. මි. 6,575
රු. බිලියන 1,984

කාර්යාංශ ආදායම
රු. මිලියන 10,639

සේවක සුභසාධන අරමුදල් වියදම්
රු. මිලියන 3,294

කාර්යාංශ බදු පෙර ලාභය
රු. මිලියන 3,618

කාර්යාංශ වියදම
රු. මිලියන 3,726

වාර්තාව පිළිබඳව

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2024 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව කාර්යාංශය සහ ඊට අනුබද්ධිත ආයතනයේ 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ඒකාබද්ධ මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය ඉදිරිපත් කරයි.

ශ්‍රී ලංකාවේ විදේශ රැකියා සඳහා වන නියාමන අධිකාරිය ලෙස, එහි මූලික පරමාර්ථ වන සුරක්ෂිතබව, ප්‍රවර්ධනය සහ සුභසාධනය වෙනුවෙන් ස්ථාවරව කටයුතු කිරීම උදෙසා වූ වි.සේ.නි.කා හි නොපසුබට කැපවීමේ කාර්යයන් මෙම වාර්තාව මඟින් පිළිබිඹු කරයි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රයත්නය විදහා දැක්වීම පිණිස මෙම වාර්තාව මූල්‍ය හා මූල්‍ය නොවන කාර්ය සාධනය ලෙස ඒකාබද්ධව දක්වා ඇත. මෙම වාර්තාව තුළ 2024 වර්ෂයේ සාක්ෂාත් කර ගන්නා ලද දෑ ඉදිරිපත් කර ඇති අතර අදාළ වන කොටස් හි සංසන්දනාත්මක විදහා දැක්වීම සඳහා සමාලෝචනයට භාජනය වන වර්ෂය සහ පෙර වර්ෂයන්හි කාර්ය සාධන දත්ත ඇතුළත් කර ඇත.

ප්‍රධාන මූල්‍ය හා මෙහෙයුම් ජයග්‍රහණ එක් කිරීමට අමතරව, ආරක්ෂිත සහ නිවැරදි සංක්‍රමණය සඳහා පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ස්ථිර කැපවීම සහ එමඟින් ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ යහපත තහවුරු කිරීම උදෙසා වූ විධානයන්ට අනුකූල වීම සහතික කිරීම පිළිබඳව වාර්තාව අවධාරණය කරයි.

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් (SLFRS / LKAS), රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ, 1971 අංක 28 දරන මූල්‍ය පනත සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ සංග්‍රහයට (Code of Best Practice on Corporate Governance issued by CA Sri Lanka) අනුකූලව මූල්‍ය තොරතුරු සකස් කර ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශන විගණන වාර්තා සමඟ මෙහිදී ප්‍රකාශයට පත් කර ඇත.

මෙම වාර්තාවේ අඩංගු තොරතුරු අදාළ නිලධාරීන්, මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය තහවුරු කරමින් විගණකාධිපතිවරයා සහ අදාළ අවස්ථාවලදී සාමාන්‍යාධිකාරී,සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.

හැඳින්වීම

දැක්ම

එතෙර වෙළඳපොළ සඳහා නිපුණතාවයෙන් පිරි මිනිස් සම්පත සැපයීමේ ලොව හොඳම තේරීම බවට ශ්‍රී ලංකාව පත්වීම

ශ්‍රී ලංකාව තුළ විදේශ රැකියා කර්මාන්තයේ පාලනය හා නියාමනය සඳහා පූර්ණ අධිකාරී බලය අප සතු වේ.

මෙහෙවර

දේශීය ආර්ථිකයට දායකවෙමින් හා සියලුම පාර්ශවකරුවන්ගේ යහපත සුරක්ෂිත කරමින්, ජනතාවට තම කුසලතාවන්ගෙන් එතෙර රැකියා වෙළඳපොළෙහි යහපත් ප්‍රතිලාභ ලැබිය හැකි කාර්යක්ෂම හා සමානත්වයෙන් යුතු මාර්ගයන් බිහි කිරීම

තත්ත්ව ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, අපගේ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය හා තෘප්තිය පවත්වා ගැනීමටත්, ශ්‍රී ලංකාවේ විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රගමනයට දායක වීමටත්, සමාජ වගකීම් සහ සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් සඳහා අපගේ කැපවීම තහවුරු කිරීමට කටයුතු කරන්නෙමු. පාරිභෝගික, නීතිමය, නියාමන සහ අනෙකුත් අදාළ අවශ්‍යතාවලට අනුකූලව අපගේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සපුරාලන උසස් තත්ත්වයේ සේවාවන් සැපයීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය කැපවී සිටී. අපගේ සේවකයින් වටිනාම වත්කම ලෙස සලකන අතර අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ගේ නිපුණතාවය වර්ධනය කර ගැනීම සහ වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව තත්ත්ව කළමනාකරණ පද්ධතියේ කාර්යාක්ෂමතාව පවත්වා ගනිමින් ගනුදෙනුකරුවන්ට සේවය සැපයීම අපගේ තත්ත්ව ප්‍රතිපත්තියයි.

ආයතන ව්‍යුහය

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

2024.11.25 දිනැති අතිවිශේෂ ගැසට් අංක. 2412/08

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

1985 අංක 21 දරණ පාර්ලිමේන්තු පනත සහ එහි සංශෝධිත 1994 අංක 04 සහ 2009 අංක 56 මගින් ස්ථාපිත

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය

1996 වසරේදී පිහිටුවන ලද, විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි පූර්ණ අනුබද්ධිත ආයතනය.

අපගේ දේශීය ජාලය

ප්‍රධාන කාර්යාලය:
අංක 234,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
කොස්වත්ත, බත්තරමුල්ල

අපගේ ශ්‍රම බලකාය

1,121

විගමණික සම්පත් මධ්‍යස්ථාන

1. මතුගම
2. තංගල්ල
3. හාලි ඇල
4. රත්නපුර
5. අම්පාර
6. කුරුණෑගල
7. නුවර
8. වවුනියාව
9. අනුරාධපුර



පුහුණු මධ්‍යස්ථාන

1. කුරුණෑගල (වැහැර)
2. පන්නිපිටිය

ප්‍රාදේශීය දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන

1. යාපනය
2. මඩකලපුව
3. හලාවත
4. දඹුල්ල
5. ගාල්ල
6. පොළොන්නරුව
7. ත්‍රිකුණාමලය
8. නුවරඑළිය
9. මොණරාගල
10. කිලිනොච්චි

අපගේ විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා වඩාත් කාර්යක්ෂමව සේවය කිරීම උදෙසා අපගේ දේශීය ජාලය පුළුල් කිරීම.....

2024 වර්ෂයේදී නුවරඑළිය, මොණරාගල සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල නව මධ්‍යස්ථාන තුනක් විවෘත කිරීමත් සමඟ ආයතනයක් ලෙස සැළකිය යුතු පුළුල් වර්ධනයක් සනිටුහන් විය. විදේශ රැකියා සඳහා වැඩිවන ඉල්ලුමට ප්‍රතිචාර වශයෙන් සහ දිස්ත්‍රික් මට්ටමින් කාර්යාංශයේ සේවාවන් ලබා ගැනීම පහසු කිරීම විශේෂයෙන්ම අවට දිස්ත්‍රික්කවල පවතින වි.සේ.නි.කා මධ්‍යස්ථාන වෙත සැළකිය යුතු දුරක් ඇති ප්‍රදේශ සඳහා යන අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් මෙම මධ්‍යස්ථාන පිහිටුවන ලදී.

අඩු ආදායම්ලාභී පවුල්වලින් විදේශ ගත වීමට අපේක්ෂා කරන ශ්‍රමිකයින්හට පුහුණු පහසුකම් ලබා ගැනීමට සහ නැවත පැමිණෙන විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විමධ්‍යගත සේවාවන් ලබා ගැනීමට ඇති මූල්‍යමය දුෂ්කරතා ලිහිල් කිරීම මෙහි අරමුණ විය.

නුවර එළිය දිස්ත්‍රික් මධ්‍යස්ථානය:

2024 ජනවාරි 07 සිට සේවාව සපයයි

මොනරාගල දිස්ත්‍රික් මධ්‍යස්ථානය:

2024 ජුනි 24 සිට සේවාව සපයයි

කිලිනොච්චි දිස්ත්‍රික් මධ්‍යස්ථානය:

2024 ජුලි 13 සිට සේවාව සපයයි

ඉහත මධ්‍යස්ථාන තුන විවෘත කිරීමත් සමඟ, කාර්යාංශයේ මුළු දිස්ත්‍රික් මධ්‍යස්ථාන සංඛ්‍යාව 10ක් දක්වා වැඩි විය.






අපගේ විදේශ ජාලය

විදේශයන්හි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩලවල පිහිටි රැකියා සහ සුභසාධන අංශ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය රටවල් 13 ක ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පිහිටුවා ඇති රැකියා සහ සුභසාධන අංශ 15 ක් ක්‍රියාත්මක කරයි. මෙම රැකියා සහ සුභසාධන අංශ මඟින් විදේශ රටවල සේවය කරනු ලබන විගමනික ශ්‍රමිකයින් හට සේවා සපයනු ලබයි. විදේශ දූත මණ්ඩල පරිපාලන සහ විදේශ සබඳතා අංශය මෙම රැකියා සහ සුභසාධන අංශවල මෙහෙයුම් සම්බන්ධීකරණය කරයි.

1. අබුඩාබි
2. බහරේන්
3. ඩුබායි
4. ඊශ්‍රායලය
5. ජෙඩා
6. ජෝර්දානය
7. කුවේට්
8. ලෙබනනය
9. මැලේසියාව
10. මාලදිවයින
11. ඕමානය
12. කටාර්
13. රියාද්
14. සිංගප්පූරුව
15. දකුණු කොරියාව



සභාපතිතුමාගේ පණිවුඩය



2024 වසර දෙස ආපසු හැරී බලන විට, ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් අපගේ ජාතික ආර්ථිකයට ලබා දෙන අමිල දායකත්වය අගය කිරීම අත්‍යවශ්‍ය වේ. 2024 වර්ෂයේදී සේවක ප්‍රේෂණ ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 6,575 ක් වාර්තා විය. මෙය 2023 වසරේ සේවක ප්‍රේෂණ වන ඇමරිකානු ඩොලර් මිලියන 5,970 ට සාපේක්ෂව 10% ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. සේවක ප්‍රේෂණවල පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් පෙන්වීම දිරිගන්වන කරුණකි.

2024 වර්ෂය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විදේශ රැකියා සඳහා ලියාපදිංචිවීම් වල සැලකිය යුතු වර්ධනයක් ද පෙන්නුම් කරන ලදී. එම වසර තුළදී විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම් 314,786 ක් වාර්තා වී ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව 5.75% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මුළු ලියාපදිංචි කිරීම් වලින් 77.66% ක් පුහුණු කාණ්ඩය යටතේ වූ අතර, අඩු කුසලතා සහිත ශ්‍රමික කාණ්ඩය 22.34% ක් විය. සමාලෝචනයට භාජනය වන වර්ෂයේදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය බිලියන 10.63 ක ආදායමක් වාර්තා කරන ලදී. ඊට අමතරව, බදු ගෙවීමට පෙර ලාභය බිලියන 3.61 ක් ලෙස වාර්තා විය.

විදේශ රැකියා සඳහා ඇති ඉල්ලුම වැඩිවීමත් සමඟ ව්‍යාජ රැකියා පොරොන්දු සම්බන්ධ වංචා සිද්ධීන්වල වර්ධනයක් දක්නට ලදී. ඊට ප්‍රතිචාර වශයෙන්, සූරාකෑම් වැළැක්වීම සහ ආරක්ෂිත, ක්‍රමවත් සහ නිවැරදි සංක්‍රමණය ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ ව්‍යාපාර පුළුල් කර ඇත. 2024 වසරේදී, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය රට පුරා සුභසාධන සහ ප්‍රත්‍යානුකරන ක්‍රියාකාරකම් රාශියක් පවත්වා ඇති අතර, එතුලින් විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා කාර්යාංශයේ කැපවීම ඉස්මතු කර දක්වයි.

2024 වර්ෂය සඳහා වූ කාර්ය සාධනය සමාලෝචනය කිරීමේදී, කාර්යාංශයේ කළමනාකාරිත්වයේ සහ කාර්ය මණ්ඩලයේ මෙන්ම සියලුම පාර්ශ්වකරුවන්ගේ දායකත්වය, විෂය භාර අමාත්‍යවරයාගේ මගපෙන්වීම සහ මෙම කාලය තුළ රේඛීය අමාත්‍යාංශය විසින් ලබා දුන් සහයෝගීතාවය ස්තුති පූර්වකව සිහිපත් කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

අපේ රටේ විශාලතම ශක්තිය වන "අපගේ මිනිස් බලය" ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ථිරසාර කැපවීමකින් යුතුව, අනාගත අභියෝග ජය ගැනීමට සහ නැගී එන අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට ව්‍යුහාත්මක වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සහ උපාය මාර්ග සංවර්ධනය කිරීම කෙරෙහි අපගේ අවධානය යොමු කිරීම පෙර දැරිව කටයුතු කරන්නෙමු.

කෝශල වික්‍රමසිංහ
සභාපති

අධ්‍යක්ෂ මණ්ඩලය

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 05 වන වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය පහත සමාජිකයින්ගෙන් සමන්විත වේ.

01 සාමාජිකයකු – මුදල් අමාත්‍යාංශයෙන්

01 සාමාජිකයකු - විදේශ කටයුතු අමාත්‍යාංශයෙන්

01 සාමාජිකයකු – කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන්

සාමාජිකයින් 04 දෙනෙකු – බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවලින්

සාමාජිකයින් 04 දෙනෙකු – විදේශ රැකියා විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි

2024 දෙසැම්බර් 31 න් අවසන් වසර තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

අධ්‍යක්ෂවරයාගේ නම		තනතුර
01. කෝශල වික්‍රමසිංහ මහතා	-	සභාපති
02. ජානක අධිකාරි මහතා	-	අධ්‍යක්ෂ
03. වන්දන ජයවර්ධන මහතා	-	අධ්‍යක්ෂ
04. ජේ.එම්.එස්.ඩී. රත්නායක මිය	-	අධ්‍යක්ෂ
05. ප්‍රදීපා සේරම මිය	-	අධ්‍යක්ෂ
06. නිල්මිණි හේරත් මිය	-	අධ්‍යක්ෂ
07. හර්ෂනි ජයසේකර මෙය	-	අධ්‍යක්ෂ
08. එම්.එෆ්.එම්. අර්ෂාඩ් මහතා	-	අධ්‍යක්ෂ
09. ප්‍රදීප් නියදඬුපොල මහතා	-	අධ්‍යක්ෂ
10. හේමන්ත සපුමොහොට්ටි මහතා	-	අධ්‍යක්ෂ
11. එම්.එෆ්.එම්. ෆනූර් මහතා	-	අධ්‍යක්ෂ

ඉහළ කළමනාකාරිත්වය

2024 දෙසැම්බර් 31 න් වසර අවසානය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ජෙයෂ්ඨ කළමනාකාරිත්වය පහත පරිදි වේ.


- කෝශල වික්‍රමසිංහ මයා - සභාපති
- ඩී.ඩී.පී. සේනානායක මයා - සාමාන්‍යාධිකාරී

- එල්.ඒ.පී.කේ.ලියන්වල මයා - අතිරේක සාමාන්‍යාධිකාරී - ආයතනික කටයුතු
- පී.පී. විරසේකර මයා - වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී - දේශීය කටයුතු
- පී.ජී.ජී.එස්. යාපා මයා - වැ.බ. අතිරේක සාමාන්‍යාධිකාරී - ජාත්‍යන්තර කටයුතු

- ඒ.කේ.යූ. රෝහණ මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – තොරතුරු තාක්ෂණ හා ගුවන් තොටුපල
- ජේ.එම්.ආර්.යූ. ජයසිංහ මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ක්‍රමසම්පාදන හා බලපත්‍ර
- එන්.වයි. සමරසේකර මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – නිති
- පී.එම්. රත්නසිංහආරච්චි මිය - වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – රැකියා අනුමැති
- ඩබ්ලිව්.ඒ.කේ. කුමාරි මිය - වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මුදල්
- ජේ.ඒ.ඩී.පී. මංජුල මයා - වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – පරිපාලන හා මානව සම්පත්
- එල්.වයි. පතිරණ මයා - වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – සමාජ සංවර්ධන
- ආර්.ඒ.එස්. චාමින්ද මයා - වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අභ්‍යන්තර විගණන
- ජී.ටී.එස්.සී.විජේරත්න මිය - වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – විදේශ සම්බන්ධතා හා සැලසුම්
- එච්.ඩබ්ලිව්. සමන්ත මයා - වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ව්‍යාපාර සංවර්ධන
- බී.ඒ. රෝහිණි මිය - වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – සමථ
- ආර්.ඩබ්ලිව්.ඒ.ජී.එස්. චාමින්ද මයා - වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – පුහුණු සහ බඳවාගැනීම්

- ජගත් බටුගෙදර මයා - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (සබරගමුව පළාත)
- එස්. ගාල්ලගේ මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ඌව පළාත)
- එච්.එම්. සුනිල් මයා - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (උතුරු මැද පළාත)
- ඩබ්ලිව්.අයි.එල්.පී. විරසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වයඹ පළාත)
- එම්.ජී.එස්. තෙන්නකොන් මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (බස්නාහිර පළාත)
- කේ.ඒ.ඩී.එස්. කුමාරපේලි මයා - ජ්‍යෙෂ්ඨ කළමනාකරු- නඩත්තු (බඳවාගැනීම්)
- ඒ.එල්.ඩී.ඩී. ලක්රාණි මිය - වැ.බ. ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ඌව පළාත)
- එන්.කේ. කන්නන්ගර මිය - වැ.බ. ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මධ්‍යම පළාත)
- ජී.ජී.පී. විජේවර්ධන මිය - වැ.බ. ජ්‍යෙෂ්ඨ කළමනාකරු (දකුණු පළාත)
- ටී.එච්.එල්.පී. අබේවික්‍රම මයා - වැ.බ. ජ්‍යෙෂ්ඨ කළමනාකරු (නැගෙනහිර පළාත)

ආයතනික සංවිධාන ව්‍යූහය -ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය



Keys -
Admin & HR – පරිපාලන හා මානව සම්පත්
Admin – පරිපාලන
Air – ගුවන් තොටුපළ ඒකකය
App – අනුමැති
BS – අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
Bus. Dis – ව්‍යාපාර ගැටළු නිරාකරණය
Con I – සම්බ – I
Con II – සම්බ – II
Fin – මුදල්
FR – විදේශ සම්බන්ධතා
Hum. Tra. – මිනිස් වෙළඳාමට එරෙහි ඒකකය
HR- මානව සම්පත්
IA – අභ්‍යන්තර විගණන
ICT- තාක්ෂණික සහ ආයතනික පුහුණු
Inv –විමර්ශන
Isr (Agri) – රක්ෂායල්- කෘෂිකාර්මික
Isr (Con) – රක්ෂායල් - ඉදිකිරීම්
IT – තොරතුරු තාක්ෂණ
Lice – බලපත්‍ර
Main – නඩත්තු
MPS – මිනිස් බල සැපයුම් සහ පා.සහ
Mkt- අලෙවිකරණ
Plan – සැලසුම්
Proc – ප්‍රසම්පාදන
Pub – ප්‍රචාරණ
QA – තත්ත්ව ආරක්ෂණ
Rec (K)- බදවා ගැනීම්(කොරියානු)
Rec (G) – බදවා ගැනීම් (සාමාන්‍ය)
Rein – ප්‍රතිස්ථාපනය
Res – පර්යේෂණ
Train (D) – පුහුණු (ගෘහාධ්)
Trans – ප්‍රවාහන
Wel – සුභසාධන

*පළාත් සඳහා පත්කර ඇති ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් අතිරේක සාමාන්‍යාධිකාරි(ආයතනික කටයුතු) ගේ අධීක්ෂණයට යටත් වේ.

ප්‍රධාන අරමුණු

විදේශ රැකියා කර්මාන්තය නියාමනය කිරීම හා ඊට අවශ්‍ය සහය ලබා දීම

ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයින් සහ මෙරට සිටින ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය හා සුරක්ෂිතතාව සහතික කිරීමේ විධිවිධාන අනුගමනය කිරීම

ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා පුළුල් කිරීම් හා ඒවා ප්‍රවර්ධනය කිරීම

කාර්යය සාධන සමාලෝචනය

කාර්ය සාධන සමාලෝචනය, ඉහත සඳහන් කළ ප්‍රධාන අරමුණු තුන යටතේ සහ කාර්යාංශයෙහි මෙහෙයුම් විශිෂ්ටත්වය පිළිබඳ කොටස යටතේ ව්‍යුහගත කර ඉදිරිපත් කෙරේ.

විදේශ රැකියා කර්මාන්තය නියාමනය කිරීම හා ඊට අවශ්‍ය සහය ලබා දීම


- බලපත්‍රකරණය
- රැකියා ඇණවුම් අනුමත කිරීමේ හා රැකියා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලීන්
- නීති පැනවීම
- ව්‍යාපාර ආරවුල් නිරාකරණය

බලපත්‍රකරණය

විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ විධිවිධාන අනුව අවශ්‍යතා සපුරා ඇති අය සඳහා විදේශ රැකියා ව්‍යාපාර කරගෙන යාමට කාර්යාංශය බලපත්‍ර නිකුත් කරයි. බලපත්‍රයක් වසරක කාලයක් සඳහා වලංගු වන අතර නැවත අලුත් කළ හැකිය.

බලපත්‍රකරණ ක්‍රියාවලිය මඟින් විගමනික ශ්‍රමිකයින් නීත්‍යානුකූල මාර්ග හරහා බඳවා ගැනීම සහතික කිරීම, වංචනික ක්‍රියාකාරකම් අවදානම අඩු කිරීම සහ වගවීම වැඩි කිරීම මගින් විගමනික ශ්‍රමිකයින් ආරක්ෂා කරයි. වි.සේ.නි.කාර්යාංශයෙහි බලපත්‍ර අංශය ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විදේශගත කිරීම සඳහා පහසුකම් සපයන විදේශ රැකියා නියෝජිතායතන සඳහා බලපත්‍ර ලබා දීම සහ නියාමනය කිරීමේ වගකීම දරයි. එම අංශය විසින් බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවලට අදාළ නීති, රෙගුලාසි සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරයි.

බලපත්‍ර අංශය මඟින් සිදු කරනු ලබන කටයුතු		2022	2023	2024
1.	නව බලපත්‍ර නිකුත් කිරීම	113	144	99
2.	බලපත්‍ර අලුත් කිරීම	864	961	1095
3.	බලපත්‍ර අවලංගු කිරීම	22	33	1000
4.	දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	04	12	03
5.	උසාවි නඩු සඳහා පෙනී සිටීම	108	206	161
6.	බලපත්‍රලාභීන් සඳහා ශාඛා කාර්යාල පවත්වාගෙන යාමට අනුමැතිය ලබා දීම	15	75	91





කාර්යාංශ පනතට අනුකූල විදේශ රැකියා සම්බන්ධ රෙගුලාසි, ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳව දැනුවත් කිරීම සඳහා නව බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවල බලපත්‍රලාභීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024.12.12 දින පවත්වන ලදී.



බලපත්‍ර අංශය මඟින් ශ්‍රී ලංකාව තුළ දැඩි රෙගුලාසි සහ බලපත්‍රකරණ අවශ්‍යතා පනවන අතුරදි, ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවල රැකියා සහ සුභසාධන අංශ මඟින්, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සමඟ සම්බන්ධ වන විදේශ රැකියා නියෝජිතායතන ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම සිදු කරයි. එමඟින් විදේශ රැකියා ක්ෂේත්‍රයේ බඳවා ගන්නන් ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි නියාමනය කරනු ලබන බව ක්‍රමවේදයක් සහතික කරයි.

රැකියා සහ සුභසාධන අංශ හරහා විදේශ රැකියා නියෝජිතායන ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම	2022	2023	2024
විදේශ රැකියා නියෝජිතායන ලියාපදිංචි කිරීම	1034	1188	884
විදේශ රැකියා නියෝජිතායන ලියාපදිංචිය අලුත් කිරීම	1687	914	1045

රැකියා ඇණවුම් අනුමත කිරීමේ හා රැකියා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලින්

රැකියා ඇණවුම් අනුමත කිරීමේ සහ රැකියා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය හරහා විදේශයන්හි සිටින ශ්‍රී ලාංකික සේවකයින්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කරන අතරම, සාධාරණ හා සදාචාරාත්මක බඳවා ගැනීමේ පිළිවෙත් සහතික කරමින්, සේවායෝජකයින්ගේ සහ විදේශ රැකියාවලට යොමු වන ශ්‍රමිකයින්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුණයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ විධිවිධාන ප්‍රකාරව, ශ්‍රී ලංකාවෙන් බැහැර රැකියා අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම ශ්‍රී ලාංකිකයෙකු විසින් ම එසේ පිටත්ව යාමට පෙරාතුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ ලියාපදිංචි වීම අනිවාර්ය වේ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ එසේ ලියාපදිංචි වීම මඟින්, සත්කාරක රටවලදී ශ්‍රී ලාංකිකයින්ගේ අයිතිවාසිකම් සහ අපේක්ෂාවන් සුරක්ෂිත කෙරෙන වලංගු රැකියා ගිවිසුමක් සහිතව ශ්‍රී ලාංකිකයින් විදේශගත රැකියාවක නිරත වන බවට සහතික කරනු ලබයි. **එසේ ලියාපදිංචි වන විගමණික ශ්‍රමිකයින් හට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ගාස්තු අයකිරීමකින් තොරව රක්ෂණාවරණයක් පිරිනමනු ලබන අතර එය ඔවුන්ගේ කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය සඳහා වලංගු වේ.** අදාළ රැකියා කොන්ත්‍රාත්තුව ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ලියාපදිංචිය වසර දෙකක හෝ තුනක කාලයක් සඳහා වලංගු වේ. රැකියා නියුක්තිකයින් සඳහා සිය ලියාපදිංචිය දිර්ඝ කර ගැනීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මඟින් සිදු කර ගැනීම සඳහා පහසුකම් සලසා ඇත.

කාර්යාංශයේ පළමු අනුමැති අංශය සහ අවසාන අනුමැති අංශය යන අංශ මේ යටතේ ක්‍රියාත්මක වේ.

පළමු අනුමැති අංශය

- බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන මඟින් ඉදිරිපත් කරනු ලබන රැකියා ඇණවුම් සහ වෙළඳ දැන්වීම් සඳහා අනුමැතිය ලබා දෙනු ලබයි. එමෙන්ම, පෞද්ගලික ක්‍රමයන් (ස්වයං ලියාපදිංචිය) ඔස්සේ රැකියා අවස්ථා ලැබෙන විගමණික ශ්‍රමිකයින් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ද මෙමඟින් පහසුකම් සලසනු ලබයි.

අවසන් අනුමැති අංශය

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් අනුමත කරන ලද රැකියා ඇණවුම් ප්‍රකාරව විදේශ රැකියා අවස්ථා සඳහා ශ්‍රී ලාංකිකයින් බඳවා ගැනීම පිණිස බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන වෙත අනුමැතිය ලබා දෙනු ලබයි.


පළමු අනුමැති අංශය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

පළමු අනුමැති අංශයේ ක්‍රියාකාරකම්	වසර		
	2022	2023	2024
ස්වයං මාර්ග ලියාපදිංචිය	187,639	121,844	97,152
අනුමත කරන ලද රැකියා ඇණවුම් සංඛ්‍යාව	3,138	4,260	4,122
අනුමත කරන ලද වෙළඳ දැන්වීම් සංඛ්‍යාව	1,005	1,341	2,848

අවසන් අනුමැති අංශය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

- 2022 සිට 2024 දක්වා ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන ඔස්සේ විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම්


මධ්‍යස්ථානය		2022	2023	2024
ප්‍රධාන කාර්යාලය		87,405	101,916	76,165
පළාත් කාර්යාල	අම්පාර	1,955	510	0
	අනුරාධපුර	1,850	2,204	2,264
	බදුල්ල	90	68	138
	හලාවත	57	873	1,449
	නුවර	5,400	5,887	6,216
	කුරුණෑගල	26,518	32,318	36,031
	රත්නපුර	21	07	43
පළාත් කාර්යාලවල එකතුව		35,891	41,867	46,141
එකතුව		**123,296**	**143,783**	**122,306**




- 2024 දී පුහුණු සහ අඩු කුසලතා සහිත ශ්‍රමික කාණ්ඩ අනුව බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන හරහා විදේශ රැකියා සඳහා ලියාපදිංචි වූ ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව

මිනිස්බල මට්ටම	2024		
	කාන්තා	පිරිමි	මුළු සංඛ්‍යාව
පුහුණු	78,865	23,936	102,801
අඩු කුසලතා සහිත ශ්‍රමිකයින්	3,428	14,620	18,048

කාර්යාංශයේ හි බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන හරහා ලියාපදිංචි කිරීම් පිළිබඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 85% ක් පුහුණු කාණ්ඩය යටතේ සහ 15% ක් අඩු කුසලතා සහිත ශ්‍රමිකයින් කාණ්ඩය යටතේ විය.





කලාපීය පිටත්වීම්

බොහෝ සේවකයින් සේවය කරන්නේ මැදපෙරදිග කලාපිය රටවල එනම් බහරේන්, කුවේට්, ඕමානය, කටාර්, සවුදි අරාබිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය තුළ ය. මැදපෙරදිග කලාපය ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් සඳහා විශාලතම විදේශ රැකියා වෙළඳපොළ ලෙස හැඳන්විය හැකි අතර, ශ්‍රී ලාංකික සේවකයින්ගෙන් 89% කට වඩා එම කලාපයේ සේවය කරයි.

පළමු අනුමැති සහ අවසන් අනුමැති අංශවලට අමතරව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම කාර්යාංශයේහි ගුවන්තොටුපළ ඒකකය සහ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පිහිටුවා ඇති රැකියා සහ සුභසාධන අංශ හරහා සිදු කිරීමට පහසුකම් සලසා ඇත.

රැකියා සහ සුභසාධන අංශ හරහා ලියාපදිංචි කිරීම			
විස්තරය	2022	2023	**2024**
විගමණික ශ්‍රමිකයින්ගේ නව ලියාපදිංචි කිරීම්	3,320	2,797	3,096
විගමණික ශ්‍රමිකයින්ගේ ලියාපදිංචි අලුත් කිරීම්	6,329	4,609	5,499

ගුවන්තොටුපල ඒකකය / සහන පියස මධ්‍යාස්ථානය හරහා ලියාපදිංචි කිරීම්	**2022**	**2023**	**2024**
ගුවන්තොටුපල ඒකකය	71,824	55,257	82,675
සහන පියස මධ්‍යාස්ථානය	3,499	4,402	5,161

නීති පැනවීම

විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් බඳවා ගැනීම සහ සේවයේ යෙදවීම නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විවිධ නීති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම්වල නිරත වේ. විදේශ සේවා නියුක්ති කාර්යංශයෙහි නීති අංශය, විශේෂ විමර්ශන අංශය සහ මිනිස් ජාවාරම්වලට එරෙහි ඒකකය නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා ක්‍රියාත්මක වේ. රැකියා අපේක්ෂකයින්, විගමණික ශ්‍රමිකයින්, ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සහ අනෙකුත් අගතියට පත් පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විවිධ නීති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනයන් ක්‍රියාත්මක කරයි. එහි ප්‍රධාන නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් සමහරක් පහත පරිදි වේ.

- **නියාමන අනුකූලතාව:** බඳවා ගැනීමේ නියෝජිතායතන බලපත්‍රකරණ අවශ්‍යතා, වර්යාධර්ම සංග්‍රහය සහ අනෙකුත් නීතිමය බැඳීම්වලට අනුකූලව කටයුතු කරන බව සහතික කරමින්, විදේශීය රැකියා සම්බන්ධ රෙගුලාසි බලාත්මක කරයි.
- **අධීක්ෂණය සහ පරීක්ෂණය**: රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා බඳවා ගැනීමේ නියෝජිතායතනවල නිරන්තර පරීක්ෂණ පැවැත්වීම සහ නිරීක්ෂණය කිරීම. මෙයට සේවා කොන්දේසි, බඳවා ගැනීමේ පරිවයන් සහ විගමණික ශ්‍රමිකයින්ගේ සුභසාධනය තක්සේරු කිරීම ඇතුළත් වේ.
- **පැමිණිලි විමර්ශනය**: බඳවාගැනීම් වංචා, සූරාකෑම, අපයෝජනය හෝ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් විගමණික ශ්‍රමිකයින් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් විසින් ඉදිරිපත් සිදු කරනු ලබන පැමිණිලි විමර්ශනය කරයි.
- **නඩු පැවරීම සහ නීතිමය ක්‍රියාමාර්ග**: විදේශ රැකියා නියෝජිතායතන හෝ සේවා යෝජකයින් විසින් සිදු කරන විෂමාචාර හෝ නීති විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන්, විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් වැරදිකරුවන්ට නඩු පැවරීම සහ වැරදි රැකියා නියෝජිතායතනවල බලපත්‍ර අවලංගු කිරීම ඇතුළුව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබයි.
- **මිනිස් ජාවාරම වැළැක්වීම**: විදේශ රැකියා ක්ෂේත්‍රය තුළ මිනිස් ජාවාරම් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර මිනිස් ජාවාරමට එරෙහිව සටන් කිරීම සහ අවදානමට ලක්විය හැකි විගමණික ශ්‍රමිකයින් ආරක්ෂා කිරීම අරමුණු කරගත් දැනුවත් කිරීමේ ව්‍යාපාර, පුහුණු වැඩසටහන් සහ මුලපිරීම් සඳහා සහභාගී වේ.

නීති අංශය, විශේෂ විමර්ශන අංශය සහ මිනිස් ජාවාරම්වලට එරෙහි ඒකකය ඔවුන්ගේ වගකීමේ කොටසක් ලෙස, මහජනතාව, රාජ්‍ය නිලධාරීන්, බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සහ අනෙකුත් අදාළ පාර්ශවයන් සඳහා ආරක්ෂිත සංක්‍රමණය, නීති, රෙගුලාසි සහ විදේශ රැකියා සහ මිනිස් ජාවාරම වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ස්වාධීනව සහ සහයෝගීව පවත්වයි.

ඉහත අංශවලට අමතරව, විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයින්ගේ කාර්යාංශ ලියාපදිංචිය පරීක්ෂා කිරීම හරහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීමේ පර්යන්තයේ සේවා කවුළුවක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. විදේශ රැකියා සඳහා නීති විරෝධී බඳවා ගැනීම් සහ මිනිස් ජාවාරම් සඳහා උත්සාහයන් මෙම පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේදී මෙම ඒකකය වෙත අනුයුක්ත නිලධාරීන් විසින් අනාවරණය කරනු ලැබේ.

නීති අංශය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වලට අදාළ කාර්ය සාධනය,

නීති අංශය මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්		ප්‍රගතිය		
		2022	2023	2024
01	කාර්යාංශයට එරෙහිව ගොනු කරන ලද නඩුවකදී නීති උසාවි සහ විනිශ්චය සභාවල පෙනී සිටීම	106	185	153
02	නීතිය උල්ලංඝනය කළ බලපත්‍රලාභී නියෝජිතයින්ට සහ බලපත්‍ර නොමැති පුද්ගලයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම	54	25	10
03	බලපත්‍රලාභී නියෝජිතයින්ට සහ බලපත්‍රලාභී නොවන පුද්ගලයින්ට එරෙහිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගොනු කරන ලද නඩු වලදී අධිකරණවල පෙනී සිටීම	4121	4472	3280
04	නීතිමය ලියකියවිලි කෙටුම්පත් කිරීම සහ සහතික කිරීම	57	98	150
05	විදේශ රැකියා වලදී අදාළ නීතිය සහ ඊට අදාළ අනෙකුත් නීති පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම සඳහා කාර්යාංශ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	00	02	06
06	පවතින නීතිය පිළිබඳව දැනුම යාවත්කාලීන කිරීම/ සංවර්ධනය සඳහා ජාතික සහ ජාත්‍යන්තර නීති වැඩමුළු සහ වැඩසටහන් සඳහා නීති නිලධාරීන් සහභාගී කරවීම	01	02	06
07	කාර්යාංශ පනත යටතේ මිනිස් ජාවාරම වැළැක්වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්ය මණ්ඩලය, පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	01	02	22
08	ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පළාත් කාර්යාලය හරහා විගමණික සේවකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට නීති සහකාර/උපදෙස් ලබා දීම (2024 වසරේ සිට)	00	02	18
කාර්යාංශයේ වෙනත් ආංශික කටයුතු සඳහා නීති සහාය ලබා දීම				
		2022	2023	2024
9	බලපත්‍ර අලුත් කිරීම සඳහා ඉදිරිපත් කළ වාර්තා ගණන	1233	1242	1272
10	සම්පූර්ණ කරන ලද රක්ෂණ ගෙවීම් ගොනු ගණන	199	277	311
11	මානව හිමිකම් කොමිෂන් සභා සහ වෙනත් සමාන සංවිධානවල අවශ්‍යවිට පෙනී සිටීම සහ අවශ්‍ය තොරතුරු සැපයීම	56	14	08

විශේෂ විමර්ශන අංශය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වලට අදාළ කාර්ය සාධනය,

කාර්යාංශය විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව පුද්ගලයින් විසින් සිදු කරනු ලබන විදේශ රැකියා සඳහා බඳවා ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් කාර්යාංශයේ විශේෂ විමර්ශන අංශය විසින් සිදු කරන ලද වැටලීම්.

වර්ෂය	සිදු කරන ලද වැටලීම් සංඛ්‍යාව	සාර්ථක වැටලීම් සංඛ්‍යාව
2022	27	27
2023	15	15
2024	24	24

විදේශ රැකියා සඳහා යම් ලේඛණයක් ව්‍යාජ ලෙස සකස් කළ හෝ වෙනස් කළ පුද්ගලයින් අත්අඩංගුවට ගත් සංඛ්‍යාව

වර්ෂය	අත් අඩංගුවට ගැනීම් සංඛ්‍යාව
2022	91
2023	132
2024	141

විශේෂ විමර්ශන අංශය විසින් පවරා ඇති නඩු ගණන

වර්ෂය	පවරා ඇති නඩු සංඛ්‍යාව
2022	91
2023	182
2024	900

විශේෂ විමර්ශන ඒකකය වෙත ලැබී ඇති සහ විසඳා ඇති පැමිණිලි සංඛ්‍යාව

වර්ෂය	ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව	විසඳා ඇති පැමිණිලි සංඛ්‍යාව
2022	1337	922
2023	3675	1348
2024	4658	1635





2024.06.07 වන දින විශේෂ විමර්ශන ඒකකය විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පළාත් කාර්යාලවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ක්‍රියාත්මක වන ගුවන්තොටුපළ ඒකකය හරහා සිදු කරනු ලබන ක්‍රියාකාරකම් වලට අදාළ කාර්ය සාධනය

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ක්‍රියාත්මක වන ගුවන්තොටුපළ ඒකකය විසින් විශේෂ විමර්ශන ඒකකය/CID/ගුවන්තොටුපළ පොලිසිය වෙත යොමු කරන ලද මගීන් සංඛ්‍යාව.

වර්ෂය	මගීන් සංඛ්‍යාව
2022	99
2023	233
2024	157

මිනිස් ජාවාරම්වලට එරෙහි ඒකකය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වලට අදාළ කාර්ය සාධනය

- රජයේ නිලධාරීන්, බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතයින් සහ මහජනතාව සඳහා වින්දිතයින් හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ තොරතුරු බෙදා හැරීම.



2024 වර්ෂය තුළ දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් 30ක් පවත්වා ඇති අතර එම වැඩසටහන් සඳහා 3478ක් පමණ පිරිසක් සහභාගී වී ඇත. 2022 සහ 2023 වසරවලට සාපේක්ෂව මෙය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන අතර ආරක්ෂිත සංක්‍රමණය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කැපවීම පෙන්නුම් කරන්නා වූ කර්තව්‍යයකි.



	2022	2023	2024
වැඩසටහන් ගණන	13	8	30
සහභාගිවුවන් සංඛ්‍යාව	1381	1488	3478



ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් වලට අමතරව, මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කිරීම සම්බන්ධයෙන් අනෙකුත් සංවිධාන විසින් පවත්වනු ලබන වැඩසටහන් සඳහා සම්පත්දායකයින් ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් සහභාගී වේ. 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එවැනි වැඩසටහන් 27 කට සහභාගී වී ඇත.

මිනිස් ජාවාරම්වලට එරෙහි ඒකකය විසින් පවත්වනු ලබන අනෙකුත් ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකම	වැඩසටහන් ගණන	සහභාගිවුවන් සංඛ්‍යාව
වින්දිතයින් හඳුනා ගැනීම සහ ආරක්ෂාව කිරීම සඳහා දූත මණ්ඩලවලට අනුයුක්ත නිලධාරීන් සහ විදේශයන්හි සිටින විගමණික ශ්‍රමිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	01	51
රැකියා සඳහා නීතිවිරෝධී සංක්‍රමණයට ගොදුරු වූවන් සහ මිනිස් ජාවාරමට ගොදුරු වූවන් හඳුනාගෙන විමර්ශන කටයුතු කිරීමේදී පොලිස් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම	ලැබුණු පැමිණිලි ගණන / CID වෙත යොමු කරන ලද 63	

ව්‍යාපාර ගැටලු නිරාකරණය

කාර්යාංශයෙහි ව්‍යාපාර ගැටලු නිරාකරණය කිරීමේ අංශය අදාළ පාර්ශව අතර පැන නගින ආරවුල් සහ ගැටුම් නිරාකරණය කිරීම සඳහා ක්‍රියා කරයි. එනම්,

- බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන දෙකක් හෝ වැඩි ගණනක් අතර,
- විදේශ නියෝජිතායතනයක් සහ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනයක් අතර හෝ
- විදේශ රැකියා නියෝජිතායතනය සහ විගමණික ශ්‍රමිකයෙකු හෝ රැකියා අපේක්ෂකයකු අතර

අනු අංක	2024 වර්ෂයට අදාල ක්‍රියාකාරකම්	ලැබුණු පැමිණිලි	විසඳූ පැමිණිලි
1	විදේශ නියෝජිතායතන වෙතින් බලපත්‍රලාභී රැකියා නියෝජිතායතනවලට එරෙහිව ලැබුණු ව්‍යාපාරික ආරවුල්	62	07
2	බලපත්‍රලාභී රැකියා නියෝජිතායතන වෙතින් විදේශ නියෝජිතායතනවලට එරෙහිව ලැබුණු ව්‍යාපාරික ආරවුල්	95	17
3	බලපත්‍රලාභී රැකියා නියෝජිතායතන අතර ඇතිවුන ආරවුල් සම්බන්ධ පැමිණිලි	0	1*
4	බලපත්‍රලාභී රැකියා නියෝජිතායතන වෙතින් රැකියා අපේක්ෂකයින්ට එරෙහිව ලැබුණු ව්‍යාපාරික ආරවුල්	5021	799
5	කාර්යාංශයේ ලියාපදිංචියකින් තොරව විදේශ ගමන් බලපත්‍ර රඳවාගෙන සිටින බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවලට එරෙහිව රැකියා අපේක්ෂකයින්ගෙන් ලැබෙන පැමිණිලි	616	327

* පෙර වසර තුළ ලැබුණු පැමිණිල්ලකි

ආරවුල් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස විසඳා ගැනීමෙන්, ශ්‍රී ලාංකික විදේශ ශ්‍රමිකයන්ගේ කීර්ති නාමය පවත්වා ගැනීමට සහ ශ්‍රී ලංකාව සහ එහි පුරවැසියන් සේවය කරන රටවල් අතර ධනාත්මක සබඳතාවයක් ප්‍රවර්ධනය කිරීමට මෙම අංශය ක්‍රියා කරයි.

.

	2022	2023	2024
සියලුම කාණ්ඩ යටතේ ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව	927	1998	5794
සියලුම කාණ්ඩ යටතේ විසඳන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව	218	512	1151

ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයින් සහ මෙරට සිටින ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීම

- පැමිණිලි නිරාකරණය / සමථකරණය
- සුභසාධන සේවා
- පැය 24 තොරතුරු සේවා
- නැවත පැමිණි විගමනික ශ්‍රමිකයින් සඳහා සහය
- සහන පියස සුභසාධන මධ්‍යස්ථානය

පැමිණිලි නිරාකරණය / සමථකරණය


ලියාපදිංචි විගමනික ශ්‍රමිකයෙකු හෝ ඔහු / ඇය වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයෙකුට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ, පළාත් කාර්යාලවල හෝ අදාල රටේ ශ්‍රී ලංකා දූත මණ්ඩල පිහිටුවා ඇති කම්කරු හා සුභසාධන අංශවල පැමිණිලි ගොනු කිරීම කළ හැක. සමථ අංශයට/පළාත් කාර්යාලවලට හෝ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු හා සුභසාධන අංශයට අනුයුක්තව සිටින කාර්යාංශයේ බලය ලත් නිළධාරීන්, අදාල බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන හා විදේශ රැකියා එජන්සි ආයතන හරහා පැමිණිලි විසඳීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම උදෙසා කාර්යාංශය විසින් පැමිණිලි කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලබයි. අදාල පාර්ශවයන්ට පැමිණිලි කළමනාකරණ පද්ධතිය ඔස්සේ සන්නිවේදනය කිරීමට හා තොරතුරු වාර්තා කිරීමට පහසුකම් සලසා ඇත.

සමථ අංශය
"එතෙර සේවයේ යෙදෙන ශ්‍රී ලාංකිකයින්ට ඔවුන් මුහුණ දෙන ගැටලු සඳහා සහන සැලසීම"

සමථ අංශය ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරලීමෙහිලා මැදිහත්කරුවෙකු සහ ආරක්ෂකයෙකු ලෙස ක්‍රියා කරමින් ඔවුන්ගේ සුබසාධනය සහතික කිරීම සහ රැකියා ආශ්‍රිත ගැටලු කාර්යක්ෂමව විසඳීම සිදු කරයි. විදේශගත ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන්ගේ රැකියා සම්බන්ධ ගැටලු විසඳීම සහ දුක්ගැනවිලි විසඳීම සඳහා මෙම අංශය ක්‍රියාත්මක වේ.

පසුගිය වසර 03 තුළ සමථකරණ අංශයේ කාර්ය සාධනය

විස්තරය	2022	2023	2024
ලැබුණු පැමිණිලි	3236	6637	6392
විසඳූ පැමිණිලි	3167	5630	6635
විගමණික ශ්‍රමිකයින් සඳහා සමථකරණ ක්‍රියාවලිය හරහා ලබා දුන් මූල්‍යමය ප්‍රතිලාභ	Rs.17,992,054/-	Rs.27,647,653/-	Rs.10,235,140/-





පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා සමථ අංශය විසින් අදාළ පාර්ශව සමඟ විශේෂ සමථ දින වැඩසටහන් පවත්වනු ලබයි.

ඉහත වැඩසටහන් මගින් අගතියට පත් පාර්ශවයන් සහ විදේශ රැකියා නියෝජිතායතන හෝ සේවා යෝජකයින් අතර ගැටලු සහ ආරවුල් සුහදශීලිව විසඳා ගැනීම සඳහා මැදිහත් වීමට පහසුකම් සපයයි. අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි විසඳුම් කරා ළඟා වීම සඳහා සාකච්ඡා කිරීම සඳහා පහසුකම් සැලසීම මෙහිදී සිදු කරයි.



2024 වර්ෂය තුළ, මුළු වැඩසටහන් 08 ක් පවත්වන ලදී. ඒවා ප්‍රධාන කාර්යාලයේ වැඩසටහන් 02 ක්, ශාඛා කාර්යාලවල 04 ක් (උතුරු මැද, වයඹ, මධ්‍යම සහ දකුණු පළාත් කාර්යාල) සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල 02 ක් ලෙසිනි.



සමථ අංශයට අමතරව, විදේශ දූත මණ්ඩල පරිපාලන සහ විදේශ සම්බන්ධතා අංශය, විදේශ සම්බන්ධතා II අංශය සහ ශ්‍රී ලංකා දූත මණ්ඩවල පිහිටුවා ඇති රැකියා සහ සුභසාධන අංශ පැමිණිලි විසඳීමේ කාර්යයයේ නිරත වේ.

විදේශ සම්බන්ධතා II අංශය, ස්වයං-ලියාපදිංචි මඟින් විදේශ ගත වූ විගමණික ශ්‍රමිකයින් සහ මුලින් ලියාපදිංචි කර නිබුණද පැමිණිලි යොමු කරන අවස්ථාවේදී විදේශ රැකියා නියෝජිතායතනවල වගකීම යටතේ නොමැති ශ්‍රමිකයින් පිළිබඳ පැමිණිලි විසඳීම සිදු කරයි.

පසුගිය වසර 03 තුළ විදේශ සම්බන්ධතා II අංශයේ කාර්ය සාධනය			
විස්තරය	**2022**	**2023**	**2024**
ලැබුණු පැමිණිලි සංඛ්‍යාව	1140	843	889
විසඳූ පැමිණිලි සංඛ්‍යාව	1112	679	881

විදේශ දූත මණ්ඩල පරිපාලන හා විදේශ සම්බන්ධතා අංශය සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩවල පිහිටි රැකියා හා සුභසාධන අංශ මඟින්, විශේෂයෙන් බන්ධනාගාර හා රෝහල් සම්බන්ධ පැමිණිලි විසඳන අතර, අවතැන් වූ විගමණික ශ්‍රමිකයින් ගෙන්වා ගැනීමට සහ මියගිය විගමණික ශ්‍රමිකයින්ගේ දේහය නැවත මෙරටට ගෙන්වා ගැනීමට සහාය වේ.

පසුගිය වසර 03 තුළ විදේශ දූත මණ්ඩල පරිපාලන සහ විදේශ සම්බන්ධතා අංශයේ සහ කම්කරු සහ සුභසාධන අංශවල කාර්ය සාධනය			
විස්තරය	**2022**	**2023**	**2024**
ලැබුණු පැමිණිලි සංඛ්‍යාව	195	5901	3874
විසඳූ පැමිණිලි සංඛ්‍යාව	120	3477	2634

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් රියාද්, ජෙඩා, ඩුබායි, ඕමාන්, කටාර් සහ කුවේට්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල යටතේ සුරක්ෂා නිවාස පවත්වාගෙන යනු ලැබේ. කාන්තා විගමණික ශ්‍රමිකයින් ඔවුන්ගේ ගැටලු විසඳා / නැවත මෙරටට ගෙන්වා ගන්නා තෙක් සුරක්ෂා නිවාවල තාවකාලික නවාතැන් පහසුකම් සපයයි. ආහාර, වෛද්‍ය පහසුකම්, ගුවන් ටිකට්පත් ගාස්තු, ප්‍රවාහන පහසුකම්, නීති ආධාර සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය / ආධාර සුරක්ෂා නිවාස රැඳවියන් සඳහා කම්කරු සුභසාධන අරමුදල යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සපයනු ලැබේ.

සුභසාධන සේවා

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන අරමුණුවලින් එකක් වන්නේ විගමණික ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය උදෙසා කටයුතු කිරීමයි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සුභසාධන අංශය, ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසිද්ධිය සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා කැපවී සිටින අතර, ඔවුන්ගේ අවශ්‍යතා සහ අභියෝගවලට මුහුණ දීම සඳහා පුළුල් සහයෝගයක් ලබා දෙයි.

වසර ගණනාවක් මුළුල්ලේ සුභසාධන අංශය විගමණික ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුභසාධනය සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදු කර ගෙන යනු ලබයි. ඒවා නම්:

1. විගමණික ශ්‍රමිකයින්ට රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමට සහාය වීම.
2. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම
3. පාසල් උපකරණ බෙදා දීම
4. විගමණික ශ්‍රමිකයින්ගේ අවශ්‍යතා ඇති දරුවන් සඳහා විශේෂ ආධාර ලබා දීම
5. විගමණික ශ්‍රමිකයින් / ළඟම ඥාතීන් සඳහා බස් ගාස්තු / ආහාර ලබා දීම
6. කම්කරු සුභසාධන අරමුදල යටතේ විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා විශේෂ ආධාර ලබා දීම
7. ආපදා තත්ත්වයකදී විගමණික ශ්‍රමිකයින්ගේ පවුල් සඳහා සහාය වීම
8. විදේශයන්හි සේවය කරන අතරතුර හදිසි අනතුරු හේතුවෙන් ආබාධිත වූ (ආබාධිත 65% හෝ ඊට වැඩි) ලියාපදිංචි විගමණික ශ්‍රමිකයින්ට නිවාස ඉදිකිරීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දීම.
9. අවශ්‍යතා ඇති විගමණික ශ්‍රමිකයින් සඳහා වෛද්‍ය පහසුකම් ලබා දීමෙන් මූල්‍ය හා මූල්‍ය නොවන සහාය ලබා දීම.
10. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිළිබඳව විගමණික ශ්‍රමිකයින් දැනුවත් කිරීම.
11. වෛද්‍ය කඳවුරු පැවැත්වීම.
12. බැංකුවලට නිර්දේශ ලිපි නිකුත් කිරීම.
13. විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන්ගේ කුසලතා නහා සිටුවීම සඳහා වැඩසටහන් පැවැත්වීම.

2024 වර්ෂයේදී, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා පවත්වනු ලබන සුභසාධන කටයුතු තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

1. ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සහයෝගයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා විගමණික ශ්‍රමිකයින් සඳහා අඩු පොලී අනුපාත යටතේ බහුකාර්ය ණය ලබා දීම.
2. කාර්යාංශයේ වැඩි වාර ගණනක් ලියාපදිංචිය ලබා ගන්නා ලද විගමණික ශ්‍රමිකයින් සඳහා ත්‍යාග යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. මේ යටතේ විදේශ විනිමය වැඩි කිරීම සඳහා දක්වන ලද දායකත්වයට උපහාරයක් ලෙස, කාර්යාංශයේ 6 වතාවකට වඩා වාර ගණනක් ලියාපදිංචි වී ඇති සේවකයින්ට පහත පරිදි සතොස වවුචර් පත් ප්‍රදානය කරන ලදී.
   - රු. 7,500/- 6 වතාවක්
   - රු. 12,500/- 7 වතාවක්
   - රු. 20,000/- 8 හා 9 වතාවක්
   - රු. 25,000/- 10 හෝ ඊට වැඩි වතාවක්
3. විදේශ රැකියා සඳහා පළමු වරට පිටත්ව යන කාන්තා ගෘහ සේවිකාවන් සඳහා වියළි සලාකයක් ප්‍රදානය කිරීම (රු. 10,000/- ක සතොස වවුචරයක් ලෙස).
4. විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන ග්‍රාමීය ප්‍රදේශවල පාසල්වල පහසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ආයතනික සමාජ වගකීම් (CSR) වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2024 වර්ෂය තුළ සුභසාධන අංශයේ ප්‍රධාන කාර්ය සාධන

1. රක්ෂණ ප්‍රතිලාභ ලබා දීම

ක්‍රියාකාරකම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	පිරිවැය (රු.මී.)
රක්ෂණ ප්‍රතිලාභ ලබාදීම ලියාපදිංචි වූ දින සිට වසර දෙකක කාලය තුළ මිය ගිය හෝ රෝගාබාධ, පුද්ගලික අනතුරු, හිරිහැරවලට ලක් වූ ලියාපදිංචි විගමණික ශ්‍රමිකයින්ට රක්ෂණ ප්‍රතිලාභ හිමි වේ.	**949**	**184.33**
• විගමණික ශ්‍රමිකයින් වෙනුවෙන් රක්ෂණ චාරික ගෙවීම (දේශීය රක්ෂණය)	**213,735**	**368.95**
•ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් සඳහා සේවා යෝජකයා විසින් ගෙවන ලද ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ගෙවා ඇති හිමිකම් ගණන (විදේශීය රක්ෂණය)	**103**	**4.85**

2. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම



2024 වර්ෂයේදී, පහත කඩඉම් විභාගවලින් සමත් වූ විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් 2688 දෙනෙකුට ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.

- 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත්
- සාමාන්‍ය පෙළ විභාගය සමත්
- උසස් පෙළ විභාගය සමත් වී රජයේ විශ්ව විද්‍යාලයක හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පෞද්ගලික විශ්ව විද්‍යාලයක පූර්ණ කාලීන අභ්‍යන්තර උපාධි පාඨමාලාවකට ඇතුළත් වී හෝ ජාතික තාක්ෂණ ආයතනයක හෝ වෙනත් අධ්‍යාපන ආයතනයක වසර 02 ක් හෝ ඊට වැඩි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරන

සේවක සුභසාධන අරමුදල යටතේ එම කාර්යය සඳහා රුපියල් මිලියන 81.12 ක මුදලක් වැය කර ඇත.

3. පාසල් උපකරණ බෙදා දීම



2022 සහ 2023 වර්ෂවලදී, විදේශයන්හි සේවයේ නිරත වන විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් 789 දෙනෙකුට සහ 956 දෙනෙකුට පාසල් උපකරණ බෙදා දෙන ලදී. කෙසේ වෙතත්, 2024 වර්ෂයේදී, සුභසාධන අංශය විසින් විදේශයන්හි සේවයේ නිරත වන විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් 12,781 ක් සඳහා රුපියල් මිලියන 121.83 ක මුල්‍ය වටිනාකමක් සහිත පාසල් උපකරණ බෙදා දෙන ලදී.



4. වෛද්‍ය කඳවුරු පැවැත්වීම

විගමණික ශ්‍රමිකයින්ගේ හෝ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සෞඛ්‍යය නංවාලීමේ අරමුණින් වෛද්‍ය කඳවුරු පවත්වනු ලැබේ. 2024 වර්ෂයේදී මධ්‍යම පළාත, බස්නාහිර පළාත, ඌව පළාත, වවුනියාව, තඹුත්තේගම, තංගල්ල, පොතුවිල්, හලාවත සහ ගොඩකවෙල යන ප්‍රදේශවල එවැනි වෛද්‍ය කඳවුරු නවයක් පවත්වන ලදී.



5. අවම වශයෙන් විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් 10 දෙනෙකු අධ්‍යාපනය ලබන ග්‍රාමීය ප්‍රදේශවල පාසල් 10 ක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ආයතනික සමාජ වගකීම් (CSR) වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම





ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 45 වන වගන්ති ප්‍රකාරව, විගමණික ශ්‍රමිකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට ප්‍රතිලාභ ලබා දීම සඳහා සේවක සුභසාධන අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදල ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පිහිටුවා ඇති රැකියා සහ සුභසාධන අංශ හරහා සුභසාධන සේවා / පහසුකම් සැපයීම සඳහා යොදා ගැනේ.

සුභසාධන අංශයට අදාල කාර්ය සාධනය 2022 - 2024							
#	ක්‍රියාකාරකම	2022		2023		2024	
		ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව	වියදම (රු.මි.)	ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව	වියදම (රු.මි.)	ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව	වියදම (රු.මි.)
1.	විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම	2,755	3.3	2,064	57.3	2,688	81.12
2.	විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් සඳහා පාසල් උපකරණ සඳහා ආධාර සැපයීම	789	7.4	956	12	12,781	121.83
3.	සේවක සුභසාධන අරමුදල යටතේ විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට විශේෂ ආධාර ලබා දීම	66	14.025	142	31.27	95	19.86
4.	විගමණික ශ්‍රමිකයින් වෙනුවෙන් රක්ෂණ වාරික ගෙවීම	314,057	444.49	194,247	430.2	213,735	368.95
5.	රක්ෂණ ප්‍රතිලාභ හිමි ප්‍රතිලාභීන්ට රක්ෂණ හිමිකම් ලබා ගැනීමට සහාය වීම	551	111.685	782	129.355	949	184.33
6.	වෛද්‍ය ප්‍රතිකාර, නිර්දේශිත ඖෂධ, ආහාර සහ අනෙකුත් ද්‍රව්‍ය සඳහා ගෙවීමට විගමණික ශ්‍රමිකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට සහායවීම	15	0.221	22	1.19	53	5.528
7.	ආබාධිත විගමණික ශ්‍රමිකයින් සඳහා නිවාස ඉදිකිරීම සඳහා මූල්‍ය සහ තාක්ෂණික සහාය ලබා දීම	06	2.1	1	0.35	0	0
8.	විගමණික ශ්‍රමිකයින්ගේ අවශ්‍යතා ඇති දරුවන් සඳහා විශේෂ ආධාර ලබා දීම	11	0.633	3	0.675	28	2.29
9.	වෛද්‍ය කඳවුරු පැවැත්වීම	2	0.629	4	3.11	9	2.72
10.	විගමණික ශ්‍රමිකයින් හෝ ඔවුන්ගේ පවුලේ අය සඳහා බස් ගාස්තු / ආහාර ලබාදීම	182	0.66	282	2.23	4,407	2.85
11.	ආපදා තත්ත්වයකදී විගමණික ශ්‍රමිකයින්ගේ පවුල්වලට සහය වීම	5	0.75	01	0.015	5	0.536
12.	බැංකු වෙත නිර්දේශ ලිපි නිකුත් කිරීම	-	-	1,878	-	1,684	-
13.	විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන්ගේ කුසලතා ඔප්නැංවීම සඳහා වැඩසටහන් පැවැත්වීම	-	-	3	0.564	1	0.25
14.	මැද පෙරදිග කලාපයේ සේවයේ නියුක්ත ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් සඳහා සේවායෝජක විසින් ගෙවනු ලබන රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම (ගෙවූ හිමිකම් ගණන)	-	-	17	7.038	103	4.85
15.	විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය සාර්ථකව පවත්වා ගෙන යන ලද විගමණික ශ්‍රමිකයින් සංඛ්‍යාව	-	-	62	0	90	0
16.	ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ඒකාබද්ධව බලපත්‍රලාභී වාණිජ බැංකු විගමණික ශ්‍රමිකයින් සඳහා අඩු පොලී අනුපාත යටතේ ණයකාර්ය ණය ලබා දීම (ප්‍රතිලාභීන් සංඛ්‍යාව)	-	-	-	-	127	238.02
17.	කාර්යාංශයේ වැඩි වාර ගණනක් ලියාපදිංචිය ලද විගමණික ශ්‍රමිකයින් සඳහා ත්‍යාග යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.	-	-	-	-	982	8.52
18.	ගෘහස්ථ රැකියා සඳහා පළමු වරට පිටත්ව යන කාන්තා විගමණික ශ්‍රමිකයින් සඳහා වියළි සලාක ප්‍රදානය කිරීම.	-	-	-	-	2,951	29.51
19.	අවම වශයෙන් විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් 10 දෙනෙකු අධ්‍යාපනය ලබන ග්‍රාමීය ප්‍රදේශවල පාසල් 10 ක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ආයතනික සමාජ වගකීම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. (ප්‍රතිලාභ ලද පාසල් ගණන)	-	-	-	-	319	187.95

24 පැය තොරතුරු සේවාව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පැය 24 පුරා ක්‍රියාත්මක වන තොරතුරු මධ්‍යස්ථානය මගින් ඕනෑම පුද්ගලයෙකුට විදේශ රැකියා පිළිබඳව තොරතුරු සැපයීමට සහ විගමණික ශ්‍රමිකයින් හෝ ඔවුන් වෙනුවෙන් පැමිණිලි භාරගැනීම සිදු කරයි. ඕනෑම පුද්ගලයෙකුට ක්ෂණික ඇමතුම් අංකයක් (1989) සහ විශේෂිත දුරකථන මාර්ග (011-2879900), විද්‍යුත් තැපෑල (infor_center@slbfe.lk), ස්කයිප් (24 hours call center - SLBFE) සහ Whatsapp / Viber / Imo (+94719802822) ඔස්සේ තොරතුරු මධ්‍යස්ථානය සම්බන්ධ කර ගත හැක.

2024 වසර සඳහා ලැබුණු ඇමතුම් ගණන
282699

නැවත පැමිණි විගමනික ශ්‍රමිකයින් සඳහා සහය

ආපසු පැමිණි විගමණික ශ්‍රමිකයින් නැවත සමාජගත කිරීම සහ සුබසාධනය සඳහා සහාය වීම වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ආධාර සහ ක්‍රියාකාරකම් රාශියක් සපයයි. එමගින්, මෙරටට ආපසු පැමිණි විගමණික ශ්‍රමිකයින් මෙරට සමාජයට නැවත ඒකාබද්ධ කිරීමට සහය ලබා දෙන අතර රටේ ආර්ථිකයට සහ සංවර්ධනයට ඔවුනට ධනාත්මක ලෙස දායක වීම සහතික කරයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රත්‍යානුකලන අංශය අනෙකුත් අදාළ ආයතන ඇතුළු දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධීකරණය සමඟින් බොහෝ ක්‍රියාකාරකම් සිදු කරයි. ආපසු පැමිණි විගමණික ශ්‍රමිකයින් ශ්‍රී ලාංකීය සමාජයට සහ ශ්‍රම බලකායට නැවත අනුගත වීම සඳහා සහාය වීමට මෙම අංශය කැපවී සිටී. විදේශයන්හි සිටින විගමණික ශ්‍රමිකයින් විසින් ලබා ගන්නා ලද අත්දැකීම් සහ නිපුණතා ඔවුන් ආපසු පැමිණීමෙන් පසු ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව එමඟින් සහතික කරයි.

ප්‍රත්‍යානුකලන අංශය බොහෝ විට අනෙකුත් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගීව එක්ව පහත සඳහන් වැඩසටහන් සහ මුල පිරීම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරයි.

- තිරසාර ආදායම් උත්පාදන අවස්ථා සංවර්ධනය කිරීම
- ප්‍රජා සංවර්ධනයට දායක වීම සඳහා ආපසු පැමිණි විගමණික ශ්‍රමිකයින්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම
- විගමණික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය සඳහා සහාය වන ප්‍රතිපත්ති සහ ක්‍රියාපිලිවෙත් ප්‍රවර්ධනය කිරීම.

මෙම විස්තීර්ණ සේවාවන් සහ ආධාරක යාන්ත්‍රණයන් ලබා දීමෙන්, ආපසු පැමිණි විගමණික ශ්‍රමිකයින්ට සාර්ථකව ශ්‍රී ලාංකීය සමාජයට නැවත සම්බන්ධ වීමට සහ ඔවුන්ගේ ප්‍රජාවන්ට සහ ජාතික ආර්ථිකයට අර්ථවත් දායකත්වයක් ලබා දීම උදෙසා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රත්‍යානුකලන අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

2024 වර්ෂය තුළ ප්‍රත්‍යානුකූලන අංශයේ ප්‍රධාන කාර්ය සාධන

- එතෙර රැකියාවක නිරතව ආපසු පැමිණ වසර 05ක් නොඉක්මවූ කාර්යාංශයේ ලියාපදිංචිය සහිත විගමණික ශ්‍රමිකයින්ට ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට හෝ පවතින ස්වයං රැකියාවක් වැඩිදියුණු කිරීමට රු. 100,000/= ක උපරිමයකට යටත්ව ද්‍රව්‍යමය සහාය ලබා දීම (අදියර දෙකකින් පිරිනමනු ලැබේ).

2024 වර්ෂය තුළ ස්වයං රැකියා සඳහා ලබා දුන් ද්‍රව්‍යමය ආධාර පිළිබඳ විස්තර	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මුදල රු. මිලියන
	529	**25.16**





- විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය සහිතව විදේශ රැකියාවක නිරතව ආපසු පැමිණ වසර 05ක් නොඉක්මවූ, විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන්ට අධ්‍යාපනික සහනයක් ලෙස එක් දරුවෙකුට රු. 10,000/= ක උපරිමයකට යටත්ව පාසල් උපකරණ බෙදා දීම.

නැවත පැමිණි විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් සඳහා පාසල් උපකරණ බෙදා දීම					
2022		**2023**		**2024**	
ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මුදල රු. මිලියන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මුදල රු. මිලියන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මුදල රු. මිලියන
815	39.42	460	44.31	1185	11.33





- නැවත පැමිණෙන විගමණික ශ්‍රමිකයින්ගේ සාර්ථකත්වයන් හඳුනා ගෙන ඒවා ප්‍රකාශයට පත් කිරීම සහ ව්‍යවසායකයින් අගය කිරීම

2024 වර්ෂයේදී, ආපසු පැමිණි විගමණික ශ්‍රමිකයින්ගේ සාර්ථකත්වයන් කාර්යාංශයේ සමාජ මාධ්‍ය ඔස්සේ සහ වැඩසටහන්වලදී ප්‍රදර්ශනය කරන ලදී. ආපසු පැමිණි ශ්‍රමිකයින්ගේ සාර්ථකත්වයන් තුළින් ඔවුන්ගේ ජයග්‍රහණ විදහා දැක්වීමට පමණක් නොව, වත්මන් සහ අනාගත විගමණික ශ්‍රමිකයින් යන දෙපිරිසටම ආදර්ශයක් සහ දිරිගැන්වීමක් ලබා දීමට ද දායක වන ලදී. මෙමඟින් තමන්ගේම ව්‍යාපාරයක් ගොඩනගා ගැනීම සඳහා තම කුසලතා සහ ඉතිරිකිරීම් භාවිතා කිරීමට ක්‍රම සොයා ගත් එම විගමණික ප්‍රජාව හරහා විදේශ රැකියා සිඟින වලින් සාර්ථකත්වය අත්කර ගැනීමට ඇති හැකියාව පිළිබඳ හැඟීමක් සහ දිරිගැන්වීමක් ඇති කිරීමට මෙන්ම ආරක්ෂිත සහ නීත්‍යානුකූල සංක්‍රමණයේ වැදගත්කම අවධාරණය කිරීම කාර්යාංශයෙහි අරමුණ විය.

තම සාර්ථකත්වයේ කතාව බෙදා ගැනීමට සහභාගී වූ සෑම පුද්ගලයෙකුටම ඔවුන්ගේ ජයග්‍රහණය අගය කිරීමක් ලෙස පමණක් නොව, ඔවුන්ගේ ස්වයං රැකියාව තවදුරටත් දියුණු කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රදානයක් ද පිරිනමන ලදී.

2024 වසර තුළ ව්‍යවසායකයින් අගය කිරීම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මුදල රු. මිලියන
	145	7.25

- නැවත පැමිණෙන විගමණික ශ්‍රමිකයින්ගේ ස්වයං රැකියා නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ පොළවල් පැවැත්වීම.

2024 වර්ෂය තුළ නැවත පැමිණි විගමණික ශ්‍රමිකයින්ගේ ස්වයං රැකියා නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ පොළවල් පැවැත්වීම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මුදල රු. මිලියන
	21	2.66

- තාක්ෂණික සහ ආයතනික සහාය ලබා දෙමින් ව්‍යවසායකයින් වීමට කැමති ආපසු පැමිණි විගමණික ශ්‍රමිකයින්ට සහාය වීම සඳහා ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම. 2024 වර්ෂයේදී සබරගමුව පළාත, වයඹ පළාත, බස්නාහිර පළාත, උතුරු පළාත සහ උතුරු මැද පළාත ආවරණය වන පරිදි මෙම වැඩසටහන පවත්වන ලදී.

ජංගම සේවා	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**	**මුදල රු. මිලියන**
	05	**0.869**

- ප්‍රත්‍යානුකරණ අංශයේ සේවාවන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා 2024 ඔක්තෝබර් මාසයේ සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ව්‍යවසායක සහාය කවුළුවක් ස්ථාපිත කරන ලදී.

අනු අංකය	මාසය	සහභාගී වූ සංඛ්‍යාව
01	ඔක්තොම්බර්	91
02	නොවැම්බර්	181
03	දෙසැම්බර්	232
	එකතුව	**504**

සහන පියස සුභසාධන මධ්‍යස්ථානය

"සහන පියස" සුභසාධන මධ්‍යස්ථානය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළට ආසන්නයේ පිහිටුවා ඇති අතර, එය අවශ්‍යතා ඇති නැවත පැමිණෙන ශ්‍රමිකයන්ට සුභසාධන පහසුකම් සම්බන්ධීකරණය කිරීම සහ සුභසාධන සේවා සැපයීම සඳහා ක්‍රියාත්මක වේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ඇතුල්වීමේ පර්යන්තයේ ඇති කාර්යාංශ සේවා කවුළුව සහන පියස මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකාවට නැවත පැමිණෙන විශේෂ සහායන් අවශ්‍ය වන ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින්ට සේවාවන් සැපයීම ද සිදු කරයි.

2024 වර්ෂයේදී සහන පියස මධ්‍යස්ථානය යටතේ දරන ලද වියදම්

අනු අංකය	විස්තරය	වියදම් (රු.)
1.	විගමණික ශ්‍රමිකයින් සඳහා ආහාර සැපයීම සඳහා වන වියදම්	345,242.74
2.	වෛද්‍ය වියදම් (ගිලන් රථ ගාස්තු, වෛද්‍ය වියදම්)	238,495.00
3.	මගී සුභසාධන අනෙකුත් වියදම් (රෙදි, සනීපාරක්ෂක ද්‍රව්‍ය ආදිය)	69,148.90
4.	විගමණික ශ්‍රමිකයින් සඳහා ගමන් වියදම්	5,449,600.00
5.	මියගිය විගමණික ශ්‍රමිකයින් වෙනුවෙන් ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සඳහා අවමංගල්‍ය වියදම්	3,400,000.00
	මුළු මුදල	**9,502,486.64**

2024 වර්ෂයේදී සහන පියස මධ්‍යස්ථානය හරහා සලසන ලද සුබසාධන සේවා

අනු අංකය	ලබාදෙන ලද සුභසාධන සේවාවන්	ඒකකය	එකතුව
1	ගමන් වියදම් ගෙවීම	පුද්ගලයන් සංඛ්‍යාව	2202
2	අවමංගල්‍ය වියදම් ගෙවීම	පුද්ගලයන් සංඛ්‍යාව	85
3	නවාතැන් පහසුකම් සැපයීම	පුද්ගලයන් සංඛ්‍යාව	160
4	රෝහල් ගත කිරීම	පුද්ගලයන් සංඛ්‍යාව	29
5	ගර්භනී සහ ළදරුවන් සමඟ නැවත පැමිණෙන කාන්තාවන් සඳහා ආධාර සැපයීම	පුද්ගලයන් සංඛ්‍යාව	13
6	මානසික ව්‍යාකූලතා සහිත පුද්ගලයින්ට සහාය වීම	පුද්ගලයන් සංඛ්‍යාව	32
7	රෝගී / ආබාධිත පුද්ගලයින්ට සහාය වීම	පුද්ගලයන් සංඛ්‍යාව	1264
8	ලිංගික හිංසනයට ලක් වූ පුද්ගලයින්ට සහාය වීම	පුද්ගලයන් සංඛ්‍යාව	22
9	රක්ෂණ හිමිකම් ඉදිරිපත් කිරීමට සහාය වීම	පුද්ගලයන් සංඛ්‍යාව	38
10	නිරිහැරයට ලක්වීම හේතුවෙන් නැවත පැමිණි පුද්ගලයින්ට සහාය වීම	පුද්ගලයන් සංඛ්‍යාව	895
11	නිරිහැරයන්ට ලක්වූ හා වැටුප් නොගෙවීම හේතුවෙන් ආපසු පැමිණි පුද්ගලයින්ට සහාය වීම	පුද්ගලයන් සංඛ්‍යාව	505
12	වැටුප් නොගෙවීම නිසා ආපසු පැමිණි පුද්ගලයින්ට සහාය වීම	පුද්ගලයන් සංඛ්‍යාව	246
13	ආගමන වැනි වෙනත් ගැටලු හේතුවෙන් ආපසු පැමිණි පුද්ගලයින්ට සහාය වීම.	පුද්ගලයන් සංඛ්‍යාව	854
14	ලියාපදිංචිවීමට මගීන්ට සහාය වීම	පුද්ගලයන් සංඛ්‍යාව	100
15	නීතිය උල්ලංඝනය කිරීම හේතුවෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින්ට සහාය වීම සහ සුභසාධන පහසුකම් සැපයීම	පුද්ගලයන් සංඛ්‍යාව	157

ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා පුළුල් කිරීම් හා ඒවා ප්‍රවර්ධනය කිරීම

- පුහුණු කිරීම
- බඳවාගැනීම
- රැකියා ප්‍රවර්ධනය සහ ප්‍රචාරනය

පුහුණු කිරීම

කාර්යාංශය විගමණික ශ්‍රමිකයින්ට ඔවුන්ගේ ආරක්ෂාව, යහපැවැත්ම සහ වෘත්තීය නිපුණතාවය සහතික කිරීම සඳහා මනා පුහුණුවක් ලබා දෙයි. කාර්යාංශයේ පුහුණු අංශ; *පුහුණු (ගෘහස්ථ) සහ පුහුණු (කාර්මික සහ ආයතනික)* යන අංශ ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් ආරක්ෂාව සහ විදේශයන්හි සාර්ථකත්වයක් අත්කර ගැනීමේ හැකියාවක් ලබන අයුරින් ඔවුන්ව හොඳින් සූදානම්කර ඇති බව සහතික කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. පරිපූර්ණ පූර්ව පිටත්වීම් සහ වෘත්තීය පුහුණුව ලබා දීමෙන්, කාර්යාංශය විසින් ශ්‍රමිකයින් සූරාකෑමෙන් ආරක්ෂා කිරීම සහ විදේශීය පරිසරයන් තුළ දියුණු වීමට අවශ්‍ය දැනුම සහ කුසලතා වලින් ඔවුන්ව සවිබල ගැන්වීම අරමුණු කරයි. මෙම පුහුණු කිරීම් මගින් වඩා හොඳ වැටුප් සහිත රැකියා සුරක්ෂිත කිරීමට වැඩි ඉඩක් ඇති බැවින් එය ශ්‍රී ලංකා ආර්ථිකයට ප්‍රේෂණ වැඩි වීමටද හේතුවේ. භාෂා සහ සංස්කෘතික පුහුණුව සේවකයින්ට ඔවුන්ගේ සත්කාරක රටවලට වඩාත් පහසු ලෙස ඒකාබද්ධ වීමට උපකාර කරයි, හුදකලා වීමේ අවදානම සහ සංස්කෘතික වරදවා වටහාගැනීම් අඩු කරයි.

පුහුණු අංශය (ගෘහස්ථ) විසින් සිදු කරනු ලබන පුහුණු පාඨමාලා:

- ගෘහස්ථ ගෘහ පාලන සහකාර ලෙස මැදපෙරදිග රටවලට පිටත්ව යන කාන්තා ශ්‍රමිකයින් සඳහා දින 28 ක පුහුණු වැඩසටහන (නේවාසික පුහුණු සහිත NVQ - III ප්‍රමිති මට්ටමට සුදුසුකම් ලබයි).
- ගෘහස්ථ ගෘහ පාලන සහකාර ලෙස යුරෝපයට සහ නැගෙනහිර ආසියානික රටවලට පිටත්ව යන කාන්තා ශ්‍රමිකයින් සඳහා දින 28 ක නිශ්චිත පුහුණු වැඩසටහන (නේවාසික පුහුණු සහිත NVQ - III ප්‍රමිති මට්ටමට සුදුසුකම් ලබයි).
- සාත්තු සේවය සඳහා විදේශ ගතවීමට අපේක්ෂා කරන රැකියා අපේක්ෂකයින් සඳහා දින 45 ක පුහුණු වැඩසටහන. (NVQ - III ප්‍රමිති මට්ටමට සුදුසුකම් ලබයි).
- සේවා පළපුරුද්ද යල් පැන ගිය සහ පෙර අත්දැකීම් සඳහා ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ නොහැකි නැවත පිටත්වීමට අපේක්ෂා කරන කාන්තාවන් සඳහා දින 7 ක පුහුණු පාඨමාලාව.
- ඉදිරියේදී සාත්තු සේවක ලෙස ඊශ්‍රායලයට යාමට අපේක්ෂා කරන තෝරාගත් රැකියා අපේක්ෂකයින් සඳහා දින 7ක පුහුණුව.
- සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම.
- විදේශ රැකියා අපේක්ෂකයින් සඳහා විදේශ රැකියා ඉලක්ක කරගත් ඉංග්‍රීසි භාෂා පුහුණුව.
- TVEC සමඟ එක්ව ගෘහස්ථ ගෘහ පාලන සහ සාත්තු සේවා පුහුණු වැඩසටහන සාර්ථකව නිම කළ විගමණික ශ්‍රමිකයින්ට NVQ - III මට්ටමේ සහතික ප්‍රදානය කිරීම.

පුහුණු ක්‍රියාකාරකම්වල කාර්ය සාධන සාරාංශය	2024		2023	
	පුහුණුලාභීන් සංඛ්‍යාව	පන්ති ගණන	පුහුණුලාභීන් සංඛ්‍යාව	පන්ති ගණන
ගෘහස්ත ගෘහ පාලන සහකාර - මැද පෙරදිග අංශය (දින 28)	4,569	196	7,373	307
ගෘහස්ත ගෘහ පාලන සහකාර - යුරෝපය සහ නැගෙනහිර ආසියාව (දින 28)	1,032	47	1,030	43
NVQ III මට්ටම තක්සේරුව සහිත සාත්තු සේවක (දින 45)	5,240	154	2,609	74
විදේශ පලපුරුදු ඇතත් පුහුණු සහතික නොමැති පිරිස සඳහා(IFE)* පුහුණු වැඩසටහන (දින 7)	1,344	58	693	46
ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන	2,627	71	902	27
රිශ්‍රායලයට යාමට නියමිත නිවෙස් පාදක සාත්තු සේවකයින් සඳහා පෙර විගමණික පුහුණු වැඩසටහන	1,544	52	667	33

ගෝලීය වශයෙන් සාත්තු සේවක අංශයේ රැකියා සඳහා වැඩි අවස්ථා ඇති වීමත් සමඟ මෙම වසරේදී 2023 වසරට සාපේක්ෂව, සාත්තු සේවක පුහුණු වැඩසටහනේ පුහුණුව සඳහා ඇති ඉල්ලුමේ වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

තවද, කාර්යාංශය විසින් ක්‍රියාත්මක පුහුණු මධ්‍යස්ථානවලට අමතරව, පුහුණු වැඩසටහන් ගණන වැඩි කිරීම සහ පුහුණු වැඩසටහන් සඳහා ලියාපදිංචි වීමට රැඳී සිටීමේ කාලය අඩු කිරීමේ අරමුණින්, කාර්යාංශයේ නිරන්තර අධීක්ෂණය යටතේ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා කාර්යාංශය විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පිළිගත් පුහුණු ආයතන ලියාපදිංචි කර ගැනීම සිදු කරන ලදී. 2024 වර්ෂයේදී, එවැනි ආයතන 20 ක අභ්‍යාසලාභීන් 1324 දෙනෙකු ගෘහස්ථ ගෘහ පාලන පුහුණුව සම්පූර්ණ කරන ලදී.

කාර්යාංශ පුහුණු මධ්‍යස්ථානවල ඇති පුහුණු පාඨමාලා

මධ්‍යස්ථානය	මැද පෙරදිග (දින 28)	නැගෙනහිර ආසියාව (දින 28)	සාත්තු සේවක (දින 45)	IFE* (දින 7)	සාක්ෂරතා (දින 18)	ඉංග්‍රීසි (දින 14)	රිශ්‍රායලයට නිවෙස් පාදක සාත්තු සේවක සඳහා පෙර විගමණික පුහුණු වැඩසටහන (දින 7)
දඹුල්ල	√						
කුරුණෑගල		√		√		√	
නුවර	√			√			
මතුගම	√	√					
පන්නිපිටිය	√		√	√		√	
රත්නපුර	√		√		√	√	√
නංගල්ල	√	√	√			√	
බදුල්ල	√		√			√	







පුහුණු (කාර්මික හා ආයතනික) අංශය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් :

- පිරිමි/කාන්තා රැකියා අපේක්ෂකයින් සඳහා පෙර විගමණික පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- කොරියානු රැකියා අපේක්ෂකයින් සඳහා පෙර විගමණික පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- දිවයින පුරා කාර්යාංශයේ ලියාපදිංචි වෙල්ඩින් පුහුණු ආයතනවලින් FCAW සහතික නිකුත් කිරීම පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම.
- දිවයින පුරා පිහිටි කාර්යාංශයේ ලියාපදිංචි ජපන් භාෂා පුහුණු ආයතන පරීක්ෂා කිරීම සහ අයීක්ෂණය කිරීම.
- ජපන් රැකියා අපේක්ෂකයින් සඳහා ජපන් භාෂා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ජපානයේ රැකියා අපේක්ෂකයින් සඳහා පෙර විගමණික පුහුණු වැඩසටහන් (TITP) පැවැත්වීම.
- රීශ්‍රායල කෘෂිකර්ම රැකියා අපේක්ෂකයින් සඳහා පෙර විගමණික පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- උපදේශකයින් සඳහා TOT වැඩසටහන් පැවැත්වීම.
- පුහුණු මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම (කාර්යාංශ සහ පුද්ගලික).
- පුහුණු පාඨමාලා සඳහා පුහුණු සහතික මුද්‍රණය කිරීම සහ බෙදා හැරීම.





කාර්ය සාධන සාරාංශය – පුහුණු වැඩසටහන්	2022		2023		2024	
	පුහුණුලාභීන් සංඛ්‍යාව	පන්ති ගණන	පුහුණුලාභීන් සංඛ්‍යාව	පන්ති ගණන	පුහුණුලාභීන් සංඛ්‍යාව	පන්ති ගණන
පෙර විගමණික පුහුණු වැඩසටහන (ගෘහස්ත ගෘහ පාලන සහකාර හැර වෙනත්) - දින 2	15273	1592	57201	2028	55239	1883
පෙර විගමණික කොරියානු පුහුණුව	1410	43	3643	88	3598	80
ජපන් භාෂා වැඩසටහන	3660	98	616	30	498	23
ජපානයේ රැකියා අපේක්ෂකයින් සඳහා පෙර විගමණික පුහුණුව (TITP)	65	07	115	15	125	10
රීශ්‍රායලය සඳහා පෙර විගමණික පුහුණුව (කෘෂිකර්ම / ඉදිකිරීම්)	-	-	-	-	1964	36

බඳවාගැනීම

බඳවා ගැනීමේ ක්‍රියාකාරකම් හරහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විදේශයන්හි යහපත් සහ ආරක්ෂිත රැකියා සුරක්ෂිත කිරීම, ඔවුන්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ආරක්ෂා කිරීම සහ ප්‍රේෂණ මගින් ජාතික ආර්ථිකයට දායක වීම සහතික කෙරේ. මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමෙන්, ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන් සඳහා සුරක්ෂිත සහ මනා පරිසරයක් නිර්මාණය කිරීමට, ඔවුන්ගේ සමස්ත අත්දැකීම් වැඩිදියුණු කිරීමට සහ බඳවා ගැනීමේ සහ රැකියා ක්‍රියාවලිය පුරාවට ඔවුන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමට කාර්යාංශය උත්සහ කරයි.

බඳවා ගැනීමේ (සාමාන්‍ය) අංශය සහ බඳවා ගැනීමේ (කොරියානු) අංශය බඳවා ගැනීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීමට, විගමණික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් සහ සුබසාධනය සුරක්ෂිත කිරීමට සහ විදේශ රැකියා අංශය තුළ සදාචාරාත්මක ක්‍රියාවන් ප්‍රවර්ධනය කිරීමට ඒකාබද්ධව කටයුතු කරයි.

බඳවා ගැනීමේ (සාමාන්‍ය) අංශය විසින් පහත බඳවා ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

❖ **ජපානය සඳහා සේවකයින් බඳවා ගැනීම**

(1) ජපානයේ International Manpower Organization හරහා තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් (Technical Intern Trainees) පිටත් කිරීම (කාර්යාංශය සහ International Manpower Development Organization අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව ක්‍රියාත්මක කරනු ලැබේ).

බඳවා ගැනීමේ වැඩසටහන යටතේ 2024 සහ 2023 වර්ෂවල පිටත්වූ සංඛ්‍යාව

වර්ෂය	ඝාන්තු සේවක	ඉදිකිරීම්	ආහාර සකස් කිරීම සහ කාර්මික ඇසුරුම්	ඔටෝ මොබයිල්	කෘෂිකාර්මික	එකතුව
2024	39	27	11	06	01	**84**
2023	37	44	3	-	-	**84**

(2) තාක්ෂණික සේවාස්ථ පුහුණුලාභීන් International Relations Organization හරහා පිටත් කිරීම (කාර්යාංශය සහ ජපානයේ International Relations Organization අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව ක්‍රියාත්මක කරනු ලැබේ)

අංශය	පිටත් වූ සංඛ්‍යාව	
	2023	**2024**
ඝාන්තු සේවක	-	05
ඉදිකිරීම්	06	19
කාර්මික ඇසුරුම්	-	-
ආහාර සකස් කිරීම	-	-

(3) විශේෂිත නිපුණතා සහිත ශ්‍රමික වැඩසටහන (SSW) යටතේ රැකියා සඳහා පිටත් කිරීම

මෙම වැඩසටහන යටතේ රැකියා ක්ෂේත්‍ර 16ක් ඇති අතර, ජපන් රජය විසින් ක්ෂේත්‍ර 07ක් සඳහා කුසලතා පරීක්ෂණ සඳහා ශ්‍රී ලංකාවට අවස්ථා ලබා දී ඇත. හෙද සේවා, ඉදිකිරීම්, කෘෂිකර්මාන්තය, ආහාර සේවා, ගොඩනැගිලි පිරිසිදු කිරීමේ කළමනාකරණය, ගුවන් සේවා (භූමි හැසිරවීම) සහ නවාතැන් යන ක්ෂේත්‍ර මෙම ක්ෂේත්‍රවලට ඇතුළත් වේ. මෙම වැඩසටහන යටතේ ශ්‍රමිකයින් පිටත් කිරීම 2024 වර්ෂයේදී ආරම්භ විය.

ක්ෂේත්‍රය	**2024දී පිටත් වූ සංඛ්‍යාව**
ඉදිකිරීම්	-
හෙද සේවා	17
ආහාර සැකසුම්	6

❖ ඊශ්‍රායලය සඳහා සේවකයින් බඳවා ගැනීම


2024 දී ඊශ්‍රායලයට බඳවා ගැනීම් කාර්යාංශය සහ ඊශ්‍රායල රජය අතර අත්සන් කරන ලද ප්‍රොටකෝල (Protocol) 03 ක් යටතේ කාණ්ඩ 03 කට සිදු කරන ලදී. මෙයට සාන්තු සේවය, කෘෂිකර්මාන්තය සහ ඉදිකිරීම් යන අංශ ඇතුළත් විය. මීට අමතරව, 2024 දී හෝටල් ගෘහ පාලනය සහ පිරිසිදු කිරීම, ආපනශාලා සහ නිෂ්පාදන යන නව අංශ 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා නව ප්‍රොටකෝල (Protocol) අත්සන් කරන ලදී.

පිටත් වූ සංඛ්‍යාව

	සාන්තු සේවා		කෘෂිකාර්ම		ඉදිකිරීම්	
	2023	**2024**	**2023**	**2024**	**2023**	**2024**
පිරිමි	87	105	357	2242	-	5097
කාන්තා	508	951	-	-	-	-
එකතුව	**595**	**1056**	**357**	**2242***	**-**	**5097**

**දන්න සඳහා 2069ක් නව ශ්‍රමිකයින් සහ 173ක් පෙර සෘතු ශ්‍රමිකයින් ඇතුලත් වේ*





ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරකම්





ඊශ්‍රායලයට කෘෂිකාර්මික රැකියා සඳහා බඳවාගැනීම් ආශ්‍රිත ක්‍රියාකාරකම්



බඳවාගැනීම් අංශය (කොරියානු)

ප්‍රථමවරට 2004 වසරේ රජයන් දෙක අතර අත්සන් කරන ලද වරින් වර අලුත් කෙරෙන අවබෝධතා ගිවිසුමට අනුව කොරියාවේ රැකියා බලපත්‍ර ක්‍රමය (EPS) යටතේ දකුණු කොරියානු ජනරජයට ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් බඳවා ගැනීමට බඳවා ගැනීමේ අංශය (කොරියාව) පහසුකම් සපයයි.


බඳවා ගැනීම් අංශය (කොරියානු) විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

- මාර්ගගත පද්ධතිය හරහා විශේෂ EPS-TOPIK සහ සාමාන්‍ය EPS-TOPIK සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම
- පත්නිපිටිය CBT මධ්‍යස්ථානයේදී විශේෂ EPS-TOPIK විභාගය සහ සාමාන්‍ය EPS-TOPIK විභාග පැවැත්වීම
- රැකියා ගිවිසුම් අත්සන් කිරීම
- අපේක්ෂකයින් පෙර විගමණික පුහුණු වැඩසටහනට යොමු කිරීම
- කොරියානු ජනරජයට E-9 සේවකයින් යොමු කිරීම
- පැමිණිලි සඳහා කටයුතු කිරීම

කොරියාව සඳහා පිටත්වීම්

අංශය	2022	2023	2024	මුළු සංඛ්‍යාව
සාමාන්‍ය	4594	3786	4344	12724
විශේෂ	888	1205	458	2551
නැවත ඇතුල්වීම	1157	1421	760	3338
මුළු සංඛ්‍යාව	**6639**	**6412**	**5562**	**18613**







රැකියා ප්‍රවර්ධනය

- *අලෙවිකරණ අංශය*
- *ප්‍රචාරක අංශය*
- *මිනිස් බල සැපයුම් අංශය*

විදේශ රැකියා සොයන ශ්‍රී ලාංකිකයින් සඳහා විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අලෙවිකරණ අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2024 වර්ෂයේදී අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්,

- මැදපෙරදිග කලාපයේ විදේශ රැකියා පිළිබඳව ඍණාත්මක ආකල්ප මැඩපැවැත්වීම සඳහා සහ ලාභදායී විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිරූප ගොඩනැගීමේ වැඩසටහන් (දේශීයව) ක්‍රියාත්මක කිරීම





- විදේශ රැකියා අපේක්ෂකයින්ට රැකියා අවස්ථා සොයා ගැනීමට පහසුකම් සැලසීම සඳහා කාර්යාංශය පළාත් කාර්යාල සහ අනෙකුත් රජයේ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් සහ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවල සහභාගිත්වයෙන් ප්‍රාදේශීය මට්ටමේ රැකියා පොළවල් සහ දිස්ත්‍රික් මට්ටමේ රැකියා පොළවල් පැවැත්වීම.

ප්‍රදේශීය මට්ටමේ පවත්වන ලද රැකියා පොළවල්	පවත්වන ලද රැකියා පොළවල් ගණන		සහභාගී වූ රැකියා අපේක්ෂකයින් සංඛ්‍යාව		සහභාගී වූ බලපත්‍රලාභී රැකියා නියෝජිතායතන සංඛ්‍යාව	
	2023	2024	2023	2024	2023	2024
උඹෙ පළාත	11	02	939	235	34	10
උතුරු පළාත	04	01	380	60	15	02
උතුරු මැද පළාත	02	01	164	60	08	02
බස්නාහිර පළාත	14	01	2318	51	38	01
නැගෙනහිර පළාත	5	-	261	-	9	-
මධ්‍යම පළාත	13	-	3017	-	44	-
දකුණු පළාත	6	-	1809	-	22	-
සබරගමුව පළාත	10	-	3844	-	84	-
වයඹ පළාත	4	-	367	-	31	-



දිස්ත්‍රික් මට්ටමේ රැකියා පොලවල් සංවිධානය කිරීම (Glocal Fair) - **2024 වසරේදී දිස්ත්‍රික් 24ක වැඩසටහන් 24ක් පවත්වන ලදී**



- Road Show වැඩසටහන් පැවැත්වීම

  2024 ඔක්තෝබර් 27 සිට 30 දක්වා සෞදි අරාබියේ පැවති මානව සම්පත් සහ මිනිස්බල ප්‍රදර්ශනයට (Human Resource & Manpower EXPO) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන 09ක් සමඟ සහභාගී විය.





- තවද, අලෙවිකරණ අංශය විසින් වරින් වර පවත්නා රැකියා අවස්ථා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට සහ එවැනි තොරතුරුවලට උනන්දුවක් දක්වන පාර්ශවයන් සමඟ බෙදා හැරීම සඳහා විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩවල සහාය ඇතිව වෙළඳපල බුද්ධි වාර්තා සකස් කරනු ලැබේ.

කාර්යාංශයේ සේවාවන්, ප්‍රතිපත්ති සහ මූලපිරීම් පිළිබඳව දැනුවත් කිරීම සහ තොරතුරු බෙදා හැරීම සඳහා **ප්‍රචාරක අංශය** ක්‍රියාත්මක වේ. කාර්යාංශයේ සේවාවන් පිළිබඳ නිවැරදි සහ අදාළ තොරතුරු පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත ළඟා කරමින් විදේශ රැකියා ප්‍රවර්ධනය සහ නියාමනය කිරීමේලා කාර්යාංශයේ මෙහෙවර තහවුරු කරනු ලබයි.

ප්‍රචාරක අංශයේ ප්‍රධාන කාර්යයන් අතරට තොරතුරු බෙදා හැරීම, මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ජන හා සමාජ මාධ්‍ය ප්‍රචාරණය සහ කාර්යාංශය විසින් සංවිධානය කරනු ලබන රැකියා පොළ, බඳවා ගැනීමේ වැඩසටහන් සහ අනෙකුත් වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රචාරණය කිරීම ඇතුළත් වේ.





ප්‍රචාරක අංශය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

	ක්‍රියාකාරකම්	2024ට අදාල කාර්ය සාධනය	2023ට අදාල කාර්ය සාධනය
1.	පුවත්පත් දැන්වීම් පළ කිරීම (ප්‍රසම්පාදන, අයදුම්පත් කැඳවීම්, රැකියා අවස්ථා, කොරියානු විභාග, සුභසාධන, දැනුවත් කිරීම සහ අනෙකුත් කාලීන ගැටලු)	පුවත්පත් 79 ක දැන්වීම් 52 ක්	පුවත්පත් 146 ක දැන්වීම් 50 ක්
2.	පුවත්පත් අතිරේක පළ කිරීම (රැකියා පොළ, විගමණික ශ්‍රමිකයන් බඳවා ගන්නා රටවල ජාතික දින, ප්‍රේෂණ ප්‍රවර්ධනය, ආරක්ෂිත සංක්‍රමණය, සුභසාධනය සහ නව ලිපි)	පුවත්පත් 108 ක අතිරේක 66 ක්	පුවත්පත් 27 ක අතිරේක 10 ක්
3.	රූපවාහිනී වැඩසටහන් (කාර්යාංශ නිලධාරීන් සජීවී රූපවාහිනී වැඩසටහන් සඳහා සහභාගී වීම, මිනිස් ජාවාරම්, ආරක්ෂිත සංක්‍රමණය, සුභසාධන ප්‍රතිලාභ, ලියාපදිංචිය ආදිය)	40	32
4.	රූපවාහිනී වෙළඳ දැන්වීම් (කාර්යාංශ ක්‍රියාකාරකම් සහ සිදුවීම්, කාර්යාංශ ලියාපදිංචි කිරීමේ වැදගත්කම, සුභසාධන කටයුතු, මිනිස් ජාවාරම් වලින් ප්‍රවේශම් වීම ආදිය)	7078	4941
5.	ගුවන්විදුලි වැඩසටහන්	98	13
6.	ගුවන්විදුලි දැන්වීම	15121	5362
7.	මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්	03	03
8.	මාධ්‍ය ආවරණය සහ වැඩසටහන්	114 වැඩසටහන්	207
9.	මාධ්‍ය හමු සහ මාධ්‍ය වෙත මාධ්‍ය නිවේදන නිකුත් කිරීම	115 නිවේදන	180
10.	සමාජ මාධ්‍ය ව්‍යාපාර	Facebook - 1098 YOUTUBE - 435 Boosting - 17 TIKTOK - 336	Facebook - 807 Youtube -123 FB 24 Channel -102 Tik Tok Video -145 FB Live -71
11.	විගමණික ශ්‍රමිකයින්ගේ සාර්ථක කතා ප්‍රකාශයට පත් කිරීම	138 සාර්ථක කතා	-
12.	දිස්ත්‍රික් මාධ්‍ය ප්‍රජා	24 ප්‍රජා	-



මාධ්‍ය ආවරණය සහ මාධ්‍ය නිවේදන නිකුත් කිරීම



රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන





දිස්ත්‍රික් මාධ්‍ය ප්‍රජාව

විදේශ රැකියා ක්ෂේත්‍රයේ මාධ්‍ය සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම සඳහා දිස්ත්‍රික් මාධ්‍ය ප්‍රජාවන් පිහිටුවීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රචාරක සහ මහජන සම්බන්ධතා අංශය මූලිකත්වය ගෙන කටයුතු කරන ලදී. එමඟින් කාර්යාංශය සහ මාධ්‍ය ප්‍රජාව අතර ශක්තිමත් සම්බන්ධතාවයක් වර්ධනය කිරීම ඉලක්කය විය. ඒ අනුව, 2024 වර්ෂය තුළ දිස්ත්‍රික්ක 23 ක මාධ්‍ය ප්‍රජාවන් පිහිටුවන ලදී.



මාධ්‍ය ප්‍රජාවන්හි අරමුණු:

- විදේශ රැකියා ක්ෂේත්‍රය පිළිබඳ නිවැරදි හා කාලෝචිත තොරතුරු බෙදා හැරීම සහතික කිරීම
- විදේශයන්හි ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය මුහුණ දෙන සාර්ථකත්වයන් සහ අභියෝග වාර්තා කිරීම සඳහා මාධ්‍යවේදීන්ට අවශ්‍ය සම්පත් සහ සහාය ලබා දීම.
- විදේශ රැකියා සම්බන්ධයෙන් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් මුහුණ දෙන ගැටලු කඩිනම් විසඳීම සඳහා කාර්යාංශයට සෘජුවම යොමු කිරීම.



“සභාපතිට කියන්න” වැඩසටහන



මහජනතාව සහ කාර්යාංශය අතර සන්නිවේදනය ශක්තිමත් කිරීමේ අරමුණින් "සභාපතිට කියන්න" නමින් නව වැඩසටහනක් කාර්යාංශය විසින් දියත් කරන ලදී. විදේශ රැකියා අංශයට අදාළ සහ කාර්යාංශය විසින් සපයනු ලබන සේවාවන්ට ආදළ නොවිසඳුනු ගැටලු සෘජුවම කාර්යාංශ සභාපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම මෙම විශේෂ වැඩසටහනේ අරමුණ විය.



කාර්යාංශයට පැමිණ ඉදිරිපත් කරන පැමිණිලි වලට අමතරව, 0112 864188 දුරකථන අංකයෙන්, 0717 593 593 WhatsApp අංකයෙන් හෝ talkchairman@slbfe.lk විද්‍යුත් තැපෑලෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට මහජනතාවට පහසුකම් සැලසිණි. මෙම බහු-නාලිකා ප්‍රවේශය මහජනතාවට, විශේෂයෙන් විගමණික ශ්‍රමික ප්‍රජාවට පහසුවෙන් පැමිණිලි යොමු කිරීමේ ක්‍රමවේදයක් සහතික කරන ලදී.

"සභාපතිට කියන්න" වැඩසටහනේ අරමුණ වූයේ වඩාත් විශ්වාසදායක, ජනතා කේන්ද්‍රීය සේවාවක් සැපයීම සඳහා තැබූ ප්‍රගතිශීලී පියවරක් සනිටුහන් කිරීමයි.

විදේශ රැකියා අපේක්ෂකයින්ට ඔවුන්ගේ විදේශ රැකියා සිහිනය යථාර්ථයක් කර ගැනීම සඳහා සහාය වීම සහ මහ පෙන්වීම සඳහා පිහිටුවා ඇති කැපවූ ඒකකයක් වන්නේ **මිනිස් බල සැපයුම් සහ සේවාදායක සහාය ඒකකයයි**. මේ සඳහා මෙම අංශය මඟින් මහජනතාව, වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුවන්නන් සහ රජයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, විදේශ රැකියා අපේක්ෂකයින් සඳහා රැකියා සම්මුඛ පරීක්ෂණ කාර්යාංශ පළාත් කාර්යාල හරහා පැවැත්වීම, කාර්යාංශයේ විදේශ රැකියා බැංකුව ප්‍රවර්ධනය කිරීම සහ මාර්ගගත රැකියා බැංකුවේ ලියාපදිංචි වීමට පාරිභෝගිකයින්ට සහාය ලබා දීම සිදු කරයි.

2023 සහ 2024 දී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර

	දැනුවත් කිරීමේ වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව		සහභාගී වූ රැකියා අපේක්ෂකයින් සංඛ්‍යාව	
		2023	2024	2023	2024
1.	දැනුවත් කිරීමේ වැඩසටහන්/ මහජනතාව සඳහා ජංගම සේවා	263	152	13,878	7848
2.	වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුලාභීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්	68	40	3775	2175
3.	රාජ්‍ය නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්	33	63	1591	3814

2024 වර්ෂයේදී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ පිළිබඳ විස්තර

බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවල පවතින පුරප්පාඩු සඳහා සුදුසු අපේක්ෂකයින් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ භෞතිකව සහ මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව	සහභාගී වූ අපේක්ෂකයින් සංඛ්‍යාව
15	105

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ රැකියා බැංකුව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් රැකියා අපේක්ෂකයින්ට මාර්ග ගත රැකියා බැංකුව ඔස්සේ ලියාපදිංචි වී විදේශ රැකියා අවස්ථාවන් සොයාගැනීම සඳහා පහසුකම් සලසයි. ඔවුන්ට මාර්ග ගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි වීමට හෝ කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයට හෝ දිවයින පුරා පිහිටුවා ඇති පළාත් කාර්යලයක් වෙත අයදුම්පත් යොමු කිරීම සිදු කල හැක. බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවලට හා සේවායෝජකයින්ට ඔවුන් සතු පුරප්පාඩු සඳහා මාර්ග ගත රැකියා බැංකුව මඟින් සුදුසු අයදුම්කරුවන් සොයා ගැනීමට ද පහසුකම් සලසා ඇත. මිනිස්බල සැපයුම් අංශය මඟින් කාර්යාංශයේ මාර්ගගත රැකියා බැංකුව ප්‍රවර්ධනය කරන අතර ප්‍රවර්ධන වැඩසටහන් අතරතුර ලියාපදිංචිය සඳහා අයදුම්පත් එකතු කරයි.

2024 දී කාර්යංශ රැකියා බැංකුවේ ලියාපදිංචි වූ මුළු රැකියා සොයන්නන්

11,033

2023 සහ 2024 වර්ෂවල කාර්යාංශයේ රැකියා බැංකුව ප්‍රවර්ධනයට අදාළ විස්තර

රැකියා බැංකුවේ රැකියා සොයන්නන් ලියාපදිංචි කිරීම සඳහා මිනිස් බල සැපයුම් අංශය විසින් සිදු කරන ලද ප්‍රවර්ධන වැඩසටහන් ගණන		ප්‍රවර්ධන වැඩසටහන් අවසානයේ කාර්යාංශ රැකියා බැංකුවේ ලියාපදිංචි වූ පුද්ගලයින් සංඛ්‍යාව	
2023	2024	2023	2024
221	46	3797	465

මෙහෙයුම් විශිෂ්ටත්වය

- මෙහෙයුම් ක්‍රියාදාමය
- අභ්‍යන්තර පාලනයන් පවත්වා ගෙන යාම
- මූල්‍ය කාර්ය සාධනය

මෙහෙයුම් ක්‍රියාදාමය

කාර්යාංශයේ **පරිපාලන, මානව සම්පත්, ප්‍රසම්පාදන, නඩත්තු, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ, සැලසුම් සහ පර්යේෂණ** යන අංශ මෙහෙයුම් විශිෂ්ටත්වය සහ අඛණ්ඩතාව සහතික කරමින් ශ්‍රී ලාංකිකයින් සඳහා විදේශ රැකියා නියාමනය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වන කාර්යාශයේ මෙහෙවර ක්‍රියාත්මක කිරීම සඳහා මනා කාර්යභාරයක් ඉටු කරයි. කාර්යාංශයේ අභ්‍යන්තර මෙහෙයුම් සහ උපකාරක සේවාවන් කාර්යක්ෂම සහ ඵලදායී කළමනාකරණය සඳහා මෙම අංශ වගකීම් දරයි. මෙම අංශයන්හි ප්‍රධාන කාර්යයන් :

- මානව සම්පත් කළමනාකරණය : දක්ෂ හා අභිප්‍රේරිත ශ්‍රම බලකායක් සහතික කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, පුහුණුව, කාර්ය සාධනය ඇගයීම සහ සංවර්ධනය කිරීම අධීක්ෂණය කිරීම.

- පහසුකම් කළමනාකරණය : හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීම සඳහා කාර්යාල පහසුකම්, යටිතල පහසුකම් සහ උපකරණ කළමනාකරණය කිරීම.

- ප්‍රසම්පාදන සහ සැපයුම්: භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන හැසිරවීම, කොන්ත්‍රාත්තු කළමනාකරණය කිරීම සහ කාලෝචිත සහ ලාභදායී සැපයුම් සහාය සහතික කිරීම.

- වාර්තා සහ ලේඛන: නිවැරදි වාර්තා පවත්වා ගැනීම, ලේඛන කළමනාකරණය සහ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම.

- සම්බන්ධීකරණය සහ සන්නිවේදනය: අභ්‍යන්තර සන්නිවේදනයට පහසුකම් සැලසීම, විවිධ දෙපාර්තමේන්තු හරහා ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සහ සුමට මෙහෙයුම් කාර්ය ප්‍රවාහයක් සහතික කිරීම.

- සැලසුම් කිරීම සහ අධීක්ෂණය: උපායමාර්ගික සැලසුම්, කාර්ය සාධන වාර්තා සහ ප්‍රගති වාර්තා සකස් කිරීම සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

අපගේ වටිනාම වත්කම..... "අපගේ සේවකයින්"

තත්ත්ව ප්‍රතිපත්තියේ අවධාරණය කර ඇති පරිදි, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තම සේවකයින් තම වටිනාම වත්කම ලෙස සලකන අතර, තම ගනුදෙනුකරුවන්ට වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව තත්ත්ව කළමනාකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව පවත්වා ගනිමින් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ගේ නිපුණතාවය වර්ධනය කිරීම කෙරෙහි දැඩි ලෙස විශ්වාස කරන අතර ඒ වෙනුවෙන් ආයෝජනය කරයි.

කාර්යාංශ සේවකයින් සඳහා එළිමහන් පුහුණු වැඩසටහන

කාර්යාංශය විසින් සිය සේවක මඩුල්ල සඳහා දින දෙකක නේවාසික එළිමහන් පුහුණු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. කාර්ය මණ්ඩලය සඳහා සංවිධානය කරන ලද එළිමහන් පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණු පහත වූයේ:

- නිලධාරීන් අතර කණ්ඩායම් හැඟීම ගොඩනැඟීම සහ සහයෝගීතාවය වර්ධනය කිරීම.
- අන්තර් පුද්ගල සන්නිවේදනය සහ අන්තර් පුද්ගල කුසලතා වැඩිදියුණු කිරීම.
- ගැටලු විසඳීමේ සහ තීරණ ගැනීමේ හැකියාවන් වැඩි දියුණු කිරීම.
- නායකත්ව කුසලතා වර්ධනය කිරීම සහ සහයෝගි කණ්ඩායම් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.
- නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදනය දිරිමත් කිරීම.
- සේවක චිත්ත ධෛර්යය, අභිප්‍රේරණය සහ සහභාගීත්වය ශක්තිමත් කිරීම.

නිලධාරීන් 853 ක් කණ්ඩායම් 10 ක් ලෙස සහභාගී විය







උපද්‍රව වලින් වෘත්තීය ආරක්ෂාව සහතික කිරීම

2024.07.09 වන දින ප්‍රධාන කාර්යාලයේ සහ මධ්‍යස්ථානවල නිලධාරීන් 45 දෙනෙකුගේ පමණ සහභාගීත්වයෙන් කාර්යාංශයේ නඩත්තු අංශය විසින් ගිනි ආරක්ෂණ පද්ධතිය සහ උපකරණ පිළිබඳ වාර්ෂික දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදී. ආරක්ෂාව සහ අනුකූලතාව සහතික කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහන මගින් ගිනි නිවන දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන්ට හදිසි අවස්ථාවකදී ක්‍රියා කළ යුතු ආකාරය සහ අදාළ ගිනි නිවන උපකරණ නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන ලදී.





අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාම

සියලුම පාර්ශ්වකරුවන්ට සේවා සැපයීමේදී ඉහළම ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීම

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් 2024 මාර්තු මාසයේදී කාර්යාංශයෙහි ප්‍රධාන කාර්යාලය සහ ශාඛා කාර්යාල සඳහා නැවත සහතික කිරීමේ විගණනයක් පවත්වන ලදී. ඒ අනුව, ප්‍රධාන කාර්යාලය සහ ශාඛා කාර්යාල 2027 අප්‍රේල් 25 වන දින දක්වා වලංගු වන ISO 9001:2015 තත්ත්ව සහතිකය අලුත් කිරීම සඳහා සුදුසුකම් ලබා ඇත.

තත්ත්ව ආරක්ෂණ ඒකකය, ISO ප්‍රමිතීන්ට අනුකූලව ආයතනික ක්‍රියාකාරකම් අධික්ෂණය කිරීම සඳහා වාර්ෂික අභ්‍යන්තර තත්ත්ව විගණන පැවැත්වීම සහ පාරිභෝගිකයින්ට කාර්යක්ෂම හා ඵලදායී සේවාවන් සැපයීම සහතික කිරීම සඳහා පාරිභෝගික ප්‍රතිපෝෂණ නිරීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

අභ්‍යන්තර විගණන අංශය, ක්‍රමානුකූල ඇගයීම සහ අධික්ෂණය තුළින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මෙහෙයුම්වල විනිවිදභාවය, වගවීම සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා කැපවී සිටී.

- අවදානම් තක්සේරුව: කාර්යාංශයෙහි ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම සහ ඒවා අවම කිරීමට පියවර නිර්දේශ කිරීම.
- අනුකූලතා විගණන: කාර්යාංශයේ සියලුම මෙහෙයුම් අදාළ නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වන බව සහතික කිරීම.
- මූල්‍ය විගණන: අරමුදල්වල නිරවද්‍යතාවය, අඛණ්ඩතාව සහ නිසි භාවිතය සහතික කිරීම සඳහා මූල්‍ය ගනුදෙනු, ගිණුම් සහ වාර්තා සමාලෝචනය කිරීම.
- මෙහෙයුම් විගණන: මෙහෙයුම් ක්‍රියාවලීන්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය ඇගයීම සහ වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීම.
- වාර්තා කිරීම සහ නිර්දේශ: පාලනය සහ පාලන යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීම සඳහා සොයාගැනීම් සහ ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ සහිත විගණන වාර්තා කළමනාකරණයට ඉදිරිපත් කිරීම.


මූල්‍ය කාර්යසාධනය

2022 සිට 2024 දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය කාර්යසාධනය (රු. මිලියන)

	2022	2023	2024
මුළු ආදායම	11,470	12,903	10,639
මුළු වියදම	-3,680	-5,119	-7,021
බදු පෙර ලාභය	**7,790**	**7,784**	**3,618**
ජංගම නොවන වත්කම්	1,863	4,800	4,494
ජංගම වත්කම්	25,167	23,104	25,801
මුළු වත්කම්	**27,030**	**27,904**	**30,295**
ජංගම වගකීම්	3,855	3,457	2,481
ජංගම නොවන වගකීම්	5,538	5,549	5,568
මුළු වගකීම්	**9,393**	**9,006**	**8,049**
ශුද්ධ වත්කම්	**17,637**	**18,898**	**22,246**

ඉහත දැක්වෙන පරිදි, සමාලෝචිත වර්ෂය සඳහා මුළු ආදායම 2023 වර්ෂය සඳහා වූ මුළු ආදායම වූ රුපියල් මිලියන 12,903 ට සාපේක්ෂව රුපියල් මිලියන 10,639 ක් විය. 2023 වර්ෂයට සාපේක්ෂව කාර්යාංශයේ ආදායමේ පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආයෝජන ආදායමේ අඩුවීමයි. එසේම විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුභසාධන වියදම්, රැකියා ප්‍රවර්ධන කටයුතුවලට අදාළ වියදම් සහ කාර්ය මණ්ඩල ආශ්‍රිත වියදම් 2023 වර්ෂයට සාපේක්ෂව ඉහළ ගොස් ඇති අතර එය 2023 වර්ෂයේදී බදු ගෙවීමට පෙර ලාභය වූ රුපියල් මිලියන 7,784ක මුදල 2024 වර්ෂයේදී රුපියල් මිලියන 3,618 දක්වා අඩුවීමට බලපා ඇත.


2022 - 2024 කාර්යාංශ ආදායම



2014 - 2024 දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය කාර්යසාධනය (රු. මිලියන)


	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
මූළු ආදායම	3,461	2,978	3,974	3,692	4,471	4,218	1,780	3,053	11,470	12,903	10,639
මූළු වියදම	-3,044	-2,528	-2,663	-2,623	-2,946	-3,169	-2,411	-2,421	-3,680	-5,119	-7,021
බදු පෙර ලාභය	**417**	**450**	**1,311**	**1,069**	**1,525**	**1,049**	**-631**	**632**	**7,790**	**7,784**	**3,618**
ජංගම නොවන වත්කම්	5,356	7,060	7,620	6,729	2,648	2,244	2,088	1,905	1,863	4,800	4,494
ජංගම වත්කම්	6,645	6,079	6,469	8,385	13,898	14,554	14,440	15,651	25,167	23,104	25,801
මූළු වත්කම්	**12,001**	**13,139**	**14,089**	**15,114**	**16,546**	**16,798**	**16,528**	**17,556**	**27,030**	**27,904**	**30,295**
ජංගම වගකීම්	4,613	1,334	1,450	1,574	1,820	1,715	1,817	1,756	3,855	3,457	2,481
ජංගම නොවන වගකීම්	3,411	3,780	2,599	2,860	3,408	3,692	4,071	4,257	5,538	5,549	5,568
මූළු වගකීම්	**8,024**	**5,114**	**4,049**	**4,434**	**5,228**	**5,407**	**5,888**	**6,013**	**9,393**	**9,006**	**8,049**
ශුද්ධ වත්කම්	**3,977**	**8,025**	**10,040**	**10,680**	**11,318**	**11,391**	**10,640**	**11,543**	**17,637**	**18,898**	**22,246**
භාණ්ඩාගාරයට ගෙවන ලද මුදල්	අවුරුද්ද	2011	2016	2017	2018	2019	2020	2022	2023	2024	
	මුදල	625	1,000	185	200	650	22	1,200	7,000	-	

කාර්යාංශයේ ආදායම: **2014 -2024** (රු. මිලියන)



කාර්යාංශයේ ප්‍රධාන ආදායම්: 2014 -2024 (රු. මිලියන)


	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
ලියාපදිංචි ගාස්තු (ඒජන්සි)	527	285	385	308	300	311	83	188	555	711	656
ලියාපදිංචි ගාස්තු (ස්වයං)	654	617	1,107	1,076	1,151	1,017	276	690	1,757	1,774	2,189
කොරියානු බඳවාගැනීම් ප්‍රවර්ධන ගාස්තු	0	0	249	116	102	120	48	7	230	279	204
පහසුකම් ගාස්තු	59	50	48	42	42	40	11	25	61	59	63
බලපත්‍ර ගාස්තු	70	67	87	49	51	61	42	60	93	114	127
සෙස් ආදායම්	292	255	202	158	194	198	55	317	943	986	675
කොරියානු පරිපාලන ගාස්තු	20	23	28	13	19	14	5	0.8	26	26	24
නැවත ඇතුල්වීමේ කොරියානු ගාස්තු	3	7	15	14	16	14	7	17	23	25	14
පුහුණු ආදායම්	222	205	198	132	155	217	66	192	575	366	363
ඊශ්‍රායල් වැඩසටහන් ආදායම්										124	1,326
විදේශ තානාපති කාර්යාලවල ආදායම්	707	705	836	841	1172	1080	274	869	3,599	3,622	1326
මූල්‍ය ආදායම	**452**	**501**	**632**	**810**	**890**	**994**	**765**	**532**	**1,888**	**2,815**	**1804**



2014 - 2024 කාර්යාංශයේ ප්‍රධාන මෙහෙයුම් වියදම් - රු. මිලියන

	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
කාර්ය මණ්ඩල පිරිවැය	819	941	1,342	1,415	1,577	1,744	1,467	1,341	1,893	1,875	2,436
ආයතනික වියදම්	293	268	488	476	549	525	391	412	581	782	958
මෙහෙයුම් වියදම්	260	241	297	255	317	327	299	278	402	528	748
මූල්‍ය වියදම්			5	5	4	9	33	22	24	18	828
වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණ	201	33	25	12	9	13	7	8	20	115	165
ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්	98	25	29	36	45	68	9	5	93	82	574
සුභසාධන - වෙනත් වියදම්	1,372	1,018	476	422	442	481	204	352	664	1,036	1,312

ප්‍රධාන මෙහෙයුම් වියදම් - 2024 (රු. මිලියන)



අපගේ බැංකු ගණුදෙණුකරුවන්









තිරසාරභාවය පිළිබඳ වාර්තාව

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඉහළම ආදායම් ලබා දීමට දායක වන්නේ සේවක ප්‍රේෂණය. එය රටේ ආර්ථික ස්ථාවරත්වයට සහ වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් සපයයි. ශ්‍රී ලංකාවේ විදේශ රැකියා නියාමනය සඳහා වූ වගකිවයුතු ආයතනය ලෙස, විදේශ රැකියා අංශය ශක්තිමත් කිරීම තුළින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා වූ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යභාරය එය හඳුනා ගනී. එසේ කිරීමේදී තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සහ ආරක්ෂිත, විධිමත් සහ නීත්‍යානුකූල සංක්‍රමණය සඳහා වූ ගෝලීය සම්මුතියේ (GCM) මාර්ගෝපදේශක මූලධර්ම ලෙස භාවිතා කරයි. තිරසාරභාවය කාර්යාංශයෙහි උපාය මාර්ගවල ප්‍රධාන අංගයක් බවට පත් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, කාර්යාංශයෙහි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලබන්නේ තිරසාර සංවර්ධන ඉලක්ක සහ එහි ඉලක්ක වලට අදාළත්වය සහ සම්බන්ධය ලබා දෙමිනි. මෙම ඒකාබද්ධ කිරීම තුළින් කාර්යාංශය තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුකූලව සිය ප්‍රතිපත්ති සකස් කිරීමට සහ එහි ක්‍රියාකාරකම් සිදු කිරීමට ඇති කැපවීම තහවුරු කරයි.

තම මෙහෙයුම් කාර්යභාරයේ දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තිරසාර අනාගතයක් සහතික කිරීම උදෙසා ආර්ථික වර්ධනයට දායක වීම සහ සමාජ වගකීම ඉටු කිරීම සඳහා වූ සිය කාර්යභාරය මනාව ඉටු කරයි.

කාර්යාංශයේ තිරසාර සංවර්ධනය ඉටු කිරීම සඳහා කරන ලද මූලපිරීම්

- **සදාචාරාත්මක බඳවා ගැනීමේ පිළිවෙත්:** කාර්යාංශය විසින් සදාචාරාත්මක විදේශ රැකියා පිළිවෙත් තුළින් තිරසාරභාවය ප්‍රවර්ධනය කරයි. විගමණික ශ්‍රමිකයින් සූරාකෑමෙන් ආරක්ෂා කිරීම සහ ආරක්ෂිත සංක්‍රමණයක් සහතික කිරීම සඳහා, කාර්යාංශය විදේශ රැකියා නියෝජිතයින් නිරීක්ෂණය කිරීම, නීති විරෝධී බඳවා ගැනීම් වැළැක්වීම සඳහා නීති ක්‍රියාත්මක කිරීම සහ නීත්‍යානුකූල සංක්‍රමණ මාර්ග පිළිබඳව දැනුවත් කිරීම සිදු කරයි.

- **පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන්:** ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, සංක්‍රමණික ගමන ඵලදායී කිරීම සඳහා අත්‍යවශ්‍ය කුසලතා සහ දැනුමෙන් විගමණික ශ්‍රමිකයින් සන්නද්ධ කිරීම සඳහා පෙර විගමණික පුහුණු වැඩසටහන් සිදු කරනු ලබයි. රැකියා නියුක්ති අවස්ථා වැඩි කිරීම සහ ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් සඳහා වූ එතෙර ඉල්ලුම වැඩි කිරීම සඳහා කුසලතා සංවර්ධන මූලපිරීම් වැඩි දියුණු කිරීම කෙරෙහි මෙහිද අවධානය යොමු කෙරේ.

- **සුභසාධන සහ ප්‍රත්‍යානුකරන සේවා:** ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වලට සහාය වීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සුභසාධන සේවා සපයයි. ප්‍රත්‍යානුකරණ වැඩසටහන් මඟින් නැවත පැමිණෙන විගමණික ශ්‍රමිකයින් සඳහා රටේ ආර්ථිකයට සහ සංවර්ධනයට ධනාත්මක ලෙස දායකත්වය ලබා දීමට සහාය වේ. ස්වයං රැකියා සඳහා මූල්‍ය ආධාර ප්‍රදානය කිරීම සහ ව්‍යවසායකත්වය දිරිමත් කිරීම සඳහා ප්‍රදේශීය මට්ටමේ පොලවල් සහ ජංගම සේවා වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම හරහා ජාතික සංවර්ධන මූලපිරීම් සඳහා සහාය දක්වයි. එවැනි මූලපිරීම් නීතිමය මාර්ග හරහා මුදල් යැවීම දිරිමත් කිරීමේ ක්‍රමවේදයක් ද වේ.

- **සහභාගීත්වය:** සමස්ත රාජ්‍ය ප්‍රවේශයක් (Whole of Government Approach) සහ සමස්ත සමාජ ප්‍රවේශයක් (Whole of Society Approach) හරහා කාර්යාංශයෙහි කොටස්කරුවන් සමඟ සම්බන්ධ වීම තුළින් විගමණික ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කරන අතරම තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී හවුල් වගකීම ප්‍රවර්ධනය කරයි.

- **පාලනය:** ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව අභ්‍යන්තර ක්‍රියා පටිපාටි අඛණ්ඩව ශක්තිමත් කිරීම සහ පාලන ව්‍යුහය සදාචාරාත්මක තීරණ ගැනීම සහ වගවීමෙන් සහ විනිවිදභාවයෙන් ක්‍රියාත්මක වන බව සහතික වීම කාර්යාංශයෙහි තිරසාර ගමන මෙහෙයවනු ලැබේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය මෙහෙයුම් කාර්යභාරය අනුව සිදු කරනු ලබන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම තුළින් හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ එහි කොටස්කරුවන් සමඟ වැඩි සම්බන්ධතාවයක් ඇති කර ගැනීම සඳහා ඩිජිටල් සේවා සහ මෙහෙයුම් පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් තිරසාර විදේශ රැකියා කළමනාකරණය සඳහා කැපවී සිටී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පාර්ශවකරුවන්

විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්

බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන

විදේශ බඳවාගැනීම් ආයතන සහ සේවායෝජකයන්

ILO, IOM, UN Women වැනි ජාත්‍යන්තර සංවිධාන

මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ජාල

කොළඹ ක්‍රියාවලිය, අබුඩාබි සංවාදය ආදි ජාත්‍යන්තර සංසද

වි.සේ.නි.කා සේවකයින් සහ වෘත්තිය සමිති

සංචාරක නියෝජිතයින්, ගුවන් සමාගම්, බැංකු සහ රාජ්‍ය නොවන සංවිධාන

රාජ්‍ය ආයතන


කාර්යාංශයට අනුබද්ධ ආයතනය
(ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය)


කම්කරු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් උපදෙස් අනුව සහ සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය ලබා ගැනීමට අනුකූලව 1996 දී ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම (SLFEA) ස්ථාපිත කරන ලදී. උනන්දුවක් දක්වන සහ සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය සඳහා පූර්ණ රාජ්‍ය මැදිහත්වීමකින් රැකියා අවස්ථා සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ රැකියා එජන්සි ආයතනය විදේශීය ආයතන සමඟ කටයුතු කරයි.

පිටත්වීමේ විස්තර – 2024 & 2023		
මාසය	2024	2023
ජනවාරි	29	21
පෙබරවාරි	30	57
මාර්තු	58	196
අප්‍රේල්	59	17
මැයි	36	43
ජූනි	33	25
ජූලි	44	74
අගෝස්තු	125	96
සැප්තැම්බර්	61	38
ඔක්තෝබර්	36	36
නොවැම්බර්	8	22
දෙසැම්බර්	19	34
එකතුව	**538**	**659**

මූල්‍ය තත්ත්වය

විස්තරය	2024 (රු.)	2023 (රු.)
මුළු ආදායම	279,981,268	314,890,111
මුළු වියදම	71,008,663	96,628,614
ලාභය	208,972,605	218,261,497





2024 දී විවිධ රටවල් හරහා සාර්ථක පිටත්වීම් 538 ක් ශ්‍රී ලංකා විදේශ රැකියා එජන්සිය විසින් වාර්තා කරන ලදී. මෙය 2023 දී පිටත්වීම් 659 ට වඩා සුළු අඩුවීමක් සනිටුහන් කළද, එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ සියලුම බඳවාගැනීම්වලදී අපේක්ෂකයින්ගේ ගුණාත්මකභාවය, අනුකූලතාවය සහ ස්ත්‍රී පුරුෂ සමතුලිතතාවය වැඩිදියුණු කිරීම කෙරෙහි ආයතනය අවධානය යොමු කිරීමයි. ඉහළම ගමනාන්ත අතරට රුසියාව (203) සහ සයිප්‍රසය (192) ඇතුළත් වූ අතර ඒවා ඒකාබද්ධව මුළු බඳවාගැනීම්වලින් 70% කට වඩා දායක විය. සිංගප්පූරුව (63) සහ රුමේනියාව (45) ද කැපී පෙනෙන ගමනාන්ත නියෝජනය කරයි. ස්ත්‍රී පුරුෂ භාවය දත්ත අනුව පිරිමින් 293 ක් සහ කාන්තාවන් 277 ක් සමඟ සමබර නියෝජනයක් පෙන්නුම් කළේය.

සදාචාරාත්මක බඳවා ගැනීම්, සේවායෝජක වගවීම සහ දිගුකාලීන රැකියා සුරක්ෂිතභාවය කෙරෙහි ප්‍රමුඛත්වය දීම තුළින් 2024 දී ප්‍රමාණාත්මකභාවයට වඩා ගුණාත්මකභාවයට ශ්‍රී ලංකා විදේශ රැකියා එජන්සියෙහි අවධානය යොමු වීම අවධාරණය කරයි. ඉදිරිය දෙස බැලීමේදී, විදේශීය එජන්සි ආයතන සහ රජයේ හවුල්කරුවන් සමඟ සබඳතා ශක්තිමත් කිරීම, පෙර විගමණික සහ වෘත්තීය පුහුණු වැඩසටහන් පුළුල් කිරීම, වඩා හොඳ විනිවිදභාවයක් සහ වේගවත් ක්‍රියාවලියක් සඳහා ඩිජිටල් පරිවර්තනය ඉහළ නැංවීම සහ අවදානම අඩු කිරීම සහ අවස්ථා වැඩි කිරීම සඳහා ගමනාන්ත රටවල් විවිධාංගීකරණය කිරීම කෙරෙහි ශ්‍රී ලංකා විදේශ රැකියා එජන්සිය අරමුණු කරයි.

අධ්‍යක්ෂ වර්තාව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2024 සඳහා අධ්‍යක්ෂ වාර්තාව සහ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඉදිරිපත් කරමු. මෙම වසර සැලකිය යුතු ජයග්‍රහණ සහ උපායමාර්ගික දියුණුවන් සනිටුහන් කළේය.

මූල්‍ය කාර්ය සාධනය

කාර්යාංශයෙහි මූල්‍ය කාර්ය සාධනය ස්ථාවරව පැවති ඇත. පසුගිය වසරට සාපේක්ෂව 17.5% ක ආදායමේ පහත වැටීමක් පෙන්නුම් කළද, රුපියල් බිලියන 10.6 ක වාර්තාගත ආදායමක් සමඟින් කාර්යාංශය සිය මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීමට සමත් වී ඇති අතර, මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් ආයෝජන ආදායමේ අඩුවීම හේතු විය. එසේම, මෙම වසර සඳහා මුළු වියදම රුපියල් බිලියන 7 ක් වූ අතර සේවක සුභසාධන අරමුදලේ, රැකියා ප්‍රවර්ධන සහ මෙහෙයුම් වියදම්වල වැඩි වීම හේතුවෙන් මෙය පසුගිය වසරට සාපේක්ෂව 37% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 2023 දී රුපියල් බිලියන 7.78 ක් වූ බදුවලට පෙර ලාභයට සාපේක්ෂව 2024 දී බදු ගෙවීමට පෙර ලාභය රුපියල් බිලියන 3.61 දක්වා අඩු වීමට මෙවා ප්‍රධාන ලෙස බලපාන ලදී. කාර්යාංශයෙහි පාලනයෙන් ඔබ්බට ආදායමට බලපාන සාධක සහ සුභසාධනය සහ ප්‍රවර්ධනය සම්බන්ධයෙන් එහි ව්‍යවස්ථාපිත බැඳීම් ඉටු කිරීම වැඩි කිරීමේ අවශ්‍යතාවය නිසා මෙම වැඩි වූ වියදමේ අවශ්‍යතාවය පැන නගින ලදී. සවිස්තරාත්මක මූල්‍ය ප්‍රකාශන ඇමුණුමේ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාර්යාංශයෙහි සියලුම මූල්‍ය ක්‍රියාකාරකම් සමාලෝචනය කර තක්සේරු කර ඇත. මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.02.20 දින අනුමත කරන ලදී.

ප්‍රධාන ජයග්‍රහණ

- **වාර්තාගත විදේශ රැකියා අවස්ථා**

  වසර ගණනාවක ආර්ථික අස්ථාවරත්වය සහ අභියෝගවලින් පසුව, 2024 වසරේදී විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම්වල ස්ථාවර ප්‍රගතියක් පෙන්නුම් කළ අතර, ලියාපදිංචි කිරීම් 314,786 ක් ලෙස වාර්තා විය. පශ්චාත් කොවිඩ් සහ ආර්ථික අර්බුදය යථා තත්ත්වයට පත්වීමත් සමඟ 2022 දී 311,056 සිට 2023 දී 297,656 දක්වා උච්චාවචනය වූ රැකියා සඳහා විදේශගත වීම් සංඛ්‍යාව, 2024 වසරේදී මෑත කාලයේ වාර්තාගත ඉහළම රැකියා සඳහා විදේශගත වීම් සංඛ්‍යාව ලෙස වාර්තා කරන ලදී. රැකියා සඳහා විදේශගත වීම්වලදී කාන්තාවන් පිටත්වීමේ සංඛ්‍යාව (40.7%) ට වඩා පිරිමි පිටත්වීමේ (59.3%) සංඛ්‍යාවේ වැඩිවීමක් ද පෙන්නුම් කල අතර එය ශ්‍රමිකයන් සඳහා වූ ඉල්ලුම සහ ශ්‍රී ලංකාවේ සංක්‍රමණයේ ප්‍රවණතාවයේ වෙනස්කම් පෙන්නුම් කරයි. 2024 වර්ෂයේ රැකියා සඳහා මුළු විදේශගත වීම් සංඛ්‍යාවෙන් 77.66% ක් අත්පත් කර ගනිමින් පුහුණු ශ්‍රමිකයින් ප්‍රමුඛ ස්ථානය ලබා ගැනිමත් අඩු කුසලතා සහිත ශ්‍රමිකයින් 22.34% ක් ලබා ගැනිමත් ඉස්මතු කරයි. කුවේට් රාජ්‍යය ප්‍රමුඛම ගමනාන්තය වූ අතර ඉන් අනතුරුව එක්සත් අරාබි එමීර් රාජ්‍ය සහ සෞදි අරාබිය ප්‍රමුඛ ගමනාන්ත විය.

- **රජයන් අතර බඳවා ගැනීම්වල වර්ධනය**

  ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දැනට ඊශ්‍රායලය, දකුණු කොරියාව සහ ජපානය සමඟ රජයන් අතර පවත්නා විධිවිධාන යටතේ ශ්‍රමියන් බඳවා ගැනීම සිදු කරයි. අඛණ්ඩ සහයෝගිතාවයෙන් හා සාකච්ඡාවලින් පසුව, 2024 දී ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යැවීම සඳහා ඊශ්‍රායල රජය සමඟ නව ප්‍රොටකෝල (protocols) තුනකට එළඹීමට කාර්යාංශය සමත් විය. 2023 වසර දක්වා, සාත්තු සේවා අංශය පමණක් ශ්‍රී ලංකාවට විවෘත පවතින ලදී. 2023 දී කෘෂිකර්මාන්තය සහ ඉදිකිරීම් අංශ විවෘත කිරීමත් සමඟ මුළු අංශ ගණන 03 දක්වා ඉහළ යන ලදී. 2024 දී, ශ්‍රී ලාංකිකයින් සඳහා හෝටල් ගෘහ පාලනය සහ පිරිසිදු කිරීම, නිෂ්පාදන සහ ආපනශාලා අංශ විවෘත කරමින් නව ප්‍රොටකෝල (protocols) 3 ක් අත්සන් කරන ලදී. අඛණ්ඩව රජයන් අතර මැදිහත්වීම හරහා ඊශ්‍රායලයේ සහ දකුණු කොරියාවේ තවත් අංශ විවෘත කිරීමට කාර්යාංශය අපේක්ෂා කරයි.

- **සේවාවන් පුළුල් කිරීම**

  2024 වර්ෂයේදී නුවරඑළිය, මොණරාගල සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල නව මධ්‍යස්ථාන තුනක් පිහිටුවීමත් සමඟ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය දේශීය ජාලය පුළුල් කර ඇති අතර එමඟින් දිස්ත්‍රික් මධ්‍යස්ථාන සංඛ්‍යාව 07 සිට 10 දක්වා නංවාලන ලදී.

- **සුභසාධන හා ආරක්ෂණ යාන්ත්‍රණයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති සංශෝධනය**

  විදේශ රැකියා අංශයේ පැන නැඟී එන අභියෝගවලට මුහුණ දීම සඳහා ප්‍රතිපත්ති සහ රෙගුලාසි සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම කෙරෙහි කාර්යාංශය ඉතා සුපරීක්ෂාකාරීව අවධානය යොමු කරන ලදී. එහි අරමුණ වූයේ විගමණික ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම සහ සදාචාරාත්මක බඳවා ගැනීම ප්‍රවර්ධනය කිරීමයි. ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින්ගේ සුභසාධනය තහවුරු කිරීමේ මෙහෙවර උදෙසා කාර්යාංශය නොසැලී කටයුතු කිරීමට හැකි විය.

  2024 දී, විදේශයන්හිදී සේවකයින්ට ඔවුන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ දැනුම ලබා දීම කෙරෙහි අවධානය යොමු කරමින් කාර්යාංශය රාජ්‍ය හා පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වයන් හරහා පෙර විගමණික පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, සුරාකෑම සහ ජාවාරම් ආශ්‍රිත සිදුවීම් විසඳීමට සහ අවම කිරීමට පියවර ගන්නා ලද අතර, ඒවාට අනුකූල නොවීම / උල්ලංඝනය කිරීම් සඳහා බලපත්‍ර අවලංගු කිරීම සහ වංචනික ක්‍රියාවන් වැළැක්වීම සඳහා දැඩි රෙගුලාසි ක්‍රියාත්මක කිරීම ආදී පියවරයන් ගන්නා ලදී. තවද 2024 වර්ෂයේදී විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා නව සුභසාධන සහ ප්‍රත්‍යානුකරණය කිරීමේ පහසුකම් / සේවාවන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.

උපායමාර්ගික මූලපිරීම් සහ අනාගත දැක්ම

අනාගත දැක්ම ලෙස, ශ්‍රී ලාංකිකයින් සඳහා විදේශ රැකියා අවස්ථා තවදුරටත් පුළුල් කිරීමට සහ විවිධ අංශ හරහා පුළුල් පරාසයක අවස්ථා ලබා දීම සඳහා රැකියා වෙළඳපොළ විවිධාංගීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට කාර්යාංශය කැපවී සිටී. 2024 වසරට සාපේක්ෂව 2025 වසර තුළ ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව වැඩි කිරීමට සැලසුම් සකස් වෙමින් පවතී. මෙම අභිලාෂකාමී ඉලක්කය සපුරා ගැනීමට සත්කාරක රටවල් සමඟ සහයෝගිතාවය වැඩි කිරීම තුලින් සහ ශ්‍රී ලාංකිකයින් සඳහා ගෝලීය වෙළඳපොළ පුළුල් කිරීම සඳහා අවශ්‍ය විශේෂඥතාව ලබා ගැනීම තුලින් අපේක්ෂා කරයි.

තාක්ෂණය හා ඉදිරියට යාමේ වැදගත්කම හඳුනා ගනිමින්, ක්‍රියාවලීන් වඩා හොඳින් විධිමත් කිරීම තුලින් සහ ශ්‍රමිකයින්ට සහ ආයතනවලට සේවාවන් සඳහා වඩාත් පහසුවෙන් ප්‍රවේශ වීමට ඉඩ සලසා දීම තුලින් සේවා සැපයීම වැඩිදියුණු කිරීම උදෙසා තාක්ෂණය භාවිතා කිරීම කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. තවද, සියලුම පාර්ශවකරුවන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීම සහ අවශ්‍ය කුසලතා සහ කාර්ය මණ්ඩල ධාරිතාව වර්ධනය කරමින් අඛණ්ඩ වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම කාර්යාංශයේ කැපවීමේ අනිවාර්ය අංගයක් ලෙස තවදුරටත් පවතී.

නියාමන අධිකාරියක් ලෙස, අභියෝග හඳුනා ගැනීම සහ එවැනි අභියෝග අවම කිරීමේ ක්‍රම පිළිබඳව නිසි අවධානය යොමු කිරීම සිදු කරයි. මෙය ශ්‍රී ලංකාව තුල ශ්‍රමිකයින් සුරාකෑම වැළැක්වීමේ නියාමන පියවරයන්ට පමණක් සීමා නොවන අතර විදේශයන්හි සේවය කරන අතරතුර ශ්‍රමිකයින් ආරක්ෂා කිරීම සහ ඉල්ලුම / අවස්ථා හඳුනා ගැනීම සඳහා වෙළඳපොළ ගවේෂණය කිරීම ද ඇතුලත් වේ.

වගකිවයුතු මහජනතාව සඳහා වූ ආයතනයක් ලෙස වගවීම සහ විනිවිදභාවය සහිත පාලනය කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරන්තර අවධානය යොමු කර ඇති බව ද සඳහන් කළ යුතුය.

අවසාන වශයෙන්, අපගේ සියලුම පාර්ශවකරුවන් සහ අපගේ කැපවූ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ නොසැලෙන සහයෝගය සහ කැපවීම වෙනුවෙන් අපගේ අවංක කෘතඥතාව පළ කිරීමට අපි කැමැත්තෙමු. අප වෙත පැවරී ඇති ප්‍රතිපත්තීන් තුළ දක්වා ඇති අරමුණට අනුකූලව සිටීමට සහ විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුභසාධනය සහ ආරක්ෂාව ශක්තිමත් කිරීමට සහ සෑමට අවස්ථා සහිත තිරසාර අනාගතයක් නිර්මාණය කිරීමට අප එක්ව කටයුතු කරමු.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

කෝශල වික්‍රමසිංහ
සභාපති

ජානක අධිකාරි
අධ්‍යක්ෂ

පාලන ව්‍යුහය

දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, 2009 අංක 56 සහ 1994 අංක 04 යටතේ සංශෝධිත 1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. විදේශ රැකියා ක්ෂේත්‍රය නියාමනය කිරීම, සුභසාධනය සහ ආරක්ෂාව සහතික කිරීම සහ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම එහි මූලික අරමුණු වේ. විවිධ පාර්ශ්වකරුවන්, ප්‍රතිපත්ති සහ මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් යාන්ත්‍රණ කාර්යාංශයෙහි පාලනයට ඇතුළත් වේ.

පාලන ව්‍යුහය

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ක්‍රියාත්මක වේ.

කාර්යාංශයෙහි පාලන ව්‍යුහය ප්‍රධාන කොටස් කිහිපයකින් සමන්විත වේ:

1. **අධ්‍යක්ෂ මණ්ඩලය:** කාර්යාංශය පාලනය කරනු ලබන්නේ විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයක් මගිනි. අධ්‍යක්ෂ මණ්ඩලයට මුදල් අමාත්‍යාංශය, කාන්තා කටයුතු අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, බලපත්‍රලාභී රැකියා නියෝජිතායතනවල නියෝජිතයින් සිව්දෙනෙකු සහ අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සිවදෙනෙකු ඇතුළත් වේ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ උපාය මාර්ගික දිශානතිය සැකසීම සහ එහි මෙහෙයුම් අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතු වේ.

2. **සභාපති:** අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් අතරින් විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් සාමාජිකයෙකු සභාපතිවරයා ලෙස පත් කරනු ලබන අතර ඔහු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවීම, නිල උත්සවවලදී කාර්යාංශය නියෝජනය කිරීම සහ කාර්යාංශයේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සභාපතිවරයාගේ වගකීම වේ.

3. **සාමාන්‍යාධිකාරී:** සාමාන්‍යාධිකාරීවරයා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර, කාර්යාංශයේ එදිනෙදා කළමනාකාරිත්වයේ වගකීම දරයි. සාමාන්‍යාධිකාරීවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරයි.

කාර්යාංශය විවිධ අංශ යටතේ සංවිධානය කර ඇති අතර, බඳවා ගැනීම්, සුභසාධනය, නීති කටයුතු, මුදල්, විදේශ සබඳතා, සමථකරණය, තොරතුරු තාක්ෂණ, පර්යේෂණ, ප්‍රත්‍යානුකරන, පුහුණු, සැලසුම්කරණය සහ පරිපාලනය සහ මානව සම්පත් වැනි විවිධ අංශ එක් එක් ක්‍රියාවන්ට වගකීම් දරයි. මෙම අංශ අතිරේක සාමාන්‍යාධිකාරීවරුන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ කළමනාකරුවන් විසින් ප්‍රධානත්වය දරමින් සාමාන්‍යාධිකාරී සහ සභාපති වෙත වාර්තා කරයි.

මූලික වටිනාකම්

ශ්‍රී ලාංකිකයින් සඳහා සදාචාරාත්මක, ආරක්ෂිත සහ ඵලදායී විදේශ රැකියා ප්‍රවර්ධනය කිරීමේ මෙහෙවර සමඟ කාර්යාංශයෙහි මූලික වටිනාකම් අනුකූල වේ:

(1) අඛණ්ඩතාව: විදේශ රැකියා නියුක්තියේදී සදාචාරාත්මක පිළිවෙත් ආරක්ෂා කිරීම සඳහා අපගේ සියලු ක්‍රියාමාර්ගවලදී අපි අවංකභාවය, වගවීම සහ විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන්නෙමු.

(2) සේවා විශිෂ්ටත්වය: විගමණික ශ්‍රමිකයින් සහ නියෝජිතායතන වෙත කාලෝචිත හා ගුණාත්මක සේවාවක් ලබා දීම තුළින් කාර්යක්ෂම, විශ්වාසදායක සහ ජනතාව කේන්ද්‍ර කරගත් සේවාවක් සැපයීමට අපි කැපවී සිටිමු.

(3) ආරක්ෂාව සහ සුභසාධනය: සංක්‍රමණයේ සෑම අදියරකදීම ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ දේශීයව හා විදේශීයන්හිදී සහාය සේවා සහ සහන යාන්ත්‍රණ සැපයීම තුළින් අපි ඔවුන්ගේ ආරක්ෂාව, ගෞරවය සහ යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙමු.

(4) වෘත්තීයභාවය: කාර්ය සාධනය සහ හැසිරීම සම්බන්ධයෙන් ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ දක්ෂ හා කුසලතා ඇති ශ්‍රම බලකායක් ප්‍රවර්ධනය කිරීම තුළින් අපි අපගේ හැසිරීම් වලදී නිපුණතාවය, වගකීම සහ ගෞරවය පෙන්නුම් කරමු.

(5) එක්ව: හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම තුළින් පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපි දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් පාර්ශවකරුවන් සමඟ එක්ව කටයුතු කරන්නෙමු.

(6) වගවීම: විනිවිදභාවයකින් යුක්ත මෙහෙයුම් සහ තීරණ ගැනීම සහ සම්පත් සහ අධිකාරී බලය වගකීමෙන් යුතුව භාවිතා කිරීම සහතික කිරීම තුළින් වගකිවයුතු මහජන නියෝජිතායතනයක් ලෙස අපගේ තීරණ, ක්‍රියාවන් සහ ඒවායේ ප්‍රතිවිපාකවල වගකීම අපි භාර ගනිමු.

(7) නවෝත්පාදනය: අපි වෙනස් වීම භාර ගන්නා අතර වඩා හොඳ සේවා සැපයීමක් සඳහා තාක්ෂණය උපයෝගී කර ගනිමින් සහ වෙනස් වන ගෝලීය ශ්‍රම වෙළඳපොළ ඉල්ලුමට අනුගත වීමෙන් විගමණික ශ්‍රමිකයින්ට සේවය කිරීමට වඩා හොඳ ක්‍රම සොයන්නෙමු.

ප්‍රධාන කාර්යයන් සහ වගකීම්

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ප්‍රධාන කාර්යයන් සහ වගකීම් කිහිපයක් ඇත:

1. **බඳවා ගැනීමේ නියෝජිතායතන නියාමනය:** ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විදේශගත කිරීම සඳහා සම්බන්ධ වන පෞද්ගලික බඳවා ගැනීමේ ආයතන නියාමනය කිරීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සිදු කරනු ලැබේ. මෙයට බලපත්‍ර ලබා දීම, අධීක්ෂණය කිරීම සහ කම්කරු නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම බලාත්මක කිරීම ඇතුළත් වේ.

2. **විදේශ රැකියා ප්‍රවර්ධනය:** රැකියා පොළවල්, විදේශීය සේවා යෝජකයින් සමඟ සහයෝගීතාවයන් සහ සත්කාරක රටවල් සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම් ඇතුළු විවිධ මුලපිරීම් හරහා ශ්‍රී ලාංකිකයින් සඳහා විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය කටයුතු කරයි.

3. **විගමණික ශ්‍රමිකයින්ගේ සුභසාධනය සහ ආරක්ෂාව:** ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින්ගේ සුභසාධනය සහ ආරක්ෂාව සහතික කිරීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූලික වගකීමකි. මෙයට පෙර විගමණික පුහුණුව, නීති ආධාර, හදිසි සහාය සහ නැවත මෙරටට ගෙන්වා ගැනීමේ සේවා සැපයීම ඇතුළත් වේ.

4. **දත්ත රැස් කිරීම සහ පර්යේෂණ:** ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සංක්‍රමණ ප්‍රවණතා, රැකියා රටා සහ ශ්‍රම වෙළඳපොළ ඉල්ලීම් පිළිබඳ දත්ත රැස් කර විශ්ලේෂණය කරයි. මෙම තොරතුරු ප්‍රතිපත්ති තීරණ දැනුම් දීමට සහ විදේශ රැකියා පාලනය වැඩිදියුණු කිරීමට යොදා ගනී.

5. **මහජන දැනුවත්භාවය සහ අධ්‍යාපනය:** විදේශ රැකියා අවස්ථා සහ අවදානම් පිළිබඳව විදේශ ගත වීමට අපේක්ෂාවෙන් සිටින විගමණික ශ්‍රමිකයින් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර සහ අධ්‍යාපනික වැඩසටහන් පවත්වයි.

පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තම වගකීම් ඉටු කිරීමේදී සියලුම කොටස්කරුවන් අත්‍යවශ්‍ය පාර්ශවකාරුවන් ලෙස සලකයි. නිරන්තර සංවාද හරහා පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වීම තුලින්, අභියෝග හඳුනා ගැනීමට සහ අභියෝග අවම කර ගැනීමට මෙන්ම නැගී එන ප්‍රමුඛතා හඳුනා ගැනීමට කාර්යාංශයට හැකියාව ලැබේ.

විවිධ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වීමේදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමස්ත රාජ්‍ය ප්‍රවේශයක් සහ සමස්ත සමාජ ප්‍රවේශයක් අනුගමනය කරයි. සමස්ත රාජ්‍ය ප්‍රවේශයේ මූලධර්මය අනුගමනය කරනු ලබන්නේ සංක්‍රමණය යනු විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු එක්ව සාක්ෂාත් කර ගත යුතු බහුමාන යථාර්ථයක් බව පිළිගනිමිනි.

සංක්‍රමණ ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා ජාත්‍යන්තර සංවිධාන, සමාජ හවුල්කරුවන්, රැකියා නියෝජිතායතන, පර්යේෂණ ආයතන සහ අනෙකුත් පෞද්ගලික අංශයේ ආයතන සමඟ සම්බන්ධ වීමෙන් කාර්යාංශය සමස්ත සමාජ ප්‍රවේශයක් අනුගමනය කරයි. මෙම ද්විත්ව ප්‍රවේශය මඟින් විදේශ රැකියා කළමනාකරණය කිරීම සඳහා කාර්යාංශය සමස්ත ප්‍රවේශගතවීමක් සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් අනුගමනය කරන බව සහතික කරයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි විගණන සහ කළමනාකරණ කමිටුව

ජාතික විගණන පනතේ 41 වන වගන්තියට අනුව, සෑම අමාත්‍යාංශයකම, දෙපාර්තමේන්තුවකම සහ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ගැසට් පත්‍රයේ පළ කර ඇති අනෙකුත් ආයතන විගණන සහ කළමනාකරණ කමිටුවක් පිහිටුවීම අනිවාර්ය වේ. එබැවින්, ජාතික විගණන පනතේ 41(2) වගන්තියේ සඳහන් සෑම විගණන ආයතනයක් සඳහාම විගණන සහ කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. (කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2025).

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විගණන සහ කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

සභාපති	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (භාණ්ඩාගාර නියෝජිත)
සාමාජික	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
සාමාජික	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
නිරීක්ෂක	-	ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයකු
කැඳවුම්කරු	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර විගණන)

ජාතික විගණන පනතේ 41 වන වගන්තියට අනුව, "විගණනය කරනු ලබන ආයතනයේ සියලු විගණන සහ කළමනාකරණ අංශ සමාලෝචනය කර, එහි සම්පත් සමස්තයක් ලෙස එම ආයතනයේ පූර්ව නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හෝ ශ්‍රී ලංකාවේ පවතින සම්පත් වලට ප්‍රමුඛත්වය දෙමින් සිදු කරනු ලබන කිසියම් නිශ්චිත ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් සම්බන්ධයෙන් ආර්ථික වශයෙන් සහ කාර්යක්ෂමව භාවිතා කරන බව සහතික කිරීම" සිදු කරයි.

විගණන සහ කළමනාකරණ කමිටුව කාර්යාංශයෙහි පාලන රාමුවට හේතු කිහිපයක් නිසා අත්‍යවශ්‍ය වේ:

- **මූල්‍ය අඛණ්ඩතාව වැඩි දියුණු කිරීම**: මූල්‍ය වාර්තාකරණ සහ විගණන ක්‍රියාවලීන් අධීක්ෂණය කිරීමෙන්, කමිටුව කර්යාංශයෙහි මූල්‍ය ප්‍රකාශනවල නිවරදෘ හා විශ්වාසනීය බව සහතික කිරීමට උපකාරී වේ.
- **කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම**: මෙහෙයුම් සහ කළමනාකරණ කාර්ය සාධනය පිළිබඳ නිරන්තර සමාලෝචනය කිරීම හරහා, කමිටුව වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගනිමින්, වඩාත් කාර්යක්ෂම හා ඵලදායී මෙහෙයුම් සඳහා දායක වේ.
- **අවදානම් අවම කිරීම**: අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනයන් කෙරෙහි කමිටුවේ අවධානය, කාර්යාංශයෙහි මෙහෙවර සහ අරමුණු කෙරෙහි බලපෑම් ඇති කළ හැකි අවදානම් අවම කිරීමට උපකාරී වේ.
- **වගවීම සහතික කිරීම**: විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීමෙන්, කමිටුව කාර්යාංශය තුළ අඛණ්ඩතාව සහ සදාචාරාත්මක හැසිරීම් සංස්කෘතියක් පෝෂණය කරයි.

2024 වර්ෂය තුළ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී.

ආයතනික සමාජීය වගකීම් වාර්තාව

ආයතනික සමාජීය වගකීම කාර්යාංශයට පැවරී ඇති අංගවලින් කොටසකි. විගමණික ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබා දීමේ වගකීම කාර්යාංශය සතුය.

ආයතනික සමාජීය වගකීම් වැඩසටහන් මගින් ප්‍රජාවේ සහභාගීත්වය වැඩි දියුණු කරන අතර ඊට මග පාදයි. මෙම වැඩසටහන් බිම් මට්ටමේ දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දෘශ්‍යතාව වැඩි කරන අතර ඕනෑම ගැටලුවක් හෝ උත්සුකයක් පිළිබඳව සෘජුවම තොරතුරු ලබා ගැනීමට අවස්ථාව ලබා ගනිමින් ප්‍රදේශයේ ප්‍රජාවන් සමඟ හවුල්කාරිත්වය ශක්තිමත් කරයි. තවද, ආයතනික සමාජීය වගකීම් වැඩසටහන් තිරසාර සංවර්ධනයට දායක වේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කර්තව්‍යයට අනුකූලව ක්‍රියාත්මක වන ආයතනික සමාජීය වගකීම් මූලපිරීම්

1. විගමණික ශ්‍රමිකයින්ගේ සුභසාධනය සහ ප්‍රත්‍යානුකරණය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විධිවිධානයන්ට අනුකූලව පවත්වනු ලබන පහත සඳහන් වැඩසටහන් හරහා ප්‍රතිලාභ ලබන්නේ විගමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් පමණි.

- රක්ෂණ ආවරණය, හදිසි අවස්ථාවල නැවත මෙරටට ගෙන්වා ගැනීමේ ආධාර සහ නීති ආධාර ඇතුළු සුභසාධන යෝජනා ක්‍රියාත්මක කිරීම.
- කාර්යාංශයේ ලියාපදිංචි විගමණික ශ්‍රමිකයින්ගේ දුදරුවන්ට ශිෂ්‍යත්ව සහ පාසල් උපකරණ ලබා දීම.
- ආපදා අවස්ථාවන්හිදී විගමණික ශ්‍රමිකයින්ගේ පවුල්වලට සහාය වීම.
- වෛද්‍ය කඳවුරු පැවැත්වීම.
- ස්වයං රැකියා සඳහා ද්‍රව්‍යමය සහාය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා මූල්‍ය ප්‍රදාන ලබා දීම.
- විගමණික ශ්‍රමිකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ පොළවල් සංවිධානය කිරීම සහ ව්‍යවසායකයින් වීමට අපේක්ෂා කරන අය සඳහා තාක්ෂණික හා ආයතනික සහාය ලබා දීම සඳහා ජංගම සේවා සංවිධානය කිරීම.
- පීඩාවට පත්ව නැවත පැමිණෙන ශ්‍රමිකයින්ට සහාය වීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ ආසන්නයේ සහන පියස නමින් සුභසාධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සහ ගැටලු විසඳන තෙක් හෝ නැවත මෙරටට ගෙන්වා ගන්නා තෙක් තාවකාලික නවාතැන් සහ මූලික අවශ්‍යතා සැපයීම සඳහා කාන්තා විගමණික ශ්‍රමිකයින් සඳහා ශ්‍රී ලංකා දූත මණ්ඩල කම්කරු හා සුභසාධන අංශවල අවශ්‍ය ස්ථානවල නවාතැන් ක්‍රියාත්මක කිරීම.

2. සදාචාරාත්මක බඳවා ගැනීම් සහ සේවක ආරක්ෂාව

- ආරක්ෂිත සංක්‍රමණය, විදේශයන්හිදී අයිතිවාසිකම් සහ නීතිවිරෝධී සංක්‍රමණයේ සහ මිනිස් ජාවාරමේ අනතුරුභාවයන් පිළිබඳව දීපව්‍යාප්ත දැනුවත් කිරීමේ ව්‍යාපාර පවත්වයි.
- සෞඛ්‍යය, නීතිමය අයිතිවාසිකම්, මූල්‍ය සාක්ෂරතාවය සහ සංස්කෘතික අනුවර්තනය පිළිබඳව ශ්‍රමිකයින් දැනුවත් කරන පෙර විගමණික පුහුණු වැඩසටහන් පිරිනමයි.
- රැකියා නියුක්තිය වැඩි කිරීම සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා සහාය වීම
- නීති විරෝධී බඳවා ගැනීම් වැළැක්වීම සඳහා දැඩි අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.

ප්‍රජාව වෙත සිදු කරන ආයතනික සමාජීය වගකීම් වැඩසටහන්

ප්‍රජාව සමඟ පුළුල් සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට සහ විගමණික ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වලට පමණක් නොව සමස්ත ප්‍රජාවටම දායක වීමට දරන උත්සාහයේ කොටසක් ලෙස, විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන පාසල්වල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් වෙන්වූ ආයතනික සමාජීය වගකීම් වැඩසටහනක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ක්‍රියාත්මක කරන ලදී.

අවශ්‍ය අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමත් සමඟ, අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහාය ඇතිව, විගමණික ශ්‍රමිකයින්ගේ දරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන පාසල්වලට සුහුරු පන්ති කාමර කට්ටල බෙදා දෙන ලදී. මෙම ඉලක්කගත ව්‍යාපෘතිය මඟින් පාසල්වලට උසස් තාක්ෂණය තුළින් වූ අධ්‍යාපනයට දරුවන්ට නිරාවරණය කිරීම සඳහා සහාය වීම අපේක්ෂා කෙරේ.

බෙදා දෙන ලද සුහුරු පන්ති කාමර කට්ටල ගණන	වියදම රු.
322 -	189,942,004

පවරන ලද වගකීමෙන් ඔබ්බට ගිය ආයතනික සමාජීය වගකීම් - මහජන සෞඛ්‍ය ආරක්ෂාව සහතික කිරීම සඳහා දායක වීම.

බත්තරමුල්ල සෞඛ්‍ය අමාත්‍යාංශය සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් ප්‍රදේශයේ රජයේ සහ පෞද්ගලික කාර්යාලවල සහභාගීත්වයෙන් මාසික ඩෙංගු මර්දන වැඩසටහන් පවත්වනු ලැබේ. පෙබරවාරි මාසය (2024.02.29) සහ ඔක්තෝබර් මාසය (2024.10.25) සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අනුග්‍රහකත්වය ලබා දෙන ලදී. මෙම වැඩසටහනේදී, විවිධ ආයතන නියෝජනය කරමින් සහභාගී වන නිලධාරීන්, ප්‍රදේශයේ විවිධ ප්‍රදේශ ආවරණය වන පරිදි ඩෙංගු අවදානම් ප්‍රදේශ නිරීක්ෂණය කිරීම සඳහා කණ්ඩායම් වලට බෙදා වෙන් කරනු ලබයි. පෙබරවාරි මාසයේ වැඩසටහන සඳහා 72 ක් සහභාගී වූ අතර ඔක්තෝබර් මාසයේ වැඩසටහන සඳහා 45 ක් සහභාගී වූහ.



අවදානම් විශ්ලේෂණ වාර්තාව

විදේශ රැකියා අංශය සාමාන්‍යයෙන් භූගොලීය දේශපාලනික වෙනස්කම් සහ අභියෝග රාශියකට ශ්‍රී ලංකාව තුළ මෙන්ම සත්කාරක රටවලවල් තුළ මුහුණ දෙයි.

(1) ආර්ථික හා භූගෝලීය දේශපාලනික අවදානම්

සත්කාරක රටවල ආර්ථික තත්ත්වයන් හේතුවෙන් හෝ විගමණික ශ්‍රමිකයින් විසින් කලින් ආධිපත්‍යය දැරූ අංශවලට එම රටෙහි සේවකයින් සංඛ්‍යාව වැඩි කිරීම සහ විගමනික ශ්‍රමිකයින් බඳවා ගැනීම සඳහා සීමාවන් යෙදීම වැනි සත්කාරක රටවල අභ්‍යන්තර නියාමනය කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් ශ්‍රමය සඳහා වන ගෝලීය ඉල්ලුම උච්චාවචනය වීම ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා ඇති ඉල්ලුමට සැලකිය යුතු ලෙස බලපෑම් ඇති කරයි. ඊට අමතරව සත්කාරක රටවල දේශපාලන අස්ථාවරත්වය සහ යුදමය තත්වයන් ද සාමාන්‍ය සංක්‍රමණික රටාවන්ට බලපෑම් හෝ බාධා කිරීම් සිදු කරයි.

අවම කිරීමේ උපාය මාර්ගය:ගෝලීය ශ්‍රම වෙළඳපොළවල් හරහා ශ්‍රම වෙළඳපොළ විවිධාංගීකරණය කිරීමට සහ නව අංශ සොයා ගැනීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අඛණ්ඩව උත්සාහ කරයි. මේ සඳහා විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සහාය ඇතිව නිතිපතා වෙළඳපල සමීක්ෂණ සහ ඉලක්කගත ප්‍රවර්ධන ක්‍රියාකාරකම් පවත්වනු ලැබේ. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වයන් තුළින් තරහකාරිත්වය වැඩි කිරීම සඳහා කුසලතා පදනම් කරගත් පුහුණු සහ භාෂා නිපුණතාවය කෙරෙහි ද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අවධානය යොමු කරයි. භූගෝලීය දේශපාලනික අවිනිශ්චිතතාවයන් සම්බන්ධයෙන්, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සහාය ඇතිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හදිසි සැලසුම් ස්ථාපිත කරයි.

(2) නියාමන සහ අනුකූලතා අවදානම

රැකියා සොයන්නන් සුරාකෑම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මුහුණ දෙන අඛණ්ඩ අභියෝගයක් වී තිබේ.

අවම කිරීමේ උපායමාර්ගය:මහජනතාව දැනුවත් කිරීම වැඩි කිරීම සඳහා ආරක්ෂිත සහ සාමාන්‍ය සංක්‍රමණය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ප්‍රමුඛත්වය දෙන අතර රැකියා නියෝජිතායතන සඳහා අනුකූලතා පියවර වැඩි දියුණු කිරීමට පියවර ගනී.

(3) මෙහෙයුම් අවදානම

පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාව කොවිඩ් වසංගත තත්ත්වය සහ ඉන්පසුව ඇති වූ මූල්‍ය අර්බුදය හේතුවෙන් ආර්ථික අභියෝගවලට මුහුණ දෙන ලදී. කොවිඩ් 19 වසංගතය සංක්‍රමණයට පමණක් නොව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන ආදායමට ද බලපෑම් එල්ල කරන ලදී. තවද, රුපියල අවප්‍රමාණය වීම සහ ඉහළ උද්ධමන අනුපාත ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සමස්ත මෙහෙයුම් වියදම් වැඩිවීමට බලපෑම් සිදු කරන ලදී.

අවම කිරීමේ උපාය මාර්ගය: භාණ්ඩාගාරය මත යැපීමෙන් තොරව, නිසි ආයෝජන කළමනාකරණය තුළින්, එවැනි අභියෝග මධ්‍යයේ වුවද, ශක්තිමත්ව සිටීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට හැකියාව ලැබී ඇත. ස්ථාවර තැන්පතු සඳහා බැංකු විසින් ලබා දෙන අඩු පොලී අනුපාතයන් නිසා ආයෝජන ආදායම අභියෝගයට ලක් වුවද, උපායමාර්ගික ආයෝජන විවක්ෂණශීලීව සිදු කිරීම හේතුවෙන් දුෂ්කර මූල්‍ය කාලවලදී යම් මූල්‍ය ස්ථාවරත්වයක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට හැකියාව ලැබී ඇත.

(4) සේවා සැපයීමේ අවදානම

ක්‍රියා පටිපාටික හිඩැස් හෝ අවශ්‍ය සම්පත් ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන්, පීඩාවට පත් ශ්‍රමිකයින්ට කාලෝචිත ආධාර සැපයීමේදී අභියෝග අත්විඳිය හැකි අතර එය අතෘප්තියට හෝ මහජන විවේචනයට හේතු විය හැක. තවද, තාක්ෂණය මත වැඩි වැඩියෙන් රඳා පැවතීම නිසා කාර්යාංශය සඳහා පමණක් නොව, ඕනෑම ආයතනයකට, සයිබර් ආරක්ෂණ අවදානම ප්‍රධාන අභියෝගයක් ලෙස පවතී.

අවම කිරීමේ උපාය මාර්ගය:කාර්යක්ෂම සේවා සැපයීම අඛණ්ඩව සහතික කිරීම සඳහා හිඩැස් සහ අවශ්‍ය සම්පත් හඳුනා ගැනීම සඳහා කාර්යාංශය එහි අභ්‍යන්තර තත්ත්ව පාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට පියවර ගනී. පද්ධති ආරක්ෂාව තහවුරු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ආරක්ෂක ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම කෙරෙහි තවදුරටත් විශේෂ අවධානයක් යොමු කෙරේ.

(5) සමාජ අවදානම

සමාජ මාධ්‍ය භාවිතය වැඩිවීමත් සමඟ ඕනෑම කරුණක් මහජනතාව අතර ඉමහත් අවධානයක් දිනා ගත හැකි අතර එහි බලපෑම වැඩි කළ හැකිය. නිරන්තරයෙන් මහජන අවධානයට ලක්වන ආයතනයක් වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ද මහජන සංජානන සහ ආඛ්‍යාන ආමන්ත්‍රණය කිරීමේ අභියෝගවලට මුහුණ දෙයි.

අවම කිරීමේ උපාය මාර්ගය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, සමථකරණ ක්‍රියාවලිය හරහා බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන හරහා ශ්‍රී ලංකාව තුල ද, විදේශයන්හිදි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල රැකියා සහ සුභසාධන අංශ හරහා ද ක්ෂණිකව සහය ලබා දීම සහතික කරයි. තවද, මහජනතාව වෙත චාර්තාකරණ යාන්ත්‍රණයන් හරහා මෙහෙයුම්වල විනිවිදභාවය වැඩි දියුණු කිරීමට පියවර ගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන



ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය

	සටහන්	සමූහය 2024 රු.	සමූහය(නැවත ප්‍රකාශ කල) 2023 රු.	ශ්‍රී. ල. වි. සේ. නි. කා 2024 රු.	ශ්‍රී. ල. වි. සේ. නි. කා 2023 රු.
ආදායම්	4	8,442,841,628	8,744,674,946	8,386,070,959	8,091,528,684
වෙනත් ආදායම්	5	632,508,286	2,068,932,743	449,162,788	1,996,377,471
		9,075,349,914	**10,813,607,688**	**8,835,233,747**	**10,087,906,155**
වියදම්					
කාර්ය මණ්ඩල පිරිවැය	6	2,472,321,338	1,907,458,069	2,436,529,425	1,875,674,039
ආයතනික වියදම්	6	967,133,597	793,474,961	957,774,345	782,066,919
මෙහෙයුම් වියදම්	6	763,553,763	1,021,736,008	747,983,310	528,896,940
දැන්වීම් හා ප්‍රචාරණ	6	165,613,825	115,428,265	165,185,616	115,428,265
ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්	6	583,424,692	98,735,800	574,430,837	82,177,391
සුභ සාධන වෙනත් වියදම්	6	1,311,766,003	1,036,249,283	1,311,766,003	1,036,249,283
මූල්‍ය සහ වෙනත් වියදම්	6	828,780,993	707,647,444	827,682,621	698,981,723
		7,092,594,210	**5,680,729,831**	**7,021,352,156**	**5,119,474,559**
මූල්‍ය ආදායම්	7	1,844,249,401	2,869,317,181	1,804,150,908	2,815,501,918
		1,844,249,401	**2,869,317,181**	**1,804,150,908**	**2,815,501,918**
බදු වලට පෙර ලාභ/(අලාභ)		**3,827,005,104**	**8,002,195,039**	**3,618,032,499**	**7,783,933,513**
බදු වියදම්	8	448,041,321	2,922,530,034	384,373,046	2,856,353,884
බදු ගෙවීමෙන් පසු ලාභය		**3,378,963,784**	**5,079,665,005**	**3,233,659,454**	**4,927,579,629**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සමූහය	සමූහය(නැවත ප්‍රකාශ කල)	ශ්‍රී. ල. වි. සේ. නි. කා	ශ්‍රී. ල. වි. සේ. නි. කා
	2024	**2023**	**2024**	**2023**
	රු.	රු.	රු.	රු.
බදු ගෙවීමෙන් පසු ලාභය	3,378,963,784	5,079,665,005	3,233,659,454	4,927,579,629
වෙනත් විස්තීරණ ආදායම්				
පශ්චාත් සේවක ප්‍රතිලාභ මත ආයු ගණක (ලාභ /අලාභ)	(73,397,417)	(63,422,020)	(73,010,628)	(62,490,701)
ආයු ගණක (ලාභ /අලාභ) මත කල්දැමූ බද්ද	21,903,188	(18,747,210)	21,903,188	(18,747,210)
ප්‍රත්‍යාගණන ලාභය මත වූ කල්බදු බලපෑම	-	180,278,756	-	180,278,756
ප්‍රත්‍යාගණන අතිරික්තය	26,812,212	3,100,403,545	26,812,212	3,100,403,545
වර්ෂය සඳහා වූ වෙනත් මුලු විස්තීර්ණ ආදායම් (බදු ශුද්ධ)	**(24,682,017)**	**3,198,513,071**	**(24,295,228)**	**3,199,444,390**
වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම්	**3,354,281,767**	**8,278,178,076**	**3,209,364,226**	**8,127,024,019**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2024 දෙසැම්බර් 31 දිනට

	සටහන්	සමූහය	සමූහය (නැවත ප්‍රකාශ කල)	ශ්‍රී. වි. සේ. නි. කා	ශ්‍රී. වි. සේ. නි. කා
වත්කම්		**2024**	**2023**	**2024**	**2023**
ජංගම නොවන වත්කම්		රු.	රු.	රු.	රු.
අස්පෘශ්‍ය වත්කම්	9	10,871,712	13,719,623	10,871,712	13,719,623
භාවිතය සඳහා අයිතිය ඇති වත්කම්	10.1	935,005,020	410,675,000	935,005,020	410,675,000
දේපළ පිරියත සහ උපකරණ	10.2	3,104,627,040	3,974,502,008	3,029,087,378	3,896,357,527
අනුබද්ධිත ආයෝජන	11	-	-	5,000,000	5,000,000
කාර්යය මණ්ඩල ණය	12.1	380,609,070	326,202,314	380,609,070	326,202,314
පෙර ගෙවුම් කාර්යය මණ්ඩල ණය	12.2	128,562,128	143,067,851	128,562,128	143,067,851
කල්දැමූ බදු වත්කම්	18.1	-	-	-	-
කෙරීගෙන යන වැඩ - ගොඩනැගිලි	10.3	4,621,324	4,621,324	4,621,324	4,621,324
		4,564,296,294	**4,872,788,120**	**4,493,756,632**	**4,799,643,639**
ජංගම වත්කම්					
තොගය	14	125,614,391	17,702,992	125,341,976	17,430,577
ජංගම මූල්‍යය වත්කම්	13	20,540,210,355	18,007,019,837	20,170,925,300	17,704,811,447
කාර්යය මණ්ඩල ණය	12.1	149,711,680	125,272,252	130,603,262	118,444,876
පෙර ගෙවුම් සහ ලැබිය යුතු දේ	15	2,300,451,054	2,801,526,345	2,262,244,323	2,759,375,261
විවිධ අත්තිකාරම්		18,703,398	18,252,967	18,688,398	18,252,967
මුදල් සහ මුදල් සමාන දෑ	16	3,231,140,270	2,568,783,243	3,093,574,346	2,486,126,028
		26,365,831,148	**23,538,557,636**	**25,801,377,605**	**23,104,441,156**
මුලු වත්කම්		**30,930,127,442**	**28,411,345,756**	**30,295,134,237**	**27,904,084,795**
හිමිකම් සහ වගකීම්					
හිමිකම්					
ප්‍රාග්ධනය		691,161,789	691,161,789	691,161,789	691,161,789
සමුච්චිත අරමුදල්		18,820,814,541	15,357,240,813	18,385,636,911	15,063,935,460
ප්‍රත්‍යාගණන සංචිතය		3,193,383,103	3,166,570,891	3,168,929,103	3,142,116,891
සම්පූර්ණ හිමිකම්		**22,705,359,433**	**19,214,973,492**	**22,245,727,803**	**18,897,214,140**
ජංගම නොවන වගකීම්					
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම	3.11	480,265,866	365,737,360	471,877,503	359,049,935
කුවේට් වන්දි මුදල් සංචිතය	20	5,095,184,517	5,189,259,131	5,095,184,517	5,189,259,131
ප්‍රදාන	24	546,235	819,353	546,235	819,353
කල්බදු වගකීම්		-	-	-	-
		5,575,996,618	**5,555,815,844**	**5,567,608,255**	**5,549,128,419**
ජංගම වගකීම්					
බදු	18.2	252,111,832	1,266,340,750	190,477,384	1,201,858,089
නියෝජිතායතන ණය හිමියෝ		419,393,495	371,520,271	421,362,764	373,132,590
උපචිත වියදම්		338,434,838	176,382,319	329,705,874	176,382,319
විවිධ ණය හිමියෝ සහ ණයගැනීම්	19	1,226,245,992	898,952,937	1,128,645,399	780,453,990
බදු වගකීම්		-	54,803,488	-	54,803,488
සංක්‍රමණික සේවකයින්ගේ දායකත්වය		12,833,402	12,118,703	12,833,402	12,118,703
කල්බදු	18.1	399,735,772	860,421,893	398,773,355	858,993,057
ගෙවිය යුතු ලාභාංශ බදු		16,059	16,059	-	-
		2,648,771,391	**3,640,556,419**	**2,481,798,178**	**3,457,742,236**
සම්පූර්ණ හිමිකම් සහ වගකීම්		**30,930,127,442**	**28,411,345,756**	**30,295,134,237**	**27,904,084,795**

පිටු 09 සිට 57 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන 2024.02.25 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
ඩබ්. ඒ. කේ. කුමාරි

කෝශල වික්‍රමසිංහ
සභාපති

අධ්‍යක්ෂ

ජානක අධිකාරී

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ අරමුදල සහ සුභසාධක අරමුදල (WWF)
අතර මූල්‍ය තත්ත්වය ප්‍රකාශය වෙන් කිරීම
2024 දෙසැම්බර් 31 දිනට

	සටහන්	ශ්‍රී. වි. සේ. නි. කා 2024 Rs.	ශ්‍රී. වි.සේ. නි. කා 2023 Rs.	කාර්යාංශයේ අරමුදල 2024 Rs.	කාර්යාංශයේ අරමුදල 2023 Rs.	සුභ සාධන අරමුදල 2024 Rs.	සුභ සාධන අරමුදල 2023 Rs.
වත්කම්							
ජංගම නොවන වත්කම්							
අස්පෘශ්‍ය වත්කම්	9	10,871,712	13,719,623	10,871,712	13,719,623	-	-
භාවිතය සඳහා අයිතිය ඇති වත්කම්	10.1	935,005,020	410,675,000	935,005,020	410,675,000	-	-
දේපළ පිටියන සහ උපකරණ	10.2	3,029,087,378	3,896,357,527	2,567,282,412	3,581,492,413	461,804,965	314,865,114
අනුමෝදිත ආයෝජන	11	5,000,000	5,000,000	5,000,000	5,000,000	-	-
කාර්යය මණ්ඩල ණය	12.1	380,609,070	326,202,314	380,609,070	326,202,314	-	-
පෙර ගෙවුම් කාර්යය මණ්ඩල ණය	12.2	128,562,128	143,067,851	128,562,128	143,067,851	-	-
කෙරිගෙන යන වැඩ - ගොඩනැගිලි	10.3	4,621,324	4,621,324	4,621,324	-		4,621,324
		4,493,756,632	**4,799,643,639**	**4,031,951,666**	**4,480,157,202**	**461,804,965**	**319,486,438**
ජංගම වත්කම්							
තොගය	14	125,341,976	17,430,577	19,049,476	17,430,577	106,292,500	-
ජංගම මූල්‍ය වත්කම්	13	20,170,925,300	17,704,811,447	571,375,095	1,274,983,147	19,599,550,206	16,429,828,300
කාර්යය මණ්ඩල ණය	12.1	130,603,262	118,444,876	130,603,262	118,444,876	-	-
ලැබිය යුතු සුභසාධන අරමුදල		-	-	3,235,400,626	2,906,376,070	-	-
පෙර ගෙවුම් සහ වෙනත් ලැබිය යුතු දේ	15	2,262,244,323	2,759,375,261	182,412,491	232,294,053	2,079,831,832	2,527,081,208
විවිධ අත්තිකාරම්		18,688,398	18,252,967	1,770,868	3,145,991	16,917,531	15,106,976
මුදල් සහ මුදල් සමාන දෑ	16	3,093,574,346	2,486,126,028	2,164,207,229	722,869,364	929,367,117	1,763,256,663
		25,801,377,605	**23,104,441,156**	**6,304,819,046**	**5,275,544,078**	**22,731,959,186**	**20,735,273,147**
මුලු වත්කම්		**30,295,134,237**	**27,904,084,795**	**10,336,770,711**	**9,755,701,280**	**23,193,764,152**	**21,054,759,585**
නිමිකම් සහ වගකීම්							
නිමිකම්							
ප්‍රාග්ධනය		691,161,789	691,161,789	691,161,789	691,161,789	-	-
සමුච්චිත අරමුදල්		18,385,636,911	15,063,935,460	3,809,157,891	2,330,958,887	14,576,479,019	12,732,976,573
ප්‍රතිඅගණන සංචිතය		3,168,929,103	3,142,116,891	3,238,377,614	3,212,912,871	(69,448,511)	(70,795,980)
සම්පූර්ණ නිමිකම්		**22,245,727,804**	**18,897,214,140**	**7,738,697,294**	**6,235,033,547**	**14,507,030,508**	**12,662,180,593**
ජංගම නොවන වගකීම්							
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	3.11	471,877,503	359,049,935	471,877,503	359,049,935	-	-
කුවේට් වන්දි සංචිතය	20	5,095,184,517	5,189,259,131	-	-	5,095,184,517	5,189,259,131
ප්‍රදාන	24	546,235	819,353	546,235	819,353	-	-
බදු වගකීම්		-	-	-	-	-	-
		5,567,608,255	**5,549,128,419**	**472,423,738**	**359,869,288**	**5,095,184,517**	**5,189,259,131**
ජංගම වගකීම්							
බදු	18.2	190,477,384	1,201,858,089	190,477,384	1,201,858,089	-	-
නියෝජිතායතන ණය නිමියෝ		421,362,764	373,132,590	421,362,764	373,132,590	-	-
කාර්යාංශයට ගෙවිය යුතු මුදල්		-	-	-	-	3,235,400,626	2,906,376,070
උපචිත වියදම්		329,705,874	176,382,319	232,840,274	176,382,319	96,865,600	-
විවිධ ණය නිමියෝ සහ ණය ගැනීම්	19	1,128,645,399	780,453,990	882,195,900	495,628,901	246,449,499	284,825,089
විලම්බිත බදු වත්කම්	18.1	398,773,356	858,993,057	398,773,356	858,993,057		
බදු වගකීම්		-	54,803,487.69	-	54,803,488	-	-
සංක්‍රමණික සේවකයින්ගේ දායකත්වය		12,833,402	12,118,702	-	-	12,833,401	12,118,702
		2,481,798,178	**3,457,742,236**	**2,125,649,679**	**3,160,798,444**	**3,591,549,126**	**3,203,319,861**
සම්පූර්ණ නිමිකම් සහ වගකීම්		**30,295,134,237**	**27,904,084,795**	**10,336,770,711**	**9,755,701,280**	**23,193,764,152**	**21,054,759,585**

පිටුව 09 සිට 57 පිටුවදක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන 2024.02.25 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
ඩබ්. ඒ. කේ. කුමාරි

කෝශල වික්‍රමසිංහ
සභාපති

අධ්‍යක්ෂ

ජාතික අධිකාරී

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

		සමූහය 2024 රු.	සමූහය 2023 රු.	ශ්‍රී. වි.සේ. නි. කා 2024 රු.	ශ්‍රී. වි.සේ. නි. කා 2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය					
බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය		**3,827,005,104**	**8,002,195,014**	**3,618,032,499**	**7,783,933,513**
ගැලපීම් :					
ක්ෂය වීම		426,908,924	235,772,091	420,678,766	228,894,253
පොලී ආදායම		(1,844,249,401)	(2,869,317,181)	(1,804,150,908)	(2,815,501,918)
මූල්‍ය වියදම්		28,188,715	28,900,059	28,041,390	18,167,656
බදු කුලී වියදම		(49,114)	3,080	(49,114)	3,080
දේ. පි.ද. බැහැර කිරීම් මත ලාභ /අලාභ		-	(5,243,743)	-	(5,243,743)
විනිමය හුවමාරු ලාභය		452,987,569	676,240,170	452,987,569	676,240,170
ප්‍රදාන ආදායම්		(273,118)	(150,686)	(273,118)	(150,686)
නැවත තක්සේරු සංචිතය		(1,099,620)	-	-	-
වර්ෂය සඳහා ගැලපීම්		(3,045,260)	132,502,610.00	-	132,814,814
පොලී ආදායම් සැපයීම්		(2,029,865)	-	(2,029,865)	
නිහ ණය ශේෂය සඳහා ආදායමට මාරු කිරීම්		(12,001,817)	-	(12,001,817)	(1,388,788,991)
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්		-	(7,000,000,000)	-	(7,000,000,000)
පාරිතෝෂික ප්‍රතිපාදනය		69,983,553	62,725,180	68,669,405	61,507,738
		2,942,325,671	**(736,373,407)**	**2,769,904,808**	**(2,308,124,114)**
බදු ගෙවීම්		(1,901,058,883)	(1,737,776,587)	(1,834,075,967)	(1,732,042,234)
පාරිතෝෂික ගෙවීම්		(28,582,647)	(36,541,224)	(28,582,647)	(35,794,114)
		(1,929,641,529)	**(1,774,317,811)**	**(1,862,658,614)**	**(1,767,836,348)**
කාරක ප්‍රාග්ධන ගැලපීම්වලට පෙර මෙහෙයුම් කටයුතු මඟින් වූ ශුද්ධ මුදල් ගලා ඒම්/ගලා යෑම්		**1,012,684,142**	**(2,510,691,218)**	**907,246,194**	**(4,075,960,463)**
කාරක ප්‍රාග්ධන වෙනස් වීම්					
ලැබිය යුතු දෑ අඩු වීම් /වැඩි වීම්	i	1,777,457,306	260,292,944	1,773,527,953	284,776,593
වර්ෂය සඳහා වෙන් කිරීම් (කුඩෙට් අරමුදල)		-	23,823	-	23,823
ණය හිමියන්ගේ වැඩි වීම් /අඩු වීම්	ii	463,865,454	(1,979,627,283)	476,391,764	(630,577,684)
		2,241,322,760	**(1,719,310,515)**	**2,249,919,717**	**(345,777,268)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ශුද්ධ මුදල් ගලා ඒම් /ගලා යෑම්		**3,254,006,903**	**(4,230,001,733)**	**3,157,165,911**	**(4,421,737,731)**
ආයෝජන ක්‍රියාකාරකම් මඟින් ජනනය වූ මුදල් ප්‍රවාහය					
දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම්		(95,446,194)	(90,705,142)	(92,920,476)	(81,327,303)
දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමෙන් ලද මුදල් ප්‍රවාහය		-	5,613,958	-	5,613,958
පොලී ආදායම්		183,593,099	931,762,550	143,494,606	877,947,287
මූල්‍ය වත්කම්වල ආයෝජනය	iii	(2,597,530,979)	5,184,410,444	(2,518,173,271)	5,365,312,975
ආයෝජන ක්‍රියාකාරකම් මඟින් ලද ශුද්ධ මුදල් ගලා ඒම් /ගලා යෑම්		**(2,509,384,074)**	**6,031,081,810**	**(2,467,599,141)**	**6,167,546,916**
මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් ලද මුදල් ප්‍රවාහය					
		-			
මූල්‍ය වියදම්		(27,462,289)	(27,319,353)	(27,314,964)	(16,586,950)
භාවිත අයිතිය ඇති වත්කම්		(54,803,488)	(55,341,132)	(54,803,488)	(55,341,132)
ණය ලබා ගැනීමෙන් ලද ආදායම්		-	-	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් ලද ශුද්ධ මුදල් ගලා ඒම් /ගලා යෑම්		**(82,265,777)**	**(82,660,485)**	**(82,118,452)**	**(71,928,082)**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වෙනස		**662,357,052**	**1,718,419,593**	**607,448,318**	**1,673,881,103**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		**2,568,783,218**	**850,363,625**	**2,486,126,028**	**812,244,925**
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ		**3,231,140,270**	**2,568,783,218**	**3,093,574,346**	**2,486,126,028**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සමූහය	කාර්යාංශය
සටහන i		
ලැබිය යුතු මුදල් වැඩි වීම /අඩු වීම		
පරිභෝජන ද්‍රව්‍ය වල වැඩි වීම /අඩු වීම	31,628,601	31,628,601
පෙරගෙවීම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ වල වැඩි වීම /අඩු වීම	1,746,279,077	1,742,334,724
වෙනත් අත්තිකාරම් වැඩි වීම /අඩු වීම	(450,371)	(435,371)
	1,777,457,306	**1,773,527,953**
සටහන ii		
ණය හිමියෝ වැඩි වීම /අඩු වීම		
නියෝජිතායතන ණය හිමියෝ වැඩි වීම /අඩු වීම	47,873,224	48,230,174
උපචිත වියදම් වැඩි වීම /අඩු වීම	162,052,519	153,323,555
ප්‍රදාන	273,118	273,118
සංක්‍රමණික සේවකයින්ගේ දායකත්වය වැඩි වීම /අඩු වීම	714,699	714,699
කුවේට් වන්දි සංචිතය	(94,074,613)	(94,074,613)
වෙනත් ණයහිමි වැඩි වීම /අඩු වීම	347,026,508	367,924,831
	463,865,454	**476,391,764**
සටහන iii		
මූල්‍ය වත්කම් වල ආයෝජනය		
කාර්යය මණ්ඩල ණය වැඩි වීම /අඩු වීම	(64,340,461)	(52,059,418)
ස්ථාවර තැන්පතු වැඩි වීම /අඩු වීම	(2,533,190,518)	(2,466,113,853)
	(2,597,530,979)	**(2,518,173,271)**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

හිමිකම් වෙනස්වීමේ ඒකාබද්ධ ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සමූහය				ශ්‍රී. ල. වි. සේ. නි. කා					
	ප්‍රාග්ධනය	සමුච්චිත අරමුදල	ප්‍රතිඅගණන අතිරික්තය	එකතුව	ප්‍රාග්ධනය	කාර්යාංශය	සුභ සාධන අරමුදල	එකතුව	ප්‍රතිඅගණන අතිරික්තය	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
සමූහය (නැවත ප්‍රකාශ කළ)										
2023 ජනවාරි 01 දිනට ශේෂය	691,161,789	17,046,963,678	66,167,346	17,804,292,813	691,161,789	7,399,311,563	9,505,188,609	16,904,500,172	41,713,346	**17,637,375,307**
වර්ෂය සඳහා ලාභය	-	5,079,664,995	-	5,079,664,995	-	1,728,856,544	3,198,723,085	4,927,579,629		**4,927,579,629**
වෙනත් විස්තීරණ ආදායම්	-	98,109,526	-	98,109,526		99,040,845		99,040,845		**99,040,845**
ප්‍රතිඅගණන සංචිතය			3,100,403,545	3,100,403,545				-	3,100,403,545	**3,100,403,545**
වර්ෂය සඳහා ගැලපීම්	-	132,502,610	-	132,502,610	-	103,749,935	29,064,879	132,814,814		**132,814,814**
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම		(7,000,000,000)		(7,000,000,000)		(7,000,000,000)		(7,000,000,000)		**(7,000,000,000)**
එකතුව	**-**	**(1,689,722,869)**	**3,100,403,545**	**1,410,680,676**	**-**	**(5,068,352,676)**	**3,227,787,964**	**(1,840,564,712)**	**3,100,403,545**	**1,259,838,833**
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**691,161,789**	**15,357,240,809**	**3,166,570,891**	**19,214,973,489**	**691,161,789**	**2,330,958,887**	**12,732,976,573**	**15,063,935,460**	**3,142,116,891**	**18,897,214,140**
2024 ජනවාරි 01 දිනට ශේෂය	691,161,789	15,357,240,809	3,166,570,891	19,214,973,489	691,161,789	2,330,958,887	12,732,976,573	15,063,935,460	3,142,116,891	18,897,214,140
වර්ෂය සඳහා ලාභය	-	3,378,963,784	-	3,378,963,784	-	1,530,484,714	1,703,174,740	3,233,659,454		3,233,659,454
වෙනත් විස්තීරණ ආදායම්	-	(51,494,229)	-	(51,494,229)		(51,107,440)		(51,107,440)		(51,107,440)
ප්‍රතිඅගණන සංචිතය			26,812,212	26,812,212		-	-	-	26,812,212	26,812,212
වර්ෂය සඳහා ගැලපීම්	-	136,104,177	-	136,104,177	-	(1,178,269)	140,327,706	139,149,437		139,149,437
ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම	-	-		-	-	-		-		-
එකතුව	**-**	**3,463,573,732**	**26,812,212**	**3,490,385,944**	**-**	**1,478,199,004**	**1,843,502,446**	**3,321,701,451**	**26,812,212**	**3,348,513,663**
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**691,161,789**	**18,820,814,541**	**3,193,383,103**	**22,705,359,433**	**691,161,789**	**3,809,157,891**	**14,576,479,019**	**18,385,636,911**	**3,168,929,103**	**22,245,727,803**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 අවසන් වූ වසර සඳහා

කාර්යංශයේ අරමුදල හා සුබසාධන අරමුදල (WWF) අතර ආදායම් සහ වියදම් වෙන් කිරීම

විස්තරය	2024			2023
	කාර්යංශය රු.	සේ.සු.අ. රු.	එකතුව රු.	 රු.
ආදායම්				
බදවා ගැනීමේ ගාස්තු - නියෝජිතායතන	592,751,868	63,648,650	656,400,518	711,438,184
බදවා ගැනීමේ ගාස්තු - පුද්ගල	1,969,056,317	219,865,037	2,188,921,354	1,774,483,577
කොරියානු බදවා ගැනීමේ ප්‍රවර්ධන ගාස්තු	-	204,256,859	204,256,859	279,138,716
පහසුකම් ගාස්තු	63,315,005	-	63,315,005	59,549,881
බලපත්‍ර ගාස්තු	127,576,285	-	127,576,285	114,383,047
සෙස් ආදායම	675,328,785	-	675,328,785	986,018,458
කොරියානු පරිපාලන ගාස්තු	24,106,477	-	24,106,477	26,794,756
නැවත ඇතුල්වීමේ කොරියානු ගාස්තුව	13,695,744	-	13,695,744	25,520,361
කොරියානු පුහුණු ගාස්තු	-	102,750,415	102,750,415	118,896,424
පුහුණු ආදායම්	-	260,282,340	260,282,340	248,113,646
ඊශ්‍රායල් වැඩසටහන් වලින් ලැබෙන ආදායම් (උප සටහන 04.1)	1,326,403,876	-	1,326,403,876	124,224,158
විදේශ මෙහෙවරින් ලැබෙන ආදායම් (උප සටහන 04.2)	70,942,105	2,672,091,196	2,743,033,302	3,622,967,476
	4,863,176,462	**3,522,894,498**	**8,386,070,959**	**8,091,528,684**
වෙනත් මෙහෙයුම් ආදායම				
රක්ෂණ කොමිස් (දේශීය සහ විදේශීය)	-	-	-	72,091,357
විවිධ ආදායම් (උප සටහන්-05.1)	420,271,058	28,891,730	449,162,788	1,924,286,115
	420,271,058	**28,891,730**	**449,162,788**	**1,996,377,471**
අඩුකළා:				
කාර්යය මණ්ඩල පිරිවැය	1,834,449,356	602,080,069	2,436,529,425	1,875,674,039
ආයතනික වියදම්	501,401,710	456,372,634	957,774,345	782,066,919
මෙහෙයුම් වියදම්	636,948,202	111,035,107	747,983,310	528,896,940
වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණ වියදම්	154,374,471	10,811,145	165,185,616	115,428,265
ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්	566,485,878	7,944,958	574,430,837	82,177,391
සුභසාධන හා වෙනත් වියදම්	-	1,311,766,003	1,311,766,003	1,036,249,283
මූල්‍ය වියදම් සහ අනෙකුත් වියදම්	33,108,025	794,574,596	827,682,621	698,981,722
	3,726,767,642	**3,294,584,514**	**7,021,352,156**	**5,119,474,559**
මූල්‍ය ආදායම් සටහන-7	358,177,882	1,445,973,027	1,804,150,908	2,815,501,918
	358,177,882	**1,445,973,027**	**1,804,150,908**	**2,815,501,918**
බදුවලට පෙර ලාභය/(අලාභය).	**1,914,857,759**	**1,703,174,740**	**3,618,032,499**	**7,783,933,514**
අඩු කලා: ආදායම් බදු * සටහන-8	(384,373,046)	-	(384,373,046)	(2,856,353,884)
බදුවලට පසු ලාභය	**1,530,484,714**	**1,703,174,740**	**3,233,659,454**	**4,927,579,630**
වෙනත් විස්තීර්ණ ආදායම්				
පශ්චාත් රැකියා ප්‍රතිලාභ මත වූ ආයු ගණක ලාභ/(අලාභ)	(73,010,628)	-	(73,010,628)	(62,490,701)
ආයුගණක ලාභ/ (අලාභ) මත වූ කල්දැමූ බදු	21,903,188	-	21,903,188	(18,747,210)
ප්‍රත්‍යාගණන ලාභ මත වූ කල්දැමූ බදු		-	-	180,278,756
ප්‍රත්‍යාගණන අතිරික්තය	26,812,212		26,812,212	3,100,403,545
වෙනත් විස්තීර්ණ ආදායම් වල එකතුව	**(24,295,228)**	**-**	**(24,295,228)**	**3,199,444,390**
මුළු විස්තරණ ආදායම	**1,506,189,486**	**1,703,174,740**	**3,209,364,226**	**8,127,024,020**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. ආයතනික තොරතුරු

1.1 සාමාන්‍ය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) යනු 1985 අංක 21 දරන පනත (1994 අංක 04 සහ 2009 අංක 56 දරන පසුකාලීන සංශෝධන පනත) යටතේ ස්ථාපිත කරන ලද රාජ්‍ය සංස්ථාවක් වන අතර වර්තමානයේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවතී. ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරයේ ප්‍රධාන ස්ථානය අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

1.2.1 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලාංකිකයින් සඳහා විදේශ රැකියා ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) ප්‍රධාන ක්‍රියාකාරකම් වන අතර රටින් පිටත රැකියා වල නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුභසාධනය සහ රැකවරණය සහතික කිරීම සඳහා විදේශ රැකියා ව්‍යාපාර සඳහා සහාය වීම සහ ඒවා නියාමනය කිරීමයි.

1.2.2 පරිපාලිත සමාගමක කොටස් හිමිකම

2024 දෙසැම්බර් 31 සහ 2023 දෙසැම්බර් 31 දිනට පරිපාලිත ආයතනය සහ එහි හිමිකාරිත්වය පහත පරිදි වේ.

අනුබද්ධිත ආයතනය	ප්‍රධාන ක්‍රියාකාරකම්	ආයෝජන වර්ගය	දෙසැම්බර් 31	
			2024	2023
ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්) සමාගම.	කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව ලබා දීම විදේශ රැකියා සඳහා බඳවා ගැනීම්	පරිපාලිත ආයතනය	100%	100%

සමූහයේ මූල්‍ය ප්‍රකාශන සඳහා දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත. 2024 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශයේ (කාර්යාංශය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, කාර්යාංශයේ සහ එහි අනුබද්ධිත ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගමේ (SLFEA) තොරතුරු වලින් සමන්විත වේ.

2. සකස් කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනට සහ එදිනට අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය, අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ('මූල්‍ය ප්‍රකාශන') සමඟින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. එම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ("SLFRS"s), ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ("LKAS"s), ස්ථාවර අර්ථකථන කමිටුවේ ("SIC"s) සහ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ අර්ථකථන කමිටුවේ ("IFRIC") අදාළ අර්ථකථනයන්ද ඇතුළත් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිත කරන ලද ප්‍රධාන ගිණුම්කරණ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් සඳහන් නොකළහොත් මෙම ප්‍රතිපත්ති ඉදිරිපත් කරන ලද සියලුම වර්ෂ සඳහා අඛණ්ඩව අදාළ කර ඇත.

2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/LKASs) අනුව කාර්යාංශයේ සහ එහි අනුබද්ධිත ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.
"මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම" (පිටු 75 සහ 76 බලන්න), "අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව" (60 පිටුව බලන්න) සහ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සමඟ දැක්වෙන ප්‍රකාශයේ (පිටු 75 සහ 76 බලන්න) දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වගකීම පිළිගනී.
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුමත කර නිකුත් කිරීමට, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.02.20 දින අවසර දෙන ලදී.

2.3 මිනුම් පදනම

වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමක් මත සහ **ඓතිහාසික** පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමූහය බහුලව ගනුදෙනු කරන සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වේ.

2.4 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට සහ අවිනිශ්චිත වගකීම් ප්‍රකාශයට පත් කිරීමට ඒ සමඟ ඇති හෙළිදරව් කිරීම් කළමනාකාරිත්වයට අවශ්‍ය වේ. මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ ඇති කිසියම් අවිනිශ්චිත තත්ත්වයක ප්‍රතිඵලයක් ලෙස අනාගත කාල පරිච්ඡේදවල බලපෑමට ලක් වූ වත්කම් හෝ වගකීම්වල ඉදිරියට ගෙන යන ප්‍රමාණයන් සමඟ සැලකිය යුතු ගැළපීමක් අවශ්‍ය විය හැකිය.

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී, කළමනාකරණය විවිධ විනිශ්චයන් ලබා දී ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල කළමනාකරණය විසින් හඳුනාගෙන තක්සේරු කර ඇති ප්‍රමාණාත්මක බලපෑම් සිදුකිරීමට හැකි වටිනාකම් සහිත රේඛීය අයිතම පිළිබඳ වෙන් වෙන් වශයෙන් තනි සටහන් මඟින් සාකච්ඡා කර ඇත.

ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම්වල ධාරණ ප්‍රමාණයන්ට ප්‍රමාණාත්මක ගැලපීම් ඇති කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති, වාර්තාකරණ දිනයේ අනාගතය පිළිබඳ මූලික උපකල්පනය යන අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර වල ඇස්තමේන්තුගත අවිනිශ්චිතතාවයන් මූල්‍ය ප්‍රකාශන රේඛීය අයිතමවල තනි සටහන් වලින් විස්තර කර ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට අදාල කර ඇති ප්‍රමිතීන් මත සමූහය සිය උපකල්පන සහ ඇස්තමේන්තු පදනම් කර ගෙන ඇත. කෙසේ වෙතත්, අනාගත වර්ධනයන් පිළිබඳ පවතින තත්වයන් සහ උපකල්පන, වෙළඳපල වෙනස්කම් හෝ සමූහයේ පාලනයෙන් පරිභාහිරව පැන නගින තත්වයන් හේතුවෙන් වෙනස් විය හැකිය. එවැනි වෙනස්කම් සිදු වූ විට උපකල්පනවලින් පිළිබිඹු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සැලකිය යුතු විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිත කර ඇති පහත සඳහන් අයිතම කළමනාකරණය විසින් සලකා බලන ලදී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය තක්සේරුවක් කර ඇති අතර, ඉදිරි කාලය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ. තවද, සමූහයේ/ කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම් හෝ කොන්දේසිවලට අදාළ කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත් නොවේ. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව ඉදිරියට ගෙන යාමේ පදනම මත සකස් කරනු ලැබේ.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය තුළ වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපීමක් ඇති කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති උපකල්පන සහ ඇස්තමේන්තු වල අවිනිශ්චිතතා පිළිබඳ තොරතුරු පහත සටහන් වල ඇතුළත් කර ඇත.

- දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය (සටහන 3.1)
- ආදායම් බදු (ප්‍රවර්තන වරිෂයේ බදු සහ විලම්භීත බදු) (සටහන 3.6)
- මූල්‍ය වත්කම් හානිකරණය: ආපසු අයකර ගත හැකි මුදලට පාදක වන ප්‍රධාන උපකල්පනය (සටහන 3.7.5)
- ප්‍රතිපාදන සහ අවිනිශ්චිතතා හඳුනා ගැනීම සහ මැනීම: සම්පත් පිටතට ගලා යාමේ සම්භාවිතාව සහ විශාලත්වය පිළිබඳ ප්‍රධාන උපකල්පනය (සටහන 3.10.1.2)
- සේවක ප්‍රතිලාභ වගකීම් මැනීම : ප්‍රධාන ආයුගණන උපකල්පනය (සටහන 3.11)

2.5 සංසන්දනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල සඳහන් කර ඇති ස්ථානයන්හි, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූලව සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රකාශ කර ඇත. වෙනත් ආකාරයකින් සඳහන් නොකළහොත්, LKAS 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අනුකූලව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති පසුගිය මූල්‍ය වර්ෂයේ ප්‍රතිපත්ති සමඟ අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත. තවද, ප්‍රවර්තන ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය ඕනෑම තැනක සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කර ඇත.

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කර ඇති සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. වෙනත් ආකාරයකින් දක්වා නොමැතිනම් පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩව යොදා ගෙන ඇත,

ජංගම සහ ජංගම නොවන වර්ගීකරණය

සමූහය ජංගම සහ ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් සහ වගකීම් ඉදිරිපත් කරයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

වත්කමක් ජංගම වන්නේ එය:

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ සාක්ෂාත් කර ගැනීමට හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අදහස් කිරීම.
- මූලික වශයෙන් වෙළඳාමේ අරමුණ සඳහා රඳවා තබා ගැනීම.
- වාර්තාකරණ කාල සීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කිරීම; හෝ
- වාර්තාකරණ කාල සීමාවෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීමක් පියවීම සඳහා නුවමාරු කිරීම හෝ වගකීමකින් නිදහස් වීමකට භාවිතා කිරීම සීමා කර නොමැති පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි මුදල් හෝ මුදල් වලට සමාන දේ ආදිය.

අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

වගකීමක් ජංගම වන්නේ:

- එය සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ පියවීමට අපේක්ෂා කෙරේ.
- එය මූලික වශයෙන් වෙළඳාම් කිරීමේ අරමුණින් පවත්වනු ලැබේ.
- වාර්තාකරණ කාලයෙන් පසු මාස දොළහක් ඇතුළත එය පියවීමට නියමිතය; නැතහොත්
- වාර්තාකරණ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීම පියවීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැති වීම.

විලම්බිත බදු වගකීම් ඇතුළුව අනෙකුත් සියලුම වගකීම් සමූහය ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කරයි

වත්කම් සහ ලැබිය යුතු දේ

3.1 දේපල, පිරියත සහ උපකරණ

3.1.1 මූලික හඳුනාගැනීම සහ මිනුම්

දේපල, පිරියත සහ උපකරණ අයිතම ගණනය කරනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩු කරමිනි. දේපල, පිරියත සහ උපකරණ වල පිරිවැය යනු අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීම් පිරිවැය සහ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද ඕනෑම වියදම් ද සමඟ වේ.

වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම දරනු ලැබූ වියදම් පිරිවැයට ඇතුළත් වේ. ආයතනයක් තමන් වෙනුවෙන් වත්කමක් ගොඩනඟන විට වත්කම්වල පිරිවැයට පහත සඳහන් දෑ අන්තර්ගත වේ.

- අමුද්‍රව්‍ය හා සෘජු ශ්‍රම පිරිවැය
- වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් ඕනෑම පිරිවැයක්

වත්කම් බැහැර කිරීමේ දී ලැබෙන ඕනෑම ලාභයක් හෝ අලාභයක් වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනා ගැනේ.

3.1.2 පසුකාලීන වියදම් සහ ප්‍රතිස්ථාපනය

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට ඉඩ තිබේ නම්, එම අයිතමයේ ධාරණ අගය මුදලින් හඳුනාගනු ලබන අතර එහි පිරිවැය විශ්වාසදායක ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරණ අගය හඳුනා ගනු නොලබයි. දේපල, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා සැපයීමේ පිරිවැය ලාභ හෝ අලාභයෙන් දැරූ ලෙස හඳුනා ගනු ලැබේ.

3.1.3 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම

වත්කමක් ලෙස හඳුනා ගැනීමෙන් පසු, විශ්වාසදායක ලෙස සාධාරණ වටිනාකම මැනිය හැකි ඉඩම් සහ ගොඩනැගිලි, ප්‍රත්‍යාගණනය කිරීමේ දිනයේ දී ප්‍රත්‍යාගණිත අගයට පසුව සිදු වූ සමුච්චිත ක්ෂයවීම් සහ පසුව සමුච්චිත හානිකරණ අලාභ අඩු කර ගෙන ඇත. නැවත තක්සේරු කරන ලද වත්කමක සාධාරණ වටිනාකම වාර්තා කිරීමේ දිනයේ දී එහි ධාරණ වටිනාකමට වඩා සැලකිය යුතු ලෙස වෙනස් නොවන බව සහතික කිරීම සඳහා තක්සේරු කිරීම් සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ඉඩම් සහ ගොඩනැගිලි සහ අනෙකුත් වත්කම් තක්සේරු කිරීම් අවම වශයෙන් වසර තුනක කාලයක් තුළ වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් වටිනාකම් අනුව සිදු කරනු ලබන අතර සාධාරණ වටිනාකමේ වෙනස් වීම් හේතුවෙන් පැන නගින ඕනෑම ලාභයක් හෝ අලාභයක් ඒවා පැන නගින වර්ෂයේ අනෙකුත් විස්තීරණ ආදායමට ඇතුළත් වේ.

ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ධාරණ අගය වැඩිවීම අනෙකුත් විස්තීරණ ආදායම් ලෙස හඳුනාගෙන ප්‍රත්‍යාගණන සංචිත ලෙස ස්කන්ධ ප්‍රාග්ධනය යටතේ දක්වනු ලබයි. කෙසේ වෙතත්, ලාභය හෝ අලාභය තුළ හඳුනාගත් එකම වත්කම් නැවත ප්‍රත්‍යාණනය කිරීම මගින් අඩුවීමේ වටිනාකම් පමණක් නැවත ගැලපීම් මගින් ලාභය සහ අලාභය වැඩිවීමක් හඳුනාගනු ලබයි.

ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ධාරණ වටිනාකම් අඩුවීමක් ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ. කෙසේ වෙතත්, එම වත්කම් සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන කිරීමේ අතිරික්තයේ පවතින ඕනෑම ණය ශේෂයක ප්‍රමාණයට අනෙකුත් විස්තීර්ණ ආදායමේ අඩුවීම් හඳුනා ගැනේ.

ඊට අමතරව, ප්‍රතයාගණනය කිරීමේ දිනයේ දී සමුච්චිත ක්ෂයවීම් වත්කමේ දළ ධාරණ වටිනාකම් එරෙහිව ඉවත් කරනු ලබන අතර ශුද්ධ මුදල් වත්කමේ ප්‍රතයාගණනය කරන ලද මුදලට නැවත ප්‍රතිස්ථාපනය කරනු ලැබේ. බැහැර කිරීමෙන් පසු, විකුණනු ලබන විශේෂිත වත්කමට අදාළ ඕනෑම ප්‍රතයාගණනය කිරීමේ සංචිතයේ පවතින වටිනාකම් සෘජුවම රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

3.1.4 ක්ෂයවීම්

ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ දේපල, පිරියත සහ උපකරණ අයිතමවල ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය මත සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් ඒවායේ ඇස්තමේන්තුගත අවශේෂ අගයන් අඩු කිරීමක් වන අතර එය සාමාන්‍යයෙන් ලාභය හෝ අලාභයෙන් හඳුනා ගැනේ. මෙය වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත භාවිතයේ රටාව වඩාත් සමීපව පිළිබිඹු කරයි.

වත්මන් සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා ඇස්තමේන්තුගත පරිහරණ ආයු කාලය පහත දැක්වේ.

• ගොඩනැගිලි	වසර 15
• කොටස් වෙන් කිරීම (ගොඩනැගිලි)	වසර 10
• මෝටර් වාහන	වසර 4
• කල්බදු ගිවිසුමක් හරහා මෝටර් වාහන ගැනීම	වසර 4
• පරිගණක මෘදුකාංග	වසර 3
• පරිගණක	වසර 3
• වෙනත් කාර්යාල උපකරණ	වසර 3
• විදුලි භාණ්ඩ සහ උපාංග	වසර 4
• විවිධ උපකරණ	වසර 3
• ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් - ලී සහ වානේ	වසර 5
• කල්බදු වත්කම්	කල්බදු කාලය ඉක්මවා

කෙසේ වෙතත්, විදේශ දූත මණ්ඩලවලට අදාළ වත්කම්වල ඵලදායී ජීව කාලය නැවත තක්සේරු කර නොමැති බැවින්, පෙර පරිදිම පහත සඳහන් භාවිත ඵලදායී ජීව කාලයන් යොදා ගෙන ඇත.

• ගොඩනැගිලි	වසර 13 1/3
• මෝටර් වාහන	වසර 5
• පරිගණක	වසර 4
• වෙනත් කාර්යාල උපකරණ	වසර 5
• විදුලි භාණ්ඩ සහ උපාංග	වසර 5
• විවිධ උපකරණ	වසර 2ක්
• ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් - ලී සහ වානේ	වසර 13 1/3
• පුහුණු උපකරණ	වසර 5

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සෑම වාර්තාකරණ දිනකම ක්ෂයවීම් ක්‍රම, ඵලදායී ජීව කාලය සහ අවශේෂ අගයන් සමාලෝචනය කර සුදුසු පරිදි ගැලපීම් කරනු ලැබේ.

3.1.4. හඳුනානොගැනීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක ධාරණ වටිනාකම එය බැහැර කිරීමේදී හෝ එහි භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය හඳුනා නොගත් විට ලාභය හෝ අලාභයට ඇතුළත් වේ.

වාණිජ මෙහෙයුම් වැඩිදියුණු කිරීමට කිසිදු බලපෑමක් නොමැති බැවින් ව්‍යාපාර ක්‍රියාකාරිත්වයට සෘජුවම ආරෝපණය කළ හැකි ආර්ථික ප්‍රතිලාභ නොමැති බැවින් පුස්තකාල පොත්, දේපල පිරියත උපකරණ ලැයිස්තුවෙන් ඉවත් කර ඇත. පුස්තකාල පොත් සුභසාධන සේවා සැපයීමක් ලෙස සැලකේ.

3.1.4 හානිකරණය

ආර්ථික අර්බුදයේ බලපෑම ද සලකා බැලීමෙන් 2023 දෙසැම්බර් 31 වන දිනට දේපල පිරියත උපකරණයන්හි හානිකරණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම්ව, දේපල පිරියත උපකරණ සම්බන්ධයෙන් වාර්තා කරන දිනට මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හානිකරණ ප්‍රතිපාදනයක් සිදු කිරීමට අවශ්‍ය වී නොතිබුණි.

කෙරීගෙන යන වැඩ ප්‍රාග්ධනය

ප්‍රාග්ධන කාර්ය ප්‍රගතිය පිරිවැයට දක්වා ඇත. මෙවා ප්‍රාග්ධනීකරණය අපේක්ෂාවෙන් තවම නිමකර නොමැති ගොඩනැගිලි ඉදිකිරීමේදී සෘජුවම සිදු වන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

3.1.5. අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලබන්නේ, එම වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ සම්භාවිතාවක් තිබේ නම් සහ පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කළ හැකි නම් ය.

3.1.6 මෘදුකාංගය

ආයතනය විසින් අත්පත් කරගත් සහ සීමිත ජීවකාලයක් ඇති අනෙකුත් අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි අලාභ අඩු කිරීමෙන් මිනිනු ලැබේ. පරිමිත සීමිත ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වලට හානි සිදුවිය හැකි බවට ඇඟවීමක් ඇති විට, හානිය සඳහා තක්සේරු කරනු ලැබේ. අවිනිශ්චිත ඵලදායී ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වාර්ෂිකව තනි තනිව හෝ මුදල් ජනනයවන ඒකක (CGU) මට්ටමින් හානි සඳහා පරීක්ෂා කරනු ලැබේ.

වාර්තා කරන දිනට ආයතනය විසින් අනෙකුත් අස්පෘශ්‍ය වත්කම් ලෙස මාදුකාංග වෙන වෙනම අත්පත් කර ගෙන ඇත.

පසුකාලීන වියදම්

මෘදුකාංග සඳහා පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එය අදාළ වන නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කළ විට පමණි. අනෙකුත් සියලුම වියදම් ලාභ හෝ අලාභයෙන් සිදු වූ ලෙස හඳුනා ගැනීම සිදු කරයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

3.1.7 ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත පරිමිත සීමිත ජීවකාලය මත සරල රේඛීය පදනම භාවිතා කරමින් සහ ඇස්තමේන්තුගත අවශේෂ අගයන් අඩු කිරීමෙන් ඒවායේ පිරිවැය කපා හැරීම සඳහා ක්‍රමක්ෂය ගණනය කරනු ලබන අතර එය ලාභ හෝ අලාභයෙන් හඳුනා ගැනේ. මෘදුකාංග වල ඇස්තමේන්තුගත ඵලදායි ජීවකාලය අවුරුදු තුනකි.

ක්‍රමක්ෂය ක්‍රම, ඵලදායි ජීවකාලය සහ අවශේෂ අගයන් සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කර අවශ්‍ය නම් සංශෝධනය කරනු ලැබේ.

3.1.8 හඳුනා නොගැනීම්

අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීමේදී හෝ එහි භාවිතයෙන් ඉවත් කිරීමේදී අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට ගිණුම් හඳුනා නොගැනීම් සිදුවේ. එවැනි අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගැනීමෙන් ලැබෙන ලාභය හෝ අලාභය, ලාභ හා අලාභ වාර්තාවේ ඇතුළත් වේ.

2023 දෙසැම්බර් 31 වන දිනට ආර්ථික අර්බුදයේ බලපෑම ඇතුළුව අස්පෘශ්‍ය වත්කම්වල විභව හානිකරණ දර්ශක ආයතනය විසින් තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම්ව, කිසිදු හානිකරණ දර්ශක හඳුනාගෙන නොමැත.

3.2 භාවිතයට අයිතිය ඇති වත්කම්

කල්බදු LKAS 17 වෙනුවට SLFRS 16 ආදේශ කර ඇත. IFRIC 4 මගින් ගිවිසුමක කල්බදු පහසුකම් නිබෙද යන්න සහ දිරි දීමනා සම්බන්ධයෙන් SIC-15 මෙහෙයුම් කල්බදු සහ SIC-27 මගින් කල්බදු සම්බන්ධ ගණුදෙණු වල නෛතික ස්වරූපය ඇගයීම් කරනු ලබයි.

මෙම ප්‍රමිතිය මගින් කල්බදු හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම සඳහා මූලධර්ම දක්වා ඇති අතර තනි ශේෂ පත්‍ර ආකෘතියක් යටතේ සියලුම කල්බදු ගිණුම්ගත කිරීමට කල්බදු ගැණුම්කරුවන්ට දක්වා ඇත. ප්‍රමිතියේ නිශ්චිත සංක්‍රාන්ති විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි, 2018 වාර්තාකරණ කාලය සඳහා සංසන්දනාත්මක කරුණු නැවත සඳහන් නොකර, 2019 ජනවාරි 01 වන දින සිට සමාගම සම්පූර්ණ අතීතාවර්ජන ක්‍රමය භාවිතා කරමින් SLFRS 16 අනුගමනය කර ඇත.

කොන්ත්‍රාත්තුවක් ආරම්භ වන විට, ආයතනය එම කොන්ත්‍රාත්තුව කල්බදු ගැනීමක්ද, නැතහොත් එය කල්බදු අඩංගු කරගෙන තිබෙද යන්න ඇගයීම් කරයි. නියමිත වටිනාකමක් සඳහා හුවමාරුවක් ලෙස හඳනාගත් වත්කමක් යම් කාලයක් සඳහා භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය ගිවිසුමක් මගින් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්තුව කල්බදුවක් වෙයි හෝ කල්බදුවක් අඩංගු වේ. ගිවිසුමක් හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුව මගින් ප්‍රකාශ කරන්නේද යන්න තක්සේරු කිරීම සඳහා ආයතනය පහත සඳහන් දෑ තක්සේරු කරයි.

ආයතනය පහත සඳහන් දෑ තක්සේරු කරයි
වත්කම භාවිතා කරන කාලය පුරාම එහි භාවිතය තුළින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ සියල්ල සැලකිය යුතු ලෙස ලබා ගැනීමට ආයතනයට අයිතියක් ඇතිවීම සහ වත්කම භාවිතා කිරීම මෙහෙයවීමේ අයිතිය ආයතනය සතුවීම.

කල්බදු ආරම්භක දිනයේ දී ආයතනය වත්කම භාවිත කිරීමේ හිමිකම සහ කල්බදු වගකීම් හඳුනා ගනී. ආයතනයේ වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම් යනු LKAS 17 යටතේ මෙහෙයුම් කල්බදු ලෙස පෙර හඳුනාගෙන තිබූ කුලියට ගත් ශාඛා පරිශ්‍රයන්ගෙන් සමන්විත වේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

3.2.1 මූලික මිනුම්

කල්බදු වගකීම ආරම්භක දිනයේ දී ආයතනය වත්කම පාවිච්චි කිරීමේ හිමිකම පිළිබඳ සහ කල්බදු වගකීමක් හඳුනා ගනී. වත්කම භාවිත කිරීමේ හිමිකම ප්‍රථමයෙන් මනිනු ලබන්නේ පිරිවැය අනුව වන අතර, එයට ආරම්භක දිනයේ දී හෝ ඊට පෙර සිදු කරන ලද ඕනෑම කල්බදු ගෙවීමක් සඳහා සකස් කරන ලද කල්බදු වගකීමේ ආරම්භක මුදල, දරන ලද ඕනෑම මූලික ඍජු පිරිවැයක් සහ අදාල වත්කම විසුරුවා හැරීමට සහ ඉවත් කිරීමට හෝ පාදක කරගත් වත්කම නැවත ස්ථාපනය කිරීම හෝ එය පිහිටා ඇති ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ඇස්තමේන්තු ගත පිරිවැයෙන් ලැබුණු ඕනෑම බදු සහනයක් අඩුකිරීම මගින් මනිනු ලැබේ.

කල්බදු වගකීම මුලින් මනිනු ලබන්නේ ආරම්භක දිනයේදී නොගෙවන ලද කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව වන අතර, කල්බදුවේ ගම්‍ය පොලී අනුපාතය භාවිත කර බදු වට්ටම් කරනු ලැබේ. එය පහසුවෙන් හඳුනා ගත නොහැකි නම්, ආයතනය තමන්ට අදාළ වර්ධක ණය ගැනීමේ අනුපාතය භාවිතා කරයි. සාමාන්‍යයෙන්, ආයතනය වට්ටම් අනුපාතය ලෙස තම ණය ගැනීමේ අනුපාතය භාවිතා කරයි. සාමාන්‍යයෙන්, සමාගම එහි වර්ධක ණය ගැනීමේ අනුපාතය වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරයි.

ආයතනය විසින් අනුබද්ධිත ආයතනයට කුලියට දී ඇති දේපලක ප්‍රතිඵලයක් ලෙස අනුබද්ධිත ආයතනයකට වත්කම භාවිත කිරීමේ හිමිකම සහ කල්බදු වගකීමක් ඇති විට, එවැනි වත්කම භාවිත කිරීමේ හිමිකම සහ කල්බදු වගකීම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මඟින් ඉවත් කරනු ලැබේ.

3.2.2 පසුකාලීන මිනුම්

භාවිත කිරීමේ හිමිකම සහිත වත්කම ආරම්භක දිනයේ සිට වත්කම භාවිත කිරීමේ හිමිකම සහිත ඵලදායී ජීවකාලය අවසන් වන දිනය හෝ කල්බදු කාල සීමාව අවසන් වන දිනය දක්වා සරල රේඛා ක්‍රමය භාවිතයෙන් ක්ෂය කරනු ලැබේ. භාවිත කිරීමේ හිමිකම සහිත වත්කම් වල ඇස්තමේන්තුගත ඵලදායී ආයුකාලය දේපල සහ උපකරණවල මෙන් නිරණය කරනු ලබයි. ඊට අමතරව, භාවිත කිරීමේ හිමිකම සහිත වත්කමකට, කිසියම් හානියක් සිදුවුවහොත්, එය වරින් වර අඩු කරනු ලබන අතර, ඒ අනුව බදු වගකීම ගලපනු ලබයි.

කල්බදු වගකීම ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලැබේ. දර්ශකයක හෝ අනුපාතයක වෙනසක් හේතුවෙන් අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් ඇති වූ විට, අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවීමට අපේක්ෂිත මුදල පිළිබඳ ආයතනයේ ඇස්තමේන්තුවේ වෙනසක් ඇති වූ විට, හෝ ආයතනය මිලදී ගැනීමක්, දිගු කිරීමක් හෝ අවසන් කිරීමේ විකල්පයක් ක්‍රියාත්මක කරන්නේද පිළිබඳ තක්සේරුව වෙනස් කළ විට එය පූර්ව මනිනු ලැබේ.

3.2.3 භාවිතයේ අයිතිය සහිත වත්කම් හානිකරණ

වාර්තා කරන දින වන විට, ආර්ථික අර්බුදය හේතුවෙන් වත්කම භාවිත කිරීමේ හිමිකමට හානි වීම සම්බන්ධයෙන් ආයතනය විසින් කිසිදු හානි කිරීමේ අලාභයක් හඳුනාගෙන නොමැත. මන්දයත්, සෑම ව්‍යාපාර ඒකකයක්ම ආයතනයේ අවදානම් කළමනාකරණ උපාය මාර්ගයට අනුව ව්‍යාපාර සඵලතාවය පවත්වාගෙන යාම පිණිස ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් යටතේ ක්‍රියාත්මක වන අතර, හැකිතාක් දුරට රජයේ නියෝග දැඩිව පිළිපදිමින් හා සහය දක්වමින් ක්‍රියා කරයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

3.2.4 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ සමූහය බදු කරුවකු වන අවස්ථාවලදී කල්බදු සඳහා ගිණුම්කරණය

කල්බදු වත්කම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ සමූහය විසින් භාවිතය සඳහා ලබා ගත හැකි දිනයේ (එනම් ආරම්භක දිනය) සිට, කල්බදු වත්කම් භාවිත කිරීමේ හිමිකම ('ROU') වත්කමක් සහ ඊට අනුරූප වගකීමක් ලෙස පිළිගනු ලැබේ.

(a) භාවිතයේ අයිතිය ඇති වත්කම් - ROU

භාවිතයේ අයිතිය ඇති වත්කම් පහත සඳහන් පිරිවැයන් ඇතුළත්ව මනිනු ලබයි.

- කල්බදු වගකීමේ මූලික මිනුම් ප්‍රමාණය;
- ආරම්භක දිනයේදී හෝ ඊට පෙර සිදු කරන ලද ඕනෑම කල්බදු ගෙවීමක් හෝ ලැබුණු ඕනෑම කල්බදු සහනයක් අඩු කිරීම;
- ඕනෑම මූලික සෘජු පිරිවැයක්;

ROU වත්කම්, පිරිවැයයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ හානි කිරීමේ අලාභය (ඇත්නම්) අඩුකිරීමෙන් පසුව මනිනු ලැබේ. ROU වත්කම් සාමාන්‍යයෙන් වත්කමේ ඵලදායි ජීවකාලය සහ කල්බදු කාලය කෙටි වන විට සරල රේඛීය පදනමක් මත ක්ෂය කිරීම සිදු කරනු ලැබේ.

(b) කල්බදු වගකීම්

කල්බදු වගකීම් මූලික වශයෙන් මනිනු ලබන්නේ එම දිනයේ දී නොගෙවන ලද කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව ය. කල්බදු ගෙවීම්වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- ස්ථාවර ගෙවීම් (ප්‍රමාණාත්මක ස්ථාවර ගෙවීම් ඇතුළුව), ලැබිය යුතු කල්බදු දිරි දීමනා අඩු කළ වටිනාකම;
- බදු ගිවිසුමේ අන්තර්ගත පොලී අනුපාතය භාවිතා කරමින් කල්බදු ගෙවීම් වට්ටම් කරනු ලැබේ. එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, සාමාන්‍යයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ සමූහයේ කල්බදු සඳහා අදාළ වන පරිදි, බදුකරුගේ වර්ධක ණය ගැනීම භාවිතා කරනු ලැබේ.
- සමාන කාලීන, ආරක්ෂාව සහ කොන්දේසි සහිත සමාන ආර්ථික පරිසරයක ROU හා සමාන වටිනාකමක් ඇති වත්කමක් ලබා ගැනීමට අවශ්‍ය අරමුදල් ණයට ගැනීම සඳහා තනි බදුකරුවකු විසින් ගෙවිය යුතු අනුපාතය මෙයයි. කල්බදු ගෙවීම්, මූලික පිරිවැය සහ මූල්‍ය පිරිවැය අතර වෙන් කරනු ලැබේ. එක් එක් කාල සීමාව සඳහා වගකීමේ ඉතිරි ශේෂය සඳහා නියත ආවර්තික පොලී අනුපාතයක් ඇති කිරීම සඳහා මූල්‍ය පිරිවැය කල්බදු කාලය තුළ ලාභ හෝ අලාභයට මූල්‍ය පිරිවැය අය කරනු ලැබේ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ සමූහය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙනම රේඛීය අයිතමයක් ලෙස කල්බදු වගකීම් ඉදිරිපත් කරයි. කල්බදු වගකීම සඳහා පොලී වියදම විස්තිරණ ආදායමේ මූල්‍ය පිරිවැය තුළ ඉදිරිපත් කෙරේ.

(c) කෙටි කාලීන කල්බදු

කෙටි කාලීන කල්බදු යනු මාස 12ක් හෝ ඊට අඩු කල්බදු කාල සීමාවක් සහිත කල්බදු වන අතර එය විස්තීර්ණ ආදායමේ වියදමක් ලෙස සරල රේඛීය පදනමක් මත හඳුනාගනු ලැබේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

3.3 අස්පෘශ්‍ය වත්කම්

3.3.1 හඳුනාගැනීමේ පදනම

අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගනු ලබන්නේ, වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ සම්භාවිතාවක් තිබෙ නම් සහ වත්කමෙහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් ය.

3.3.5 පසුකාලීන වියදම්

පසුකාලීන වියදම් ප්‍රාග්ධනකරණය කරනු ලබන්නේ එය අදාළ නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කළ විට පමණි. අභ්‍යන්තරව උත්පාදනය වන කීර්තිනාමය සහ වෙළඳ නාම සඳහා වන වියදම් ඇතුළුව අනෙකුත් සියලුම වියදම් ලාභ හා අලාභ වශයෙන් හඳුනාගනු ලැබේ.

3.4 මූල්‍ය නොවන වත්කම්වල හානිකරනය

වත්කමක් හානිකරණය විය හැකි බවට ඇඟවීමක් තිබෙද යන්න ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් වාර්තා කරන සෑම දිනකම තක්සේරු කරනු ලැබේ. කිසියම් ඇඟවීමක් තිබේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණය පරීක්ෂාවක් අවශ්‍ය වූ විට, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් වත්කමේ අයකර ගත හැකි අගය ඇස්තමෙන්තු කරයි. වත්කම වෙනත් වත්කම් හෝ වත්කම් කණ්ඩායම් වලින් බොහෝ දුරට ස්වාධීන මුදල් ප්‍රවාහ උත්පාදනය නොකරන්නේ නම් මිසක. වත්කමක අයකර ගත හැකි කරනු ලබන අගය වත්කමක සාධාරණ අගයට වඩා වැඩි වන අතර විකිණීමට ඇති පිරිවැය සහ භාවිතයේ ඇති අගය අඩු කිරීමෙන් ගණනය කරනු ලබන අතර එය තනි වත්කමක් සඳහා නිරණය කරනු ලබන අතර වත්කමක ධාරණ වටිනාකම එහි අයකර ගත හැකි අගය ඉක්මවා ගිය විට, වත්කමේ හානිකරණයක් සිදු වූ ලෙස සලකනු ලබන අතර එහි අයකර ගත හැකි අගයට ලියා හරිනු ලබයි. භාවිතයේ ඇති අගය තක්සේරු කිරීමේදී, ඇස්තමෙන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලබන්නේ මුදල්වල කාලීන වටිනාකම සහ වත්කමට විශේෂිත අවදානම් පිළිබඳ වත්මන් වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන පූර්ව බදු වට්ටම් අනුපාතයක් භාවිතා කරමිනි. සාධාරණ වටිනාකම අඩුකර විකිණීමේ පිරිවැය නිරණය කිරීමේදී මෑත කාලීන වෙළඳපල ගනුදෙනු තිබෙ නම් සැලකිල්ලට ගනී. එවැනි ගනුදෙනු හඳුනාගත නොහැකි නම්, සුදුසු තක්සේරු ආකෘතියක් භාවිතා කරනු ලැබේ.

3.5 විදේශ මුදල්

අ) ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල් ඒකකය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ ආයතනය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය (ක්‍රියාකාරී මුදල් ඒකකය) භාවිතා කරමිනි. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හි ක්‍රියාකාරී සහ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හි ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වේ.

ආ) විදේශ මුදල් ගනුදෙනු

විදේශ මුදල් වලින් කරන ලද ගනුදෙනු වලදී ගනුදෙනුව සිදු වූ දිනට අදාළ වන විනිමය අනුපාත වලට අනුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි අදාළ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

වාර්තාකරණ දිනයේදී විදේශ මුදල් වලින් නම් කරන ලද මුල්‍ය වත්කම් සහ වගකීම්, වාර්තාකරණ දිනට පවතින ස්ථානීය අනුපාතයට නැවත පරිවර්තනය කරනු ලැබේ. නැවත පරිවර්තනය කිරීමේදී පැන නගින විදේශ මුදල් වෙනස්කම් ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. මුදල් අයිතම පියවීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී පැන නගින සියලුම වෙනස්කම් ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ. විදේශ මුදල් ඒකකයක ඓතිහාසික පිරිවැය අනුව ගෙන යනු ලබන මුල්‍ය නොවන වත්කම් සහ වගකීම්, ආරම්භක ගනුදෙනුවේ දිනයේ පැවති විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කෙරේ. විදේශ මුදල් ඒකකයක සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මුදල් නොවන අයිතම, සාධාරණ වටිනාකමකින් තීරණය කරන දිනයේ විනිමය අනුපාත භාවිතා කරමින් පරිවර්තනය කරනු ලැබේ.

මූල්‍ය නොවන අයිතම නැවත මාරු කිරීමේදී ඇතිවන ලාභය හෝ අලාභය, අයිතමයේ සාධාරණ වටිනාකමෙහි වෙනස් වීමේදී ලාභය හෝ අලාභය හඳුනා ගැනීමට අනුකූලව සලකනු ලැබේ. (එනම්, අනෙකුත් විස්තීර්ණ ආදායම් හෝ ආදායම් ප්‍රකාශනයේ සාධාරණ වටිනාකමෙහි ලාභය හෝ අලාභය හඳුනාගෙන ඇති අයිතමවල පරිවර්තනය කිරීමේ වෙනස්කම් හෝ පිළිවෙලින් අනෙකුත් විස්තීර්ණ ආදායම් හෝ ආදායම් ප්‍රකාශයේ ද හඳුනාගෙන ඇත).

3.6 බදුකරණය

3.6.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බද්ද යනු වාර්තාකරණ දිනයේ දී පනවන ලද බදු අනුපාත සහ පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු බදු ගැලපීම් භාවිතා කරමින්, වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු අපේක්ෂිත බදු ය.

අනෙකුත් විස්තීර්ණ ආදායම්වල සෘජුවම හඳුනාගෙන ඇති අයිතමවලට අදාළ ප්‍රවර්තන බදු ආදායම් ප්‍රකාශයේ නොව අනෙකුත් විස්තීර්ණ ආදායම්වල හඳුනා ගැනේ. අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත් වන තත්වයන් සම්බන්ධයෙන් බදු ප්‍රතිලාභවල ගත් ස්ථාවරයන් කළමනාකරණය වරින් වර ඇගයීමට ලක් කරන අතර සුදුසු අවස්ථාවල දී විධිවිධාන ස්ථාපිත කරයි.

3.6.2 විලම්භීත බදු

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම්වල බදු පදනම් සහ ඒවායේ ධාරණ වටිනාකමේ ප්‍රමාණයන් අතර වාර්තා කිරීමේ දිනයේ තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්භීත බදු සකසනු ලැබේ.

බදු අය කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සඳහා විලම්භීත බදු වගකීම් හඳුනා ගෙන ඇත.

අඩු කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම්, භාවිතයට නොගත් බදු බැර ඉදිරියට ගෙන යාම සහ භාවිතා නොකළ බදු පාඩු ඉදිරියට ගෙන යාම සඳහා විලම්භීත බදු වත්කම් හඳුනා ගෙන ඇත. බදු අය කළ හැකි ලාභය ලබා ගත හැකි ප්‍රමාණයට සහ භාවිතා නොකළ බදු බැර ඉදිරියට ගෙන යාම සහ භාවිතයට නොගත් බදු පාඩු භාවිතා කළ හැකි බදු වත්කම් හඳුනා ගෙන ඇත.

විලම්භීත බදු වත්කම්වල ධාරණ වටිනාකම සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරනු ලබන අතර විලම්භීත බදු වත්කම් සියල්ලම හෝ කොටසක් භාවිතා ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයක් ඇති නොවීම දක්වා දක්වා අඩු කෙරේ. හඳුනා නොගත් විලම්භීත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභ මගින් විලම්භීත බදු වත්කම් අයකර ගැනීමට ඉඩ සැලසෙන මට්ටම දක්වා හඳුනා ගැනේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

විලම්බිත බදු වත්කම් සහ වගකීම්, වත්කම් සාක්ෂාත් කරගත් හෝ වගකීම් පියවූ වර්ෂය තුළ අදාළ වීමට අපේක්ෂිත බදු අනුපාත අනුව මනිනු ලබන අතර, වාර්තාකරණ දිනයේදී බලාත්මක කර ඇති හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කර ඇති බදු අනුපාත මත පදනම් වේ.

3.7 මූල්‍ය වත්කම්

3.7.1 ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම

මූල්‍ය වත්කම් **SLFRS 9, 'මූල්‍ය උපකරණ'** ට අනුකූලව ඉදිරිපත් කර හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ **13** වන සටහනේ මූල්‍ය වත්කම් හෙළිදරව් කර ඇත.

3.7.2 මූලික හඳුනාගැනීම සහ මිනුම්

SLFRS 9 හි විෂය පථය තුළ ඇති මූල්‍ය වත්කම්, ක්‍රමක්ෂය කළ පිරිවැය, අනෙකුත් විස්තීර්ණ ආදායම (OCI) මගින් සාධාරණ වටිනාකම් සහ ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකම් ලෙස වර්ගීකරණය කර ඇත.

මූලික හඳුනාගැනීම දී මූල්‍ය වත්කම් වර්ගීකරණය මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි ව්‍යාපාර ආකෘතිය මත රඳා පවතී. මෙම තක්සේරුව මූලික මුදල හා පොලී පමණක් ගෙවීම පරීක්ෂණය (SPPI) ලෙස හඳුන්වන අතර එය මූලික උපකරණ මට්ටමින් සිදු කරනු ලැබේ. ව්‍යාපාර ආකෘතිය තීරණය කරන්නේ මුදල් ප්‍රවාහයන් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමෙන්ද, මූල්‍ය වත්කම් විකිණීමෙන් ද නැතහොත් මේ දෙකම සිදු කිරීම මගින් ද යන්න තීරණය කරනු ලැබේ.

ප්‍රමාණාත්මක මූල්‍යකරණ සංරචකයක් අඩංගු නොවන වෙළඳ ලැබිය යුතු හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ප්‍රායෝගික උපයෝගීතාව යොදා ගෙන ඇති දේ වෙළඳ ලැබිය යුතු දේ හැර, සියලුම වෙළඳ ලැබිය යුතු දේ ගනුදෙනු මිලෙන් මිනුම් කරනු ලැබේ.

මූලිකව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මූල්‍ය වත්කමක් එහි සාධාරණ වටිනාකමට අනුව මනිනු ලබන අතර සාධාරණ වටිනාකමක් නොමැති මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් ලාභය හෝ අලාභය (FVPL) මගින් අත්පත් කර ගැනීමට සෘජුවම ආරෝපණය කල හැකි ගනුදෙනු පිරිවැයට එකතු කරයි. ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමින් (FVPL) ගෙනයන මූල්‍ය වත්කම සඳහා වූ ගනුදෙනු පිරිවැය, එම අවස්ථාවේ ලාභය හෝ අලාභය ලෙස සලකා ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරයි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙ හි මූල්‍ය වත්කම් අතරට මුදල් සහ කෙටිකාලීන තැන්පතු, වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ, ණය සහ අනෙකුත් ලැබිය යුතු දේ සහ මිල ගණන් ඉදිරිපත් නොකළ මූල්‍ය උපකරණ ඇතුළත් වේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

3.7.3 පසුකාලීන මිනුම්

පසුකාලීන මිනුම් අරමුණු සඳහා, මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ගීකරණය කර ඇත.

- ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ මූල්‍ය වත්කම්
- සමුච්චිත ලාභ සහ අලාභ ප්‍රතිවක්‍රීකරණය සමඟ OCI හරහා සාධාරණ වටිනාකමින් වටිනාකම් සහිත මූල්‍ය වත්කම්
- හඳුනාගැනීම අවලංගු කිරීමෙන් පසු සමුච්චිත ලාභ සහ අලාභ ප්‍රතිවක්‍රීකරණය නොකර OCI හරහා සාධාරණ අගයකින් නම් කරන ලද වත්කම්
- ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයක් සහිත මූල්‍ය වත්කම්

3.7.3.1 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ ලැබිය යුතු දේ යනු සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් නොකරන ලද ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික මිනුම් කිරීමෙන් පසුව, එවැනි මූල්‍ය වත්කම් හානිකරණ අලාභය අඩුකිරීමෙන් පසු ඵලදායි (Effective Interest Rate method - EIR) භාවිතයෙන් ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලැබේ. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීම් සඳහා වන ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ EIR හි අනිවාර්ය අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. මෙම EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට ඇතුළත් වේ. මෙම හානිකරණයෙන් ඇතිවන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනාගෙන ඇත.

3.7.3.2 කල්පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන

ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල්පිරීම තෙක් රඳවා ගැනීමට, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ධනාත්මක චේතනාවක් සහ හැකියාවක් ඇති විට, කල්පිරීම තෙක් රඳවා තබා ගනී. මූලික මිනුම් කිරීමෙන් පසුව, කල්පිරීම තෙක් රඳවාගෙන සිටින ආයෝජන සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් හානිකරණ අඩුකිරීමෙන් පසුව ක්‍රමක්ෂ පිරිවැයට අනුව, මනිනු ලැබේ. EIR හි අනිවාර්ය අංගයක් වන අත්පත් කර ගැනීම් සඳහා ගාස්තු හෝ පිරිවැය මත ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට ඇතුළත් වේ. හානිකරණයෙන් ඇතිවන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනා ගැනේ.

3.7.4 හඳුනා නොගැනීම

මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිවාසිකම් කල් ඉකුත් වී ඇති විට හෝ මාරු කර ඇති විට සහ ආයතනය හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට මූල්‍ය වත්කම් හඳුනා ගැනීම අවලංගු කිරීම සිදු වේ.

3.7.5 මූල්‍ය වත්කම් හානිකරණය

2018 අප්‍රේල් 1 වන දින සිට, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රමක්ෂ පිරිවැය යටතේ ගෙන යන ලද එහි ණය උපකරණ හා සම්බන්ධ අපේක්ෂිත ණය පාඩු ක්‍රමක්ෂය පිරිවැයට සහ FVOCI ඉදිරියට ගෙන යනු ලැබේ. යොදන ලද හානිකරණ ක්‍රමවේදය ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් සිදුවී තිබේද යන්න මත රඳා පවතී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් SLFRS 9 මගින් අවසර දී ඇති සරල කළ ප්‍රවේශය වෙළඳ වලින් ලැබිය යුතු දේ සඳහා අදාළ කර ගන්නා අතර, ලැබිය යුතු දේවල මුලික හඳුනාගැනීමෙන් අපේක්ෂිත ජීවිත කාලය පුරාම සිදුවන පාඩු හඳුනා ගැනීම අවශ්‍යතාවක් පවතී.

3.7.5.1 ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ ගනු ලබන මූල්‍ය වත්කම්

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා තබා ඇති වත්කම්, එම මුදල් ප්‍රවාහයන් මූලික සහ පොලි ගෙවීම් පමණක් නියෝජනය කරන අතර, ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලැබේ. පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මූල්‍ය වත්කම් ක්‍රම ක්ෂය කළ පිරිවැයට මනිනු ලැබේ:

- මූල්‍ය වත්කම ව්‍යාපාර ආකෘතියක් තුළ පවත්වාගෙන යනු ලබන අතර ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණින් සහ
- මූල්‍ය වත්කමේ ගිවිසුම් නියමයන් නිශ්චිත දිනයන්හිදී මුදල් ප්‍රවාහයන් ඇති කරනු ලබන අතර එමගින් ගෙවිය යුතු ප්‍රාග්ධන මුදල මත මූලික සහ පොලිය පමණක් ගෙවීම සිදු කරයි.

ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ මූල්‍ය වත්කම් පසුව සඵල පොලී අනුපාත (EIR) ක්‍රමය භාවිතයෙන් මනිනු ලබන අතර ඒවා හානිකරණයට යටත් වේ. වත්කම ප්‍රති හඳුනානොගැනීම, වෙනස්කල විට හෝ හානිකරණය වූ විට ලාභ හෝ අලාභ ලෙස ප්‍රතිලාභ සහ අලාභ මත හඳුනා ගැනේ.

3.7.6.1. OCI තුළින් සාධාරණ අගයකින් යුත් මූල්‍ය වත්කම්

වත්කම්වල මුදල් ප්‍රවාහයන් SPPI නියෝජනය කරන අවස්ථාවකදී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම සඳහා තබා ඇති වත්කම්, FVOCI හි මත මිනුම් කරනු ලැබේ.

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම්, SLBFE ආයතනය OCI හරහා සාධාරණ වටිනාකමකින් ණය සාධන පත්‍රය මනිනු ලබයි

- මූල්‍ය වත්කම ව්‍යාපාර ආකෘතියන් තුළ පවත්වාගෙන යනු ලබන අතර ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම හා විකිණීම යන දෙකම අත්පත් කර ගැනීමේ අරමුණින් සහ
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනවලදී මුදල් ප්‍රවාහ ඇති කරන අතර ඒවා හිඟ මූලික මුදල මත වූ SPPI ලෙස සැලකේ.

ධාරණ වටිනාකමේ වලනයන් OCI මගින් සිදුවන අතර ලාභ හෝ අලාභයන් හඳුනාගෙන හානිකරණයේ ලාභ හෝ අලාභ පොලී ආදායම සහ විදේශ විනිමය ලාභ සහ අලාභ හඳුනා ගැනීම හැර ධාරණ වටිනාකමේ වලනයන් OCI මගින් සලකනු ලැබේ. මූල්‍ය වත්කම හඳුනාගහොත්, OCI හි කලින් හඳුනාගෙන තිබූ සමුච්චිත ප්‍රතිලාභ හෝ අලාභය ස්කන්ධ ලාභ හෝ අලාභයට නැවත වර්ගීකරණය කර අනෙකුත් ලාභ / (අලාභ) ලෙස හඳුනා ගනු ලැබේ. මෙම මූල්‍ය වත්කම වලින් ලැබෙන පොලී ආදායම සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායමට ඇතුළත් කරනු ලැබේ. විදේශ විනිමය ලාභ සහ අලාභ අනෙකුත් ප්‍රතිලාභ/(අලාභ) ලෙස ඉදිරිපත් කර ඇති අතර හානිකරණය වියදම් ආදායම් ප්‍රකාශයේ වෙනම රේඛීය අයිතම ලෙස ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

3.7.6.2. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම්

ලාභය හෝ අලාභය මගින් සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම් අතරට වෙළඳාම සඳහා තබා ඇති මූල්‍ය වත්කම්, ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයක් ඇතිව මූලිකව හඳුනාගැනීමෙන් එහි නම් කරන ලද මූල්‍ය වත්කම් හෝ සාධාරණ අගයක් ඇතිව මැනිය යුතු අනිවාර්ය මූල්‍ය වත්කම් වලට ඇතුළත් වේ. මූල්‍ය වත්කම් කෙටි කාලීනව විකිණීම හෝ නැවත මිලදී ගැනීම සඳහා අත්පත් කර ගත් මූල්‍ය වත්කම් ඒවා වෙළඳාම් සඳහා රඳවා තබා ගත් ඒවා ලෙස වර්ගීකරණය කෙරේ. මූලික සහ පොලිය ගෙවීම් පමණක් නොවන මූල්‍ය ප්‍රවාහයන් සහිත මූල්‍ය වත්කම්, ලාභ හා අලාභ හරහා සාධාරණ වටිනාකමට මිනුම් කරනු ලැබේ. ඉහත විස්තර කළ පරිදි OCI තුළින් ක්‍රමක්ෂ කළ (ණය හිලව්) හෝ පිරිවැයකට හෝ සාධාරණ පිරිවැයකට වර්ග කරනු ලැබීමට ණය නීත්‍යානුකූල ලේඛනය සඳහා නිර්ණායක පැවතුනහොත් මීස නීත්‍යානුකූල ලේඛනය, මුල් අවස්ථාවේදී හඳුනාගත් ලාභ හෝ පාඩු හරහා සාධාරණ අගයකට එම ණය නීත්‍යානුකූල ලේඛනය ඇගයුම් කළ හැකිය.

ලාභය හෝ අලාභය මගින් සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම්, ලාභය හෝ අලාභ ප්‍රකාශනයේ ප්‍රති හඳුනාගන්නා සාධාරණ වටිනාකමෙහි ශුද්ධ වෙනස්කම් සමඟින් සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇත.

3.8 පරිභෝජන භාණ්ඩ

යල් පැන ගිය සහ සෙමින් චලනය වන අයිතම සඳහා වෙන් කිරීමෙන් පසු, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධිත වටිනාකම යන දෙකෙන් අඩු අගයට පරිභෝජන මනිනු ලැබේ.

ශුද්ධ උපලබ්ධිත වටිනාකම ලබාගනුයේ සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියේදී ඇස්තමේන්තුගත විකුණුම් මිල, නිම කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදු කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කිරීමයි.

3.9 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යනු අතැනි මුදල් සහ බැංකුවේ ඇති මුදල්, අත්පත් කර ගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක් තුළ කල්පිරීම් සහිත අනෙකුත් කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයක් සහිත ආයෝජන වේ.

වගකීම් සහ ප්‍රතිපාදන

3.10 මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ වටිනාකමකින් ගනුදෙනු පිරිවැය අඩු කිරීමෙන් හඳුනාගෙන, පසුව සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැයට ඉදිරියට ගෙන යනු ලැබේ. වාර්තාකරණ දිනය අවසන් වීමෙන් පසු මාස 12 කට වඩා වැඩි කල් පිරීම් හැර, ඒවා ජංගම වගකීම්වලට ඇතුළත් කර ඇති අතර, එම අවස්ථාවේ දී ඒවා ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

හඳුනා නොගැනීම

මූල්‍ය වගකීම ප්‍රති හඳුනාගන්නේ එම වගකීම යටතේ ඇති බැඳීම් අවසන් වූ විටය.

3.10.1 පසුකාලීන මිනුම්

මූල්‍ය වගකීම් මැනීම පහත පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී;

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

3.10.1.1 අනෙකුත් මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීමෙන් පසුව, පොලී සහිත ණය සහ ණය ගැනීම් සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට අනුව මනිනු ලැබේ. වගකීම් හඳුනා නොගත් විට මෙන්ම සඵල පොලී අනුපාත ක්‍රමය (EIR) ක්‍රමක්ෂය කිරීමේ ක්‍රියාවලිය හරහා ආදායම් ප්‍රකාශයේ ලාභ සහ අලාභ හඳුනා ගැනේ.

ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කර ගැනීම් සඳහා වන ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ EIR හි අනිවාර්යය අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට ඇතුළත් කර ඇත.

3.10.1.2 ප්‍රතිපාදන , බැඳීම් සහ අසම්භාව්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමාන බැඳීමක් (නීතිමය හෝ සම්මුතිකමය) ඇති විට ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වීමට ඉඩ ඇති අතර එම බැඳීමේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකි විට ප්‍රතිපාදන හඳුනා ගැනේ. සමූහය විසින් ප්‍රතිපාදනයකින් කොටසක් හෝ සියල්ලම ප්‍රතිපූරණය කිරීමට අපේක්ෂා කරන විට, ප්‍රතිපූරණය පාහේ නිශ්චිත වූ විට, ප්‍රතිපූරණය වෙනම වත්කමක් ලෙස පිළිගනු ලැබේ. ප්‍රතිපාදනවලට අදාළ වියදම, ඕනෑම ප්‍රතිපූරණයක ශුද්ධ ආදායම් ප්‍රකාශනයේ දක්වා ඇත.

කාලය අනුව මුදලේ වටිනාකම ප්‍රමාණාත්මක නම්, සුදුසු විට වගකීමට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරන වත්මන් බදු පෙර අනුපාතයක් භාවිතා කරමින් ප්‍රතිපාදන වට්ටම් කරනු ලැබේ. වට්ටම් භාවිතා කරන විට, වට්ටම් භාවිතා කරන විට, කාලයත් සමඟ ප්‍රතිපාදනයේ වැඩිවීම මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

ඓතිහාසික අත්දැකීම් සහ එක් එක් අවස්ථා වල නිශ්චිත නියමයන් මත පදනම්ව ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ. බොහෝ දුරට ඉඩ ඇති ප්‍රතිඵලය සලකා බලමින්, සමූහය ඇස්තමේන්තුවක් සකස් කරයි.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සියලුම ප්‍රතිපාදන ගිණුම්ගත කර ඇත.

අසම්භාව්‍ය වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරනු ලබන විය හැකි බැඳීම් වන අතර එහිදී ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සිදුවිය නොහැකි හෝ පහසුවෙන් මැනිය නොහැකි විය හැක. සියලුම අසම්භාව්‍යය වගකීම් මූල්‍ය ප්‍රකාශන සඳහා මූල්‍ය සටහනක් ලෙස අනාවරණය කෙරේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට එරෙහිව සේවකයින් සහ බාහිර පුද්ගලයින් විසින් ගොනු කරන ලද අධිකරණ නඩු විභාග වෙමින් පවතින අතර රු. 35,736,168.00ක මුළු අසම්භාව්‍ය වගකීමක් ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

නඩු අංකය	SLBFE (LKR) වෙතින් අපේක්ෂා කරන වන්දි
SC/FR/39/17	-
DC/1852/13	10,000,000/-
DC 3895	10,000,000/-
SCSPL/LA/277/24	-
SC/FR/284/24	-
CA/WRIT/235/23	-
CA/WRIT/456/23	
DSP/151/2023	5,736,168/-
WP/HCCA/COL/74/24	10,000,000/-
CA/WRIT/295/22	-
CA/WRIT/263/21	-
HCMCA/66/23	-
අභි/6425/22(25823)	-
අභි/6420/22(25821)	-
අභි/6426/22(25830)	-
අභි/03/2019/(91163)	-
අභි/6421/22/(25822)	-
HCMCA/68/23	-
82546/A/PHI	-

බදු තක්සේරු කිරීම්

2019/2020 වර්ෂයට අදාළව රු. 32,369,631.00 ක ආදායම් බදු පිළිබඳ කරුණු විභාග වෙමින් පවතී. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය බදු අභියාචනා කොමිසමට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, වගකීම් අවසන් කර නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශනයේ කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොමැත.

3.11 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

3.11.1 විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති වගකීම් වාර්තාකරණ දිනයේදී අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම් වේ. LKAS 19 - "සේවක ප්‍රතිලාභ" මගින් නිර්දේශ කර ඇති පරිදි ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය භාවිතා කරමින් ස්වාධීන ආයුගණක විශේෂඥවරුන් විසින් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ආයුගණක ලාභ සහ අලාභ වලින් සමන්විත ප්‍රති මිනුම්, ඒවා සිදුවන කාල සීමාව තුළ OCI තුළින් රඳවා ගත් ඉපැයීම් වලට අනුරූප හර හෝ බැර කිරීම් සමඟ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේදී සිදුවන කාලසීමාවේදීම හඳුනා ගෙන ඇත. ප්‍රති මිනුම් පසු කාල පරිච්ඡේදවල ලාභය හෝ අලාභය ලෙස නැවත වර්ගීකරණය නොකෙරේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සේවා පිරිවැය (වත්මන් සේවා පිරිවැය සහ ඕනෑම අතීත සේවා පිරිවැයක්) සහ ලාභයේ හෝ අලාභයේ පොලී වියදමට ආරෝපණය කළ හැකි සහ අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමෙහි වෙනස්කම් සමූහය හඳුනා ගනී. අර්ථ දක්වා ඇති සැලසුම් ප්‍රතිලාභ වගකීම් තීරණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන සටහන 3.11.4 හි දක්වා ඇත.

ප්‍රතිලාභ සැලසුම් වගකීම් සඳහා ශ්‍රී.ල.වි.සේ.නි.කා. මෙන්ම සමූහයේ අනුබද්ධිත ආයතනය බාහිරව අරමුදල් සපයා නොමැත. කෙසේ වෙතත්, වගකීම් පියවීම් සඳහා ආයෝජන වෙන් කරනු ලැබේ.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතට අනුව සේවකයෙකුට පාරිතෝෂික ගෙවීමේ වගකීම් පැන නගින්නේ වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

3.11.2 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා ආරම්භක ශේෂයන්හි සිට අවසන් ශේෂයන් දක්වා ඇති සැසඳීම පහත වගුවේ දැක්වේ:

දෙසැම්බර් 31 වන විට	කණ්ඩායම 2024 ශ්‍රී ලංකා රු.	කණ්ඩායම 2023 ශ්‍රී ලංකා රු.	SLBFE 2024 ශ්‍රී ලංකා රු.	SLBFE 2023 ශ්‍රී ලංකා රු.
වසර ආරම්භයේදී ශේෂය	356,681,362	275,722,863	359,049,937	270,845,609
වත්මන් සේවා පිරිවැය	22,854,999	13,095,064	21,992,914	12,755,528
පොලී පිරිවැය	47,128,554	49,630,116	46,676,491	48,752,210
ආයුගණන (ලාභ) / අලාභ	73,397,417	63,422,020	73,010,628	62,490,701
	500,062,332	401,870,063	427,719,339	394,844,048

3.11.3 ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති වියදම

දෙසැම්බර් 31 වන විට	කණ්ඩායම 2024 ශ්‍රී ලංකා රු.	කණ්ඩායම 2023 ශ්‍රී ලංකා රු.	SLBFE 2024 ශ්‍රී ලංකා රු.	SLBFE 2023 ශ්‍රී ලංකා රු.
වත්මන් සේවා පිරිවැය	22,854,999	13,095,064	21,992,914	12,755,528
පොලී පිරිවැය	47,128,554	49,630,116	46,676,491	48,752,210
අනෙකුත් විස්තීර්ණ ආදායමෙන් හඳුනාගෙන ඇති ආයුගණන (ලාභ) / පාඩු	73,397,417	63,422,020	73,010,628	62,490,701
ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති වියදම්	143,380,970	120,147,200	141,680,033	123,998,439

3.11.4 ප්‍රධාන උපකල්පන සහ ප්‍රමාණාත්මක සංවේදීතා විශ්ලේෂණය

විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මේ පිරිවැය තීරණය කරනු ලබන්නේ ආයුගණන තක්සේරු කිරීම් මගින් වන අතර එයට විවිධ උපකල්පන සිදු කිරීම ඇතුළත් වේ. වට්ටම් අනුපාතය තීරණය කිරීම, අනාගත වැටුප් වැඩිවීම්, කාර්ය මණ්ඩල පිරිවැටුම සහ විශ්‍රාම යන වයස (සේවක මරණ අනුපාතය) මෙයට ඇතුළත් වේ. තක්සේරුවට සම්බන්ධ සංකීර්ණතා සහ එහි දිගුකාලීන ස්වභාවය නිසා, විශ්‍රාම ප්‍රතිලාභ බැඳීමක් මෙම උපකල්පනවල වෙනස්කම් වලට වැඩි සංවේදීතාවක් දක්වයි. සෑම වාර්තාකරණ දිනයකදීම සියලුම උපකල්පන සමාලෝචනය කෙරේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ප්‍රධාන උපකල්පන සහ ඒවායේ සංවේදීතා විශ්ලේෂණයන් පහත තවදුරටත් සාකච්ඡා කෙරේ:

3.11.4.1 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

2024 දෙසැම්බර් 31 වන දිනට විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම පිළිබඳ ස්වාධීන ආයුගණක තක්සේරුවක් වෘත්තීය ආයුගණකවරුන් වන Messrs Actuarial and Management Consultants (Pvt) Ltd. විසින් සිදු කරන ලදී.

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම තක්සේරු කිරීම සඳහා ආයුගණකවරුන් විසින් භාවිතා කරන තක්සේරු ක්‍රමය වන්නේ"ප්‍රක්ෂේපිත ඒකක ණය" ක්‍රමය වේ. LKAS 19 මගින් නිර්දේශ කරන ලද ක්‍රමය - "සේවක ප්‍රතිලාභ" වේ.

සේවක ප්‍රතිලාභවල පිරිවැය තීරණය කිරීමේදී භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පන වූයේ:

විස්තර	2024	2023
වට්ටම් අනුපාතය (%)	(වසරකට) 13	(වසරකට) 13
අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය වැටුප් වර්ධක අනුපාතය (%)	10	10
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය (%)	4	3
විශ්‍රාම යන වයස (අවුරුදු)	60	60

3.11.4.2 සමූහය

ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනය (පුද්) සමාගම

2024 දෙසැම්බර් 31 වන දිනට Actuarial and Management Consultants (Private) Limited විසින් සේවක ප්‍රතිලාභ සඳහා වන ප්‍රතිපාදන පිළිබඳ ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදී. සේවක ප්‍රතිලාභ වගකීම් තක්සේරු කිරීම සඳහා ආයුගණකවරුන් විසින් භාවිතා කරන තක්සේරු ක්‍රමය වන්නේ "ප්‍රක්ෂේපිත ඒකක ණය" ක්‍රමය වේ. LKAS 19 මගින් නිර්දේශ කරන ලද ක්‍රමය - "සේවක ප්‍රතිලාභ ක්‍රමය" වේ.

සේවක ප්‍රතිලාභ වගකීම තීරණය කිරීමේදී භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පන වූයේ:

විස්තර	2024	2023
වට්ටම් අනුපාතය (%)	11	18
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය (%)	3	3
විශ්‍රාම යන වයස (අවුරුදු)	60	60

03.11.4.3 භාවිතා කරන ලද උපකල්පනවල සංවේදීතාව

දෙසැම්බර් 31 වන දිනට සැලකිය යුතු උපකල්පන සඳහා ප්‍රමාණාත්මක සංවේදීතා විශ්ලේෂණයක් පහත පරිදි වේ:

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් වගකීමට ඇති බලපෑම

විස්තර	ශ්‍රී.ලං.වි.සේ.නි.කා.	
	2024 (LKR)	2023 (LKR)
වට්ටම් අනුපාතය 1% වැඩි වීම	443,612,205	337,085,710
වට්ටම් අනුපාතය ප්‍රතිශත 1% අඩු වීම	503,586,199	383,668,142

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ සිදුවන ප්‍රධාන උපකල්පනවල සාධාරණ වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමට ඇති බලපෑම නිස්සාරණ ක්‍රමයක් මත පදනම්ව ඉහත සංවේදීතා විශ්ලේෂණයන් තීරණය කර ඇත. සංවේදීතා විශ්ලේෂණයන් පදනම් වී ඇත්තේ සැලකිය යුතු උපකල්පනයක වෙනසක් මත වන අතර අනෙකුත් සියලුම උපකල්පන නියතව තබා ගනී. සංවේදීතා විශ්ලේෂණයන් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමේ සැබෑ වෙනසක් නියෝජනය කළ නොහැකිය. මන්ද උපකල්පනවල වෙනස්කම් එකිනෙක හුදකලාව සිදුවීමට ඇති ඉඩකඩ අඩු බැවින්ය.

3.11.5 නිර්වචිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දායක වන අතර, සේවක භාරකාර අරමුදලේ දායකත්වය අදාළ නියාමනයන්ට අනුකූලව අදාළ දායක අරමුදල් මගින් ආවරණය කෙරේ. සේවකයින් ආවරණය වන පරිදි සැලසුම් සඳහා දායක මුදල් සඳහා වන බැඳීම් ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදලට දායක වන වැටුපෙන් ශ්‍රී. වි.සේ.නි.කා. සහ සේවකයින් පිළිවෙලින් 15% සහ 10% බැගින් දායක වේ.

සේවක භාර අරමුදල

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සේවක භාර අරමුදලට වගකීම් සහිත වැටුපෙන් 3% ක දායකත්වයක් සපයයි.

3.12 රජයේ ප්‍රදාන

3.12.1 වත්කම් ආශ්‍රිත ප්‍රදාන

හාලිඇල, කතරගම සහ රත්නපුර පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම් සඳහා භාණ්ඩාගාරය රු. 691,161,789ක ප්‍රදාන ලබා දී ඇත.

2017 වසර දක්වා, වත්කම්වලට අදාළ රජයේ ප්‍රදාන කොටස් යටතේ සටහන් කර ඇති අතර, වත්කම අපේක්ෂිත භාවිතය සඳහා සූදානම් වූ පසු, වත්කමේ සඵල ආයු කාලය පුරා ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ.

කෙසේ වෙතත්, 2018 වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රාග්ධන දායකත්වයේ කොටසක් ලෙස ප්‍රදාන සලකා බැලීමට උපදෙස් දෙන ලදී. ඒ අනුව අවශ්‍ය වෙනස්කම් සිදු කරන ලදී.

2023 වර්ෂයේදී කොරියානු ජනරජයෙන් සහ Diamond International (Lanka) Pvt Ltd රු. 970,039.00ක වියදමින් විදේශ ගමන් බලපත්‍ර ස්කෑනර් යන්ත්‍ර 3 ක් සහ stamp reader යන්ත්‍ර 10 ක් ප්‍රදානයක් ලෙස ලැබී ඇත.

ආදායම සහ වියදම්

3.13 ආදායම් හඳුනාගැනීම

අ) ගාස්තු ආදායම

අපේක්ෂිත සේවාව පාරිභෝගිකයා වෙත ලබා දීමෙන් එක් එක් කාර්ය සාධන බැඳීම් තෘප්තිමත් වූ විට සේවා සැපයීමෙන් ලැබෙන ආදායම ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගෙන ඇත. මෙයට බඳවා ගැනීමේ ගාස්තු, පහසුකම් ගාස්තු, බලපත්‍ර ගාස්තු, සෙස් බදු, කොරියානු පරිපාලන සහ නැවත ඇතුළත් වීමේ ගාස්තු, කොරියානු ප්‍රවර්ධන ගාස්තු, කොරියානු පුහුණු ගාස්තු සහ අනෙකුත් පුහුණු ගාස්තු සහ සියලුම විදේශීය මෙහෙවර ආදායම් ඇතුළත් වේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආ) පොලී ආදායම

ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් මනිනු ලබන සියලුම මූල්‍ය උපකරණ සඳහා, පොලී ආදායම හෝ වියදම වාර්තා කරනු ලබන්නේ සඵල පොලී අනුපාතය (EIR) භාවිතා කරමිනි. එය මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයු කාලය හරහා හෝ සුදුසු අවස්ථාවලදී කෙටි කාලයක් තුළ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් මූල්‍ය වත්කමේ හෝ වගකීමේ ශුද්ධ ධාරණ අගයට නියත වශයෙන්ම වට්ටම් කරන අනුපාතයයි. පොලී ආදායම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට ඇතුළත් වේ.

ඇ) වෙනත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනමක් මත හඳුනා ගැනේ.

3.14 වියදම්

ගෙවීම් නොසලකා හැර ශ්‍රී.ල.වි.සේ.නි.කා. හි මෙහෙයුම් පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම්, වසර තුළ කරන ලද පදනම් නොසලකා වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේ දී ආදායමට ඒක් කර ඇත.

3.15 සුභසාධන අරමුදල (WF)

1985 අංක 21 දරන පනතේ 45 වන වගන්තියට අනුකූල වීම සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත සේවය කරන සේවකයින්ගේ ප්‍රයෝජනය උදෙසා ශ්‍රී.ල.වි.සේ.නි.කා. විසින් සුභසාධන අරමුදල (WF) ස්ථාපිත කර ඇත. එය සුභසාධන අරමුදල විසින් දැරිය යුතු ආදායම සහ වියදම් නිශ්චිතව දක්වා ඇත. ඊට අමතරව, පනතට අනුකූලව ආදායම් සහ වියදම් වාර්තා කිරීම සඳහා ශ්‍රී.ල.වි.සේ.නි.කා. වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් ඇත.

1997.08.31 දින හිටපු අතිගරු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය විසින් කැඳවන ලද රැස්වීමට අනුව, කාන්තා ගෘහ සේවිකාවන් විශේෂයෙන් මුහුණ දෙන දුෂ්කරතා සහ අපහසුතා සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලාංකික සේවකයින් සඳහා සුභසාධන කටයුතු සඳහා විශේෂ අරමුදලක් පිහිටුවීම සහ අරමුදල් මූලාශ්‍ර පිළිගත නොහැකි නම් රජයෙන් අරමුදල් සැපයීම අවධාරණය කරන ලදී. හිටපු ගරු කම්කරු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 1998.04.21 දිනැති අංක 15/98 දරන කැබිනට් සංදේශයට අනුව, 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශ පනතේ 45 වන වගන්තියේ සුභසාධන අරමුදල සඳහා ඇති ප්‍රතිපාදන භාවිතා කිරීමට තීරණය කරන ලදී. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ලයනල් ප්‍රනාන්දු මහතා විසින් නිකුත් කරන ලද 1999 අංක 01 දරන ගිණුම්කරණ චක්‍රලේඛයේ සේවක සුභසාධන අරමුදලට අනුව ප්‍රතිපාදන අඩංගු වේ. එම චක්‍රලේඛයට අනුව, 4 වන වගන්තිය යටතේ, කම්කරු සුභසාධන අරමුදලට ලැබීම් ලැයිස්තුගත කර ඇති අතර 5 වන වගන්තිය යටතේ කම්කරු සුභසාධන අරමුදලේ ගෙවීම් ලැයිස්තුගත කර ඇත. ඒ අනුව, සුභසාධන අරමුදලෙහි ආදායම සහ වියදම් පහත පරිදි වේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම

- ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන්ගෙන්, විදේශීය සේවා යෝජකයින්ගෙන් සහ බලපත්‍රලාභීන්ගෙන් සහ වෙනත් ඕනෑම පාර්ශවයකින් ලැබෙන සියලුම පරිත්‍යාග සහ දායක මුදල් WF සඳහා ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතුය.
- ශ්‍රී.ල.වි.සේ.නි.කා. වෙතින් ලැබෙන දායකත්වයන්
- එක් එක් පුද්ගලයාගේ බඳවා ගැනීමේ ගාස්තුවෙන් 10% - 1994 අංක 4 දරන ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය (සංශෝධන) පනත.
- පුහුණු ගාස්තු
- විදේශ දූත මණ්ඩල මගින් එකතු කරන ලද ගාස්තු (කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ක්‍රමය යටතේ)
- ආයෝජන ආදායම් සහ වෙනත්

වියදම්

- ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නිරත වී නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන ශ්‍රී ලාංකිකයින් සඳහා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්ගේ පවුල්වලට මහ පෙන්වීම සහ තොරතුරු සැපයීම.
- ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා සඳහා බඳවා ගන්නා ලද ශ්‍රී ලාංකිකයින් පුහුණු කිරීම සහ දැනුවත්භාවයට පත් කිරීම.
- ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට සහාය වීම.
- වැටුප්, ගමන්, ප්‍රාග්ධන වියදම්, නැවත ගෙන්වා ගැනීමේ පිරිවැය, කුලිය, ආහාර සහ ඖෂධ, නීති ගාස්තු සහ අනෙකුත් සුභසාධන වියදම් වැනි විදේශ දූත මණ්ඩලවලට අදාළ වියදම්.
- රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති පරිදි වැටුප් සහ වෙතන, මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය, නඩත්තු පිරිවැය, උපයෝගිතා ගාස්තු වැනි සුභසාධන අරමුදල සඳහා සෘජුව හඳුනාගත නොහැකි ශ්‍රී.ල.වි.සේ.නි.කා. විසින් දරනු ලබන වියදම්වලින් 5% ක්.

3.16 කාර්යාංශ අරමුදල

මෙම අරමුදල 1994 අංක 4 දරන පනතින් සහ 2009 අංක 56 දරන පනතින් සංශෝධනය කරන ලද 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ විධිවිධාන යටතේ ස්ථාපිත කරන ලදී. හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය යටතේ ඉදිරිපත් කර ඇති "අරමුදලේ" චලනය සහ සංයුතිය පහත සඳහන් දෑ වලින් සමන්විත වන අතර එම පනතේ අවශ්‍යතාවලට අනුකූල වේ.

අරමුදලට ගෙවිය යුතු වන්නේ,

- ප්‍රදාන, ණයක් හෝ වෙනත් ආකාරයකින් රජය විසින් කාර්යාංශයට සපයන ඕනෑම අරමුදල්;
- මෙම පනත යටතේ අයකර එකතු කරන ලද ඕනෑම සෙස් බද්දකින් ලැබෙන ආදායම;
- ගාස්තු සහ අයකිරීම් ලෙස කාර්යාංශයට ලැබුණු සියලුම මුදල්;
- කාර්යාංශය විසින් කරන ලද ඕනෑම ආයෝජනයකින් ආදායමක් ලෙස කාර්යාංශයට ලැබුණු සියලුම මුදල්;
- කාර්යාංශය විසින් එහි බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ ඉටු කිරීමේදී කාර්යාංශය වෙත ලැබුණු සියලුම මුදල්.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

අරමුදලින් ගෙවනු ලබන්නේ,

- අධ්‍යක්ෂවරුන්ට ගෙවිය යුතු වේතන;
- කාර්යාංශයේ නිලධාරීන්ට සහ සේවකයින්ට ගෙවිය යුතු වැටුප්;
- කාර්යාංශයේ නියෝජිතයින්ට ගෙවිය යුතු ඕනෑම දීමනාවක්; සහ
- කාර්යාංශය විසින් එහි බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ ඉටු කිරීම සඳහා දරන ලද ඕනෑම වියදමක් පියවා ගැනීමට අවශ්‍ය සියලුම මුදල්.

ඉහත සඳහන් කරුණු අනුව, ශ්‍රී.ල.වි.සේ.නි.කා. විසින් සුභසාධන අරමුදලේ සහ කාර්යාංශ අරමුදලේ ආදායම් සහ වියදම් වෙනම සටහනක (සටහන අංක 6.1) සහ 2023 මූල්‍ය ප්‍රකාශනවල වත්කම් සහ වගකීම් වෙනම ශේෂ පත්‍රයක,හෙළිදරව් කිරීමේ අරමුණින් වත්කම් සහ වගකීම් සඳහා සටහන් වලට අමතරව දක්වා ඇති අතර වසර තුළ සුභසාධන අරමුදලේ (WF) වෙනස්කම් පෙන්වීමට හිමිකම් වෙනස්කම් ප්‍රකාශය යටතේ සුභසාධන අරමුදල (WF) සඳහා වෙනම තීරුවක් දක්වා ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

4 ආදායම

විස්තරය	2024	2023	2024	2023
	සමූහය	සමූහය (නැවත ප්‍රකාශ කළ)	ශ්‍රී. ල. වි. සේ. නි. කා	ශ්‍රී. ල. වි. සේ. නි. කා
	රු.	රු.	රු.	රු.
බදවා ගැනීමේ ගාස්තු - නියෝජිත ආයතන	656,400,518	711,438,184	656,400,518	711,438,184
බදවා ගැනීමේ ගාස්තු - තනි පුද්ගල	2,188,921,354	1,774,483,577	2,188,921,354	1,774,483,577
කොරියානු රැකියා ප්‍රවර්ධන ගාස්තු	204,256,859	279,138,716	204,256,859	279,138,716
පහසුකම් ගාස්තු	63,315,005	59,549,881	63,315,005	59,549,881
බලපත්‍ර ගාස්තු	127,476,285	114,283,047	127,576,285	114,383,047
සෙස් ආදායම	674,711,130	985,901,274	675,328,785	986,018,458
කොරියානු පරිපාලන වියදම්	24,106,477	26,794,756	24,106,477	26,794,756
කොරියානු නැවත ඇතුල්වීමේ ගාස්තු	13,695,744	25,520,361	13,695,744	25,520,361
කොරියානු පුහුණු කිරීමේ ගාස්තු	102,750,415	118,896,424	102,750,415	118,896,424
පුහුණු කිරීමේ ආදායම	260,282,340	248,113,646	260,282,340	248,113,646
ඊශ්‍රායල් වැඩසටහන් වලින් ලැබෙන ආදායම් (උප සටහන 04.1)	1,326,403,876	124,224,158	1,326,403,876	124,224,158
විදේශ දූත මණ්ඩල මගින් ලද ආදායම් (උප සටහන් 04.2)	2,743,033,302	3,622,967,476	2,743,033,302	3,622,967,476
බදවා ගැනීමේ ආදායම්	57,488,324	653,363,446	-	-
	8,442,841,628	**8,744,674,946**	**8,386,070,959**	**8,091,528,684**

නියෝජිත ආයතනවල බදවා ගැනීම් සඳහා පහසුකම් සැපයීමේ ගාස්තු සහ බදවා ගැනීමේ ගාස්තු පහත පරිදි ගණනය කර ඇත.

ගෙවිය යුතු ගාස්තු (රු.)	පහසුකම් ගාස්තු (රු.)	බදවා ගැනීමේ ගාස්තු (රු.)	නියෝජිත ආයතනයේ කොටස (70%) (රු.)
18,200	200	5,400	12,600

4.1 ඊශ්‍රායල් වැඩසටහන් වලින් ලැබෙන ආදායම

විස්තරය	2024	2023	2024	2023
	සමූහය	සමූහය	ශ්‍රී. ල. වි. සේ. නි. කා	ශ්‍රී. ල. වි. සේ. නි. කා
	රු.	රු.	රු.	රු.
ඊශ්‍රායල කෘෂිකර්ම සැකසුම් ගාස්තුව	283,355,488	51,768,259	283,355,488	51,768,259
ඊශ්‍රායල ඖත්තු සේවා සැකසුම් ගාස්තු	117,980,466	72,455,899	117,980,466	72,455,899
ඊශ්‍රායල ඉදිකිරීම් සැකසුම් ගාස්තු	925,067,922	-	925,067,922	-
	1,326,403,876	**124,224,158**	**1,326,403,876**	**124,224,158**

4.2 Income from Overseas Mission

විස්තරය	2024	2024			2023
	සමූහය	කාර්යාංශය	කම්. සුභ. අර.	එකතුව	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
වියවාසනීයතාවය තක්සේරු කිරීම	89,149	-	89,149	89,149	6,053,405
රැකියා ඇණවුම් අනුමත කිරීම	206,093,347	-	206,093,347	206,093,347	234,272,037
සේවා නියුක්තිය තහවුරු කිරීම /ලියාපදිංචි කිරීම	1,446,475,231	-	1,446,475,231	1,446,475,231	1,451,594,530
ආපසු නොගෙවන නැන්පතු	403,906,145	-	403,906,145	403,906,145	820,054,700
ශ්‍රී. ල. වි. සේ. නි. කා ලියාපදිංචිය අලුත් කිරීම	79,255,255	70,942,105	8,313,149	79,255,255	88,990,136
විදේශ රැකියා නියෝජිත ආයතන අලුත් කිරීමේ ගාස්තු	21,640,430	-	21,640,430	21,640,430	18,650,823
ලැබී ඇති රක්ෂණ හිමිකම්	13,494,754	-	13,494,754	13,494,754	278,700
විවිධ ආදායම්	10,195,243	-	10,195,243	10,195,243	2,478,327
කොන්ත්‍රාත්තු ලියාපදිංචි කිරීමේ ගාස්තු	561,883,748		561,883,748	561,883,748	1,000,594,818
	2,743,033,302	**70,942,105**	**2,672,091,196**	**2,743,033,302**	**3,622,967,476**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

5 වෙනත් මෙහෙයුම් ආදායම්

විස්තරය	2024	2023	2024	2023
	සමූහය	සමූහය	ශ්‍රී. ල. වි. සේ. නි. කා	ශ්‍රී. ල. වි. සේ. නි. කා
	රු.	රු.	රු.	රු.
රක්ෂණයෙන් ලද කොමිස් (දේශීය හා විදේශීය)	-	72,091,357	-	72,091,357
වෙනත් ආදායම් (උප සටහන් 05.1)	632,508,286	1,996,841,386	449,162,788	1,924,286,115
	632,508,286	**2,068,932,743**	**449,162,788**	**1,996,377,471**

5.1 විවිධ ආදායම්

විස්තරය	2024	2024			2023
	සමූහය	කාර්යාංශය	සේ.සු.අ.	එකතුව	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	-	-	-	-	86,479
ස්ථාවර වත්කම් බැහැර කිරීම	-	-	-	-	5,486,461
සැපයුම්කරුවන්ගේ ආපසු නොගෙවිය යුතු තැන්පත් (ටෙන්ඩර්)	856,771	856,771	-	856,771	1,519,464
කොරියන් පොත් විකිණීම්	3,750	3,750		3,750	10,500
2009 අංක 56 දරන පනතේ 69(B) යටතේ අධිකරණයේ තැන්පතුවලින් 75 % ක්	8,055,531	-	8,055,531	8,055,531	7,239,963
කොරියන් විභාග ගාස්තු ආදායම්	262,606,962	262,606,962	-	262,606,962	362,425,917
තැණසල වෙතින් ලද ආදායම්	3,717,568	3,717,568	-	3,717,568	3,853,606
NVQ ගාස්තු	19,095,556	19,095,556	-	19,095,556	20,091,943
ගෘහ සේවිකාවන් අසාදුගත ලේඛන ගත කිරීම සහ අසාදු ලේඛන ගත කිරීම අවත් කිරීම	821,869	821,869	-	821,869	709,458
කොරියන් සුහුණු වන්නන්ගේ නිල ඇඳුම්	3,744,901	3,744,901	-	3,744,901	5,183,034
ගොඩනැගිලි කුලී	312,331	312,331	-	312,331	271,304
ජපානය සඳහා ශ්‍රමිකයින් පිටත් කර යැවීම වෙනුවෙන් ලද කොමිස් මුදල්	20,836,199	-	20,836,199	20,836,199	21,452,086
UAE සහ ඕමාන් බඳවා ගැනීම් සඳහා සැකසුම් ගාස්තු	81,101,215	81,101,215	-	81,101,215	66,625,899
කුලී ආදායම් - ශ්‍රී.ල. වි. සේ. නි. කා ගුවනාගාරය	1,325,315	1,325,315	-	1,325,315	2,603,250
ප්‍රදාන මගින් ලද ආදායම්	273,118	273,118	-	273,118	150,686
විකල්ප දැනුවත් කිරීමේ වැඩසටහන් - කොවිඩ්	-	-	-	-	9,859,276
ෂොංකොං ගුවන් සේවක තනතුර සඳහා පහසුකම් ගාස්තු	250,339	250,339		250,339	
වෙන්කිරීමේ ගාස්තු - කතරගම	2,030,927	2,030,927	-	2,030,927	1,438,174
කොරියානු බැලුම්කර ආපසු ගැනීම්	26,681,845	26,681,845	-	26,681,845	23,336,803
වෙනත් විවිධ ආදායම්	17,448,591	17,448,591	-	17,448,591	1,391,941,812
වෙනත් විවිධ ආදායම් එකතුව	**449,162,788**	**420,271,058**	**28,891,730**	**449,162,788**	**1,924,286,115**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

6 වියදම්

සේවක පිරිවැය

විස්තරය	2024	2023	2024	2023
	සමූහය	සමූහය	ශ්‍රී. ල. වි. සේ. නි. කා	ශ්‍රී. ල. වි. සේ. නි. කා
	රු.	රු.	රු.	රු.
වැටුප් හා වේතන	1,350,949,212	1,126,203,154	1,329,556,378	1,105,064,289
කාර්යය මණ්ඩල සුභ සාධන	350,422,968	207,231,831	345,716,908	205,833,351
සේ. අ. අ හා සේ. හා. අ	137,386,746	117,257,796	135,114,206	115,330,576
නිවාස ණය පොලී ප්‍රතිපූර්ණය කිරීම	7,263,199	8,590,850	7,263,199	8,590,850
ප්‍රසාද දීමනා	164,340,448	148,021,872	161,343,698	145,323,642
අතිකාල දීමනා	211,717,114	148,864,841	208,942,574	145,831,049
ගමන් වියදම්	93,001,543	37,233,748	93,001,543	37,233,748
පාරිතෝෂික	69,983,553	62,725,180	68,669,405	61,507,738
කාර්යය මණ්ඩල ණය වියදම්	50,452,406	42,422,362	50,452,406	42,422,362
කාර්යය මණ්ඩල ප්‍රහුණු කිරීම්	36,804,149	8,906,435	36,469,108	8,536,435
	2,472,321,338	**1,907,458,069**	**2,436,529,425**	**1,875,674,039**

පරිපාලන වියදම්

විස්තරය	2024	2023	2024	2023
	සමූහය	සමූහය	ශ්‍රී. ල. වි. සේ. නි. කා	ශ්‍රී. ල. වි. සේ. නි. කා
	රු.	රු.	රු.	රු.
මුද්‍රණ ලිපි ද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය	91,352,151	92,069,211	89,051,170	86,975,356
දුරකථන සහ තැපැල්	81,015,759	68,883,497	79,790,308	67,729,697
කුලී	372,419,223	320,582,034	372,419,223	320,582,034
ගොඩනැගිලි නඩත්තුව	143,701,728	77,162,294	142,103,148	76,170,854
විගණන ගාස්තු	2,655,499	3,356,900	2,246,500	3,074,000
විදුලි ගාස්තු	117,014,577	116,679,358	115,323,574	115,198,557
කැලි අනුපාත වැඩවල පිරිවැය	1,808,345	1,573,300	1,808,345	1,573,300
ආරක්ෂක ගාස්තු	70,408,319	73,165,894	69,171,576	72,254,149
අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු සහ ගමන් වියදම්	1,515,416	1,380,568	1,082,005	994,619
කතරගම නිවාඩු නිකේතනයේ වෙනත් වියදම්	40,755	-	40,755	-
ජල ගාස්තු	69,028,145	28,348,033	68,742,726	28,086,185
නීති සහ උපදේශන ගාස්තු	16,173,680	10,273,872	15,995,015	9,428,168
	967,133,597	**793,474,961**	**957,774,345**	**782,066,919**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මෙහෙයුම් වියදම්

විස්තරය	2024	2023	2024	2023
	සමූහය	සමූහය	ශ්‍රී. ල.වි. සේ. නි. කා	ශ්‍රී.ල. වි. සේ. නි. කා
	රු.	රු.	රු.	රු.
ස්ථාවර වත්කම් ක්ෂය වීම	426,908,924	235,772,091	420,678,766	228,894,253
මෝටර් වාහන ධාවන වියදම්	184,774,049	126,556,550	179,548,596	117,429,274
වාහන කුලී	94,983,157	27,955,404	94,983,157	27,955,404
පරිගණක නඩත්තු	17,510,076	27,015,907	16,760,496	26,588,632
කාර්යාල උපකරණ නඩත්තු කිරීම	32,398,229	28,347,262	32,198,804	24,097,055
පුවත්පත් සහ මාසික සහරා	1,324,395	1,545,724	1,292,165	1,513,624
බොල් ණය	1,912,620	207,000	1,912,620	207,000
පරිත්‍යාග	5,000	100,794,727	-	100,794,727
ස්ථාවර වත්කම් විකිණීමේ අලාභ	-	242,718	-	242,718
වෛද්‍ය රක්ෂණය	-	2,232,230	-	-
බදවා ගැනීමේ වියදම්	-	466,910,526	-	-
විවිධ වියදම්	3,737,312	4,155,868	608,705	1,174,252
	763,553,763	**1,021,736,008**	**747,983,310**	**528,896,940**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

වෙලඳ දැන්වීම් සහ ප්‍රචාරණය

විස්තරය	2024	2023	2024	2023
	සමූහය	සමූහය	ශ්‍රී.ල. වි. සේ. නි. කා	ශ්‍රී.ල. වි. සේ. නි. කා
	රු.	රු.	රු.	රු.
වෙළඳ දැන්වීම් වියදම්	119,203,977	57,385,145	118,775,769	57,385,145
රූපවාහිනී වැඩසටහන් පිරිවැය	4,270,778	30,632,283	4,270,778	30,632,283
රේඩියෝ වැඩසටහන් පිරිවැය	26,209,357	16,626,087	26,209,357	16,626,087
දැනුවත් කිරීමේ වැඩසටහන්	15,929,712	10,784,751	15,929,712	10,784,751
	165,613,825	**115,428,265**	**165,185,616**	**115,428,265**

ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්

විස්තරය	2024	2023	2024	2023
	සමූහය	සමූහය	ශ්‍රී. වි. සේ. නි. කා	ශ්‍රී. වි. සේ. නි. කා
	රු.	රු.	රු.	රු.
වෙළෙඳ ප්‍රවර්ධන	555,861,054	53,894,095	546,867,198	37,335,686
වෙළෙඳ පොළ ප්‍රවර්ධන ක්‍රියාකාරකම්	1,561,087	1,793,409	1,561,087	1,793,409
ශ්‍රමිකයන් සංක්‍රමණය වන රටවලින් පැමිණි ධුන මණ්ඩල වියදම්	684,743	3,054,538	684,743	3,054,538
ජපත් වැඩසටහන් සඳහා බදවා ගැනීම්	1,867,016	1,449,194	1,867,016	1,449,194
කොරියන් ව්‍යාපෘති සඳහා වියදම් සහ බදවා ගැනීම්	16,367,694	21,996,257	16,367,694	21,996,257
රීශ්‍රායල් වැඩසටහන සඳහා බඳවා ගැනීම්	6,795,630	1,714,507	6,795,630	1,714,507
නියෝජිත ආයතන ප්‍රදාන උත්සවය	-	13,462,505	-	13,462,505
සම්මන්ත්‍රණ සහ වැඩමුළු	287,468	1,371,296	287,468	1,371,296
	583,424,692	**98,735,800**	**574,430,837**	**82,177,391**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සුභ සාධන වෙනත් වියදම්

විස්තරය	2024	2023	2024	2023
	සමූහය	සමූහය	ශ්‍රී. වි. සේ. නි. කා	ශ්‍රී. වි. සේ. නි. කා
	රු.	රු.	රු.	රු.
පුහුණු ක්‍රියාකාරකම්	267,383,572	221,394,265	267,383,572	221,394,265
සංක්‍රමණික සේවකයන්ගේ රක්ෂණ පිරිවැය	349,000,329	430,282,026	349,000,329	430,282,026
සංක්‍රමණික සේවකයන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව	85,598,538	57,366,900	85,598,538	57,366,900
පාසල් පොත් බෙදා දීම	307,986,133	12,037,270	307,986,133	12,037,270
කම්කරු සේවය ලබා ගන්නා රටවල ධූත මණ්ඩල වියදම්	280,007	3,297,801	280,007	3,297,801
සංක්‍රමණිකයන්ගේ ආහාර, වෛද්‍ය හා වෙනත් වියදම්	39,971,853	38,492,263	39,971,853	38,492,263
සුභ සාධන මධ්‍යස්ථානය - සීදුව	10,589,683	11,255,036	10,589,683	11,255,036
දේශීය හා විදේශීය සමිතිකරණය හා අනෙකුත් සුභ සාධන කටයුතු	991,191	3,447,180	991,191	3,447,180
සංක්‍රමණිකයන් සඳහා සමාජ ශුභ සාධන පහසුකම්	11,846,038	19,954,015	11,846,038	19,954,015
ආබාධිත සංක්‍රමණික සේවකයන් සඳහා නිවාස වැඩසටහන්	1,928,995	353,075	1,928,995	353,075
සංක්‍රමණික සේවකයන් සඳහා සුභ සාධන පහසුකම්	129,607,977	41,188,136	129,607,977	41,188,136
විදේශ විගණන කටයුතු සඳහා විදේශ ගමන් වියදම්	-	9,950,327	-	9,950,327
අවමංගල්‍ය වියදම් සඳහා විශේෂ දීමනා	12,640,000	11,510,000	12,640,000	11,510,000
සංක්‍රමණික සේවකයන් සඳහා වෛද්‍ය බිල්පත්	7,767,561	9,719,600	7,767,561	9,719,600
ජාත්‍යන්තර සංක්‍රමණික දිනය	4,121,714	3,809,277	4,121,714	3,809,277
බස් ගාස්තු හා සංග්‍රහ සැපයීම්	16,828,524	2,233,395	16,828,524	2,233,395
සංක්‍රමණික සේවකයන් හා ඔවුන්ගේ පවුල් සඳහා වෛද්‍ය කඳවුරු	400,614	3,115,960	400,614	3,115,960
සංක්‍රමණිකයන් සහ අනෙකුත් පවුල් සඳහා සහාය වීම	57,001,439	155,431,553	57,001,439	155,431,553
විදේශ නානාපති සේවය - වෙනත් වියදම්	7,821,836	1,411,205	7,821,836	1,411,205
	1,311,766,003	**1,036,249,283**	**1,311,766,003**	**1,036,249,283**

මූල්‍ය සහ අනෙකුත් වියදම්

විස්තරය	2024	2023	2024	2023
	සමූහය	සමූහය	ශ්‍රී. වි. සේ. නි. කා	ශ්‍රී. වි. සේ. නි. කා
	රු.	රු.	රු.	රු.
මූල්‍ය ගාස්තු	24,096,512	16,881,692	23,949,187	6,149,314
කල්බදු සඳහා පොලී වියදම්	3,365,777	10,437,636	3,365,777	10,437,636
(එ) කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයෙන් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම වෙත ගෙවිය යුතු ශේෂය රු.3,524,406ක් වුවද ඒජන්සි සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයෙන් ලැබිය යුතු ශේෂය ලෙස රු.7,289,762ක් දක්වා තිබීම හේතුවෙන් එම ශේෂ අතර රු.3,765,356 ක නොගැසඳීමක් පැවතුණි.

(ඒ) 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිත (පෞද්.) සමාගමට ගෙවන ලද කාර්යය මණ්ඩල වැටුප් රු.2,137,808 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී සමාගමෙන් කාර්යාංශයට ප්‍රතිපූර්ණය කිරීමේදී ලැබියයුතු වැටුප් ගිණුමෙන් අඩුකිරීම වෙනුවට වැටුප් හා වේතන ගිණුමට බැර කර තිබීම හේතුවෙන් ලැබිය යුතු ශේෂය හා වැටුප් හා වේතන වියදම් එම වටිනාකමෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ක) 2023 වර්ෂයේදී අනතුරට ලක් වූ කාර්යාංශයේ වාහනය අළුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැය කරන ලද රු.4,476,433ක මුදල, එම පාඩුව වෙනුවෙන් අයවිය යුතු ලෙස දක්වා තිබුණු රු.5,077,427ක මුදලින් හිලව් නොකර අයවිය යුතු මුළු මුදලම කාර්යාංශයේ විවිධ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ග) කාර්යාංශයේ හෝමාගම සහ බත්තරමුල්ල ඉඩම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.392,745,770ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ච) වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර තිබූ කේවල ණය ශේෂ ලේඛනය අනුව නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.27,101,524 ක් වුවද ණය ලේඛනය අනුව එම ශේෂය රු.24,217,216ක් වූයෙන් සේවක ණය ශේෂයෙහි රු.2,884,308ක නොසැසඳීමක් පැවතුණි.

(ජ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ නියෝජිත ණයහිමියන් 1,332 දෙනෙකු වෙත ගෙවිය යුතු රු.421,362,764කට අදාල ණයහිමි ශේෂය සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකෙරුණි. ඒ අතුරින් අක්‍රිය නියෝජිතායතන 313කට අදාල ගෙවිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් ලබාගෙන නොතිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථන ඉදිරිපත් කළ ණයහිමියන් 40 දෙනෙකුගේ ශේෂයන්හි රු.50,418 සිට රු.1,672,099ක පරාසයක නොසැසඳීම් පැවතුණි.

1.3 සමූහයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමූහයේ වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමූහය පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමූහයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති (ඇ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සික්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමාකිරීම් තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර කාර්යාංශයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කාර්යාංශය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

(අ) ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිත ආයතන නියෝජනය කරන කාර්යංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වෙනත් විදේශ රැකියා නියෝජිත ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරන බව විගණනයේදී අනාවරණය විය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24හි 18 ඡේදය අනුව මෙම සම්බන්ධයෙන් සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 10.3 වගන්තිය හා 2021 ඔක්තෝබර් 14 දිනැති අංක PED/P/SLBFE/3/11(ii) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය	රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට පටහැනිව වාහන ණය, පොළී රහිත ණය, ක්ෂණික ණය සහ වන්දනා ණය ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.111,262,459ක ශේෂයක් පැවතුණි.

(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2020.03.25 දින 35 වන 2.14.1 වගන්තිය	අත්පොතෙහි අතිරේකයෙහි අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගෘහස්ථ අංශයේ රැකියාවන් සඳහා ප්‍රථම වරට විදේශගත වන ගෘහ සේවිකාවන්ට ලබාදීම සඳහා 2023 ඔක්තෝබර් 13 දින රු.138,600,000 ක් වටිනාකමැති සතොස වවුචර්පත් මිලදී ගෙන තිබුණි

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත නිරීක්ෂණ හැර කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට යොමුව		අනුකූල නොවීම
(අ)	1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත (i) 14 (1) වගන්තිය	විදේශ දූත මණ්ඩල සේවයේ තනතුරු සඳහා පැරණි බඳවා ගැනීමේ පටිපාටිය අනුව බාහිර අයදුම්කරුවන් නියමිත සුදුසුකම් සපුරා නොතිබීම මත බඳවාගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. නමුත් මේ දක්වා අනුමත වී නොතිබුණු නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව නැවත වරක් අයදුම්පත් කැඳවන ලෙස විෂයභාර අමාත්‍යවරයා විසින් 2023 සැප්තැම්බර් 07 දින වැඩබලන සභාපති වෙත ලිඛිත නියෝගයක් ලබාදී තිබුණි. ''කාර්යාංශයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ලිඛිත විධාන දෙනු ලැබිය හැකි අතර, කාර්යාංශය විසින් ඒ විධාන ක්‍රියාවේ යෙදවිය යුතුය'' යන පනතේ යොමුගත වගන්තිය පදනම් කරගෙන බාහිර අයදුම්කරුවන් 19 දෙනෙකු පැරණි බඳවා ගැනීමේ පටිපාටිය අනුවද, පළමුවර සුදුසුකම් සපුරා නොතිබීම මත ප්‍රතික්ෂේප කර තිබූ 08 දෙනෙකු ඇතුළුව 14 දෙනෙකු අනුමත වී නොතිබූ නව බඳවා ගැනීමේ පටිපාටිය අනුවද කාර්යාංශය විසින් බඳවා ගෙන තිබුණි.
	(ii) 48(1) වගන්තිය	කාර්යාංශයේ යෝජනා සම්මතයක බලය සහිතව මීස සුභ සාධන අරමුදලින් කිසිම ගෙවීමක් නොකළ යුතු වුවද, අමාත්‍යාංශය මගින් පවත්වා තිබූ ජයගමු ශ්‍රී ලංකා වැඩසටහන යටතේ සුහුරු පුවරු බෙදා දීමේ ව්‍යාපෘතිය සඳහා කාර්යාංශයේ අරමුණු වලින් බැහැරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය රහිතව සුභ සාධන අරමුදලින් රු.148,470,300 ක් වැය කර සුහුරු පුවරු 297ක් මිලදී ගෙන තිබුණි.
(ආ)	2022 අගෝස්තු මස 16 දිනැති අංක අමප/22/1067/625/002	දූත මණ්ඩලවල රැකියා හා සුබසාධන අංශ සඳහා කාර්යමණ්ඩලය බඳවා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය හා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ

දරන "විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල රැකියා හා සුබසාධන අංශ සඳහා කාර්යමණ්ඩල අවශ්‍යතා" මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණයේ (ii) තීරණය

නිලධාරීන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්ට නියම කර තිබුණි.

නමුත් මෙම තීරණය අනුව කටයුතු නොකර කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ විධායක ශ්‍රේණියේ එක් නිලධාරියෙකු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නියෝජනය කරන පරිදි දින අනුව වෙන් කර කාර්යාංශයේ සභාපති, සාමාන්‍යාධිකාරි, අතිරේක සාමාන්‍යාධිකාරි හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(විදේශ කටයුතු) යන නිලධාරීන් අතරින් දෙදෙනෙකු සමඟ තිදෙනෙකුගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල 4ක් සාමාන්‍යාධිකාරි විසින් පත්කර තිබුණි.

(ඇ) 2020 ජනවාරි 31 දිනැති අංක 36.05.21 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය

I. විදේශ දූත මණ්ඩල සේවය සඳහා කාර්ය මණ්ඩලය බදවා ගැනීමේදී පෙර සේවයේ යෙදී සිට නැවත පැමිණ වසර 05ක් ප්‍රධාන කාර්යාලයේ හෝ වෙනත් කාර්යාලයක සේවය කර තිබිය යුතුය යන තීරණයට පටහැනිව 2023 අප්‍රේල් 6 දිනැති අංක 1/2023 දරන සභාපතිවරයාගේ අභ්‍යන්තර වක්‍රලේඛය මඟින් වසර 03 ක් ලෙස සංශෝධනය කර එදින සිට 2023 මැයි 02 දින දක්වා විදේශ දූත මණ්ඩල සේවය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා තිබුණි. ඒ අනුව අයදුම්පත් කඳවා දින 50කට පසුව එනම් 2023 ජූනි 22 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මඟින් වසර 03ක් ලෙස සංශෝධනය කර තිබුණි.

II. කාර්යාංශයේ නිලධාරීන්ගෙන් ලද අයදුම්පත් 145ක් අතුරින් බඳවාගත් සංඛ්‍යාව 17ක් වූ අතර ඒ අතුරින්ද 6 දෙනෙකු මින් පෙර විදේශ දූත මණ්ඩල වල සේවය අවසන් කර පැමිණ වසර 05 සම්පූර්ණ නොවූ නිලධාරීන් දෙදෙනෙකු 3 වන හා 4වන වතාවටත් බඳවාගෙන තිබුණි.

III. ඩුබායිහි පිහිටි කම්කරු සුභ සාධන අංශයේ උපදේශක ලෙස සේවයේ නියුතුව සිටි නිලධාරිනිය 2023 සැප්තැම්බර් 28 දින විශ්‍රාම යාම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා සුදුසුකම් සහිත නිලධාරියෙකු බඳවා නොගෙන, කාර්යාංශයේ සභාපතිගේ අංක 01/2023 දරන වක්‍රලේඛය ප්‍රකාරව ඩුබායි කම්කරු සුභසාධන අංශයේ උපදේශකව සිට ලංකාවට පැමිණ මාස 18ක් නොඉක්මවූ දූත මණ්ඩල සේවය සඳහා අයදුම්පත් යොමු කිරීමට සුදුසුකම් නොලබන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගුවන් තොටුපල ඒකකය) තනතුරෙහි කටයුතු කළ නිලධාරිනියක පුරප්පාඩුව ඇති

වූ දින සිටම පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව එම නිලධාරිනිය 2023 නොවැම්බර් 23 දින සිට මාස 03ක් සඳහා තාවකාලික පදනම මත පත් කර 2024 නොවැම්බර් 26 දින තවත් වසරකට සේවා දිගුවක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී 2025 පෙබරවාරි 27 දින නැවත ලංකාවට කැඳවා තිබුණි.

(ඇ) 2023 සැප්තැම්බර් 21 දිනැති අංක 40/2023 දරන සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) අභ්‍යන්තර උපදෙස් පත්‍රිකාව

විදේශ දූත මණ්ඩල කම්කරු සුභසාධන අංශයන්හි සියලුම ලියවිලි පරීක්ෂා කර ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් කළයුතු වුවත් මුදල් විෂයය අධීක්ෂණය සඳහා වූ කළමනාකරුවෙකු ප්‍රධාන කාර්යාලයේ සිටියදී තානාපති කාර්යාල වලින් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගත් ලිපි ලේඛන මුදල් විෂයය සම්බන්ධ අධීක්ෂණ නිලධාරියෙකු නොමැති බදුල්ල පළාත් කාර්යාලය වෙත යැවීම හේතුවෙන් මුදල් ගනුදෙනු සම්බන්ධ අධීක්ෂණයක්වී නොතිබුණි.

2025 පෙබරවාරි 27 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා කමිටුවේදී මේ සම්බන්ධයෙන් සිදු කළ සාකච්ඡාවේදී මූල්‍යමය කටයුතු ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශය මගින් සිදු විය යුතු බවට සාකච්ඡා වූ නමුත් විගණිත දිනය වූ 2025 මැයි 30 දින දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) ශ්‍රී ලංකාව හා දකුණු කොරියාව යන රාජ්‍යයන් දෙක අතර ගිවිස ගෙන තිබූ අවබෝධතා ගිවිසුමේ 11(3) වගන්තිය අනුව ශ්‍රමිකයින් විදේශගත වීමට අවශ්‍ය ගුවන් ටිකට්පත් කාර්යාංශය මගින් වෙන් කිරීම සිදු කළ යුතු වුවද, එය විදේශ රැකියා ඒජන්සි සමාගම වෙත ලබා දී තිබුණි. විදේශ රැකියා ඒජන්සි සමාගමට සෘජුවම ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ ටිකට්පත් මිලදී ගැනීමට හැකියාව තිබියදී පුද්ගලික නියෝජිතායතන මගින් මිල ගණන් කැඳවීම, හේතුවෙන් ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ මිල ගණන් ඉක්මවා රු. 3,000 සිට රු.72,000 දක්වා අතර වැඩි මිල පරාසයක් තුළ ටිකට්පත් මිලදී ගැනීම සිදු කර තිබුණු බව 2023 ජනවාරි සිට සැප්තැම්බර් 20 දින දක්වා සිදු කළ නියැදි පරීක්ෂාවෙදී අනාවරණය විය. එහිදී ශ්‍රමිකයින් 3,767 දෙනෙකුගෙන් රු.122,560,467 ක් වැඩිපුර අයකර තිබූ අතර ඉන් විදේශ රැකියා ඒජන්සි සමාගමට රු.27,786,521 ක් ලාභයක් ලැබීමෙදී පුද්ගලික නියෝජිතායතන 4 කට රු.94,774,446 ක ලාභයක් උපයා ගැනීමට කටයුතු සැලසී තිබුණි.

(ආ) කාර්යාංශය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් 2025 පෙබරවාරි 25 දින අනුමත කරන ලද කාර්ය මණ්ඩලය තුළ ඇතුළත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 12ත් තනතුරු 09 ක් 2023 වර්ෂයේ සිට වාර්තාවේ දිනය දක්වාම වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි.

(ඇ) ඕමාන් තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේ රාජකාරී කටයුතු සඳහා නිදෙනෙකු පමණක් පත්කර තිබියදී 2022 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළ එහි සිදු වී තිබූ විනය විරෝධී ක්‍රියා හේතුවෙන් 2022 නොවැම්බර් 09 දින තුන්වන ලේකම්ගේ වැඩ තහනම් කර තිබුණි. සුරක්ෂා නිවාසයේ නවාතැන් ගෙන සිටි ගෘහ සේවිකාවන් 100කට අධික ප්‍රමාණයක් භාරව සියළු කටයුතු සුරක්ෂා නිවාස පාලිකාව විසින් තනිව සිදු කර තිබූ අතර එම ගෘහ සේවිකාවන් කලහකාරී ලෙස හැසිරී සුරක්ෂා නිවාසයට අලාභහානි සිදුකර තිබුණි. අදාළ ගොඩනැගිල්ල පරිපාලන කටයුතු සඳහා භාවිතා කිරීමට ගිවිසුම්ගත වී තිබුණද, එය සුරක්ෂා නිවාසයක් ලෙස භාවිතා කිරීමෙන් ගිවිසුම කඩවීම මත එම නිවසේ හිමිකරු වෙත අලාභ ගෙවිය යුතුව තිබුණි. 2023 පෙබරවාරි 01 දින එම ගොඩනැගිල්ලෙන් ඉවත් වුවද, අලාභය තක්සේරු කිරීම 2023 මැයි දක්වාම ප්‍රමාදවීම හේතුවෙන් කුලී මුදල, ජල හා විදුලි බිල්පත් ඇතුලුව අලාභහානි සඳහා එකතුව රු.19,130,480 ක් 2023 ජූලි 11 දින ගෙවා තිබුණි. තවද, එහි ඇතිවූ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා වසරක් තුළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු කණ්ඩායම් ඇතුළුව නිලධාරී කණ්ඩායම් 3ක් ඕමාන් රාජ්‍යය වෙත යැවීම සඳහා රු.17,262,076ක් වැය කර තිබුණි. ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් යොමු කරන ලෙස තානාපතිතුමන් විසින් කාර්යාංශයේ සභාපති දැනුවත් කර තිබුණද, ඒ සඳහා නිවැරදි තීරණ නොගැනීම නිසා රු.36,392,556ක් අමතරව වැය කිරීමට සිදුවී තිබුණි.

(ඈ) 2013 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05කට අවබෝධතා ගිවිසුමක් අත්සන් කර කාර්යාංශය විසින් 2013 මාර්තු 08 දින සමෘද්ධි අධිකාරිය වෙත රු.මිලියන 100ක මුදලක් ගෙවා තිබුණි. ගිවිසුමට අනුව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සොයාබැලීම සඳහා ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුවක් පත් කිරීම හා කාර්යාංශය නමින් සමෘද්ධි බැංකුවේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම යන කොන්දේසි සමෘද්ධි අධිකාරිය විසින් කඩකුර තිබුණි. තවද යම් පාර්ශවයක් ගිවිසුම කඩකරයි නම් මාස 06කට පෙර දැනුම්දී ඉවත් වීමට අවස්ථාව තිබී ඇති නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2018 වර්ෂයේදී ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසුව හෝ කාර්යාංශයේ මූල්‍ය අංශයේ වගකිව යුතු නිලධාරීන් විසින් මේ පිළිබඳව තොරතුරු ලබා ගෙන ඉතිරි මුදල හෝ අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට මෙම මුදලට අදාල පොලී මුදල රු. මිලියන 241ක් සමඟ මුළු මුදල රු. මිලියන 341ක් බවට ශේෂ සනාථන ලිපියක් පමණක් ලබා ගෙන තිබුණි.

(ඉ) 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී විගමණික ශ්‍රමිකයින් වෙත ගෙවිය යුතු රු.72,720,528ක ශේෂයක් අදාළ කාලසීමාවේදී කඩිනමින් ගෙවීම කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ඔවුනට අහිමි වී තිබුණු අතර 2019 සිට 2024 දක්වා විගමණික ශ්‍රමිකයින් වෙත ගෙවිය යුතු ශේෂය රු.78,343,308ක්ව පැවතුණි.

(ඊ) 2024 අප්‍රේල් 04 සිට අගෝස්තු 13 දින දක්වා ඊශ්‍රායල් රාජ්‍යය වෙත ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා විදේශගත කිරීමට අයදුම් කර තිබූ 1,125 දෙනෙකුගෙන් බඳවා ගැනීමේ ගාස්තු ලෙස කාර්යාංශය විසින් ඇමරිකන් ඩොලර් 1,000ක් එනම් රු.311,000ක් බැගින් අයකර තිබුණි. එහෙත් ඊශ්‍රායල් රජය හා ශ්‍රී ලංකා රජය අතර අත්සන් කරන ලද සංශෝධිත ගිවිසුම අනුව 2024 සැප්තැම්බර් 04 දින සිට එය ඇ.ඩො. 502ක් ලෙස එනම් රු.154,000ක් වී තිබීම හේතුවෙන් කාර්යාංශය විසින් එක් අයෙකුගෙන් රු.157,000 බැගින් 1,125 දෙනෙකුගෙන් රු.176,250,000ක් වැඩිපුර අයකර රඳවාගෙන තිබුණි.

(උ) ජන්‍යන්තර පිළිකා දිනය නිමිත්තකොට ගෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා අත්‍යවශ්‍ය ඖෂධ හා උපකරණ මිලදී ගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස් කරන ලෙස අමාත්‍යවරයා විසින් 2022 දෙසැම්බර් 23 දින ඉල්ලීමක් කාර්යාංශයේ සභාපතිවරයා වෙත යොමු කර තිබුණි. ඒ අනුව පිළිකා රෝහල් දෙකක සිදු කරන ලද සමීක්ෂණයක් පදනම් කරගෙන 2023 ජනවාරි 20 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරියෙකු සමඟ සාකච්ඡාවක් පවත්වා, එදිනම විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකින් ලබාගත් අනුමැතිය මත 2023 ජනවාරි 23 දින කාර්යාංශය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සංවර්ධන අරමුදලට රු. මිලියන 100 ක් ලබාදී තිබුණි. කෙසේ වෙතත් විදේශගතව සිටින ශ්‍රමිකයින්ගේ පවුල්වල සාමාජිකයින් හා විදේශගතව සිට ආපසු මෙරටට පැමිණ ඇති පිළිකා රෝගවලින් පෙළෙන ශ්‍රමිකයින් වෙත මෙමඟින් ප්‍රතිලාභයක් ලැබුණේද යන්න පසුවිපරම් සිදු කර නොතිබුණි.

(ඌ) කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතන විසින් සපයනු ලබන සේවාවන්, ජංගම සේවා මාලාවක් ''ජයගමු ශ්‍රී ලංකා (Glocal fair) '' නමින් 2024 ජනවාරි 31 දින සිට ජූලි 28 දින දක්වා දිස්ත්‍රික්ක 24ක් ආවරණය කරමින් පවත්වා තිබූ අතර ඒ සඳහා කාර්යාංශය විසින් රු.1,259,752,579ක් වැයකර තිබුණි. ඒ තුළ විගමණික ශ්‍රමිකයින් වෙනුවෙන් සුභසාධන කටයුතු සඳහා රු.257,026,770ක් පමණක් වැයකර තිබුණි. විදේශ රැකියා නියෝජිතායතන වෙත වෙළඳ කුටි මිලදී ගැනීම සඳහා සෙස් බදු අරමුදල් භාවිතා කළ හැකි බව කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී විසින් 2023 ජූනි 13 දින අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබුණු අතර ඒ අනුව එක් වෙළඳ කුටියක් රු.500,000 බැගින් කුටි 920 ක් ලබාදීම සඳහා රු.542,800,000ක් පුද්ගලික ආයතනයක් වෙත ගෙවීම් කර තිබුණි. නියෝජිතායතන 115ක් සම්බන්ධ වී රැකියා අවස්ථා වැඩි කිරීමේ අරමුණින් මෙය පවත්වා තිබුණද, 2025 අප්‍රේල් 30 දින වන විටත් නියෝජිතායතන 28ක් මඟින් ශ්‍රමිකයින් 840දෙනෙකු පමණක් විදේශ ගත කර තිබූ අතර නියෝජිතායතන 87 ක් මඟින් කිසිවකු විදේශගත කර නොතිබුණි. කාර්යාංශය විසින් 2023 වර්ෂයේ සෙස් බදු ආදායමෙන් රු.542,800,000ක් භාවිතා කර සමස්ත නියෝජිත ආයතන 1019කින් නියෝජිත ආයතන 59කට පමණක් විශේෂ වරප්‍රසාදයක් ලබාදී තිබූ අතර නියෝජිත

ආයතන 960කට ප්‍රතිලාභ අහිමි වී තිබුණි. එමෙන්ම, වැඩසටහන් 21ත් 24ත් අතර සංඛ්‍යාවකට සහභාගි වී තිබූ නියෝජිත ආයතන 10න් 4ක්ම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගේ ආයතන විය. වෙළඳකුටී මිලදී ගැනීම, ස්මාර්ට් බෝඩ් මිලදී ගැනීම,සහභාගිකයින් සඳහා සංග්‍රහ වියදම් හා මාධ්‍ය ප්‍රචාරණ කටයුතු ආදිය සඳහා රු.1,002,725,809ක නිශ්කාර්ය වියදමක් දරා තිබුණි.

(එ) විදෙස් ගත සේවය අවසන් කර පැමිණ තිබූ ශ්‍රමිකයින්ගේ සුභසාධන කටයුතු සිදු කිරීම සඳහා කාර්යාංශයේ ප්‍රතිසංවිධාන අංශයක් පවතින අතර, 2024 වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මට අනුව වැඩසටහන් 04ක් සඳහා රු. මිලියන 44.04ක් වැය කර ප්‍රතිලාභ ලබාදී තිබියදී, මෙම අරමුණ සඳහාම කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමේ රැස්වීම් 03ක් විගමණික හරසර නමින් පැවැත්වීමට 2024 ජූලි 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීමකට අනුව මේ සඳහා වැය වන මුදල් ලබාදීමට 2024 ජූලි 16 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී රු.62,756,542ක් අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. ජනාධිපතිතුමාගේ, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයාගේ සහ කම්කරු හා විදේශ රැකියා රාජ්‍ය අමාත්‍යවරයාගේ සුබපැතුම් 3 ක් ඇතුළත් ලිපිගොනු 15,000ක් මුද්‍රණය සඳහා රු.1,935,000 ක්ද, ශ්‍රමිකයන් ප්‍රවාහනය සඳහා රු.8,230,375ක්ද , ආහාරපාන සඳහා රු.14,855,000ක්ද සහ රැස්වීම පැවැත්වීමට ශාලාවක් සකස් කිරීම හා වෙනත් වියදම් සඳහා රු.37,736,167ක් වශයෙන් එකතුව රු.62,756,542 ක් ඵලදායී නොවන කාර්යයන් වෙනුවෙන් වැය කර තිබුණි.

(ඒ) රැකියා වෙළෙඳ පොළ පිළිබඳව හා දේශීය සහ විදේශීය රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු ලබා දීම, යන අරමුණු සඳහා කාර්යාංශය විසින් 2024 ජනවාරි 31 දින සිට ජූලි 28 දින දක්වා දිස්ත්‍රික්ක 25කම ජයගමු ශ්‍රී ලංකා නමින් දින දෙකක වැඩසටහන් සතිපතා පවත්වමින් යන අවස්ථාවක එම අරමුණු සඳහාම ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් පවත්වන Smart Youth දිස්ත්‍රික් වැඩසටහන් 15ක් සඳහා සහභාගී වීමට රු. මිලියන 9.4 ක ඇස්තමේන්තුගත වියදමක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු අතර, 2024 ජූනි 14 හා 15 දෙදින ගාල්ල සහ ජූනි 28 හා 29 දෙදින කුලියාපිටිය යන ප්‍රදේශයන්හි පවත්වා තිබූ වැඩසටහන් සඳහා සහභාගී වී රු.3.198,164 ක් අනාර්ථික ලෙස වැය කර තිබුණි.

(ඔ) ප්‍රථමවරට විදේශගතවන ගෘහසේවිකාවන්ට ලබාදීම සඳහා මිලදීගෙන තිබූ සතොස වවුචර්පත් වලින් 2025 මැයි 07 දින වන විටත් රු.25,250,000ක් වටිනා වවුචර්පත් ප්‍රධාන කාර්යාලයේ ඉතිරිවී තිබූ අතර, රු.52,370,000ක් වූ වවුචර්පත් 5,237ක් ලබා ගැනීමට විදේශගතවූ ගෘහ සේවිකාවන් සුදුසුකම් ලබා තිබුණද, දත්ත පද්ධතිය තුළ ඔවුන්ගේ නිවැරදි තොරතුරු ඇතුළත් කර නොතිබීම මත වාර්තාවේ දිනය දක්වාම ප්‍රතිලාභීන් වෙත ලබාදීමට නොහැකිව පළාත් කාර්යාල වල පැවතුණි. ඒ අනුව වවුචර්පත් මිලදීගෙන මාස 19ක් ගතව තිබුණද රු.77,620,000ක් වටිනා වවුචර්පත් බෙදා දීමට නොහැකි වී තිබීම හේතුවෙන් මෙම මුදල් වෙනත් ආයෝජනයක යෙදවීමෙන් උපයාගත හැකිව තිබූ ආදායම සුභසාධක අරමුදලට අහිමි වී තිබුණි.

(ඔ) 2018 වර්ෂයට පෙර සිට භාණ්ඩාගාරයෙන් ලැබියයුතු ශේෂයක් ලෙස (Labour contract agreement fees) පැවතෙන රු.869,955,801 ක මුදල නිරවුල් කරගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(ක) 2013 ජනවාරි 18 දින රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත කහගොල්ල ඉඩම සඳහා රු.20,000,000ක් ගෙවීම් කර වර්ෂ 12කට වැඩි කාලයක් ගතවී තිබුණද මුදල් නැවත අයකරගැනීම හෝ ඉඩම අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ජ.ම්.ව.බී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)

විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ නිරීක්ෂණ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිතයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

	විගණකාධිපති වාර්තාව	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම
1.2	**තන්ත්වා ගණනය කළ මතය සඳහා පදනම**	
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01හි 32 ඡේදය ප්‍රකාරව වත්කම් සහ වගකීම් හෝ ආදායම් සහ වියදම් හිලව් කිරීම සිදු නොකළ යුතු වුව ද, නියෝජිත ආයතන මගින් ලැබිය යුතු වූ රු.46,688,508 ක්. ඔවුන්ට ගෙවිය යුතු ශේෂ සමඟ හිලව් කර දක්වා නිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ලැබිය යුතු ශේෂය හා ගෙවිය යුතු ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී වත්කම් සහ වගකීම් වෙන වෙනම ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 66 ඡේදය අනුව මාස 12 ක් තුළ උපලබයි වෙතැයි අපේක්ෂා කරන වත්කම් පමණක් ජංගම වත්කම් ලෙස දැක්විය යුතු වුවද වසර තුනකින් අයකර ගැනීමේ පදනම මත 2024 වර්ෂයේදී මනුසවිය බහු විධ ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී තිබූ රු. 234,480,000ක් වූ සම්පූර්ණ මුදලම ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි.	ආ) බහුවිධ ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදී ඇති ණය මුදල් වලට අදාළ වත්කම් වර්ගීකරණය එනම් ජංගම වත්කම්, ජංගම නොවන වත්කම් ලෙස 2025 වර්ෂයේදී අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කරනු ඇත.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 36 හා 38 ඡේද ප්‍රකාරව 2023 වර්ෂයේදී කාර්යාංශය සතු දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී විදේශ දූත මණ්ඩලවල පවතින පිරිවැය රු.452,694,904ක් වූ දේපළ, පිරියත හා උපකරණ හා පිරිවැය රු.6,450,000 ක් වූ ඉඩම් 2 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.	(ඇ) විදේශ දූත මණ්ඩලවල වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.දඹුල්ල හා රත්නපුර ඉඩම් දෙකෙහිම ප්‍රත්‍යාගණන කටයුතු ඉදිරියේදී සිදුකිරීමට අපේක්ෂා කරනු ලැබේ.
(ඈ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිත (SLFRS) 10 හි 19 ඡේදය අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එක සමාන ගනුදෙනු හා සිද්ධීන් සම්බන්ධයෙන් එක හා සමාන ගිණුම් කරණ ප්‍රතිපත්තීන් භාවිතා කරමින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කළ යුතු වුවත්, වත්කම් ක්ෂය කිරීම හා ආයෝජන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම සහ කාර්යාංශය විසින් එකිනෙකට වෙනස් ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර තිබියදී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.	(ඈ) කාර්යාංශය සමඟ අනුගත වන ක්ෂය හා ආයෝජන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම දැනුවත් කර ඇත. 2025 වසර අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ඒ අනුව කටයුතු සිදුකරනු ඇත.

(ඉ)	මූල්‍ය කල්බදු පදනම මත ලබාගත් වටිනාකම රු.410,675,000 ක් වූ මෝටර් රථයෙහි කල්බදු මුදල් 2023 වර්ෂයේ අවසානය වන විට ගෙවා අවසන් වී තිබියදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1667 ඡේදය අනුව කාර්යාංශයේ වත්කමක් ලෙස දැකිවීමකින් තොරව තව දුරටත් කල්බදු වත්කම් යටතේ දක්වා තිබුණි.	(ඉ) කාර්යාංශ හිමිකාරීත්වය සතු වත්කම් ලෙස මේ වන විට නිවැරදි කර ඇත.
(ඊ)	තානාපති කාර්යාල කම්කරු සුභ සාධන අංශය විසින් ඉදිරිපත් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන වල දැක්වෙන මුදල් පොත අනුව බැංකු ගිණුම් ශේෂය සහ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එම බැංකු ශේෂයන් අතර රු.3,582,113 ක වෙනසක් පැවතුණි.	(ඊ) අදාළ ශේෂයන් නිවැරදි කරන ලෙසටත්, අවශ්‍ය ගැලපීම් සිදුකරන ලෙසටත් දූත මණ්ඩල වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත.ඒ අනුව නිවැරදි කිරීම් සිදුකර ඇත.
(උ)	කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන වල කෙරිගෙන යන වැඩ (capital work in progress) යටතේ දක්වා තිබුණු 2018 වර්ෂයේදී මතුගම පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා උපදේශන ගාස්තු ලෙස ගෙවන ලද රු.3,884,584 ක් ව්‍යාපෘතිය අත්හැර දැමීම හේතුවෙන් අලාභයක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.	කාර්යාංශ ගිණුම් තුල 2018 වර්ෂයේ සිට කෙරිගෙන යන වැඩ ලෙස මතුගම පුහුණු මධ්‍යස්ථානයට අදාළව ගෙවන ලද රු. 3,884,584ක මුදල උපදේශන ගාස්තු ලෙස ගිණුම් ගතවී ඇත. එය ඉදිකිරීමකට අදාළව කෙරිගෙන යන වැඩ සඳහා අදාළ උපදේශන සේවා සැපයුම් වෙනුවෙන් දරන ලද වියදමක් බැවින් අලාභයක් ලෙස හඳුනාගැනීම සඳහා පදනමක් නැත.ඉදිරියේදී ඉදිකිරීම් කිරීමට බලාපොරොත්තු වේ.
(ඌ)	අමාත්‍යවරයාගේ විදේශ සංචාර වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට කාර්යාංශය වෙත අයවිය යුතු රු.3,419,544 ක් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ලෙස ගිණුම්ගත නොකර කාර්යාංශයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	(ඌ) විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලැබිය යුතු ඉතිරි මුදල වන රු.3,419,544/- ක වටිනාකම ගිණුම් තැබීමට කටයුතු සිදුකර ඇත.
(එ)	කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයෙන් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම වෙතගෙවිය යුතු ශේෂය රු.3,524,406 ක් වුවද ඒජන්සි සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයෙන් ලැබිය යුතු ශේෂය ලෙස රු.7,289,762 ක් දක්වා තිබීම හේතුවෙන් එම ශේෂ අතර රු.3.765,356 ක නොසැසඳීමක් පැවතුණි.	(එ) විදේශ රැකියා නියෝජිත ආයතනය හා කාර්යාංශ සැසඳුම් සිදුකර අවශ්‍ය ගැලපීම් සිදුකර 2025 වර්ෂයේ අවසන් ගිණුම් තුලින් නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
(ඒ)	2023 වර්ෂයේදී ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිත (පෞද්.) සමාගමට ගෙවන ලද කාර්යය මණ්ඩල වැටුප් රු.2,137,808 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී සමාගමෙන් කාර්යාංශයට ප්‍රතිපූර්ණය කිරීමේදී ලැබිය යුතු වැටුප් ගිණුමෙන් අඩු කිරීම වෙනුවට වැටුප් හා වේතන ගිණුමට බැර කර තිබීම හේතුවෙන් ලැබිය යුතු ශේෂය හා වැටුප් හා වේතන වියදම එම වටිනාකමෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.	(ඒ) 2025 වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු සිදුකර ඇත.

(ක)	2023 වර්ෂයේදී අනතුරට ලක් වූ කාර්යාංශයේ වාහනය අළුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිතවර්ෂයේදී වැය කරන ලද රු. 4.476,433 ක මුදලු, එම පාඩුව වෙනුවෙන් අයවිය යුතු ලෙස දක්වා තිබුණු රු.5,077,427 ක මුදලින් හිලව් නොකර අයවිය යුතු මුළු මුදලම කාර්යාංශයේ විවිධ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.	(ක) 2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු සිදුකර ඇත.
(ග)	කාර්යාංශයේ හෝමාගම සහ බත්තරමුල්ල ඉඩම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.392.745,770ක් ගිණුම් ගත කර නොතිබුණි.	(ග) කාර්යාංශය ශේෂ පත්‍ර දිනට හිමිකමක් නොමැති වත්කම් ගිණුම්ගත කිරීම යෝග්‍ය නොවේ. 2025 අවසන් ගිණුම් තුලින් හිමිකම් නොමැති වත්කම් හෙළිදරව් කිරීමට කටයුතු සිදුකරනු ඇත. බත්තරමුල්ල ඉඩමට අදාළ ගිණුම් සටහන් තබා ඇත.
(ච)	වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර තිබූ කේවල ණය ශේෂ ලේඛනය අනුව නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.27,101,524 ක් වුවද ණය ලේඛනය අනුව එම ශේෂය රු.24,217,216ක් වූයෙන් සේවක ණය ශේෂයෙහි රු.2,884,308ක නොසැසඳීමක් පැවතුණි	(ච) අවසන් ගිණුම්වල දක්වා ඇති ශේෂයන් සඳහා ඊට සමාන උපලේඛන විගණනයට ඉදිරිපත් කර ඇත. කාර්යාංශය විසින් විවිධ ණය සඳහා පාලන ගිණුම් ගිණුම්කරණ පද්ධතිය තුළ පවත්වාගෙන යනු ලබයි. විස්තරාත්මක එක් එක් ණය සඳහා ගිණුම්කරන පද්ධතියෙන් පරිබාහිරව උප ලෙජරය නඩත්තු කර තුලනය කරමින් වර්ෂය තුළ පවත්වාගෙන යනු ලබයි. එසේ විස්තරාත්මකව පවත්වාගෙන යනු ලබන ණය ලේඛන මඟින් එක් එක් පුද්ගලයන් වෙනුවෙන් පවත්නා උපලේඛනයක් අදාළ පාලන ගිණුම් සමඟ තුලනය කර එය විගණනය වෙත ඉදිරිපත් කර ඇත.
(ජ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ නියෝජිත ණය හිමියන් 1,332 දෙනෙකු වෙත ගෙවිය යුතු රු.421,362,764 කට අදාල ණය හිමි ශේෂය සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකෙරුණි. ඒ අතුරින් අක්‍රිය නියෝජිතායතන 313 කට අදාල ගෙවිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීම් ලබාගෙන නොතිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ සනාථන ඉදිරිපත් කළ ණය හිමියන් 40 දෙනෙකුගේ ශේෂයන්හි රු.50,418 සිට රු. 1,672,099 ක පරාසයක නොසැසඳීම් පැවතුණි.	අදාළ ලැබිය යුතු ශේෂයන් පිළිබඳව වාර්තා පවත්වාගෙන යා යුත්තේ නියෝජිත ආයතන වන අතර ඔවුන්ගේ ගිණුම් කටයුතු පිළිබඳව කාර්යාංශයට තහවුරුවක් ලබා දීමට නොහැක. නමුත් කාර්යාංශය සතුව පවත්නා ලැබීම් රිසිට්පත් ගිණුම්ගත කර ඇති ආකාරය අනුව සහ කාර්යාංශ අනුමැතිය ලබා දී ඇති උපලේඛන, රැකියා ඇණවුම්, නැවත ලියාපදිංචි දත්ත පදනම් කරගෙන අවශ්‍ය නම් අතිරේක පරීක්ෂාවක් ඉහත ශේෂ තහවුරුව සම්බන්ධයෙන් සිදු කළ හැකිවේ. කාල විශ්ලේෂණ වාර්තා පිළියෙල කර විගණනය වෙත ලබාදීමට අපේක්ෂා කරන අතර ගිණුම්කරන පද්ධතිය සපයා ඇති ආයතන දැනුම් දී ඇත්තේ අවුරුදු ගණනාක දත්තයන් රාශියක් ඇති බැවින් ඒවා ගොනුගත කර අදාළ වර්ෂයට පිළියෙල කිරීමට වැඩි කාලයක් ගතවන බවයි. ඒ අනුව මෙය 2025 වර්ෂයේ අවසන් ගිණුම් සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

	නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 10.3 වගන්තිය හා 2021 ඔක්තෝබර් 14 දිනැති PED/P/SLBFE/3/11(ii) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය	රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට පටහැනිව වාහන ණය, පොළී රහිත ණය, ක්ෂණික ණය සහ වන්දනා ණය ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.111.262,459 ක ශේෂයක් පැවතුණි	1985 අංක 21 දරන පාර්ලිමේන්තු පනත මඟින් විදේශ රැකියා ක්ෂේත්‍රය නියාමනය හා පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිහිටුවා ඇති අතර, කාර්යාංශය ආරම්භයේ සිටම මේ දක්වා කාර්යාංශය උපයා ගනු ලබන අරමුදල් පදනම් කර ගෙන කාර්යාංශයෙහි කටයුතු සිදු කරනු ලබන අතර, මහා භාණ්ඩාගාරය වෙතින් අරමුදල් සපයා ගැනීමක් සිදුව නොමැත. සේවක සුබසාධන ණය යෝජනා ක්‍රමයන් ලෙස කාර්ය මණ්ඩලයට ණය ලබාදීමේ ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ක්‍රියාත්මක කරනු ලබයි. කාර්යාංශය විසින් සේවක ණය යෝජනා ක්‍රමයන් රජයේ ප්‍රතිපත්තියට යටත්ව ක්‍රියාත්මක කරනු ලබන අතර, 1999.08.02 දිනැති ලිපියට අනුව කාර්යාංශය විසින් ලබාදෙනු ලබන ණය යෝජනා ක්‍රමයන්හි පොළී ප්‍රතිශතයන් අඩු කිරීම සම්බන්ධයෙන්ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව, කාර්ය මණ්ඩලය වෙත ලබාදෙන ණය යෝජනා ක්‍රමයන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙහි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාව මත ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රමයන්වේ.
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි 2020.03.25 දින 35 වන අතිරේකයෙහි 2.14.1 වගන්තිය	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගෘහස්ථ අංශයේ රැකියාවන් සඳහා ප්‍රථම වරට විදේශගත වන ගෘහ සේවිකාවන්ට ලබාදීම සඳහා 2023 ඔක්තෝබර් 13 දින රු 138,600,000 ක් වටිනා සතොස වවුවරපත් මිලදී ගෙන තිබුණි	ගෘහස්ථ අංශයේ රැකියාවක් සඳහා ප්‍රථම වරට විදේශ ගත වන ගෘහ සේවිකාවන්ට ලබා දීම සඳහා රජය සතු සහ දිවයිනේ සෑම ප්‍රදේශයකම විහිදී පවතින එකම ආයතනය සතොස බැවින්, සෘජු මිලදී ගැනීම් පදනම යටතේ 2023 ඔක්තෝබර් 13 දින රු.138,600,000.00 ක් වටිනාකම් ඇති සතොස වවුවර්පත් මිලදී ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා ගෙන ඇත.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත නිරීක්ෂණ හැර කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

	කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම
(අ)	අ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත (i) 14 (1) වගන්තිය	විදේශ දූත මණ්ඩල සේවයේ තනතුරු සඳහා පැරණි බඳවා ගැනීමේ පටිපාටිය අනුව බාහිර අයදුම්කරුවන් නියමිත සුදුසුකම් සපුරා නොතිබීම මත බඳවා ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. නමුත් මේ දක්වා අනුමත වී නොතිබුණු නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව නැවත වරක් අයදුම්පත් කැඳවන ලෙස විෂයභාර අමාත්‍යවරයා විසින් 2023 සැප්තැම්බර් 07 දින වැඩ බලන සභාපති වෙත ලිඛිත නියෝගයක් ලබාදී තිබුණි. “කාර්යාංශයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ලිඛිත විධාන දෙනු ලැබිය හැකි අතර, කාර්යාංශය විසින් ඒ විධාන ක්‍රියාවේ යෙදවිය යුතුය " යන පනතේ යොමුගත වගන්තිය පදනම් කරගෙන බාහිර අයදුම්කරුවන් 19 දෙනෙකු පැරණි බඳවා ගැනීමේ පටිපාටිය අනුවද, පළමුවර සුදුසුකම් සපුරා නොතිබීම මත ප්‍රතික්ෂේප කර තිබූ 08 දෙනෙකු ඇතුළුව 14 දෙනෙකු අනුමත වී නොතිබූ නව බඳවා ගැනීමේ පටිපාටිය අනුවද කාර්යාංශය විසින් බඳවා ගෙන තිබුණි.	1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල යටතේ තානාපති කාර්යාල දූත මණ්ඩල වල රැකියා හා සුභසාධන අංශයන් සඳහා කාර්ය මණ්ඩල පත් කිරීමට මේ වන තෙක් අනුගමනය කල ක්‍රියාවලියට අනුකූලව තවදුරටත් එය සිදු කිරීමට විෂය භාර අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2022.12.28. දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක අමප22/2200/625/002-II දරන 2023.03.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ යටතේ අනුමැතිය ලැබී ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදීමෙන් පසු කාර්යාංශ පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල යටතේ ගරු කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යවරයා විසින් නව බඳවා ගැනීමේ පටිපාටියෙහි පැවති ගැටළුව නිවැරදි කරන තුරු, පෙර පැවති බඳවා ගැනීමේ පටිපාටිය භාවිතා කර 2024/2025 වර්ෂය සඳහා තානාපති කාර්යාල සේවය සඳහා නිලධාරීන් තෝරා පත් කර ගන්නා ලෙස 2023.04.03 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයාට ලිඛිතව ලබාදුන් නියෝගය ප්‍රකාරව ඒ සඳහා පෙර පැවති බඳවා ගැනීමේ පටිපාටිය භාවිතා කර අයදුම්පත් කැඳවා ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් ලබා ගත් ලකුණු අනුව බඳවා ගැනීම් සිදුකර ඇත. කාර්යාංශ පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල යටතේ විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් 2023.09.07 දින බාහිර අයදුම්කරුවන් වෙතින් නව බඳවාගැනීම් පටිපාටියට අනුව නැවත අයදුම්පත් කැඳවන ලෙස කාර්යාංශ සභාපති වෙත නියෝග කර ඇත.

			ඒ අනුව බාහිර අයදුම්කරුවන් සඳහා 2023 සැප්තැම්බර් මස දෙවන වර අයදුම්පත් කැඳවා ඇත. පෙර පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව වයස සීමාව සම්බන්ධයෙන් සඳහන්ව තිබුනද නව බඳවාගැනීම් පටිපාටියට අනුව වයස සීමාව සඳහන්ව නැත. එබැවින්, 2023 සැප්තැම්බර් මස දෙවන වර අයදුම්පත් කැඳවීමෙදී ඊට පෙර 2023 අප්‍රේල් මස අයදුම්පත් කැඳවූ අවස්ථාවේදී අයදුම්කළ අයදුම්කරුවන් බොහෝ දෙනෙකු අයදුම් කර තිබුණි. එය අයදුම්කරුවන්ගේ අභිමතය පරිදි සිදුවූවකි. එහිදී නව බඳවා ගැනීමේ පටිපාටියට අනුව පළමු වර අයදුම් කර වයස සීමාව නිසා ප්‍රතික්ෂේප වූ ඇතැම් අයදුම්කරුවන් හට දෙවන වර සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබාගැනීමට අවස්ථාව හිමි වී ඇත.
	ii) 48(1) වගන්තිය	කාර්යාංශයේ යෝජනා සම්මතයක බලය සහිතව මීය සුභ සාධන අරමුදලින් කිසිම ගෙවීමක් නොකළ යුතු වුවද, අමාත්‍යාංශය මගින් පවත්වා තිබූ ජයගමු ශ්‍රී ලංකා වැඩසටහන යටතේ සුහුරු පුවරු බෙදා දීමේ ව්‍යාපෘතිය සඳහා කාර්යාංශයේ අරමුණු වලින් බැහැරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය රහිතව සුභසාධන අරමුදලින් රු.148,470,300 ක් වැය කර සුහුරු පුවරු 297 ක් මිලදී ගෙන තිබුණි.	ii. කාර්යාංශ පනතෙහි (48) (1) (අ) වගන්තිය අනුව ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආධාර දීමෙහි ලා දරන ලද සියලු ව්‍යයදම් සුභසාධන අරමුදලින් ගෙවිය හැකි බවට දක්වා ඇත. 2024.01.12 දිනැති යොමු අංක ML/PRD/Glocal Fair/2023/2024 දරන කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් කාර්යාංශ සාමාන්‍යාධිකාරි වෙත යොමු කරන ලද ලිපිය මගින් විගමණික ශ්‍රමිකයින්ගේ දූ දරුවන්ගේ සුභසාධන කාර්යය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක පිහිටි එක් පාසලක් වෙනුවෙන් එක් සුහුරු පුවරුවක් බැගින් ලබා දෙන ලෙස දන්වා ඇත. තවද අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශ කරන ලද පාසැල් වෙත සුහුරු පුවරු ලබා දී ඇත. 2024.01.22 දිනැති අංක 08/2024 (M– 01) දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අධ්‍යක්ෂ මණ්ඩල කළමනාකරන පද්ධතියට උඩුගත කර බහුතර සාමාජිකයින්ගේ එකඟතාවය ලබා දී ඇත. ඉන් අනතුරුව 2024.01.29 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 40.04.09 යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසැල් සඳහා සුහුරු පුවරු මිලදී ගැනීමට අමතරව හා ඉදිරියේ දී පැවැත්වෙන වැඩසටහන් වලටද ඒවා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් මිලදී ගැනීමට අනුමැතිය ලබා දී ඇත. තවද, 2024.03.07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් සුහුරු පුවරු මිලදී ගැනීම

			සඳහා රු.මිලියන 265 ක සීමාවකට යටත්ව රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් මිලදී ගැනීමට 2024.03.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 24/0487625/007 අනුව අනුමැතිය හිමිව ඇත. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුමත කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. ක්‍රියාකාරී සැලැස්මෙන් පරිබාහිර කටයුත්තක් සිදුකරනු ලබන්නේ නම් අදාළ කර්තව්‍යය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමුකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුවේ. ඒ අනුව, සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරනු ලැබේ. 2024.06.27 දිනැති සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ WEL202051500 (Implement a CSR programme) යටතේ මෙම ක්‍රියාකාරකම සඳහා මුදල් වෙන් කිරීමක් සිදුකර ඇත. සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලබාදී ඇත.
(ආ)	2022 අගෝස්තු මස 16 දිනැති අංක අමප/22/1067/625/002 දරන විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල රැකියා හා සුබසාධ අංශ සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතා " මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණයේ (ii) තීරණය	දූත මණ්ඩල වල රැකියා හා සුබසාධන අංශ සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය හා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්ට නියම කර තිබුණි. නමුත් මෙම තීරණය අනුව කටයුතු නොකර කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ විධායක ශ්‍රේණියේ එක් නිලධාරියෙකු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නියෝජනය කරන පරිදි දින අනුව වෙන් කර කාර්යාංශයේ සභාපති, සාමාන්‍යාධිකාරී, අතිරේක සාමාන්‍යාධිකාරී හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	2022 ජූලි 28 වන දිනැති විෂය භාර අමාත්‍යවරුන්ගේ සංදේශය සඳහා 2022/08/16 දිනැති අංක අමප/22/1067/625/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී තිබුණද, 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයාට පැවරී ඇති බලතල යටතේ 2022.12.28. දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් තානාපති කාර්යාල දූත මණ්ඩල වල රැකියා හා සුභසාධන අංශයන් සඳහා කාර්ය මණ්ඩල පත් කිරීමට මේ වන තෙක් අනුගමනය කල ක්‍රියාවලියට අනුකූලව තවදුරටත් එය සිදු කිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද එම අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක අමප22/2200/625/002-II දරන 2023.03.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ යටතේ අනුමැතිය ලැබී ඇත. එබැවින් පෙර පැවති බඳවා ගැනීමේ පටිපාටිය භාවිතා කර 2024/2025 වර්ෂය සඳහා තානාපති කාර්යාල සේවය සඳහා නිලධාරීන් තෝරා පත් කර ගන්නා ලෙස 2023.04.03 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයාට ලිඛිතව ලබාදුන් නියෝගය ප්‍රකාරව කටයුතු කිරීමට තීරණය කර ඇති බැවින් 2022/08/16 වන දිනැති අංක 22/1067/625/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක නොවිය.

		(විදේශ කටයුතු) යන නිලධාරීන් අතරින් දෙදෙනෙකු සමඟ තිදෙනෙකුගෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල 4 ක් සාමාන්‍යාධිකාරී විසින් පත්කර තිබුණි.	
(ඇ)	2020 ජනවාරි 31 දිනැති අංක 36.05.21 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය	1. විදේශ දූත මණ්ඩල සේවය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී පෙර සේවයේ යෙදී සිට නැවත පැමිණ වසර 05ක් ප්‍රධාන කාර්යාලයේ හෝ වෙනත් කාර්යාලයක සේවය කර තිබිය යුතුය යන නිරණයට පටහැනිව 2023 අප්‍රේල් 6 දිනැති අංක 1/2023 දරන සභාපතිවරයාගේ අභ්‍යන්තර වක්‍ර ලේඛය මඟින් වසර 03 ක් ලෙස සංශෝධනය කර එදින සිට 2023 මැයි 02 දින දක්වා විදේශ දූත මණ්ඩල සේවය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා තිබුණි. ඒ අනුව අයදුම්පත් කඳවා දින 50 කට පසුව එනම් 2023 ජුනි 22 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මඟින් වසර 03 ක් ලෙස සංශෝධනය කර තිබුණි.	සභාපතිවරයාගේ 2023.04.06 දිනැති 01/2023 දරන අභ්‍යන්තර වක්‍රලේඛය මඟින්, තානාපති කාර්යාල සේවය සඳහා අයදුම්පත් කැඳවීමේදී පෙර දූත මණ්ඩල සේවයේ යෙදී සිට නැවත පැමිණ වසර තුනක් සපුරා ඇති අයට ඉල්ලුම් කිරීමට හැකි බවට සඳහන් කර තිබුනි. නමුත්, එදින වන විට වලංගුව පැවතියේ පෙර දූත මණ්ඩල සේවයේ යෙදී සිට නැවත පැමිණ වසර පහක් ප්‍රධාන කාර්යාලයේ හෝ වෙනත් කාර්යාංශ ශාඛාවක සේවය කර තිබිය යුතුය යන්න බැවින්, 2023.06.12 දිනැතිව 89/2023(M-05) දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කරමින් ඉහත සඳහන් කල වසර පහක කාලය අවලංගු කර එකී කාල සීමාව වසර තුනක් ලෙස සංශෝධනය කිරීම සඳහා ආවරණ අනුමැතියක් ඉල්ලා ඇත. ඒ අනුව 2023.06.22 දිනැති 39.39.09 අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මඟින් ඉහත පරිදි ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ආවරණ අනුමැතිය ලබාදී ඇත.
		II. කාර්යාංශයේ නිලධාරීන්ගෙන් ලද අයදුම්පත් 145 ක් අතුරින් බඳවාගත් සංඛ්‍යාව 17 ක් වූ අතර ඒ අතුරින්ද 6 දෙනෙකු මින් පෙර විදේශ දූත මණ්ඩල වල සේවය අවසන් කර පැමිණි වසර 05 සම්පූර්ණ නොවූ නිලධාරීන් දෙදෙනෙකු 3 වන හා 4 වන වතාවටත් බඳවාගෙන තිබුණි	මීට පෙර විදේශ දූත මණ්ඩල වල සේවය නොකල නිලධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබාදීම යන්න 01/2023 වක්‍රලේඛයෙහි සඳහන් කලද, මීට පෙර විදේශ දූත මණ්ඩලවල සේවය කළ නිලධාරීන් තෝරා නොගන්නා බව එයින් ගම්‍ය නොවන අතර, ඉන් අදහස් කර ඇත්තේ නවක නිලධාරීන් සඳහා ප්‍රමුඛතාවය ලබාදීම වේ. පැවති අනුමත බඳවා ගැනීම් පටිපාටියේද එවැනි කොන්දේසියක් සඳහන් නො වේ. තවද , මීට පෙර විදේශ දූත මණ්ඩලවල සේවය කළ නිලධාරීන් තෝරා නොගත යුතු බව පැවති අනුමත බඳවා ගැනීම් පටිපාටියේද එවැනි කොන්දේසියක් සඳහන් නොවන අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූ නිලධාරීන් විසින් ලබාගත් ලකුණු ප්‍රමාණය

			අනුව වැඩි ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ප්‍රතික්ෂේප කළ නොහැකි අතර, ඒ අනුව නිලධාරීන් තෝරා ගැනීම සිදු කර ඇත. විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා මෙම තෝරාගත් නිලධාරීන්ගෙන් 11 දෙනෙකුම මින් පෙර විදේශ දූත මණ්ඩලවල සේවය කර නොමැති නිලධාරීන් වේ
		III. ඩුබායිහි පිහිටි කම්කරු සුභ සාධන අංශයේ උපදේශක ලෙස සේවයේ නියුතුව සිටි නිලධාරිනිය 2023 සැප්තැම්බර් 28 දින විශ්‍රාම යාම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා සුදුසුකම් සහිත නිලධාරියෙකු බඳවා නොගෙන, කාර්යාංශයේ සභාපතිගේ අංක 01/2023 දරන වක්‍ර ලේඛය ප්‍රකාරව ඩුබායි කම්කරු සුභසාධන අංශයේ උපදේශකව සිට ලංකාවට පැමිණ මාස 18 ක් නොඉක්මවූ දූත මණ්ඩල සේවය සඳහා අයදුම්පත් යොමු කිරීමට සුදුසුකම් නොලබන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගුවන් තොටුපල ඒකකය) තනතුරෙහි කටයුතු කළ නිලධාරිනියක පුරප්පාඩුව ඇති වූ දින සිටම පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව එම නිලධාරිනිය 2023 නොවැම්බර් 23 දින සිට මාස 03 ක් සඳහා තාවකාලික පදනම මත පත් කර 2024 නොවැම්බර් 26 දින තවත් වසරකට සේවා දිගුවක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී 2025 පෙබරවාරි 27 දින නැවත ලංකාවට කැඳවා තිබුණි.	කේ.ඒ.පී. පෙරේරා මහත්මිය 2021.07.29 දින සිට ඩුබායි කොන්සල් ජනරාල් කාර්යාලයේ රැකියා හා සුභසාධන අංශයේ උපදේශක තනතුරෙහි සේවය සඳහා වාර්තා කර ඇති අතර, 2023 සැප්තැම්බර් මාසයේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ බැවින්, සේවය අවසන් කර ඇත. ඩුබායි කොන්සල් ජනරාල් කාර්යාලයේ රැකියා හා සුභසාධන අංශය එක් රාජ්‍ය තාන්ත්‍රික නිලධාරී තනතුරක් පමණක් පවතින ඉතා අධික කාර්ය භාරයක් සිදුකරන ස්ථානයක් වේ. එබැවින් එහි උපදේශක තනතුර සඳහා පෙර පළපුරුද්ද සහිත නිලධාරියෙකු තාවකාලිකව හෝ ඉතා කඩිනමින් පත් කරන ලෙස කොන්සල් ජනරාල් විසින් කාර්යාංශය වෙත දන්වා ඇත. එකී ඉල්ලීම අනුව, හදිසි සේවා අවශ්‍යතාවය සළකා, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත, පෙර එම කොන්සල් ජනරාල් කාර්යාලයේම උපදේශක ලෙස සේවය කළ බැවින්, ඇයව වෛද්‍ය පරීක්ෂණ හා පොලිස් නිශ්කාශණ වාර්තාවලින් නිදහස් කර ගැනීමට හැකි නිසා අයි.පතිනායක මහත්මිය 2023.11.24 වන දින සිට නැවත ඩුබායි කොන්සල් ජනරාල් කාර්යාලයේ රැකියා හා සුභසාධන අංශයේ උපදේශක තනතුරෙහි සේවය සඳහා මූලිකව මාස තුනක කාලයක් සඳහා පත් කර ඇත. වැඩ බලන සභාපතිතුමාගේ අනුමැතිය මත නව උපදේශක තනතුරට තෝරා ගෙන ඇති නිලධාරිනිය වැඩ භාර ගන්නා තෙක් පතිනායක මියගේ සේවා කාලය දීර්ඝ කර ඇත.

(ඇ)	2023 සැප්තැම්බර් 21 දිනැති 40/2023 දරන සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) අභ්‍යන්තර උපදෙස් පත්‍රිකාව	විදේශ දූත මණ්ඩල කම්කරු සුභසාධන අංශයන්හි සියලුම ලියවිලි පරීක්ෂා කර ගිණුම් කරණ පද්ධතියට ඇතුළත් කළ යුතු වුවත් මුදල් විෂයය අධීක්ෂණය සඳහා වූ කළමනාකරුවෙකු ප්‍රධාන කාර්යාලයේ සිටියදී තානාපති කාර්යාල වලින් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගත් ලිපි ලේඛන මුදල් විෂය සම්බන්ධ අධීක්ෂණ නිලධාරියෙකු නොමැති බදුල්ල පළාත් කාර්යාලය වෙත යැවීම හේතුවෙන් මුදල් ගනුදෙනු සම්බන්ධ අධීක්ෂණයක් වී නොතිබුණි. 2025 පෙබරවාරි 27 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා කමිටුවේදී මේ සම්බන්ධයෙන් සිදු කළ සාකච්ඡාවේදී මූල්‍යමය කටයුතු ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශය මගින් සිදු විය යුතු බවට සාකච්ඡා වූ නමුත් විගණිත දිනය වූ 2025 මැයි 30 දින දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි	විෂය භාර ගිණුම් නිලධාරී විසින් නිරතුරුව ගිණුම් පරිගණක පද්ධතිය පරීක්ෂා කරමින්, අවශ්‍ය අවස්ථාවලදී බදුල්ල කාර්යාලයේ නිලධාරීන් හා සම්බන්ධ වී අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම, නිවැරදි කර ගැනීම ආදිය සිදුකරනු ලබයි. ගිණුම් නිලධාරිගේ රාජකාරී කටයුතු කළමනාකරු (මුදල්) විසින් නිරතුරු සුපරීක්ෂණයට යටත්වන බවද අවධාරණය කරනු ලැබේ. ඒ අතුරින්, අධීක්ෂණ කටයුතු සිදුකිරීම තුලින් සිදුවිය හැකි අවභාවිතාකිරීම් හෝ වංචා සිදුවීම් අවදානම් උපරිමව අවම කරගැනීමට හැකි වේ යැයි විශ්වාස කරමි. පොදු ව්‍යාපාර කාරක සභාව වෙත කාර්යාංශය විසින්, ඌව පළාත් කාර්යාලය වෙත ප්‍රධාන කාර්යාලය විසින් කරන ලද වැඩ පැවැරීම සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව කාර්යාංශය දීර්ඝ විස්තරයක් 2025.04.30 දින යොමු කර ඇතත් මේ දක්වා ඒ සම්බන්ධව නිර්දේශයක් ලබාදී නොමැති බවද දන්වනු කැමැත්තෙමි. ඌව පළාත් කාර්යාලයේ නිලධාරීන් මඟින් සිදුකරන දූත මණ්ඩල ගණුදෙණු ලෙජරයට පිටපත් කිරීම දූත මණ්ඩල නිලධාරීන් විසින්ම ගිණුම්කරන පද්ධතියට සටහන් තැබීමට අවශ්‍යය කටයුතු සිදුකරමින් පවතී.

2.2.4. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

	විගණකාධිපති වාර්තාව	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම
(අ)	ශ්‍රී ලංකාව හා දකුණු කොරියාව යන රාජ්‍යයන් දෙක අතර ගිවිස ගෙන තිබූ අවබෝධතා ගිවිසුමේ 11 (3) වගන්තිය අනුව ශ්‍රමිකයින් විදේශගත වීමට අවශ්‍ය ගුවන් ටිකටපත් කාර්යාංශය මඟින් වෙන් කිරීම සිදු කළ යුතු වුවද, එය විදේශ රැකියා ඒජන්සි සමාගම වෙත ලබා දී තිබුණි. විදේශ රැකියා ඒජන්සි සමාගමට සෘජුවම ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ ටිකටපත් මිලදී ගැනීමට හැකියාව තිබියදී පුද්ගලික නියෝජිතායතන මඟින් මිල ගණන් කැඳවීම, හේතුවෙන් ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ මිල ගණන් ඉක්මවා රු. 3,000 සිට රු.72.000 දක්වා අතර වැඩි මිල පරාසයක් තුළ ටිකටපත් මිලදී ගැනීම සිදු කර තිබුණු බව 2023 ජනවාරි සිට සැප්තැම්බර් 20 දින දක්වා සිදු කළ නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. එහිදී ශ්‍රමිකයින් 3,767 දෙනෙකුගෙන් රු.122,560.467 ක් වැඩිපුර අයකර තිබූ අතර ඉන් විදේශ රැකියා ඒජන්සි සමාගමට රු. 27,786,521 ක් ලාභයක් ලැබීමේදී පුද්ගලික නියෝජිතායතන 4 කට රු.94,774,446 ක ලාභයක් උපයා ගැනීමට කටයුතු සැලසී තිබුණි.	• ශ්‍රී ලංකා රජය හා දකුණු කොරියානු රජය අතර 2012 අගෝස්තු 29 දින එළඹ ඇති අවබෝධතා ගිවිසුමෙහි ගුවන් ප්‍රවේශපත් වෙන් කිරීම සම්බන්ධයෙන් සඳහන් වී තිබෙන 11 ඡේදයෙහි උප කරුණු 03 “ The sending agency will take necessary measures, including making flight reservations in advance to ensure that workers enter Korea on the scheduled date.” ට අනුව අදාළ ශ්‍රමිකයන් නියමිත දිනයට කොරියාව වෙත ඇතුල්වීම තහවුරු කිරීම සඳහා එම ශ්‍රමිකයන් වෙත ගුවන්ප්‍රවේශපත් වෙන් කිරීමේ කාර්යය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් කළ යුතුය. ඒ අනුව 2023.04.06 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 66/2023 (M-03) – Reservation of air tickets for Korean – bound E-9 workers යටතේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 39.25.21 අනුව එම ගුවන්ප්‍රවේශපත් වෙන් කිරීමේ කාර්යය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පරිපාලිත සමාගමක් වන ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය වෙත පවරා ඇත. Sri Lankan Airline ආයතනයෙන් පමණක් ගුවන් ටිකටපත් මිලදී ගැනීමට ප්‍රතිපාදන නොමැති අතර ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිලගනන් කැඳවීම මගින් එම කාර්යය සිදුකරයි.මේ සම්බන්ධයෙන් කාර්යාංශයෙන් විමර්ශනයක් සිදුකරමින් පවතින අතර ඉදිරි පියවර ගනු ඇත.
(ආ)	කාර්යාංශය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් 2025 පෙබරවාරි 25 දින අනුමත කරන ලද කාර්ය මණ්ඩලය තුළ ඇතුළත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 12 න් තනතුරු 09 ක් 2023 වර්ෂයේ සිට වාර්තාවේ දිනය දක්වාම වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි.	**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු** නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු සඳහා 2023 වර්ෂයේ දී වැඩ බැලීමේ පදනමින් හෝ තනතුරේ රාජකාරී ඉටු කිරීමේ පදනමින් පත් කර මේ දක්වා සේවය කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී නිලධාරීන් 05 දෙනෙකි . 2024 වර්ෂයේ දී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා පත් කරන ලද මේ දක්වා සේවය කරන සංඛ්‍යාව 01 2025 වසරේ වැඩ බැලීමේ පදනමින් තනතුරේ රාජකාරී ඉටු කිරීමේ පදනමින් පත් කර මේ දක්වා සේවය කරන ඇති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී නිලධාරීන් 02 මේ වන විට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර දරන නිලධාරීන් දෙදෙනෙකු විදේශ දූත මණ්ඩල සේවයේ යෙදී සිටියි. අනුමත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු ප්‍රමාණය 12 ක් වන අතර ස්ථිර කාර්ය මණ්ඩලය 08 කි. ඒ අනුව, පුරප්පාඩු 04 ක් පවතී. නිලධාරීන් 02 දෙනෙකු විදේශ දූත මණ්ඩල සේවයේ යෙදී සිටින අතර, 02 දෙනෙකු අතිරේක සාමාන්‍යාධිකාරී තනතුරු සඳහා වැඩ බැලීමේ පදනමින් පත්කර ඇත. එක් නිලධාරියෙකු වැඩ තහනමට ලක්වී ඇත. ඒ අනුව, පත්වීම් 08 ක් වැඩ බැලීමේ සහ තනතුරේ රාජකාරී ඉටු කිරීමේ පදනමින් පත්කර ඇත. එමෙන්ම, අනුමත තනතුරු ප්‍රමාණය ඉක්මවා කිසිදු අවස්ථාවක වැඩ බැලීමේ පත්වීම් ලබා

		දී නොමැත. කාර්යාංශයේ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරිවීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් අනුමැතිය ඉල්ලා ඇත.
(ඇ)	ඕමාන් තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේ රාජකාරී කටයුතු සඳහා තිදෙනෙකු පමණක් පත්කර තිබියදී 2022 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළ එහි සිදු වී තිබූ විනය විරෝධී ක්‍රියා හේතුවෙන් 2022 නොවැම්බර් 09 දින තුන්වන ලේකම්ගේ වැඩ තහනම් කර තිබුණි. සුරක්ෂා නිවාසයේ නවාතැන් ගෙන සිටි ගෘහ සේවිකාවන් 100 කට අධික ප්‍රමාණයක් භාරව සියළු කටයුතු සුරක්ෂා නිවාස පාලිකාව විසින් තනිව සිදු කර තිබූ අතර එම ගෘහ සේවිකාවන් කලහකාරී ලෙස හැසිරී සුරක්ෂා නිවාසයට අලාභහානි සිදුකර තිබුණි. අදාළ ගොඩනැගිල්ල පරිපාලන කටයුතු සඳහා භාවිතා කිරීමට ගිවිසුම්ගත වී තිබුණ ද, එය සුරක්ෂා නිවාසයක් ලෙස භාවිතා කිරීමෙන් ගිවිසුම කඩවීම මත එම නිවසේ නිම්කරු වෙත අලාභ ගෙවිය යුතුව තිබුණි. 2023 පෙබරවාරි 01 දින එම ගොඩනැගිල්ලෙන් ඉවත් වුවද, අලාභය තක්සේරු කිරීම 2023 මැයි දක්වාම ප්‍රමාද වීම හේතුවෙන් කුලී මුදල, ජල හා විදුලි බිල්පත් ඇතුලුව අලාභහානි සඳහා එකතුව රු.19,130,480 ක් 2023 ජූලි 11 දින ගෙවා තිබුණි. තවද, එහි ඇති වූ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා වසරක් තුළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු කණ්ඩායම් ඇතුළුව නිලධාරී කණ්ඩායම් 3 ක් ඕමාන් රාජ්‍යය වෙත යැවීම සඳහා රු .17,262,076 ක් වැය කර තිබුණි. ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් යොමු කරන ලෙස තානාපතිතුමන් විසින් කාර්යාංශයේ සභාපති දැනුවත් කර තිබුණද, ඒ සඳහා නිවැරදි තීරණ නොගැනීම නිසා රු. 36,392,556 ක් අමතරව වැය කිරීමට සිදුවී තිබුණි.	තානාපති කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල තුල රඳවා ගත හැකි ප්‍රමාණය ඉක්මවා රැඳවියන් පැමිණ ඇති අතර සංචාරක වීසා මත විදේශ ගත වූ කාන්තාවන්ද තානාපතිතුමාගේ උපදෙස් පරිදි භාර ගැනීමට සිදු වීම තුලින් කුලී පදනම මත යාමට සිදුව ඇත. කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලෙහි ගිවිසුම් ප්‍රකාරව එම ගිවිසුම් අවලංගු කර ගොඩනැගිල්ල නැවත පළමු පාර්ශවය වෙත භාර දීමට නම් එම ගොඩනැගිල්ල භාර ගන්නා අවස්ථාවේදී පැවති තත්ත්වයෙන්ම භාර දිය යුතු වන අතර, යම් අලුත්වැඩියා කටයුත්තක් සිදු විය යුතු නම් එය දෙවන පාර්ශවය විසින් සිදු කල යුතු වේ. කාර්යාංශය වෙත සාවද්‍ය තොරතුරු සපයමින් අවධිමත් මාර්ග ඔස්සේ සංචාරක වීසා භාවිතයෙන් රැකියා සඳහා ඕමාන් රාජ්‍ය වෙත පිටත්ව ගිය කාන්තා විගමණිකයින් විසින් සිදු කරන ලද කලහකාරී තත්ත්වය මත ඇති වූ අලාභය හා වැඟි වතුරින් සිදු වූ හානිය වෙනුවෙන් විශාල මුදලක් ගෙවීමට සිදු විය. ගොඩනැගිල්ලට සිදු වූ අලාභ හානිය පිළිබඳ පරීක්ෂණය සඳහා ගොඩනැගිලි නිම්කරු වෙනුවෙන් පෙනී සිටි පාර්ශවය හා එකඟත්වයට ගතවූ ප්‍රමාදය හේතුවෙන් අලුත්වැඩියා කිරීමට මාස හතක කාලයක් ගත විය. එකී හේතුවෙන් 2023 මැයි 16 දින එය පරීක්ෂා කර නැවත යථා තත්ත්වයට පත් කරන තෙක් කුලී මුදල, ජල බිල්පත්, විදුලි බිල්පත් හා අලාභහානී සඳහා වන සියළුම වියදම් ලෙස රු.19,130,480/- ක මුදලක් ගෙවීමට සිදු වී ඇත. ඕමාන් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය තුළ ඇති වූ කලහකාරී තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා වසරක් තුළ කණ්ඩායම් 03 ක් ඕමාන් රාජ්‍යය වෙත ගොස් නොමැති අතර 2022 ,2023 සහ 2024 යන වර්ෂයන්හිදී පහත සඳහන් වූ සංචාරයන්හි නියළී ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය නොසලකා සංචාරක වීසා බලපත්‍ර භාවිතා කරමින් ඕමානයේ රැකියා සඳහා පිටත්ව ගිය ශ්‍රී ලාංකික කාන්තාවන් මුහුණ දෙන ගැටළු විසඳීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් අංක 34/2022 සහ 2022.11.21 දිනැතිව කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/1883/625/013 යටතේ ලබා දී ඇති අනුමැතිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුදල් භාවිතා කරමින් ඕමානය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය (ඩුබායි) වෙත එකී විමර්ශන කටයුතු සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී (ජාත්‍යන්තර කටයුතු) මූලිකත්වයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකු, විශේෂ විමර්ශන අංශයේ (වී.සේ.නි.කා) නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත වූ කණ්ඩායමක් (06) 2022.12.10 සිට 2022.12.18 දක්වා සංචාරය සඳහා සහභාගි වී ඇත.

		මෙම සංචාරයට අදාළ වාර්තාව සහ රු. 7,258,948.23 ක සම්පූර්ණ පිරිවැය පිළිබඳව විදේශ සම්බන්ධතා 1 අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇති අතර ඒ සඳහා අනුමැතිය හිමිව ඇත. 2022.08.16 වන දින කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශයේදී පවත්වන ලද රැස්වීමකදි විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ප්‍රේෂණ ඉහළ නැන්වීමේ අපේක්ෂාවෙන් විදේශයන්හි රැකියා ප්‍රවර්ධන වැඩසටහන් කඩිනමින් පැවැත්වීම සඳහා කාර්යංශය වෙත උපදෙස් ලැබී ඇත. ඒ අනුව, එකී ප්‍රවර්ධන කටයුතු කුවෙට්, ඕමානය, කටාරය, සෞදි අරාබියාව, කොරියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය මූලික කරගෙන සංචාරවල මූලික කටයුතු සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවය අපේක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2022.08.24 වන දින ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, එකී සංචාරය 2023.02.06 සිට 2023.02.11 වන දින දක්වා ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සැදුම්ලත් කණ්ඩායමක් (03) ඊට සහභාගි වී ඇත. මෙම සංචාරයට සහභාගිවූ අතිරේක සාමාන්‍යාධිකාරි (ජාත්‍යන්තර කටයුතු) 2023.02.07 සිට 2023.02.24 වන දින දක්වා ඕමාන් නානාපති කාර්යාලයේ රැඳවුම් නිවාසයේ රැඳී සිටින රැඳවියන්ගේ ගැටළු නිරාකරණය කිරීම සඳහා ඕමානයේ රැඳී සිට ඇත. ගරු අමාත්‍යතුමා විසින් එරට ඉහළ පෙළේ නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වා ඇති බව සහ සංචාරය පිළිබඳ වන වාර්තාව සහ රු.3,905,496.24 ක සම්පූර්ණ පිරිවැය සම්බන්ධව විදේශ සම්බන්ධතා 1 අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇති අතර ඒ සඳහා අනුමැතිය හිමිව ඇත. විදේශයන්හි පිහිටි දූත මණ්ඩලවල රැකියා හා සුභසාධන අංශවල ක්‍රියාකාරිත්වය, අභ්‍යන්තර පාලනයන් සහ මෙහෙයුම් මාර්ගෝපදේශවලට අනුකූල වීම පරීක්ෂා කිරීම මඟින් ඒවායේ කාර්යය සාධනය තක්සේරු කිරීම සඳහා කාර්යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව වාර්ෂිකව විගණන පරීක්ෂණ කණ්ඩායම් තුනක් යොමු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අභ්‍යන්තර විගණන අංශය වෙත ලැබී ඇත. ඒ අනුව, 18.12.2023 - 29.12.2023 දින දක්වා ඕමානය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍ය (ඩුබායි) වෙත මෙම සංචාරය සිදුකර ඇති අතර ඊට අදාළ අභ්‍යන්තර විගණන අංශයේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මෙහි සඳහන් පරිදි එහි පිරිවැය දරා ඇති අතර එකී වාර්තාව සහ රු. 6,097,632.23 ක සම්පූර්ණ පිරිවැය (විදේශ සම්බන්ධතා අංශයේ ලේඛන ප්‍රකාරව) සම්බන්ධව විදේශ සම්බන්ධතා 1 අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇති අතර ඒ සඳහා අනුමැතිය හිමිව ඇත. ඉහත තොරතුරු අනුව ඕමාන් රාජ්‍යය වෙත සියළුම සංචාර සඳහා වසර තුළ රු. 17,262,076.70 ක පිරිවැයක් දරා ඇත.

(ඇ)	2013 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ ඒකාබද්ධව රට විරුවෝ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අවබෝධතා ගිවිසුමක් අත්සන් කර කාර්යාංශය විසින් 2013 මාර්තු 08 දින සමෘද්ධි අධිකාරිය වෙත රු.මිලියන 100 ක මුදලක් ගෙවා තිබුණි. ගිවිසුමට අනුව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුවක් පත් කිරීම හා කාර්යාංශය නමින් සමෘද්ධි බැංකුවේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීම යන කොන්දේසි සමෘද්ධි අධිකාරිය විසින් කඩ කර තිබුණි. තවද යම් පාර්ශවයක් ගිවිසුම කඩ කරයි නම් මාස 06 කට පෙර දැනුම් දී ඉවත් වීමට අවස්ථාව තිබී ඇති නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2018 වර්ෂයේදී ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසුව හෝ කාර්යාංශයේ මූල්‍ය අංශයේ වගකිව යුතු නිලධාරීන් විසින් මේ පිළිබඳව තොරතුරු ලබා ගෙන ඉතිරි මුදල හෝ අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට මෙම මුදලට අදාල පොලී මුදල රු. මිලියන 241 ක් සමඟ මුළු මුදල රු. මිලියන 341 ක් බවට ශේෂ සනාථන ලිපියක් පමණක් ලබා ගෙන තිබුණි.	රාජ්‍ය ආයතන දෙකක් අතර පවතින ගැටළුවක් නිසා මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු කල නොහැකි තත්වය නිසා අමාත්‍යාංශ අතර මැදිහත්වීමෙන්,2025.04.10 දින අතිරේක ලේකම් (සංවර්ධන/ විදේශ රැකියා) ප්‍රධානත්වයෙන් පවත්වන ලද සාකච්ඡාවේදී පහත සඳහන් යෝජනා ආයතන දෙකෙහි අධ්‍යක්ෂ මණ්ඩල වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීමට තීරණය කරන ලදී . I. විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම ප්‍රකාරව, ණය ලබා දීමේදී තබා ගත යුතු ඇප සුරැකුම් හා රුපියල් 50,000/- ක තැන්පතුව ලබා දී ඇති එහෙත් ණය ගෙවීම් පැහැර හැර ඇති ණය හිමියන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී දැරීමට සිදුවන යම් පාඩුවක් ඇත්නම් එම මුදල දෙපාර්ශවය අතර සම සමව බෙදා ගැනීමට II. ඉදිරි කටයුතු තවමත් අවසන් නොවූ ණය සම්බන්ධයෙන් (උදා: අධිකරණ කටයුතු පවතින) අදාළ තීරණ අනුව දැරීමට සිදුවන යම් පාඩුවක් ඇත්නම් එයද සම සමව බෙදා ගැනීමට III. සුරැකුම් රහිත ණය නැවත අයකර ගැනීම සමෘද්ධි සංවර්ධන දෙපාර්ථමේන්තුවේ අභ්‍යන්තර ගැටළුවක් බවත් එහි වගකීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට බාරගත නොහැකි බැවින් සමෘද්ධි සංවර්ධන දෙපාර්ථමේන්තුව මගින් අභ්‍යන්තර ක්‍රමවේදයක් සිදු කර එම ගැටළුව නිරාකරණය කර ගැනීමට IV. නිවාස ණය වැඩසටහන සම්බන්ධ ප්‍රචාරක වැඩසටහන් සඳහා වැය වූ මුදල දෙපාර්ශවය අතර සම සේ බෙදා ගැනීමට. ඒ අනුව,ආරක්ෂිත තැන්පතුවක් ලෙස තබා ඇති රු.මිලියන 100 ක මුදලට අදාළ පොළිය රුපියල් මිලියන 247.56 වේ. තවද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කාර්යාංශය වෙත යොමු කරන ලද 2025.08.06 දිනැති ලිපිය සමග රු.මිලියන 100 ක තැන්පතුව සහ ඊට අදාළ පොළිය සමග මුළු මුදල රු 301,420,000.00 ක වටිනාකම සහිත අංක 197270 දරන 2025.08.06 දිනැති චෙක්පත කාර්යාංශය වෙත ලබා දී ඇත.
(ඉ)	2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී විගමණික ශ්‍රමිකයින් වෙත ගෙවිය යුතු රු.72.720,528 ක ශේෂයක් අදාළ කාල සීමාවේදී කඩිනමින් ගෙවීම් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ඔවුනට අහිමි වී තිබුණු අතර 2019 සිට 2024 දක්වා විගමණික ශ්‍රමිකයින් වෙත ගෙවිය යුතු ශේෂය රු.78,343,308 ක්ව පැවතුණි.	2008 වර්ෂයේ සිට 2018 වර්ෂයන්ට අදාළව ගෙවිය යුතු රු.72,720,528ක ශේෂයක් කාර්යාංශ ආදායමට ගෙන ඇත්තේ ඔවුන් සොයා ගෙවීමට සියළු උත්සහ ගැනීමෙන් අනතුරුව සහ අදාළ හිමිකරුවන් මුදල් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කළහොත් නැවත ගෙවීමේ පදනම මත වේ. නොගෙවූ ශේෂයන් ආදායමට ගනු ලැබුයේ වසර 5කට වඩා වැඩි කාලයක් අදාළ ගෙවීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවූ බැවිනි. ප්‍රමාණවත් ලේඛන ගත සාක්ෂි සහිතව ගෙවීම් සඳහා ඉල්ලීම් කරනු ලබන්නේ නම් නැවත ගෙවීමේ පදනම මත අදාළ ශේෂයන් ආදායමට ගෙන ඇත. එම ශේෂයන් මේ වන විට රක්ෂණ වන්දි ලෙස රු.1,912,698.71 ක මුදලක් හා පැමිණිලි නිරාකරණයට අදාළව රු.711,513 මුදලක් හිමිකරුවන් වෙත ගෙවා ඇත.

		එමෙන්ම විගණනයෙන් පෙන්වා දෙන පරිදි 2019-2024 කාලසීමාවට අදාළව ගෙවිය යුතු ශේෂය රු.131,965,235කි. එම වටිනාකමින් 2025.05.31 දිනට රු.53,621,926ක් ගෙවා ඇති අතර, එදිනට ගැටළු නිරාකරණය සඳහා රු.33,904,373.67ක ප්‍රමාණයක් ද, නැවත ගෙන්වා ගැනීම සඳහා රු. 14,438,851.51ද, සුරක්ෂා නිවාස තැන්පතු සඳහා රු.5,575,775.15ක්ද ගෙවිය යුතු යුනියන් රක්ෂණ තැන්පතු රු.5,004,353.05ක් ද, ගෙවිය යුතු දේශීය රක්ෂණ තැන්පතු රු.19,419,955.14ක් ප්‍රමාණයක් ගෙවීම් කිරීමට ඇත. එම ගෙවිය යුතු වටිනාකම අදාළ හිමිකරුවන් නිවැරදිව හඳුනාගෙන ඉදිරියේදී ගෙවීම් කිරීමට කටයුතු සිදුකරන අතර, එහිදී කාර්යාංශයේ ක්‍රමවේදය වන්නේ නියමිත ලිඛිත සාක්ෂි සහිතව අදාළ හිමිකම් ලබාගැනීම සඳහා ඉල්ලුම් කරනු ලබන හිමිකරුවන් වෙත අදාළ හිමිකාරීත්වය සහතික කරගැනීමෙන් අනතුරුව නිරවුල් කිරීමට කටයුතු කිරීමෙනි. එවැනි හිමිකම් පෑමේ ලේඛනවල ගැටළුවක් ඇති වුවහොත් ගෙවීම් සිදුකිරීම ප්‍රමාදවීම වැළැක්විය නොහැක.
(ඒ)	2024 අප්‍රේල් 04 සිට අගෝස්තු 13 දින දක්වා ඊශ්‍රායල් රාජ්‍යය වෙත ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා විදේශ ගත කිරීමට අයදුම් කර තිබූ 1,125 දෙනෙකුගෙන් බදවා ගැනීමේ ගාස්තු ලෙස කාර්යාංශය විසින් ඇමරිකන් ඩොලර් 1,000 ක් එනම් රු. 311,000 ක් බැගින් අයකර තිබුණි. එහෙත් ඊශ්‍රායල් රජය හා ශ්‍රී ලංකා රජය අතර අත්සන් කරන ලද සංශෝධිත ගිවිසුම අනුව 2024 සැප්තැම්බර් 04 දින සිට එය ඇ.ඩො. 502 ක් ලෙස එනම් රු. 154,000 ක් වී තිබීම හේතුවෙන් කාර්යාංශය විසින් එක් අයෙකුගෙන් රු. 157,000 බැගින් 1,125 දෙනෙකුගෙන් රු. 176,250,000 ක් වැඩිපුර අයකර රඳවා ගෙන තිබුණි.	ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියාලාභීන්ගෙන් 2024.04.04 දින සිට 2024.09.03 දින දක්වා වැඩිපුර අයකර ගෙන ඇති ඇ.ඩො. 494 මුදල්,එසේ අයකර ගෙන ඇති පුද්ගලයන්ට මාසයක් ඇතුලත ගෙවීම් සිදුකර අවසන් කිරීම සඳහා මේ වන විට මූලික කටයුතු සිදුකර ඇත. ඒ අනුව අදාළ පුද්ගලයන්ගේ අනන්‍යතාවය හා තොරතුරු තහවුරු කර ගෙන ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ඓ)	ජාත්‍යන්තර පිළිකා දිනය නිමිති කොට ගෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා අත්‍යවශ්‍ය ඖෂධ හා උපකරණ මිලදී ගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස් කරන ලෙස අමාත්‍යවරයා විසින් 2022 දෙසැම්බර් 23 දින ඉල්ලීමක් කාර්යාංශයේ සභාපතිවරයා වෙත යොමු කර තිබුණි. ඒ අනුව පිළිකා රෝහල් දෙකක සිදු කරන ලද සමීක්ෂණයක් පදනම් කරගෙන 2023 ජනවාරි 20 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරියෙකු සමඟ සාකච්ජාවක් පවත්වා, එදිනම විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකින් ලබාගත් අනුමැතිය මත 2023 ජනවාරි 23 දින කාර්යාංශය විසින් අමාත්‍යාංශයේ සෞඛ්‍ය සංවර්ධන අරමුදලට රු. මිලියන 100 ක් ලබාදී තිබුණි. කෙසේ වෙතත් විදේශගතව	පිළිකා රෝගීන් වැඩි වශයෙන් ප්‍රතිකාර ලබා ගන්නා රෝහල් දෙකක සමීක්ෂණයක් සිදු කර 2022.12.29 දින මහරගම අපේක්ෂා රෝහලෙහි සහ 2022.12.30 දින ගාල්ල කරාපිටිය රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන පිළිකා රෝගීන් අතර විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් සැලකිය යුතු පිරිසක් ප්‍රතිකාර ලබා ගන්නා බව හඳුනා ගෙන ඇත. එසේම පිළිකා රෝගීන් අතර විදෙස්ගත ශ්‍රමිකයන්ගේ පවුල් වල සාමාජිකයින් සහ විදේශගතව සිට ආපසු මෙරටට පැමිණ ඇති අය පිළිකා රෝගය ප්‍රතිකාර ලබා ගැනීමට යොමු වී තිබෙන බව සුභ සාධන අංශය වෙත ලැබෙන ඉල්ලීම් ලිපි අනුවද පැහැදිලි විය. ඔවුන් සඳහා සහ සමස්ථ පිළිකා රෝගීන් සඳහා ලබා දිය යුතු ඖෂධ හිඟයක් පවතින බවද පැහැදිලි විය. ඒ අනුව, එවකට ඇති වූ පිළිකා ඖෂධ හිඟය සලකා ජාතික අවශ්‍යතාවයක් ලෙස රජයට සහය දැක්වීමක් වශයෙන් රු.මිලියන 100 ක් ඖෂධ ලබා ගැනීම සඳහා ජාතික සෞඛ්‍ය

	සිටින ශ්‍රමිකයින්ගේ පවුල්වල සාමාජිකයින් හා විදේශගතව සිට ආපසු මෙරටට පැමිණි ඇති පිළිකා රෝග වලින් පෙළෙන ශ්‍රමිකයින් වෙත මෙමඟින් ප්‍රතිලාභයක් ලැබුණේද යන්න පසු විපරම් සිදු කර නොතිබුණි.	සංවර්ධන අරමුදලේ (AC.No. 88300300 – Bank of Ceylon Metropolitan වෙත චෙක්පත් අංක - 188399 මඟින් ගෙවා ඇත.) එසේම අදාළ ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල වෙතට ලැබුණ බවට ඔවුන්ගේ අංක 000151 සහ 2023.01.23 දිනැති ලදු පත මඟින් තහවුරු කර ඇත. කාර්යාංශය විසින් ලබා දුන් මුදල් පිලිබඳ පසු විපරම් කිරීමෙන් පසුව, සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක NHDF/03/2023 හා 2023.08.21 දිනැති ලිපිය මඟින් කාර්යාංශය ලබා දුන් රු.මිලියන 100 ක මුදලින් පිළිකා රෝගය සඳහා ඖෂධ (oncology drugs) ලබා ගත් බව කාර්යාංශය වෙත දැනුම් දී ඇත. පිළිකා රෝගයෙන් පෙළෙන විගමනික ශ්‍රමික පවුල්වල රෝගීන් සඳහා සහ සියළු පිළිකා රෝගයෙන් පෙළෙන රෝගීන් සඳහා එම මුදල් යොදවා ඇති බව ඒ අනුව තහවුරු වේ.
(ඌ)	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතන විසින් සපයනු ලබන සේවාවන්, ජංගම සේවා මාලාවක් " ජයගමු ශ්‍රී ලංකා (Glocal fair) " නමින් 2024 ජනවාරි 31 දින සිට ජූලි 28 දින දක්වා දිස්ත්‍රික්ක 24 ක් ආවරණය කරමින් පවත්වා තිබූ අතර ඒ සඳහා කාර්යාංශය විසින් රු. 1,259,752,579 ක් වැයකර තිබුණි. ඒ තුළ විගමණික ශ්‍රමිකයින් වෙනුවෙන් සුභසාධන කටයුතු සඳහා රු.257,026,770ක් පමණක් වැයකර තිබුණි. විදේශ රැකියා නියෝජිතායතන වෙත වෙළඳ කුටි මිලදී ගැනීම සඳහා සෙස් බදු අරමුදල් භාවිතා කළ හැකි බව කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී විසින් 2023 ජූනි 13 දින අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබුණු අතර ඒ අනුව එක් වෙළඳ කුටියක් රු. 500,000 බැගින් කුටි 920 ක් ලබාදීම සඳහා රු. 542,800,000 ක් පුද්ගලික ආයතනයක් වෙත ගෙවීම් කර තිබුණි. නියෝජිතායතන 115 ක් සම්බන්ධ වී රැකියා අවස්ථා වැඩි කිරීමේ අරමුණින් මෙය පවත්වා තිබුණ ද, 2025 අප්‍රේල් 30 දින වන විටත් නියෝජිතායතන 28 ක් මඟින් ශ්‍රමිකයින් 840 දෙනෙකු පමණක් විදේශ ගත කර තිබූ අතර නියෝජිතායතන 87 ක් මඟින් කිසිවකු විදේශගත කර නොතිබුණි. කාර්යාංශය විසින් 2023 වර්ෂයේ සෙස් බදු ආදායමෙන් රු.542,800,000 ක් භාවිතා කර සමස්ත නියෝජිත ආයතන 1019 කින් නියෝජිත ආයතන 59 කට පමණක් විශේෂ වරප්‍රසාදයක් ලබාදී තිබූ අතර නියෝජිත	අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතන විසින් සපයන සේවාවන්, සේවාලාභීන් පදිංචි ස්ථාන වලදී පහසුවෙන් ලබාගත හැකිවන පරිදි ජයගමු ශ්‍රී ලංකා (Glocal Fair) වැඩසටහන සැලසුම් සහගතව ක්‍රියාත්මක කර ඇත. කාර්යාංශ ක්‍රියාකාරී සැලැස්ම අනුව වෙන් වෙන්ව කරන ලද සුභසාධන වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් එක් ස්ථානයකදී මෙම සංකල්පයට අනුව සිදුකර ඇත. මෙම රැකියා වෙළඳපොළ පැවැත්වීමේ අරමුණ විදේශ රැකියාලාභීන් තෝරා ගැනීම පමණක් නොව, විදේශ රැකියා පිළිබඳව සමස්ථ ජනතාව විශේෂයෙන්ම තරුණ ප්‍රජාව දැනුවත් කර ඔවුන් විදේශ රැකියා සඳහා නිවැරදි මාර්ග ඔස්සේ විදේශ රැකියා සඳහා යොමු කිරීම සහ ඉපයීම් පිළිබඳව දැනුවත් කිරීම ද වේ. ජයගමු ශ්‍රී ලංකා (Glocal Fair) වැඩසටහන 2024.01.17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 21/2024(M-01) සඳහා 2024.01.29 දිනැතිව අංක 40.04.23 යටතේ ලබාදෙන ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව අදාළ කාර්යාංශීය කාර්යයන් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. 2024.01.12 දිනැති අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියට අනුව 2024.01.29 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තිරණ අංක 40.40.13 මඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ Glocal Fair 2024 වැඩසටහන සඳහා නියෝජිතායතන 20 ක් සහභාගි කරවා ගැනීම සඳහා කුටි (Stalls) මිලදී ගැනීමට සහ 2024.02.12 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 25/2024 (M/02) මඟින් Glocal Fair 2024. වැඩසටහන මොණරාගල දිස්ත්‍රික්කයේ පැවැත්වීම සඳහා කුටි 20 මිලදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. 2024..01.30 දිනැති අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියට අනුව 2024.02.22 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 28/2024(M-02) මඟින් Glocal Fair වැඩසටහන ඉතිරි දිස්ත්‍රික්ක 23 හිදි රැකියා නියෝජිතායතන 40 බැගින් සහභාගි

	ආයතන 960 කට ප්‍රතිලාභ අහිමි වී තිබුණි. එමෙන්ම, වැඩසටහන් 21 ත් 24 ත් අතර සංඛ්‍යාවකට සහභාගි වී තිබූ නියෝජිත ආයතන 10 න් 4 ක්ම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගේ ආයතන විය. වෙළඳ කුටි මිලදී ගැනීම, ස්මාර්ට් බෝඩ් මිලදී ගැනීම, සහභාගිකයින් සඳහා සංග්‍රහ වියදම් හා හා මාධ්‍ය ප්‍රචාරණ කටයුතු ආදිය සඳහා රු, 1,002,725,809 ක නිශ්කාර්ය වියදමක් දරා තිබුණි.	කරවා ගැනීමටත් ඒ සඳහා කුටි 40 බැගින් මිල දී ගැනීමටත් අනුමැතිය ඉල්ලා ඇති අතර ඒ සඳහා 2024.03.05 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 40.11.04 මගින් කැබිනට් මණ්ඩල අනුමැතියට යටත්ව රුපියල් මිලියන 566.4 ක මුදලක් සෙස් අරමුදල් භාවිතයෙන් සිදුකිරීමට අනුමැතිය ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2024.03.07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 05/2024 මගින් Glocal Fair වැඩසටහන දිස්ත්‍රික් 25 හිදී පවත්වා ගෙන යාම සහ වියදම් සිදු කිරීමට අනුමැතිය ඉල්ලා ඇති අතර ඒ සඳහා 2024.03.12 දිනැති අංක 24/0487/625/007 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍ය මණ්ඩලයේ එකඟතාවය ලබා දී ඇත. 2023.01.24 දින අංක 39.11.17 අධ්‍යක්ෂ පත්‍රිකා යටතේ යාපනයේ Glocal Fair වැඩසටහන සඳහා කුටි 25 ක් මිලදී ගැනීම ඇතුළුව අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 9.54 ක අනුමැතිය ලබා තිබුනි.එසේ තිබියදී කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම් විසින් ML/PRD/5/6/22 දරන 2023.05.26 දිනැති ලිපිය මගින් භාණ්ඩාගාර මුදල් උපයෝගී කර සිදු නොකරන ලෙස දන්වා සිටි බැවින් එම ලිපියට පැහැදිලි කිරීමක් ලෙස සභාපතිතුමාගේ උපදෙස් පරිදි පිළිතුරු ලෙස AGM/CA/01/14 දරන 2023.06.14 ලිපිය මගින් ඒ සඳහා කාර්යාංශයේ සෙස් අරමුදල භාවිතා කල හැකිද යන්න සාමාන්‍යාධිකාරීගේ අත්සනින් යුතුව විසින් විමසා ඇත.ඉන්පසු ML/PRD/5/6/22 දරන 2023.06.21 දිනැති ලිපිය මගින් විදේශ රැකියා නියෝජිතායතන වෙත පහසුකම් සැලසීම හා විදේශ රැකියා කර්මාන්තයේ ප්‍රගතිය සඳහා වන වියදම් සෙස් අරමුදලෙන් ගෙවීම සඳහා පියවර ගන්නා ලෙස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම් දැනුම්දී ඇත. Glocal Fair 2024 වැඩසටහන් මාලාව සඳහා කාර්යාංශය විසින් සියළුම බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන වෙත වැඩසටහන් පවත්වන සියළුම දින/ දිස්ත්‍රික්ක සඳහන් කරමින් විවෘත ආරාධනාවක් (Open Invitation) සිදු කිරීමෙන් පසුව, එම වැඩසටහන් සඳහා සහභාගිවීමට කැමැත්ත පල කරන ලද අනුපිළිවෙල අනුව තෝරාගෙන ඇත. ඒ අනුව, බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන ඔවුන් සහභාගි වීමට අවශ්‍ය දිස්ත්‍රික්ක අනුව සිය ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇත. මෙම ක්‍රමවේදය යටතේ රැකියා නියෝජිත ආයතනයන්හි නියෝජිතයන් අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කළද එම විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා ද මෙවැනි රැකියා වෙළඳපොළ සඳහා සහභාගී වීම බාධාවක් නොවේ. • පවත්වන ලද Glocal Fair 2024 වැඩසටහන් ප්‍රමාණය - 24 • සහභාගී වන ලද බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන ප්‍රමාණය - 115 • විදේශ රැකියා සඳහා බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන වල ලියාපදිංචි වූ ප්‍රමාණය-53,476

		• 2025.04.30 දින වන විට විදේශගත වී ඇති ප්‍රමාණය - 840 මෙම වැඩ සටහන යටතේ විගමණික ශ්‍රමිකයින් ශ්‍රමිකයින් උදෙසා සහ අනෙකුත් ව්‍යදම් වෙනුවෙන් කාර්යාංශය විසින් දරන ලද රු.1,259,752,579/- ක සම්පූර්ණ ව්‍යදම් විස්තරය පහත පරිදි වේ. • විදේශ රැකියා නියෝජිත ආයතනවලට රැකියා පොළ වැඩසටහන් පැවැත්වීමට අවස්ථාව සලසා දීම (කුටි වෙනුවෙන්) රු.542,800,000/- • විගමණික ශ්‍රමිකයින්ගේ දු දරුවන්ට පාසල් උපකරණ ලබාදීම රු.127,622,336/- හා ශිෂ්‍යත්ව ලබාදීම රු.80,355,000/- • විදේශ ගතවූ ඇතැම් ශ්‍රමිකයින් සඳහා තෑගි වවුචර්පත් ලබාදීම රු.8,105,191/- • විදෙස් රැකියා නිමකර ආපසු පැමිණි ශ්‍රමිකයින් සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීම රු.17,280,633/- • විදෙස් රැකියා නිමකර ආපසු පැමිණි සාර්ථක ව්‍යාපාර කර්මාන්ත පවත්වා ගෙන යනු ලබන විගමනික ශ්‍රමිකයින් උදෙසා කාර්යාංශය විසින් සිදුකරන ලද ඇගයීමක් වශයෙන් ලබා දෙන ලද මූල්‍ය දායකත්වය රු.13,138,702/- • දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නිර්දේශය යටතේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්ම තෝරාගත් පාසැල් සඳහා ස්මාට් පුවරු ලබාදීම රු.183,468,302/- • වැඩිවාර ගණනක් කාර්යාංශයේ ලියාපදිංචි වූ විගමනික ශ්‍රමිකයින් හට සතොස වවුචර්පත් ලබාදීම රු.4,362,500/- • උපකාර අවැසි ආබාධිත විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත සුභසාධන පහසුකම් සැපයීම රු.4,879,524/- • මහන මැෂින් /ඇස්කණ්නාඩි පරිත්‍යාග කිරීම රු.1,282,890/- • විගමණික ශ්‍රමිකයින්ගේ දු දරුවන් සහභාගිවන නැටුම් කණ්ඩායම් සඳහා (එක් දරුවකුට රු.5000/-ක් බැගින්) රු .420,000/- • විගමණික ශ්‍රමිකයින්, දු දරුවන් හා පවුලේ සාමාජිකයින් වෙනුවෙන් ඉහත දැක්වූ පරිදි පවත්වන වැඩසටහන්හිදී කෙටි ආහාර, දිවා ආහාර හා වතුර සැපයීම රු.66,112,260/- • විගමණික ශ්‍රමික ජාලවල සාමාජිකයින් වැඩසටහන්වලට ගෙන්වා ගැනීමේදී කෙටි ආහාර, දිවා ආහාර හා ප්‍රවාහන ව්‍යදම් රු.12,931,929/- • රාජ්‍ය නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, පොලිස් නිලධාරීන් , නීති නිලධාරීන් හා විදුහල්පතිවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම රු.10,561,651/ • ප්‍රාදේශීය මාධ්‍යවේදීන්/ සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම රු.10,557,187/-

		• කාර්යාංශ කළමනාකාරිත්වය/ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා ආහාර, ඉන්ධන වියදම්, අතිකාල දීමනා හා අනෙකුත් වියදම් රු.18,126,732/- • වැඩසටහන්වල ප්‍රචාරණය හා මාධ්‍ය කටයුතු රු.144,011,126/- • විගමණික ශ්‍රමිකයින්ගේ ස්වයං රැකියා පොළ වැඩසටහන් පැවැත්වීමට වෙළඳ කුටි ලබාදීම රු. 796,000/- • අනෙකුත් වියදම් රු.5,798,866/- • විශේෂ අමුත්තන්ගේ සංග්‍රහ/දිවා ආහාර සඳහා 7,141,750/-
එ	විදෙස් ගත සේවය අවසන් කර පැමිණ තිබූ ශ්‍රමිකයින්ගේ සුභසාධන කටයුතු සිදු කිරීම සඳහා කාර්යාංශයේ ප්‍රතිසංවිධාන අංශයක් පවතින අතර, 2024 වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මට අනුව වැඩ සටහන් 04 ක් සඳහා රු. මිලියන 44.04 ක් වැය කර ප්‍රතිලාභ ලබාදී තිබියදී, මෙම අරමුණ සඳහාම කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමේ රැස්වීම් 03 ක් විගමණික හරසර නමින් පැවැත්වීමට 2024 ජූලි 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීමකට අනුව මේ සඳහා වැය වන මුදල් ලබාදීමට 2024 ජූලි 16 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී රු.62,756,542 ක් අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. ජනාධිපතිතුමාගේ, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යවරයාගේ සහ කම්කරු හා විදේශ රැකියා රාජ්‍ය අමාත්‍යවරයාගේ සුබ පැතුම් 3 ක් ඇතුළත් ලිපිගොනු 15,000 ක් මුද්‍රණය සඳහා රු.1,935,000 ක්ද, ශ්‍රමිකයන් ප්‍රවාහනය සඳහා රු.8,230,375ක්ද ආහාරපාන සඳහා රු.14,855,000ක්ද සහ රැස්වීම පැවැත්වීමට ශාලාවක් සකස් කිරීම හා වෙනත් වියදම් සඳහා රු.37,736,167 ක් වශයෙන් එකතුව රු.62,756,542 ක් ඵලදායී නොවන කාර්යයන් වෙනුවෙන් වැය කර තිබුණි.	2024.06.26 දිනැති හා අංක 24/1258/625/018 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් මෙම විගමණික හරසර වැඩසටහනට අදාළ කරුණු සඳහා 2024.07.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ලබා දී ඇත. මෙම වැඩසටහන Glocal Fair වැඩ සටහනේ දිගුවක් බැවින් ඒ සඳහා අවශ්‍ය අරමුදල්ද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙතින් සලසා ගැනීමේ හැකියාව සොයා බලා ඒ අනුව අවශ්‍ය පියවර ගන්නා ලෙස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්ට එමගින් නියම කර ඇත. ඒ අනුව මෙම විගමණික හරසර වැඩ සටහන Glocal Fair වැඩ සටහන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මඟින් අරමුදල් වෙන් කරන ලෙස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් 2024.07.03 දින අංක MFE/ADM/06/01/01/11/2023 දරන ලිපිය මඟින් කාර්යාංශ සභාපති වෙත දන්වා ඇත. ඒ අනුව, 2024.07.16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත යොමු කරන ලද අංක 94/2024 M-06) දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සඳහා අංක 40.39.02 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මඟින් ඇස්තමේන්තුව ලැබූ පසු මෙම මුදල් නිදහස් කිරීමට අනුමැතිය ලැබී ඇත. 2024.07.16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 40.39.02 අනුව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිඛිත ඉල්ලීමට අනුව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමට පමණක් කාර්යාංශය කටයුතු කර ඇති අතර, මෙම වැඩ සටහනේ අනෙකුත් සියළු කටයුතු අමාත්‍යාංශය විසින් සිදුකර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති අනුමැතිය යටතේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම් විසින් 2024.07.17 දිනැතිව කල ඉල්ලීමට අනුව, රු. මිලියන 40 ක මුදලක් සහ 2024.07.30 දිනැතිව කල ඉල්ලීමට අනුව රු. 23,362,242.50 ක මුදලක් වශයෙන් කාර්යාංශය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.
ඒ	රැකියා වෙළෙඳ පොළ පිළිබඳව හා දේශීය සහ විදේශීය රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු ලබා දීම, යන අරමුණු සඳහා කාර්යාංශය විසින් 2024 ජනවාරි 31 දින සිට	විගණන වාර්තාවේ සඳහන් පරිදි මෙම වැඩසටහන් පවත්වා ඇත්තේ එකම අරමුණකට නොවන අතර එහි අරමුණු විවිධ වේ.

	ජූලි 28 දින දක්වා දිස්ත්‍රික්ක 25 කම ජයගමු ශ්‍රී ලංකා නමින් දින දෙකක වැඩසටහන් යතිපතා පවත්වමින් යන අවස්ථාවක එම අරමුණ සඳහාම ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් පවත්වන Smart Youth දිස්ත්‍රික් වැඩසටහන් 15 ක් සඳහා සහභාගී වීමට රු. මිලියන 9.4 ක ඇස්තමේන්තු ගත වියදමක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු අතර, 2024 ජුනි 14 හා 15 දෙදින ගාල්ල සහ ජුනි 28 හා 29 දෙදින කුලියාපිටිය යන ප්‍රදේශයන්හි පවත්වා තිබූ වැඩසටහන් සඳහා සහභාගී වී රු.3.198,164 ක් අනාර්ථික ලෙස වැය කර තිබුණි.	ජයගමු ශ්‍රී ලංකා වැඩසටහන රේඛීය අමාත්‍යාංශය මගින් අමාත්‍යාංශය යටතේ පවත්නා සියළුම ආයතනයන් හි සේවා එක් පරිශ්‍රයකදී මහ ජනතාව වෙත ලබා දීම සඳහා සිදුකරන ලද වැඩසටහනක් වන අතර, සියලුම ආයතන විසින් සපයන සේවාවන්, සේවාලාභීන් පදිංචි ස්ථාන වලදී පහසුවෙන් ලබාගත හැකිවන පරිදි ජයගමු ශ්‍රී ලංකා වැඩසටහන සැලසුම් සහගතව ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව විදේශීය රැකියා අවස්ථා සැලසීම, දැනුවත් කිරීම හා විගමණික ප්‍රඥාව වෙත සුහසාධන පහසුකම් සැපයීම මෙම වැඩසටහන් වලදී සිදුකර ඇත. ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් හා ලබාදුන් නියෝග අනුව ජයගමු ශ්‍රී ලංකා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2024.01.17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 21/2024(M-01) සඳහා 2024.01.29 දිනැතිව අංක 40.04.23 යටතේ ලබාදෙන ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව අදාළ කාර්යාංශයීය කාර්යයන් ක්‍රියාත්මක කරනු ලැබ ඇත . 2024.03.05 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 40.11.04 මගින් කැබිනට් මණ්ඩල අනුමැතියට යටත්ව රුපියල් මිලියන 566.4 ක මුදලක් සෙස් අරමුදල් භාවිතයෙන් සිදුකිරීමට අනුමැතිය ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2024.03.07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 05/2024 මගින් Glocal Fair වැඩසටහන දිස්ත්‍රික් 25 හිදී පවත්වා ගෙන යාම සහ වියදම් සිදු කිරීමට අනුමැතිය ඉල්ලා ඇති අතර ඒ සඳහා 2024.03.12 දිනැති අංක 24/0487/625/007 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍ය මණ්ඩලයේ එකඟතාවය ලබා දී ඇත . ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මගින් දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ කේන්ද්‍ර කර ගනිමින් ප්‍රවර්ධන වැඩසටහන් මාලාවක් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන බවත්, ඒ සඳහා සහභාගිවන ලෙසටත් 2024.06.05 දිනැති MOYS/SEC/46 අංක දරන ලිපිය මගින් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් එවකට කාර්යාංශයේ සභාපති වෙත දන්වා ඇත. ඒ අනුව 76/2024 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2024.06.12 දින අධ්‍යක්ෂ මණ්ඩල කළමනාකරණ පද්ධතියට උඩුගත කර සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ අවධානය පිණිස යොමු කර ඇති අතර එහිදී ලබාගන්නා ලද බහුතර සාමාජිකයින්ගේ එකඟතාවය අනුව මෙහි ඉදිරි කටයුතු සිදුකර ඇත. 2024.06.27 දිනැතිව පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒ සඳහා 40.32.04 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මඟින් ආවරණ අනුමැතිය ලබා දී ඇත. Smart Youth වැඩසටහන සඳහා කාර්යාංශය සහභාගී වී ඇත්තේ කාර්යාංශයේ ලියාපදිංචි වෘත්තීය පුහුණු ආයතන මෙම වැඩසටහන සඳහා සහභාගී කර වීම සඳහා වේ. මෙහිදී විදේශීය රැකියා වෙළඳපොළ කේන්ද්‍ර කර ගනිමින් වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා තරුණ තරුණියන් මෙම වෘත්තීය පුහුණු ආයතන වෙත යොමුකර විදේශීය රැකියා සඳහා

		වෘත්තීය ප්‍රහුණුව, කුසලතා වර්ධනය, සඳහා තරුණ රැකියා අපේක්ෂකයින් දැනුවත් කිරීම සිදුකර ඇත. එමෙන්ම නොයෙකුත් ආයතන/අමාත්‍යාංශ මගින් ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වන ලෙසට සිදු කරන ලද ඉල්ලීම් සඳහා එම ඉල්ලුම් කරන ආයතන/ අමාත්‍යාංශයේ අවශ්‍යතා අනුව කාර්යාංශය සහභාගි වීම සිදු කරනු ලබයි. එමඟින් අපේක්ෂා කරනුයේ විවිධ ඉලක්ක ගත කණ්ඩායම් සම්බන්ධ කර ගනිමින් කාර්යාංශ සේවාවන් හැකි තරම් ජනගත කිරීම වේ. තවද රට තුළ පැවති ඩොලර් ඌනතාවය සඳහා විවිධ ප්‍රවර්ධන වැඩසටහන් හා සම්බන්ධ වෙමින් විදේශ රැකියා සඳහා යොමු කරනු ලබන ශ්‍රී ලාංකිකයින්ගේ සංඛ්‍යාත්මක වර්ධනයක්ද මෙවැනි ප්‍රවර්ධන වැඩසටහන් තුළින් දිගු කාලීනව අපේක්ෂා කර ඇත. ප්‍රචාරක අංශයේ ක්‍රියාකාරී සැලැස්මේ 3.3.9.7 ක්‍රියාකාරකම යටතේ Awareness to Public සඳහා රු.මිලියන 55 ක් වෙන් කර ඇත. අංශවල ක්‍රියාකාරී සැලැස්මයන් අනුව සකස් කරන ලද 2024 ප්‍රසම්පාදන සැලැස්මේ එය Job Promotional Programme, Job Fair Programme & Related Works යන කාණ්ඩ යටතේ ප්‍රසම්පාදන සැලැස්ම මගින් මුදල් වෙන් කර ඇත. ජංගම වෙළෙඳ කුටියේ සැකිල්ල හා ඊට අදාළ අනෙකුත් අවශ්‍යතා සකස් කිරීමට රු.1,950,000.00 වියදමකුත්, නඩත්තු කටයුතු සහ ස්ථාන 15ක සවිකිරීමේ කම්කරු වියදම් ලෙස රු. 3,768,000.00ක් වෙන් කර තිබුණද එම මුදලින් රු. 2,662,628.00 ක මුදලක් ගාල්ල වැඩසටහන සඳහා යොදාගෙන ඇත. කුරුණෑගල සිදු කරන ලද වැඩසටහන සඳහා රු. 353,536.00 ක මුදලක් සැලසිනේ ආයතනය වෙත ගෙවා ඇත.
ඔ	ප්‍රථමවරට විදේශගත වන ගෘහසේවිකාවන්ට ලබාදීම සඳහා මිලදී ගෙන තිබූ සතොස වවුචර්පත් වලින් 2025 මැයි 07 දින වන විටත් රු.25,250,000 ක් වටිනා වවුචපත් ප්‍රධාන කාර්යාලයේ ඉතිරි වී තිබූ අතර, රු.52,370,000 ක් වූ වවුචර්පත් 5,237 ක් ලබා ගැනීමට විදේශගත වූ ගෘහ සේවිකාවන් සුදුසුකම ලබා තිබුණද, දත්ත පද්ධතිය තුළ ඔවුන්ගේ නිවැරදි තොරතුරු ඇතුළත් කර නොතිබීම මත වාර්තාවේ දිනය දක්වාම ප්‍රතිලාභීන් වෙත ලබාදීමට නොහැකිව පළාත් කාර්යාල වල පැවතුණි. ඒ අනුව වවුචර්පත් මිලදී ගෙන මාස 19 ක් ගතව තිබුණ ද රු. 77,620,000 ක් වටිනා වවුචර්පත් බෙදා දීමට නොහැකි වී තිබීම හේතුවෙන් මෙම මුදල් වෙතත් ආයෝජනයක යෙදවීමෙන් උපයාගත හැකිව තිබූ ආදායම සුභසාධක අරමුදලට අහිමි වී තිබුණි.	සතොස වවුචර්පත් මිලදී ගැනීම සඳහා අංක 103/2023 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සහ තීරණ අංක 39.39.23 මඟින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2006 හි 3.5 - 1 ඍජු මිලදී ගැනීම් යටතේ රජයට අනුබද්ධිත දීප ව්‍යාප්ත ආයතනයක් වන ලංකා සතොස ආයතනය වෙතින් මිලදී ගැනීම් සිදු කර ඇත. ඇතැම් අවස්ථා වල රැකියා නියෝජිත ආයතන මගින් අදාළ ගෘහසේවිකාවන්ගේ තොරතුරු නිවැරදි ලෙස ලබා දීමට කටයුතු නොකිරීම මත අදාළ හිමිකරුවන් සොයා ගැනීමට නොහැකි විය. මෙම වවුචර්පත් බෙදා දීම සඳහා කඩිනම් පියවරක් ලෙස සංවර්ධන නිලධාරී (විදේශ රැකියා) මාර්ගයෙන් අදාළ හිමිකරුවන් සොයා ගෙන වවුචර්පත් ලබා දීමට කටයුතු කළ අතර, කෙසේ වුවත්, 2025.09.30 දින වන විට රු.20,290,000/- ක වවුචර්පත් ඉතිරිව ඇත.

ඔ	2018 වර්ෂයට පෙර සිට භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස (Labour contract agreement fees) පැවතෙන රු.869,955,801 ක මුදල නිරවුල් කර ගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධව මුදල් අයකර ගැනීම සඳහා සාකච්ඡා වට ගණනාවක් සිදුකර ඇති අතර මෙතෙක් විසඳුමක් ලැබී නොමැත.කෙසේ වුවද මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කරමින් පවතී.මේ පිළිබඳව රේඛීය අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශය දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබාගැනීමට අපේක්ෂා කරමි.
ක	2013 ජනවාරි 18 දින රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත කහගොල්ල ඉඩම සඳහා රු.20,000,000 ක් ගෙවීම් කර වර්ෂ 12 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද මුදල් නැවතඅයකරගැනීම හෝ ඉඩම අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද 2013.11.22 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් කහගොල්ල ඉඩම හා ගොඩනැගිලි කාර්යාංශය වෙත 99 අවුරුදු බදු පදනම මත පවරා දීමට ඉල්ලීම් කර ඇති අතර 2014.01.14 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ඉඩමෙහි භුක්තිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත භාරදී ඇත. මෙම ඉඩම බදු පදනම මත පවරා ගැනීමේ ක්‍රියාවලිය, ප්‍රමාද වෙමින් පවතින බව විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2014.12.18 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. ඉඩම සම්බන්ධයෙන් වාර්තාවක් ගරු නීතිපතිතුමා වෙත 2016.12.28 දිනැතිව යොමුකර ඇති අතර ඉඩම වෙනුවෙන් රු. මිලියන 20ක් කාර්යාංශය විසින් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත ගෙවා ඇති බැවින්, ඒ සඳහා නෛතික පොලිය අයකර ගැනීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති) විසින්, නීතිපතිතුමා වෙත 2017.02.06, 2017.05.17, 2018.01.03 දිනැතිව ලිපි යොමුකර ඇති අතර රාජ්‍ය ආයතන අතර නෛතික ක්‍රියාමාර්ග ගැනීම වළක්වමින් 2018.05.22 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණ සැලකිල්ලට ගනිමින් මේ සඳහා ඉදිරි කටයුතු සිදුකල නොහැකි බවත් විෂයභාර අමාත්‍යවරයා හරහා අදාළ ආරවුල අමාත්‍ය මණ්ඩලයට යොමු කල යුතු බවත් නීතිපති දෙපාර්තමේන්තුව මඟින් 2018.08.07 දින දන්වා ඇත. රු. මිලියන 20 ක මුදල සහ ඒ සඳහා නෛතික පොලිය ඉතා කඩිනමින් ලබාදෙන ලෙස රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2017.09.20 දිනැතිව දන්වා ඇති අතර රු. මිලියන 20 ක මුදල හෝ එම මුදලේ වටිනාකමට සරිලන ලෙස ඉඩමෙන් කොටසක් පවරා දෙන ලෙස 2017.12.21, 2018.05.08 දිනැතිව විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇත. ඉඩම් කාර්යාංශය වෙත පවරා ගැනීම සඳහා එවකට රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ඇමතිතුමා විසින් 2018.02.19 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. එම අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2018.04.25 දිනැතිව අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී ඇති අතර එමඟින් ඉඩම් කොටස යුද්ධ හමුදාවේ 6 වන කාරක ඉංජිනේරු දෙපාර්තමේන්තුව

		ස්ථානගත කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරන බව දන්වා ඇත. මිලියන 20 ක මුදල් නැවත අයකරගත යුතු බැවින් මේ සම්බන්ධයෙන් 2018.07.09 , 2018.07.17 දිනැතිව අමාත්‍යාංශ ලේකම්ගෙන් උපදෙස් ඉල්ලා ඇති අතර ඉඩම පැවරීමට අදාළ කටයුතු කිරීම වෙනුවෙන් කාර්යාංශයට ගෙවිය යුතු මුදල් යුධ හමුදාව විසින් ගෙවීමට කටයුතු කිරීම වඩාත් සුදුසු බව දන්වා 2018.08.21 දිනැතිව අධ්‍යක්ෂ (බැංකු, වැවිලි හා කර්මාන්ත) විසින් ලේකම් (ආරක්ෂක අමාත්‍යාංශය) වෙත ලිපියක් යොමු කර ඇත. 2019.01.21 දිනැති ලිපිය මඟින් මිලියන 20 ක මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර දෙන ලෙසත්, 2019.02.01 දිනැති ලිපිය මඟින් මෙම ඉඩමේ හුක්තිය වෙනත් පාර්ශවයකට භාරදීමට පෙර කාර්යාංශය විසින් ගෙවීම් කර ඇති රු.මිලියන 20ක මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙසත් අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා ඇත. නමුත් 2020.03.03 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම් සලකා බලමින් කොවිඩ් 19 වෛරස රෝගය නිරෝධායන තාවකාලික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩම භාවිතා කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලබා දී ඇත. මෙම ඉඩම සඳහා ගෙවීම් කරන ලද රු.මිලියන 20ක මුදල් කාර්යාංශය වෙත ලබාදී ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස 2021.04.09 හා 2022.10.26 දිනැතිව ආරක්ෂක සේනා ආඥාපති, ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) වෙත දන්වා ඇත. අවස්ථා ගණනාවකදීම මෙම ඉඩම සඳහා අත්තිකාරම් ලෙස ගෙවන ලද මුදල් කාර්යාංශය වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලීම් සිදුකර ඇති අතර ගෙවන ලද අත්තිකාරම් මුදල් නැවත කාර්යාංශය වෙත නොලැබීම හේතුවෙන් විදේශ රැකියා අපේක්ෂකයින් සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමට කහගොල්ල ඉඩම කාර්යාංශයට නැවත අත්පත් කරගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2024.06.04 දිනැතිව ඉදිරිපත් කර ඇත. නමුත් එහිදී ගරු ජනාධිපතිතුමා විසින් කෘෂිකර්ම නවීකරණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ යෝග්‍යතාවය පෙන්වා දෙන ලද බවත් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේ හැකියාව හා මේ සම්බන්ධයෙන් වන යෝග්‍ය නිර්දේශයන් සහිතව නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත ඇමතිතුමා වෙත 2024.06.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් දන්වා ඇති බැවින් ඉඩම කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කරන්නේ නම් කාර්යාංශය විසින් මෙම ඉඩම සඳහා ගෙවීම් කර ඇති රු. මිලියන 20 ක මුදල් නැවත ලබා දීමට අවශ්‍ය කටයුතු

		සිදුකරන ලෙස අදාළ පාර්ශවයන් දැනුවත් කරන මෙන් 2024.07.23 දිනැතිව රේඛීය අමාත්‍යාංශ ලේකම්වෙත ලිපියකින් දන්වා ඇත. කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන්නේ ද යන්න අනුව ගෙවීම් කල මුදල ආපසු ලබා ගැනීමට ඉදිරි පියවර ගත හැකි බව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය මඟින් දන්වා ඇති අතර කෙසේ වෙතත්, වර්තමානයේදී රට තුල කොවිඩ් 19 වසංගත තත්ත්වය පහව ගොස් ඇති බැවින් මෙම ඉඩම නැවත කාර්යාංශය වෙත පවරා දීමට හෝ කාර්යාංශය විසින් ගෙවන ලද රු. මිලියන 20 ක මුදල ආපසු ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන මෙන් 2024.09.30 දිනැතිව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය වෙත දන්වා ඇත.කෙසේ වුවත් මේ වන විටත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් මෙම ඉඩම භාවිතා කරන බැවින්, ඉඩම් නැවත කාර්යාශය වෙත පවරා දීමට හෝ ගෙවන ලද මි.20 ක මුදල ආපසු ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ලේකම් විදේශ කටයුතු විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය වෙතින් 2025.02.06 හා 2025.04.25 වන දින ඉල්ලීම් කර ඇති අතර රු.මි. 20 ක මුදල ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙත 2025.05.20 දිනැතිව දන්වා ඇත.

කෝශල වික්‍රමසිංහ

සභාපති

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம்
Sri Lanka Bureau of Foreign Employment

ප්‍රධාන කාර්යාලය
234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
දුර: +94 11 287 9901-. 3 / +94 11 288 0500 ඊමේල්: info@slbfe.lk
වෙබ්: slbfe.lk ක්ෂණික ඇමතුම්: 1989

தலைமை அலுவலகம்
234, டென்சில் கொப்பேகடுவ மாவத்தை, கொஸ்வத்தை, பத்தரமுல்ல,
தொலைபேசி: +94 11 287 9901-3/ +94 11 288 0500 மின்னஞ்சல்: info@slbfe.lk
வலை: slbfe.lk ஹாட்லைன்: 1989

Head Office
234, Denzil Kobbekaduwa Mawatha, Koswatta, Battaramulla, Sri Lanka.
Tel: +94 11 287 9901-3 / +94 11 288 0500 Email: info@slbfe.lk
Web: slbfe.lk Hotline: 1989